*Chokher Bali* charts the decline of the joint family in Bengal, a phenomenon of which Tagore had become aware by 1880.The novel depicts a small family with one male head.Asha, the daughter-in-law, is expected to submit to the authority of her mother-in-law Rajalakshmi. In this compact domestic arrangement, Annapurna and Binodini occupy the position of dependents who are short-term residents.In the novel, Mahendra marries Asha for love; he also tries to educate her. This break from the customary arranged marriage indicates the shift towards companionate marriage, an idea that was gaining currency in Bengal as a result of exposure to Western culture. At the same time, the text demonstrates the difficulties inherent in such a paradigm shift, for the ideal of prem or romantic love causes conflict with the traditional environment of the rest of the household (Panja). *Chokher Bali* thus represents a society in transition, and the ways in which changes in the family structure affected the lives of women.

Asha's character is also a feature of the text's modernity. She does not conform to Bankimchandra's stereotypes of prachina, the traditional woman skilled in domestic affairs, and nabina, the westernized "modern" woman who seeks social sophistication while neglecting household responsibilities. Asha's ignorance and naivete, which Mahendra at first finds so charming, begin to annoy him when he discovers Binodini's domestic skills. Asha, however, does not accept Mahendra's betrayal when he becomes infatuated with Binodini. "She was unable to follow her mashi's advice, the dictates of the puranas, the discipline enjoined upon her by the scriptures; she could no longer worship this husband who had fallen from the pedestal of conjugal love. Today, she deconsecrated the lord of her heart, immersing him in the sea of shame that was Binodini" (CB 310-11). Asha'srejection of the passive tolerance enjoined upon the devoted Hindu wife, her refusal to abide by the decrees of tradition and the scriptures, is a significant marker of the modernity of Tagore's novel (Bhattacharya and Bhattacharya 37).Although she forgives Mahendra in the end, she does so with a newfound affirmation of choice and self-assurance.

Bihari, too, is a complex figure. Although he is educated, he does not take up a regular profession. Instead, he takes up social service, choosing to work for the benefit of those

who belong to the underprivileged sections of society. He represents the new social consciousness of educated Bengalis of this period, and the emerging spirit of individualism characteristic of the time (Sogani 88). His opposition to Mahendra's adulterous love for Binodini suggests a conservative, didactic mindset; yet his desire to marry the widowed Binodini also indicates a liberal outlook and a progressive social awareness. In the tussle between reason and passion, Bihari finds himself unable to live up to his own ideal of moral duty. He first falls in love with Asha, another man's wife, and then feels drawn by Binodini'sseductive charm. It is this ambivalence that gives his character the psychological complexity that defines the modernity of Tagore's approach in *Chokher Bali*.

The central, and most complex figure, of course, is Binodini. She confounds the distinctions between *prachina* and *nabina* created by Bankimchandra in his classification of nineteenth century women. Instead, she "is an intriguing amalgam of the various types of Bengali women that Chatterjee has put into exclusive compartments" (Panja 217). Contrary to the image of the pure, chaste "bhadramahila" or respectable upper-class woman, Binodini assertively expresses her individual needs and desires. Though a transgressive figure in the first part of the novel, Binodini is transformed by her love for Bihari, and ultimately chooses to withdraw into a life of austerity (Sogani 66). According to Dipesh Chakrabarty, the body, as a site for the struggle between opposite tendencies is an unresolved problem in the text (Chakrabarty 74). He argues that rup or physical beauty is not an issue in *Chokher Bali* (Chakrabarty 71). Most readers would agree, though, that Binodini's character is actually endowed with a strong element of physical allure (Panja 219). She isboth thesubject and the object of desire, a self-conscious target of the male gaze, but also driven by her own passion for Bihari. But her desire cannot be explained in terms of the Freudian paradigm of the triangular relationship between father, mother and child. Binodini's desire is fanned by the repressive social practices of nineteenth century Bengal, and it does not fit the models provided by Western theory. The modernity of Tagore's text demands a different reading frame.

Having created such a subversive figure, though, Tagore seemed at a loss to find an appropriate resolution to her predicament. The fact that he twice changed the ending of the novel indicates his own dissatisfaction with the story's denouement. The disruption triggered by Binodini's entry into the lives of Mahendra and Bihari allowed of no neat solution in the social milieu within which their narrative is embedded. Though the narrative ends in reconciliation, Binodini's departure into oblivion at the end of the text leaves us with the sense of a tale left unfinished. But then, fragments and open endings are also features of the modern novel.

## Works Cited

Bhattacharya, Anuttam. *Rabindra Rachanabhidhan* (Bengali) Vol. 7. Kolkata: Deep Prakashan, 2007.

Bhattacharya, Prabhatkumar and Uma Bhattacharya. *Adhunikatar Rupptatima* vol. 1 (Bengali). Kolkata: D. N. Publications, 1991.

Chakrabarty, Dipesh. "Witness to Suffering: Domestic Cruelty and the Birth of the Modern Subject in Bengal". Mitchell, ed. 49-86.

Chatterjee, Partha. "Two Poets and Death: On Civil and Political Society in the Non-Christian World." *Questions of Modernity*, ed. Timothy Mitchell.35-48.

Das, Sisir Kumar and Sukanta Chaudhuri, eds. Rabindranath Tagore: *Selected Writings on Literature and Language*. New Delhi: Oxford University Press, 2001.

Mitchell, Timothy, ed. *Questions of Modernity*. Minneapolis: University of Minnesota Press, 2000.

Panja, Shormishtha. "Rabindranath Tagore's Chokher Bali: The New Woman, Conjugality and the Heterogeneity of Home". *Signifying the Self: Women and Literature*. Ed. Malashri Lal, Shormishtha Panja and Sumanyu Satpathy. New Delhi: Macmillan, 2004. 211-225.

Sogani, Rajul. *The Hindu Widow in Indian Literature*. New Delhi: Oxford University Press, 2002.

Tagore, Rabindranath. *Chokher Bali* (1903). Translated by Radha Chakravarty. New Delhi: Srishti, 2003.

____. "Modern Poetry." Das and Chaudhuri, eds. *Selected Writings on Literature and Language*.

# දකුණු ආසියානු විකල්ප යථාර්ථවාදයක්: රවීන්ද්‍රනාත් තාගෝර්ගේ කෙටිකතා කලාව

ලියනගේ අමරකීර්ති

> 'කලාව යනු නිර්මාණශීලී මනුෂ්‍යාත්මය
> යථාර්ථයේ කැඳවුමට දක්වන ප්‍රතිචාරයයි.
> එය බාහිර යථාර්ථයේ අනුකරණයක් නොවේ.
> ඒ යථාර්ථයට දක්වන ප්‍රතිචාරයකි.'
> - රවීන්ද්‍රනාත් තාගෝර්

දකුණු ආසියාවේ සාහිත්‍ය ඉතිහාසය දෙස ආපසු හැරී බලන විට යුරෝපීය කෙටිකතාකරුවන් තරම්ම වැදගත් දුවැන්ත ලේඛකයෙකු ලෙස රවීන්ද්‍රනාත් තාගෝර්ගේ ලේඛන පෞරුෂය මතුව එයි. මේ වන විට ප්‍රකට ඔහුගේ බොහෝ කතා ලියවී ඇත්තේ 19 වන සියවසේ අවසාන භාගයේදීය. එහෙත් කෙටිකතාකරුවෙකු ලෙස ඔහුගේ නම ලෝක කෙටිකතාවේ දුවැන්තයන්ගේ නම් අතර සඳහන් නොවේ. 1913 දී සාහිත්‍ය පිළිබඳ නොබෙල් ත්‍යාගය ලැබීමෙන් පවා ප්‍රබන්ධ රචකයකු ලෙස ඔහුට හිමිවිය යුතු ගෞරවය ලැබී නැතැයි කිව හැකිය. දුන් දුන් ඔහුගේ කෘති ඉංග්‍රීසි බසට නැගී ප්‍රධාන පොත් ප්‍රකාශකයන් වෙතින් පළ වුවද 19 වැනි සියවස තරම් ඈත කාලයක වංග බසින් ලියමින් ලෝක ප්‍රබන්ධ කතාව වෙත ඔහු සැපයූ දායකත්වයෙහි සාහිත්‍යික සංස්කෘතික අගයයන් ප්‍රබන්ධ ශාස්ත්‍ර විෂයක කතිකාව තුළට පිවිස නැත. ඔහුගේ කෙටිකතා, එම කතා මාදිලියේ ඉතිහාසය පිළිබඳ අවබෝධයක් ඇතිව කියවන්නෙකුට වහා වැටහී යා යුතු කරුණක් නම් රවීන්ද්‍රනාත් තාගෝර් යන නම ඇන්ටන් චෙකොෆ්, ගී ද මෝපසාන්, ඕ. හෙන්රි වැන්නන්ගේ නම් අතරෙහි සඳහන් විය යුත්තක් බවය. එය එසේ සිදු වී නොමැත්තේ මන්ද යන්න වෙනම ගැටලුවකි. එහි හේතු ඇත්තේ නූතන ප්‍රබන්ධ කතාව දකුණු ආසියාව වෙත '' හඳුන්වා දෙනු'' ලැබූ යටත් විජිත ඓතිහාසික පසුබිම තුළය. නූතන කෙටිකතාවේ පූරෝගාමීන් ලෙස යුරෝපයීය නම් කීපයක් පමණක් සඳහන් වීම ප්‍රබන්ධ කතාව පිළිබඳ යටත් විජිත කතිකාවෙහි ඵලයක් මිස අන් කුමක් ද?

සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි පවා රවීන්ද්‍රනාත් තාගෝර්ට හිමි විය යුතු තැන පිළිබඳ නිසි වැටහීමක් ඇති බව නොපෙනේ. එහෙත් තාගෝර්ගේ කෙටිකතා සැලකිය යුතු ප්‍රමාණයක් සිංහලයට පරිවර්තනය වී තිබේ. එතෙකුදු වුව තාගෝර්ගේ ප්‍රබන්ධ කලාවෙහි අගය නිසි තක්සේරුවට ලක් කෙරී නැත. මෙම ලිපියේ අරමුණ සාහිත්‍යික යථාර්ථවාදයේ සීමා පිළිබඳ වර්තමානයෙහි සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයේ පවතින කතිකාව වෙත තාගෝර් කෙටිකතාව රැගෙන ඒමයි.[1]

යථාර්ථවාදයේ පදනම හැටියට පවතින තාර්කික හේතුඵල සම්බන්ධය අතාර්කිකත්වය, අස්වාභාවිකත්වය, අද්භූතය ආදිය ප්‍රබන්ධගත කිරීමට ඉඩ නොදෙන බව පශ්චාත් යථාර්ථවාදයන් වෙනුවෙන් හඬ නගන අයගේ තර්කයකි. යථාර්ථවාදී ධාරාවේම බොහෝ විට රැඳෙමින් සිය ප්‍රබන්ධ කරණයෙහි නියැලුන තාගෝර්ගේ කෙටිකතා යථාර්ථවාදයේ මෙම සීමාව ගැන 19 වන

සියවසේදී තරම් ඈත කාලයකදීම සංවේදී වී ඇත. නොඑසේ නම් තාගෝර්ගේ කතා කලාව වෙතින් පලවන්නේ ඔහුටම ආවේණික දකුණු ආසියානු යථාර්ථවාදයකි. මෙතෙක් මා සඳහන් කළ පරිදිම යථාර්ථවාදය යන්නට මුළු ලෝකයටම සරිලන, ඒකමිතික, කේවල අර්ථයක් නැති බව තාගෝර්ගේ කතා කලාවෙන් පෙනෙන අනෙක් කරුණයි. යථාර්ථවාදය යනු විවිධාකාර රූපයන්ගෙන් ප්‍රකාශයට පත් වන විශාල සහ විවිධ සංකල්පයන්ගේ එකතුවක් ලෙස තේරුම් ගැනීම වඩා ප්‍රයෝජනවත්ය යන තර්කයට තාගෝර්ගේ කතා කලාවෙන් ලැබෙන්නේ ඉමහත් පිටුවහලකි. අපි මෙම ප්‍රවාදය තාගෝර් කතා කිහිපයක් ඇසුරින් විමසා බලමු.

''ඇටසැකිල්ල''[2] නම් කෙටිකතාව 1892 වර්ෂයේ දී මුලින්ම පළ වුවකි. එහි කතා සාරාංශය මෙසේය:

තමන් කුඩා කල සිය නිවසේ කාමරයක ඇට සැකිල්ලක් එල්ලී තිබුණු බව කථකයාට මතකය. මේ කථකයා අධ්‍යාපනය ලැබූ කාලයයි. එකල ඔහු එම කාමරයේදී කැම්බෙල් වෛද්‍ය විද්‍යාලයේ ශිෂ්‍යයෙකුගෙන් කායව්ච්ඡේද විද්‍යාවත්, පණ්ඩිතවරයෙකුගෙන් සම්භාව්‍ය කෘතියකුත් හදාළේය. මේ බොහෝ කලකට ඉස්සර දූන් ඒ ඇට සැකිල්ල එම කාමරයේ නැත. වර්තමානයේ දවසක කථකයාට, එම ඇට සැකිල්ල, තිබූ කාමරයේ නිදා ගන්නට සිදු වෙයි. කෙසේ හෝ කථකයාට නින්ද නොයයි. ඔහුට ඇර ඇට සැකිල්ල සිහි වෙයි. ඔහු ඒ ගැන කල්පනා කරමින් ඇඳේ ඒ මේ අත පෙරලි පෙරලී සිටියි. මොහොතකින් කිසිවෙක් කාමරයට ඇතුල් වෙයි. ඒ ඇට සැකිල්ලේ හිමිකාරයා බව ඒ තැනැත්තිය කියයි. දෙදෙනා අතර සංවාදයක් ගොඩ නැගේ. ඒ ''කටහඬ'' (තැනැත්තිය) සිය **මරණය** සිදු වූ සැටි කියයි. ඇය සිය පළමු සැමියා මිය ගිය පසු, ඇගේ සොහොයුරාගේ ගෙදර ගොස් වසයි. තාමත් තරුණ ඇය සිය සොහොයුරාගේ මිතුරෙකු වන වෛද්‍යවරයකුට පෙම් කරයි. ඇය හා සබඳකම තිබුණත් වෛද්‍යවරයා දෑවැද්දක් සහිතව වෙනත් විවාහයක් කර ගනියි. එහෙයින් ඇය දිවි නසා ගනියි. මේ වසර තිස් පහකට පෙරදීය. ඇය මරණයේ වැතිර සිටියදී පිරිමි ළමයින් තුන් දෙනෙක් ඇගේ ඇට සැකිල්ල තුළට අත දමා කාය ව්‍යවච්ඡේදය ඉගෙන ගනු ඇයට දූනෙයි. මේ ''කටහඬ'' ඇගේ මරණය සිදු වූ අයුරු කථකයාට කියා පාන්දර නික්ම යයි.

මෙම කෙටිකතාවෙහි කතා දෙකක් ඇත. එකක් කථකයාගේ කතාවයි. දෙවැන්න අර ස්ත්‍රී කටහඬ විස්තර කරන ඇගේ කතාවයි. මේ කතා දෙකම කතාමය වශයෙන් ගැඹුරු හෝ සවිස්තරාත්මක කතා නොවේ. එහෙත් තාගෝර් සිය කෙටිකතාව ගොඩ නගන ආකාරය, එහි ව්‍යුහය සහ ඉදිරිපත් කිරීම යනාදී අංග සම්මත යථාර්ථවාදය ඉක්මවා සිටියි.

(කට හඬේ පැමිණීම තාගෝර් විස්තර කරන්නේ කථකයා දකින සිහිනයක් ලෙස නොවේ. කථකයාට නින්ද නොයන බව තාගෝර් පැහැදිලිව කියයි. ''කලක් එහි ජීවත් වී නොපුරුදු හෙයින්, මට නිදාගත නොහැකි විය!'' අවදියෙන් සිටින ඔහුගේ ඇඳ මත, මදුරු දැලට පිටින් කිසිවෙකු හිඳගත් බව කථකයාට දූනෙයි. මේ සිද්ධිය කථකයාගේ මනෝ විකාරයක් බව **කීමේ හෝ නොකීමේ** වගකීම රචකයා බාර නොගනියි. ඒ වෙනුවට සිහිනයත්-යථාර්ථයත් අතර දෙවැනි යථාර්ථයක් තාගෝර් නිර්මාණය කරයි. තාගෝර්ගේ ගද්‍ය රචනාව ඔස්සේ සිහිනය, මනෝ විකාරය හා තථ්‍ය යථාර්ථය අතර දෙවැනි යථාර්ථයකට ඇතුලු වන්නට පාඨකයාට ඇරයුම් කෙරේ. මේ දෙවැනි යථාර්ථය වූ කලී ප්‍රබන්ධමය යථාර්ථයකි. ඒ ප්‍රබන්ධමය යථාර්ථය තථ්‍ය යථාර්ථයටත්, සාම්ප්‍රදායික යථාර්ථවාදී ප්‍රබන්ධයෙන් ගම්‍ය කෙරෙන යථාර්ථයටත් වඩා වෙනස්ය. රචකයා යට කී සිද්ධිය විස්තර කරන්නේ මෙසේය.

'' එම කාමරයෙහි සිට පුරුද්දක් නොතිබුණත් මට නිදාගත නොහැකි විය. මම ඇඳෙහි පෙරළී පෙරළී සිටි නිසා පල්ලියේ ලොකු ඔරලෝසුවේ සීනුව වදින වදින සැරේට මට ඇසිණ. කාමරයෙහි මුල්ලක වූ තෙල් පහන වෙව්ලා, විනාඩි පහකට පමණ පසු සම්පූර්ණයෙන්ම, නිවී ගියේය. මෑතකදී අපේ ගෙදර මරණ දෙකක් සිදු වී තිබුණ බැවින් පහන නිවී යාම ම'සිත ලෙහෙසියෙන්ම, අකල්‍ය සිතුවිලි ජනිත කළේය. අලුයම එකට පහන් දැල්ලට සදාතනික අන්ධකාරය තුළට මැකී යන්නට පුළුවන. මිනිසෙකුගේ ජීවිතයෙහි පුංචි ගිනි දැල්ලද යම් දවාලක හෝ රැයක නිවී ගොස් අමතක වී යන්නට පුළුවන. මා ඒ ඇට සැකිල්ල අයිතිකරුගේ ජීවිතය පිළිබඳ පරිකල්පනයේ යෙදී සිටින විට කිසිවෙකු සජීවීව බිත්තිය අද්දරින් යමින්, හඬ නගා හුස්ම ගනිමින්, මගේ මදුරු දැල වටා යනු මට වහා දැනුණේය...... මේ මගේ නිදි නැති අධික ලෙස උෂ්ණ පත් මොළය විසින් ගොතන ලද සිද්ධියක් බව මම හොඳ හැටි දැන සිටියෙමි.

මට අඩි ශබ්ද ලෙස ඇසුණේ මගේ හිසට ගසා එන රුධිරයයි.''[3]

මෙහි දී රචකයා මේ සිදු වී කථකයාගේ සිහිනයක් නොවන බව හෙළි කරනු පමණක් නොව, එය කථකයාගේ පරිකල්පනයේම කොටසක් විය හැකි බවද අඟවයි. තමාට එවැනි විකාර පරිකල්පනයන් ඇති විය හැකි බව කථකයාම දනියි. කතාවේ මුලින් සඳහන් වූ පරිදිම කථකයා වූ කලී නූතන විද්‍යාත්මක අධ්‍යාපනයක් ලද්දෙකි.

කථකයා මේ ''කට හඬ'' සමග කතා කිරීමට තීරණය කරන්නේ, ''තමාගේ පරිකල්පනය තුළින් උපන් සතෙකුට'' තමා බිය නොවිය යුතු බැවිනි.

මී ළඟට ඒ කටහඬ සිය කතාව විස්තර කරයි. එහෙත් ඇයගේ කතාව කථකයාගේම පරිකල්පනයක් ද නොවේද යන ප්‍රශ්නය පාඨකයාට වහා අමතකව යයි. තථ්‍ය යථාර්ථය සහ අස්වාභාවිකත්වය අතර බිත්තිය වහා බිඳ වැටෙයි. අලුයම හිරු එළිය කාමරයට එන විටම ඒ තැනැත්තිය (කට හඬ) පිටව යයි.

තාගෝර්ගේ ප්‍රබන්ධ කලාවේ සුවිශේෂ ලක්ෂණයක් නම් චරිතවල සිතුවිලි විස්තර කිරීමට නොයන අල්පෝක්තිය ආත්ම කොටගත් ගද්‍ය රචනා ශෛලියයි. මේ නිසා කතාව අවසන් වන විට ස්වාභාවිකත්වය හා අස්භාවිකත්වය මූට්ටු නොපෙනෙන සේ එකට පුරුද්දනු ලැබේ. එමගින් ප්‍රබන්ධ කතාවේදී පමණක් අත්දැකිය හැකි යථාර්ථයක් ඔහුගේ ප්‍රබන්ධ කතාව තුළ ගොඩ නැගේ.

කතාවෙහි අර්ථ වෙත එළඹෙන්නට ඇවැසි පාඨකයාට තම තම නැණ පමණින් අර්ථ නිෂ්පාදනාත්මක ගනුදෙනුවක කතාව සමග එළඹෙන්නට පුළුවන. උදාහරණයක් ලෙස පහන නිවී යාමත් සමග මතුව එන්නේත්, පසු දින හිරු එළිය සමග මැකී යන්නේත් කථකයාගේම අවිඥානය විය හැකිය. නැති නම් මිනිසාගේ එදිනෙදා ලෞකික පැවැත්මේදී දිනපතා භාවිත කෙරෙන යථාර්ථය පිළිබඳ තාර්කික, දින චරියාගත තර්කනය අඳුරත් සමග නිදයි. එවිට තර්කයේ බලාධිපත්‍යයට එතරම් හසු නොවන, අද්භූතයට, ඇදහිය නොහැක්කට ඉඩ ඇති දෙවැනි තර්කනයක් මතුව එයි. මෙම අවිඥානයේ තර්කනය, විඥානයේ තර්කනයට වඩා නම්‍යශීලීය;

මෙම කතාව අර්ථ කථනය කිරීමට වඩා එහි ප්‍රබන්ධ ව්‍යුහය ගොඩ නගා ඇති ප්‍රබන්ධ ශාස්ත්‍රමය නීති රීති පද්ධතිය හඳුනා ගැනීම අපගේ අරමුණ හෙයින් අපි මෙතැනින් මොහොතකට නවතිමු.

''පුංචි මහත්මයාගේ ආපසු පැමිණීම'' අවධානයට ලක් විය යුතු තවත් තාගෝර් කතාවකි.[4] රායිචරන් වූ කලී ධනවත් පවුලක සේවකයෙකි. ඔහු කුඩා කල සිටම ඒ පවුලට වැඩ කර තිබේ. එම පවුලේ පුතා වන අනුකුල් විවාහ වී පුතෙකු ලද විට රායිචරන්ගේ කාර්ය භාරය වන්නේ ඒ දරුවා බලා කියා ගැනීමයි. දරුවා ගෝකාට් එකක තබාගෙන එහෙ මෙහෙ ගෙන යාම රායිචරන්ගේ චරිතයයි. හුරතල් දරුවා මෙවැනි එළිමහනට ගිය දවසක, පද්මා ගඟේ වැටී අතුරුදහන් වෙයි. මුලු ගමම එක් වී දරුවා සෙවුවද සොයා ගත නොහැකි වෙයි. අනුකූල්ගේ බිරිඳ සිතන්නේ රායිචරන්, දරුවා පැළඳ සිටි ආභරණ ගැනීම සඳහා ඔහු පැහැර ගෙන ගිය බවයි. මේ අර්බුදයෙන් පසු රායිචරන් ආපසු සිය ගමටම යයි. ඔහුගේ මහලු වෙමින් සිටින බිරිඳ ඉන් පෙර දරුවෙකු බිහි නොකළ බිරිඳ මෙවර අනුකූල්ගේ දරුවා අතුරුදහන් වී නොබෝ කලකින්, පුතෙකු බිහි කරයි. ඒ දරු උපතත් සමගම රායිචරන්ගේ බිරිඳ මිය යයි. රායිචරන් සිතන්නේ මේ ඉපිද ඇත්තේ තමා ඉතා ආදරයෙන් රැක බලා ගත් ''පුංචි මහත්තයා'' කියාය. දරුවකු බිහිකළ නොහැකි වයසේ සිටි සිය බිරිඳට දාව ඉපදීම නිසාත්, ''පුංචි මහත්තයා'' කළ කී සියලු හුරතල් වැඩම කිරීමත් නිසා තමාගේ ආදරය ලබා ගැනීම උදෙසා පුංචි මහත්තයා යළි ඉපදී ඇති බව රායිචරන්ට සහතිකය. ඔහු පෝසත් දරුවෙකු හදන වඩන සේ සිය පුතා හදා වඩා, සිය ඉඩකඩම් විකුණා ඉන් ලද මුදලෙන් පුතා කල්කටාවට යවා උගන්වා තරුණ වයසට එළඹුණු පසු අනුකූල්ගේ පවුල වෙත ගෙන ගොස් බාර දෙයි. පුංචි මහත්තයා ගඟේ ගිලී ගියා නොව තමා විසින් පැහැරගෙන යන ලද බව රායිචරන් කියයි. රායිචරන්ගේ පුතාටද සිය පියා මතක ඇත්තේ සේවකයකු වැන්නෙකු ලෙස මිස පියෙකු ලෙස නොවේ. තමා කුඩා කල සිට හැදුණ වැඩුණේ රායිචරන් සමග බව තරුණයා කියයි. ඒ සියල්ලටමත් වඩා අනුකූල්ගේ බිරිඳ සිය අතුරුදහන් වූ දරුවා ගැන තාමත් වැළපෙන්නී, මෙම තරුණයා දුටු විගසම සිය පුතා ලෙස පිළිගෙන වැළඳ ගනියි. මේ සිද්ධියෙන් රායිචරන් අතුරුදහන් වී යයි.

මෙම කෙටිකතාවේ 'කාලය' ඉතා දිගු වුවද කතාව ඉතා කෙටිය. කතාව ඉදිරිපත් කරන්නේද ඉතා සරල, තාත්ත්වික තාගෝර්ගේ සුපුරුදු රචනා ශෛලියෙනි. එහෙත් කතාවේ ව්‍යූහය ගොඩ නැගී ඇති මූලික තර්කනය, තාත්වික හේතුඵල යථාර්ථවාදයේ මූලික තර්කනය ඉක්මවා සිටියි.

කතාවෙහි ප්‍රධානතම ඇදහිය නොහැකි සිද්ධිය වූ කලී ''පුංචි මහත්තයාගේ'' යළි ඉපදීමයි. වයසට යන රායිචරන්ගේ බිරිඳ දරුවෙකු බිහි කිරීමයි. ඉකිබිතිව පුංචි මහත්තයා කළ කී දේම ඒ දරුවා ද කිරීම, සිදුවීම් ඇදහිය නොහැකි ස්වභාවය තීව්‍ර කරයි. මේ යළි ඉපදීම තාගෝර්ගේ කෙටිකතාවේ ව්‍යූහීය සංරචනය 'තාර්කික' කිරීම උදෙසා අත්‍යවශ්‍ය වේ.

මෙම ඇදහිය නොහැකි තත්ත්වය ආශ්චර්යාත්මක යථාර්ථවාදී ප්‍රබන්ධ කතාවක තරම් අස්වාභාවික නොවුණද තාත්ත්වික යථාර්ථවාදී සම්ප්‍රදායට වඩා මඳක් එපිටින් සිටියි. තාගෝර් කර්මවාදය, පුනරුත්පත්තිය වැනි දකුණු ආසියානු සංකල්පයන් මඟින් බටහිර තාත්ත්වික යථාර්ථවාදයේ සීමා මායිම් ඈතට තෙරපන බව පෙනේ.

''එකම එක රැයක්''[5] කෙටිකතාවේදී තාගෝර් සාහිත්‍යික යථාර්ථවාදය ඉක්මවන සැටි මුල් කතා දෙකටම වඩා වෙනස්ය. උත්තම පුරුෂ දෘෂ්ටිකෝණයෙන් ලියවෙන මෙහි කථකයා සහ සුරබලා නැමති දැරිය කුඩා කල සිට එකට හැදී වැඩෙති. ඔවුහු අසල් වැසියෝය. දෙදෙනා ''මනමාලයා - මනමාලි සෙල්ලම'' පවා කරති. ඔවුන් වැඩිවිය පත් වූ පසු විවාහ කර දිය යුතු බව ඔවුන්ගේ දෙමාපියෝ කතා කරති. කථකයා, වැඩිවිය පත් වන විට ලිපිකරුවෙකු වීම සඳහා නගරයට යයි. යටත් විජිත ක්‍රමය යටතේ ආදායම් බදු රැස් කරන්නන්, ලිපිකරුවන් වැනි තනතුරු ඉහළ

රැකියා බවට ඉහළට එස වී තිබේ. උන්නතිකාමී අදහස් සහිත කථකයා ''උසස්'' රැකියාවක් සඳහා ඉගෙනීම උදෙසා මුළු තරුණ ජීවිතයම පාහේ වැය කරයි. මේ අතර සුරබලා ධනවත් නීතිඥයෙකු හා විවාහ වී පිට පලාතකට යයි. කාලය ගත වෙයි. ''ප්‍රධාන ලිපිකරු'' තනතුරක් හඹා ගිය කථකයා ඉතා තරගකාරී විභාග සමත් වීමට අසමත් වන බැවින් ඔහුට හැකි වන්නේ පාසලක සහාය ගුරු තනතුරක් ලබා ගැනීමට පමණි. කථකයා සහාය ගුරු තනතුරු ලබා යන්නේ සුරබලා සහ ඇගේ සැමියා ජීවත්වන ගමටමය. ඒ නීතිඥ - සැමියා සමග මිත්‍රත්වයක් ගොඩ නගා ගන්නා කථකයා එහි යන්නට එන්නට පටන් ගනියි. කථකයා සහ සුරබලා අතර කුඩා කල වූ මිත්‍රත්වය සැමියා නොදනියි. තරුණ බිරිඳක ලෙස වඩාත් රූමත් සුරබලා කෙරෙහි ආසාව සහ ඇය අහිමි කර ගැනීම පිළිබඳ පසු තැවිල්ල ඔහු තුළ වැඩෙයි. පාසල් ගුරු නිවාසයේ හුදකලාව වසන කථකයා තනිකමේ ශෝකයෙන් වෙලෙයි. මේ අතර දවසක නීතිඥ-සැමියා පිට පලාතක නඩුවකට යයි. එදින රැයේ නිවසේ සිටින්නේ සුරබලා පමණි. කථකයා එහි යම් දෝ නොයම් දෝ යන දෙගිඩියාවෙන් පසු වෙයි. එදින රැයේ මහා වැස්සක් වැටී ගංවතුරක් ගලයි. කථකයා යට වූ ගම්මානය මැදින්, මහ රැයේ සුරබලාගේ නිවස දෙසට යයි. ඔහු වැ කන්දක් වැනි කඳු ගැටයකට අඳුරේ ගොඩවෙද්දී ඒ කඳු ගැටයට එහා පැත්තෙන්ද කිසිවෙකු ගොඩ වෙන බව කථකයාට දැනෙයි. ඒ සුරබයා බව ඔහු සැක හැර දැන ගනී. ඇයද කථකයා වසන පාසල දෙසට එන්නට පිටත් වී ඇති බව පෙනී යයි. ඔවුහු දෙදෙනා ඒ රැය ඒ කඳු ගැටය මත එකිනෙකාට ආසන්නතයෙන් වැතිර වචනයකුදු කතා නොකර ගත කරති. පසු දින පහන් වන විට ගංවතුර බැස යයි. සුරබලා වචනයකුදු කතා නොකර ඇගේ නිවසට යයි. කථකයාද ආපසු යයි.

මෙම කතාව මුල සිට අග දක්වාම ලියැවී ඇත්තේ යථාර්ථවාදී ශෛලියෙනි. යථාර්ථවාදී සම්ප්‍රදාය ඉක්මවන කිසිදු සිද්ධියක් ද එහි නැත. එහෙත් තරුණ යුවළ හුදෙකලා රැය වචනයක් හෝ කතා නොකර ගත කිරීමේ සිද්ධිය තුළ ගුප්තාර්ථයක් ඇත. තාගෝර් එම අවස්ථාව විස්තර කරන ආකාරය කතාව යථාර්ථවාදයෙන් මඳක් එපිටට කතාව තල්ලු කරයි. මෙහිදී යථාර්ථවාදය සමතික්‍රමණය කරන අංගෝපාංග අඩංගු වන්නේ කතාවේ, ව්‍යුහය තුළ නොව එහි ශෛලිය තුළය, තාගෝර් එය විස්තර කරන සැටි මෙසේය.

''සුරබලා මා හා එක්වීම පිණිස දැන් ලෝකය අත හැර දමා ඇත. මගේ ළමා කාලයේ වූ සුරබලා යම් පෙර බවයක සිට මගේ ජීවිතය වෙත පාවී ඇවිත් තිබුණේය. ඇය යම් පුරාණ *ගුප්තාර්ථවත් අන්ධකාරයක* සිට මා හා එක්වීම පිණිස ජනයා පිරි මෙලොව සැදෑ එළිය හා හිරු එළිය වෙත ඇවිත් සිටියාය. දැන් අවුරුදු ගණනාවකට පසු, ඇය ආලෝකය සහ සෙසු ජනයා අත්හැර මා හා තනිවීම පිණිස මේ පාලු, බිය ගෙන දෙන ලෝකාන්ත *අන්ධකාරය* වෙත පැමිණ තිබේ. ළපටි මල් පොහොට්ටුවක් ලෙස, ඇය වරක් ජීවිතයේ ප්‍රවාහය දිගේ මා වෙත ආවාය; මෙවර සුපිපුණු මලක් සේ ඇය මරණයේ ප්‍රවාහය දිගේ මා වෙත පැමිණ තිබේ. තව එක දිය රැලක් ආවේ නම් අප අපගේ වෙන් වෙන් පැවැත්මේ සිහින් නටුවෙන් ගිලිහී එක පැවැත්මක් බවට පත් වන්නට ඉඩ තිබිණි. නමුත් ඒ අවසන් දිය රැල්ල නො ආ එක හොඳය. ඇය සිය සැමියා, දරුවන් සමග සතුටින් ජීවත් විය යුතුය. ඒ ලෝකාන්තයේ ඉවුරේ සිට එක් තනි රැයකදී මා දරා ඉවසූ දේත්, මා විඳි සදාතනික ප්‍රීතියත් මට ඇතිය.''[6]

සංස්කෘත තත්සම බහුල වංග බසින් මේ විස්තරය මීට වඩා ධ්වනිතාර්ථ නගන්නට ඉඩ ඇත. එහෙත් විලියම් රැඩිෂ්ගේ ඉංග්‍රීසි පරිවර්තනයෙන් පවා සමීප කියවන්නෙකුට වටහා ගත හැකි යම් **පුරාණෝක්තිමය** ස්වභාවයක් මේ විස්තරයෙහි දැකිය හැකිය. කතාව මුලදී ලෞකික,

මොලොවට අයත් යුවළක් සේ නිරූපණය වන මේ යුවළ මෙම තීරණාත්මක ගංවතුර රාත්‍රියේදී එදිනෙදා ජීවිතයේ පරිසමාවෙන් එපිටට ප්‍රසාරණය කරනු ලැබේ. නොඑසේ නම් සුවිශාල සංසාර සාගරයත්, අනන්ත සොබා දහමත් යන දැවැන්ත කලාලය මත ඉතා කුඩා ක්ෂුද්‍ර යුවළක් බවට ඔවුන් සංකෝචනය කෙරේ. කාලය වශයෙන්, ඒ එක් තනි රැය සදාතනිකත්වය මත තබා පෙන්වනු ලැබේ. අවකාශය වශයෙන් ඔවුන් දෙදෙනා හමු වූ ඒ කුඩා කඳුගැටය අපරිමිත සොබා දහම මත තබා පෙන්වනු ලැබේ. එමතු නොව ඒ ගලන මහා ගංවතුර හුදු ගංවතුරක් ලෙස නොව ලෝකොත්පාදක හෝ ලෝක නාශක ගංවතුරක් බවට විශාලනය කරනු ලැබේ. එම රූපයෙහිදී තමා ''සදාතනිකත්වය'' වෙත ළං වූ බව කථකයා කියයි.[7] යථාර්ථවාදී කෙටිකතාවේදී කාලය යනු අප දන්නා හඳුනන ඔරලෝසු-කැලැන්ඩර් කාලයයි. එහෙත් මෙහිදී එම ලෞකික කාලය සදාතනිකත්වය බවට පත් වේ. එහෙයින් යථාර්ථවාදයෙන් ඇරඹෙන කතාව අවසන් වන්නේ පුරාණෝක්තිමය යථාර්ථවාදයකිනි.

තාගෝර්ගේ කෙටිකතාවල අන්තර්ගතය වශයෙන් පවත්නා නොගැඹුරු සහ අල්ප බව ඔහු මග හැර ගන්නේ ඒ අල්ප බව හා ඒ හා බැඳුණ පලදායිකත්වය ස්වභාවධර්මය හා සදාතනිකත්වය සමග බද්ධ කරමිනි. ''තැපැල් ස්ථානාධිපති''[8] කතාව ඊට මනා නිදසුනකි.

යටත් විජිත සමයෙහි එක්තරා දුප්පත් ගමක ඉන්ඩිගෝ පැක්ටරියක බ්‍රිතාන්‍ය ජාතික කළමනාකරු ඒ ගමට තැපැල් කන්තෝරුවක් ලබා ගනියි. එම තැපැල් කන්තෝරුවට පත්වන තැපැල් ස්ථානාධිපති කල්කටාවේ උගත් තරුණයෙකි. අවිවාහක ඔහු සිය කෑම පිසීම, නෑමට වතුර පිළියෙළ කිරීම ආදී ගෙදර දොර වැඩ කටයුතු සඳහා ඒ ගමෙහි වසන අනාථ දැරියකගේ උදව් ලබා ගනියි. ඒ සඳහා ගෙවීමක් නොකෙරෙන අතර ඉතිරි වන කෑම ආදිය පමණක් ඇයට දෙනු ලැබේ. මේ අතර තැපැල් ස්ථානාධිපති රෝගී වෙයි. දැරිය පරිණත ගැහැනියක සේ, මවක සේ ඔහු රැක බලා ගනියි. රෝගය සුව වූ පසු ඔහු ඒ දුෂ්කර පළාත අත හැර ආපසු කල්කටාවට යාමට තීරණය කරයි.

ඒ අනාථ දැරිය එහි දමා යාම පිළිබඳ තැපැල් ස්ථානාධිපතිගේ හෘදය සාක්ෂිය වේදනා දෙයි. ඔහු ඇයට කියවීමට පවා උගන්වා තිබේ. ඇය රැගෙන යාමටද හැකියාවක් නැත. තැපැල් ස්ථානාධිපති ඔහුගේ ගමනට අවශ්‍ය මුදල් පමණක් ගෙන ඉතිරි මුදල් සියල්ල ඇයට දෙයි. මුදල් ප්‍රතික්ෂේප කරන ඇය හඬමින් පැන දුවයි.

මේ වූ කලී තාගෝර්ගේ පැහැදිලිවම යථාර්ථවාදී කෙටිකතාවකි. එහෙත් එහිදී පවා දෛනිකත්වය සහ ලෞකිකත්වය එක්තරා විශ්වීයත්වයක් හා සදාතනිකත්වයක් පිළිබඳ හැඟීමක් සමග මුසු කෙරේ. තැපැල් ස්ථානාධිපති රුවල් ඔරුවක නැගී නික්ම යන අවස්ථාව තාගෝර් විස්තර කරන්නේ මෙසේය.

''ඔහු ඔරුවට නැගුණු විට එහි රුවල් ඔසවා තිබුණි; ගංවතුරෙන් ඉදිමී තිබුණ ගඟෙහි වතුර පෘතුවියෙහි කඳුළු මෙන් රැළි නගන විට තැපැල් ස්ථානාධිපතිට දරුණු වේදනාවක් දැනුණේය. සරල ගැමි දැරියකගේ ශෝකී බරිත මුහුණෙහි රුව දැවැන්ත, නොකියවුණු විශ්වීය ශෝකයක් ගැන කියන්නාක් සේ විය. ආපසු යාමට තියුණු ආශාවක් ඔහුට ඇති විය. ලෝකය විසින් අත්හැර දමන ලද අර අනාථ දැරිය ගෙන ආ යුතු නොවේද ඔහු? නමුත් ඒ වන විට සුළඟ රුවල් පුරවා විසුරුවමින් තිබිණ. මහත් දිය පිරුණු ගඟ භයානක සේ ගලන්නට විය; ගම්මානය පසුකර අවසන්ය; ගඟ අද්දර සොහොන් බිම දර්ශනය විය. ගඟ තරඟ විසින් නොඇලුණු සිත් ඇති

කරන ලද ඔහු ජීවිතයේදී වෙන්වීම් මරණ ආදිය බොහෝ ගණනක් ඇති බව දාර්ශනිකව සිහි කළේය. මේලොව කවුරු කාට නම් අයිති වේ ද?''[9]

මෙම දර්ශනය තුළදී තාගෝර් විස්තර කරන්නේ දූරිය ගම තුළ දමා යාම පිළිබඳ සිය හෘද සාක්ෂියේ චෝදනාව මග හැර ගැනීමට තැපැල් ස්ථානාධිපති තැත් කරන සැටිය. තැපැල් ස්ථානාධිපති වූ කලි ගමෙහි වාසය දුෂ්කර යැයි සලකන නූතන අධ්‍යාපනයක් ලද්දෙකි. එහෙත් දූරිය අතහැරයාම පිළිබඳ තාගෝර් තැපැල් ස්ථානාධිපතිට පමණක් චෝදනා නොකරයි. විවේචනාත්මක යථාර්ථවාදියෙක් හෝ සමාජවාදී යථාර්ථවාදියෙක් නම් මේ අවස්ථාවේදී ගම සහ නගරය, සාම්ප්‍රදාය සහ නූතනත්වය සහ පන්ති ක්‍රමය ආදී ලෞකික සංසිද්ධීන්ගේ ක්‍රියාකාරිත්වය හෙළි දරව් කර නවතියි. තාගෝර් පියවරක් ඉන් එහාට යයි. ඔහු ජීවිතය සහ මරණය; එක්වීම සහ වෙන්වීම ආදිය පිළිබඳ දාර්ශනික චින්තාවක්ද මතු වන ලෙස සිය සංකල්ප රූප පද්ධතිය පෙළ ගස්වයි. ගඟෙහි සුළඟට හා දිය පාරෙහි වේගයට හසු වූ තැපැල් ස්ථානාධිපති සංසාරයෙහි හා ස්වභාවයෙහි ප්‍රවාහයට හසු වූ තනි හුදෙකලා මිනිසෙකු සේ අපට මොහොතකට පෙනෙයි. පෘථිවියෙහි වසන දහසක් මිනිසුන්ගේ ශෝකය, දුක්ඛය හා දෝමනස්සය අතර අනාථ දූරියගේ කඳුළු පිරි මුහුණ එක් පුංචි ජීවිත තිතක් බවට පත් වේ.

තාගෝර් මෙම කතාවෙන් කරන්නේ ජීවිතය පිළිබඳ දෛවවාදී, විඥානවාදී විග්‍රහයක් යැයි යථාර්ථවාදී සම්ප්‍රදායේ සාහිත්‍ය මඟින් සාහිත්‍ය කියවීම පුහුණු වූ විචාරකයෙකුට පෙනෙන්නට පුළුවන. ජීවිතය හෝ සමාජය පිළිබඳ එක් තනි විග්‍රහයක් සැපයීමේ යථාර්ථවාදී අවශ්‍යතාවෙන් තාගෝර් මුළුමනින්ම මිදී ගනියි. ඒ වෙනුවට ඔහු විටෙක ලෞකිකත්, විටෙක පාර ලෞකිකත් වන බහු විධ අරුත් නිපදවන සාහිත්‍ය පඨිතයක් නිපදවයි.

''ක්ෂුදා හරිත පාෂාණ''[10] තාගෝර්ගේ අසහාය ගද්‍ය රචනා කෞශල්‍යයටත්, යථාර්ථවාදය හැම්මීමට ලක් කරන කතා නිපදවීමට ඔහුට වූ හැකියාවටත් දෙස් දෙයි. මුල මැද අග සහිත නාටකීය සිද්ධිවලින් යුත් කතාවක් මෙහි නැත. එහි මූලික සිදුධිය වූකලී එක්තරා පැරණි මැලිගාවක් ඇතුළතදී පුද්ගලයෙකු අත් දුටු අධිස්වභාවික සිද්ධි දාමයකි. එහි සාරාංශය මෙයයි. එක්තරා බෙංගාලි මධ්‍යම පාන්තික උගතෙක් සිය තරුණ වියේදී ආදායම් බදු රැස් කරන්නෙකු ලෙස පිටිසර ගමකට යයි. එම ගමෙහි අවුරුදු දෙසිය පනහකට පෙර මුස්ලිම් රජ කෙනෙකු විසින් කරවන ලද මාලිගයක් වෙයි. කඳු වැටි අතරින් සර්පයෙකු සේ ගලා යන ගංගාවකින් යුත් ''ප්‍රේමාන්විත'' ප්‍රදේශයක් වූ එහි මේ මාළිගය ගොඩනගනු ලැබ ඇත්තේ රජවරුන්ගේ කායික ප්‍රමෝදය උදෙසාය. අවුරුදු දෙසිය පනහකට පෙර ඒ මාළිගයේ වූ නාන පොකුණ අසබඩ කිරිගරුඬ මත පර්සියාවෙන් ගෙන්වන ලද තරුණ සුරූපිණියෝ නිරුවතින් හිඳ සිටියහ. නාන පොකුණ රෝසමල් සුවඳ ගන්වා තිබිණි. සිතාර් උකුලේ තබාගත් සුරූපිණියෝ ගසාල් ගී ගැයූහ. දැන් මේ කිසිවක් නැති මාළිගය ගරා නොවැටී තවමත් එලෙසම තිබේ. තරුණ ආදායම් බදු නිලධාරියා මෙහි නවාතැන් ගනියි. දවසක සැඳෑ කල මාළිගයේ සිට ගංගාව වෙත යන පඩි පෙළෙහි ඔහු හිඳ සිටින අතර ''පිරිසක්'' පඩි පෙළ දිග ගඟට යන'' පා හඬ ඔහුට ඇසෙයි. කිසිවෙක් පෙනෙන්නට නැත. ඔවුන්ට ඔහුද ඔහුට ඔවුන්ද නොපෙනේ. තව දවසක අදිසි කිසිවෙක් ඔහුව මාළිගයේ කාමර වෙත ''තල්ලු කරන්නාක්'' මෙන් මෙහෙයවයි. මේ මග පෙන්වන්නිය ඔහුට නොපෙනුණද ඇය අරාබි ජාතික කාන්තාවක බව ඔහුට සහතිකය. එය අරාබි නිසොල්ලාසයේ ''හෙවත්'' එක්දහස් එක් රැයේ රාත්‍රියක් ලෙස ඔහුට දැනේ. තවත් විචිත්‍ර දේ ඔහු ඒ මාළිගාවේදී දකියි. තවත් රැයක ඔහු නිදා සිටින විට ඔහුගේ ඇඳ යට ගල් ගෙබිම තුළින් ''මාව නිදහස් කරන්නැ''යි කිසිවෙක් කෑ ගසයි. වඩාත් මවිතකර සිදුවීම නම් ඒ මාළිගාව

අසල වසන පිස්සෙක් කථකයා දකින රූප ගැන දන සිටීමයි. ඔහු ''ඔය පේන සේරම බොරු'' යයි මහා හඬින් කෑ ගසයි. කථකයා පමණක් නොව තවත් මිනිසෙකු ඒ රූපාවලිය දැක ඇති බව පාඨකයාට ඇඟී යයි. එනම් මාලිගාව ඇතුළතදී කථකයාට ඇසෙන පෙනෙන දේ කථකයාගේ මනෝ විකාර නොවන බව පාඨකයාට දැනේ. ඒ ශබ්ද සහ රූපවලටද එක්තරා **පැවැත්මක්** ඇත. ඒ බව තුන්වැරන්නෙක්ද දනියි. ඒ තුන් වැන්නා නම් කථකයාගේ කාර්යාලයේ මහලු ලිපිකරුය. තමා දකින අසන රූපාවලියේ තේරුම කුමක් දැයි කථකයා එම ලිපිකරුගෙන් අසන ලදුව ඔහු කියන්නේ, එක්තරා කාලයකදී අතෘප්ත ආසාවන්ගෙන් අලලන ලද නිසා ඒ රාගාශාවන්ගෙන්, නිස්සාර ආශාවන්ගෙන් ශාප කරනු ලැබ ඇති ඒ මාලිගයේ ගල් පිපාසිතව ඒ අසලට එන සෑම කෙනෙකුගේම ආත්මය කා දමන බවයි. අර මාලිගාව අසල වනස පිස්සා එසේ මාළිගාවේ ගල් අවතාර විසින් බාදනය කරන ලද ආත්මය ඇත්තෙකි. දැන් තමාට ඒ ශාපයෙන් ගැලවීමට මගක් ඇත් දැයි කථකයා මහලු ලිපිකරුගෙන් අසයි. එකම එක් මගක් ඇති බව මහල්ලා කියයි. එය හෙළිවීමට පෙර කතාව අවසන් වේ.[11]

මෙම මූලික කතාව අසුරා ඇත්තේ වෙනත් බාහිර රාමුවකය. මෙම කතාව අසුරා ඇත්තේ වෙනත් බාහිර රාමුවකය. මෙම කතාව එහි කථකයා විසින් එක්තරා ආගමික නිවාඩු දවසක ගමනක් ගොස් දුම්රියෙන් එන අතර තරුණයන් දෙදෙනෙකුට කියනු ලැබේ. ඒ බාහිර රාමුව ඉතා සංක්ෂිප්තය. එහි කථකයාද කතාව කියන්නේ උත්තම පුරුෂයෙනි. එම කථකයා කතාව ආරම්භ කරන්නේ මා සහ පරම විඥානාර්ථවාදී නෑදෑයෙකු සමග ගමනක් එන අතර අපට ඒ මිනිසා මුණ ගැසිණි. ඉතා උගත්, චතුර 'ඒ මිනිසා' යට සාරාංශ කර දක්වන ලද අභ්‍යන්තර කතාව කියයි.

මෙම කතාවේ ඇතැම් අංග යථාර්ථවාදී සම්ප්‍රදාය ඉක්මවන බව ඉතා පැහැදිලිය. එහිලා තාගෝර් උපයෝගී කර ගන්නේ දකුණු ආසියානු ජනශ්‍රැතියෙහි හා ආගමික සම්ප්‍රදායන්ගේ නිතර හමුවන ප්‍රේතයන් පිළිබඳ විශ්වාස සහ ඒ ආශ්‍රිත සංකල්ප රූපයන්ය.[12] එපමණක් නොව, ප්‍රේතාත්ම පිළිබඳ මූලික සංකල්පය සාහිත්‍යික සංකල්පරූපයක් බවට පත් කිරීමටත්, එම සංකල්පරූපය මෙම කෙටිකතාවෙහි ව්‍යුහය ගොඩනගන පදනම ලෙස යොදා ගැනීමටත් තාගෝර් ඉතිහාසය සහ සම්භාව්‍ය සාහිත්‍ය වෙතින් ගත් සංකල්ප රූප භාවිතයට ගනියි. දෙවැනිව කතාවෙහි අධි-ස්වභාවික සිද්ධි දාමය සිදුවන අවකාශය හෙවත් මාලිගය පිහිටා ඇත්තේ ගුප්ත පරිසරයකය. ඒ පරිසරය වූ කලි තර්කයේ සහ නූතනත්වයේ නගරය නොවේ. තර්කය සහ අතර්කය එකට පවතින ආදිකල්පික ස්වභාවය දරණ පරිසරයකි. ඒ තුන්වැනිව කාමර බොහෝ ගණනකින් හා අඳුරු පදික වේදිකාවන්ගෙන් යුත් ඒ මාලිගා සංකීර්ණය වූ කලි ඉතිහාසයේ සහ සංස්කෘතියේ පාරම්පරික සංකල්පරූප, මතකයන් සහ අවශේෂයන් ගබඩා කරන ලද සාමූහික අවිඥානයේ සංකේතයක් වැනිය.

තාගෝර් ඉතිහාසය සහ සම්භාව්‍ය සාහිත්‍යය සිය කතාවේ අධි-තාත්විකත්වය ගොඩ නැගීම උදෙසා සිය සාහිත්‍ය පඨිතය මත එකට මුසු කරයි. දෙවැනි ෂා මහ්මුඩ් රජු මේ මාළිගය ගොඩ නගන ලද බව තාගෝර් ඉන්දීය ඉතිහාසයෙන් ගනියි. එය ඉතිහාසයෙන් ගත්තේ යැයි කියද්දී එය සැබෑ ඓතිහාසික සිද්ධියක්ම විය යුතු යැයි මම අදහස් නොකරමි. ඉතිහාස සිද්ධියක ස්වරූපය ගත් කාල්පනික ඉතිහාස සංසිද්ධියක්ද මෙසේ භාවිතා කළ හැකිය.

මීළඟට මුස්ලිම් රජෙකු විසින් කරන ලද මෙම මාලිගයෙන් ඇසෙන සංගීතය, ඉන් නැගෙන සුවඳ, එහි ගැයෙන කාව්‍ය (ගසාල් ආදිය) ඉන්දියාවේ මුස්ලිම් ඉතිහාසය හෙවත් මූගල් අධිරාජ්‍ය අවදිය සිහි ගන්වයි.[13]

මේ විචිත මාලිගයේ සිදුවන අස්වාභාවික සිදුවීම් මාලාව පිළිබඳ තාගෝර් භාවිත කරන්නේ[6] එක් දහස් එක් රැය (Arabian Nights) බඳු කෘතිවල පැනෙන සංකල්පරූප පද්ධතීන්ය. කථකයා අඳුරු කාමරය වෙත මෙහෙය වන අදිසි ගැහැනිය තාගෝර් විස්තර කරන්නේ මෙසේය.

''මට මගේ අදිසි මග පෙන්වන්නිය මගේ දෑසින් දැකිය නොහැකි වුවද, ඇය පිළිබඳ සංකල්පරූපයක් මගේ සිතේ තිබුණේය. ඇය වූ කලි අරාබි ජාතික ගැහැනියකි. ඇගේ කිරි ගරුඬ සුදු පාටින් යුතු අත්, තට්ටු ගණනකින් යුත් ගවුම් අත අස්සෙන් එළියට පැමිණ තිබිණි. එවා සුමට දැඩි අත්ය. සුදු වේලයෙක් ඇගේ හිස පලඳනාවෙන් පහළට වැටිණ. වක ගැසුණ පිහියක් ඇගේ ඉණේ රැඳී තිබිණි. එය 'එක් දහස් එක් රැයෙන්' එක් රැයක් පාවී ආවාක් සේ විය.[14]

'එක් දහස් එක් රැය' වූකලි 19 වන සියවස වන විට මුළුමනින්ම පාහේ දකුණු ආසියානු සංස්කෘතිය තුළටත් සාහිත්‍ය ඉතිහාසය තුළටත් අවශෝෂණය කර ගැනුණ කෘතියකි. මූගල් යුගයේ මුස්ලිම් කාම සුඛ මාළිගයක සිද්ධි පිළිබඳ සංකල්ප රූප නිපදවීම සඳහා තාගෝර් එම කෘතියේ පැනෙන සංකල්ප රූප භාවිත කරනු මතු නොව ඒ කෘතියේ නමම පවා ශක්ති සම්පන්න සංඥාවක් සේ භාවිත කරයි. තවත් තැනකදී තාගෝර් සම්භාව්‍ය සාහිත්‍ය පාඨක මනස තුළ ගොඩ නගා ඇති සංකල්ප රූපයක් අවදි කිරීම උදෙසා, ඒ මාළිගයේ සිදු වූ විසිතුරු සිදුවීම ආශ්චර්යවත් කතන්දර පොතකින් පිටු ගැල වී පැමිණ මාළිගයේ විවිධ කාමරවල රැඳුණාක් සේ වී යැයි කියයි.[15] මේ වූ කලි අසිරිමත් සංකල්ප රූපයකි.

ඊ ළඟට මේ ආශ්චර්යවත් සිදුවීම් සිදු වන මාලිගය පිහිටා ඇති පරිසරයෙහි ගුප්ත භාවය එතැන සිදුවන සිද්ධීන්හි අධිස්වාභාවිකත්වය තීව්‍ර කිරීම උදෙසා යොදා ගනියි.

''ඒ ගිම්හානයේ ආරම්භය විය.... (මම මාලිගයෙන්) යන පඩි පෙළ කෙළවර ගඟ අයිනේ සැප පුටුවක, හිරු බැස යාමට මොහොතකට පෙර හිඳ සිටියෙමි. ශුස්තා ගඟ කෙට්ටු වී තිබිණ. එහි නොයෙක් වැලි කඳු සැදෑ හිරු එළියේ, එහා පැත්තෙන් රතුපාටින් පෙනිණ. මා අසල පැහැදිලි නොගැඹුරු වතුරෙහි කුඩා ගල් කැට දිලිසිණි. හුස්ම ගන්නා තරම් සුළඟක්වත් එහි නොවිණ. කැලෑ බැසිල්, මිංචි, අසමෝදගම් සුවඳ ගඟ බඩ කඳු දෙසින් පැමිණ වායුගෝලය පීඩාකාරී බවට පත් කළේය.''[16]

මුලින්ම කථකයාට අධි-ස්වාභාවික හඬද ඇසෙන අවස්ථාව එන්නේ මෙම පරිසර වර්ණනාවට අමතරවය. තාගෝර් ඒ අවස්ථාව ගොඩ නගන්නේ මෙසේය.

''පර්වත කූට පිටු පසින් හිරු බැස ගිය පසු දවසේ නාටකය හදිසියෙන් අවසන් කරමින් වැටෙන තිරයක් සේ දීර්ග හෙවනැල්ලක් පතිත විය. කඳු අතර මැද ඒ විවරයෙහි ගොම්මන් වෙලාව යැයි කියා දෙයක් නොතිබිණ. එනම් අඳුර හා ආලෝකය මිශ්‍ර වීමක් සිදු නොවිණ. මා අශ්වයා පිට නැග පිටත්ව යාමට සූදානම් වෙන විටම මට පඩි පෙළ දිගට පා හඬවල් ඇසිණ. මා ආපසු හැරී බැලූ නමුත් එහි කිසිවෙක් නොවූහ.[17]

මේ ලිපියේ මූලික තර්කයට නිදසුන් ලෙස යොදා ගත හැකි කෙටිකතා තවත් රැසක් ඇත. ඒ සියල්ල සාරාංශ කිරීමට මෙහි අවකාශ නැත. අනෙක, මෙහි අරමුණ තාගෝර්ගේ කෙටිකතා කලාව වර්තමාන සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයේ පශ්චාත්-යථාර්ථවාදී ආඛ්‍යාන මාර්ග පිළිබඳ කතිකාව වෙත යොදා ගන්නේ කෙසේද යන්න සලකා බැලීම මිස

තාගෝර්ගේ කෙටිකතා කලාව සමස්තයක් වශයෙන් අගය කිරීම නොවේ. එහිලා මම පොහොසත්ද නොවෙමි.[18] එහෙයින් මෙතෙක් සඳහන් කළ කතා කිහිපයෙහි හමුවන ආකාරයට තාගෝර් තාත්ත්විකවාදී යථාර්ථවාදයේ ඇතැම් සීමා සමතික්‍රමණය කරන්නේ කෙසේද යන්න සංක්ෂිප්තව සමාලෝචනය කරමු.

කාව්‍යාත්මක වංග බසින් ලියවුණද[19] බෙංගාලි ජන ජීවිතය පිළිබඳ සමාජ ලේඛන ලෙස තාගෝර්ගේ කතා ඉතා යථාර්ථවාදී බව කිවයුතු නැත. ගම සහ නගරය අතර පරතරය, කුලභේදය, නූතනත්වය සහ සම්ප්‍රදාය අතර ගැටුම, යටත් විජිතවාදය සහ ස්වදේශීයත්වය අතර පීඩාකාරී සබඳකම යනාදිය තාගෝර්ගේ කතා මාලාව තුළ අඩංගු වේ. එසේ වෙතත් ඔහු මේ ඉන්දීය යථාර්ථය සාහිත්‍ය ගත කරන්නේ ස්වාභාවිකවාදී යථාර්ථවාදියෙකු ලෙස නොවේ. ස්වාභාවිකවාදී යථාර්ථවාදියා ස්වභාවය ධර්මය හැකිතාක් වාස්තවිකව විස්තර කිරීමට ප්‍රයත්න දරයි. ඔහුගේ හෝ ඇයගේ විස්තර වර්ණනා විද්‍යාත්මක නිවැරදිතාවයකින් යුක්තය; සවිස්තරය[20] තාගෝර්ගේ කෙටිකතා තුළ කිසිවෙක් මෙවැනි ස්වභාවික යථාර්ථවාදී ලක්ෂණ සොයන්නේ නම් ඔහු හෝ ඇය දුර්මුඛ කරනු ලබන්නට ඉඩ ඇත. විලියම් රැඩිස් තාගෝර්ගේ සුවිශේෂ යථාර්ථවාදය විස්තර කරමින් අගනා ප්‍රකාශයක් කරයි. ''ස්වාභාවිකවාදී අංග තාගෝර්ගේ කතා තුළ ඇත්දැයි බැලීම ඔහුගේ යථාර්ථවාදයේ හදවත වෙත අප ගෙන නොයයි. ඔහුගේ යථාර්ථවාදය අවශ්‍යයෙන්ම **හැඟීම පිළිබඳ යථාර්ථවාදයකි.**'' රැඩිස්ගේ මතයේ හැටියට මේ සුවිශේෂ යථාර්ථවාදය තමා විසින් අත්පත් කර ගන්නා ලද ජයග්‍රහණයකියි තාගෝර් විශ්වාස කළේය.[21]

මේ සුවිශේෂි යථාර්ථවාදී ප්‍රභේදය වූ කලී බෙංගාලි සමාජයේ විවිධ සාමාජික අසාධාරණයන්, මහජන දුක්ඛ දෝමනස්සයන් හොඳින් දන හැඳින නිපදවන ලද්දකි. ඉඩම් හිමියෙකු ලෙස බෙංගාලි ගම්බද ප්‍රදේශයක ජීවත් වන අතර ඔහු ගැමි ජන ජීවිතය හොඳින් නිරීක්ෂණය කළ බව තාගෝර්ම කිහිප වරක් කියා ඇත.[22] එහෙත් ඔහු ඔහුටම ආවේනික යථාර්ථවාදයක් නිපදවා ගන්නේ ඒ දෛනික, සාමාජික සහ මතුපිට යථාර්ථය නිරීක්ෂණයෙන් පමණක් නොවේ.

තාගෝර් සිය නිර්මාණ මගින් **පරමෝත්කෘෂ්ට ප්‍රකෘතිය** කරා ළං වීමට තැත් කරයි. මේ වූකලී ශතවර්ෂාධික කාලයක් සිට ඉන්දියානුවන් විසින් ළං වීමට සහ විස්තර කිරීමට යත්න දරන ලද තත්ත්වයකියි විලියම් රැඩිස් ප්‍රකාශ කරයි.

''උපනිශද් ලියූ මුනිවරු ඔවුන්ගේ හුදෙකලා වනගත ආශ්‍රමවල සිට මිනිස් සංසාරික පැවැත්ම පිටුපස පරමෝත්තම ජගද්විෂයී බලයක්, ඉන්ද්‍රිය සංජානනය පිළිබඳ මායාවක්, වෛදික සහ හින්දු දෙවිවරුන්ගේ ස්වර්ග ලෝකයක් තිබිය යුතු බව වටහා ගත්හ. තාගෝර්ගේ ආධ්‍යාත්ම ප්‍රෝත්සාහයන් පැවත එන්නේද ඒ මුනිවරයන්ගෙනි. ඉතා ඉහළ තලයන්හිදී මනුෂ්‍ය විඥානය මෙම පරමෝත්කෘෂ්ට ප්‍රකෘතියෙන් සෑදී ඇති බව තාගෝර් ඇත්ත වශයෙන්ම විශ්වාස කළේය.[23]

මෙම ප්‍රකෘතිය මුහුණුවර දෙකකින් ස්වාභාවික ලෝකය මත ප්‍රකාශයට පත් වෙන බව තාගෝර් විශ්වාස කළේය. ඉන් එකක් අතිශය සාරවත්ය; සෑම කල්හිම වෙනස් වෙමින් පවතී; බලසම්පන්නය. භයානකය; තේජස්වීය. ප්‍රකෘතියේ මෙම මුහුණුවර සොබා දහම නිර්මාණාත්මක වෛපුල්‍ය වෙතත් මිනිස් ජීවිතයේ අනන්ත සංකීර්ණත්වය වෙතත් ප්‍රකට වෙයි. අනෙක් අතට ප්‍රකෘතියේ දෙවැනි මුහුණුවර නිහඬය; ශාන්තය, සරලය; ප්‍රකෘතියේ මේ මුහුණුවර දෙකම සිය නිර්මාණ මගින් ප්‍රතිනිර්මාණය කරමින්, සිය නිර්මාණවල ලෞකික වස්තු විෂය සමතික්‍රමණය කිරීමට තාගෝර් උත්සාහ දැරීය.[24] ජීවිතයෙහි සාමාන්‍ය සහ එදිනෙදා සුඛ දුක්ඛයන් සේම මෙම

**පරමාදර්ශී ප්‍රකෘතියද** යථාර්ථයේම අංගයන් ලෙස තාගෝර් විසින් සලකනු ලැබිණ.

''පුංචි මහත්තයාගේ ආපසු පැමිණීම'', කතාවේ පද්මා ගංගාවත්, ''ක්ෂුදා හරිත පාෂාණ'' කතාවේ කඳු වැටි පෙළ සහ ගංගාවත්, ''එකම එක රැයක්'' කතාවේ මහා වර්සාව සහ ගංවතුරත් අර පරමෝත්කෘෂ්ට ප්‍රකෘතියේ බලසම්පන්න සහ භයානක මුහුණුවර ප්‍රකට වෙන අවස්ථා ලෙස තාගෝර් ස්වභාවිකවාදී යථාර්ථවාදයෙන් ඉහළට ඔසවයි. ''එකම එක රැයක්'' කතාවේ කථකයා ඔහු විවාහ විය යුතුව තිබුණු ගැහැනිය හා එක් ගංවතුර රාත්‍රියකදී එක්වීම ප්‍රකෘතියේ අඩවිය වැනිය. ''ක්ෂුදා හරිත පාෂාණ'' කතාවේ මාලිගය පිහිටි පරිසරය තාගෝර් විස්තර කරන්නේ ප්‍රකෘතිය වැඩ වසන තැනක් විස්තර කරන්නාක් මෙනි.

තාගෝර් කෙටිකතාවල පරිසරය සහ පසුබිම වර්ණනා මේ නිසා අරමුණු දෙකක් උදෙසා රචිතය. එකක් නම් පාඨකයාට යථාර්ථය පිළිබඳ තාත්ත්විකවාදී හැඟීමක් දීමය. දෙවැන්න කතාව ඒ තාත්විකවාදීත්වයෙන් ඉහළට ඔසවා 'ප්‍රකෘතිය' සමග සම්බන්ධ කිරීමය. මේ වූකලී තාගෝර් කලා ජීවිතයේ පරමාර්ථයක් බව ඔහුගේ කාව්‍ය, කෙටිකතා, නවකතා ආදී සාහිත්‍ය මාධ්‍යයන්හි පමණක් නොව ඔහුගේ චිත්‍ර කලාවෙන් පවා පෙනේ.[25] ඉතා මෑතකදී පළ කරන ලද තාගෝර් සිත්තම් එකතුවක අවසන් චිත්‍රය, ම'සිත සසල කරයි.[26] තාගෝර් සිය මරණයට (1941) වසර හතරකට පෙරදී අඳින ලද මෙම සිත්තමේ පලා පැහැයත්, පොළෝ පැහැයත් සුසංයෝගව හිඳී. සිත්තමේ හරි මැද සිත්තරාගේම මුහුණට සමාන මිනිස් මුහුණක ඡායාවක් ඇත. සාරවත් පසෙහි පැහැයට සමාන ඒ මුහුණ ගලායන ගංගාවක් සේ පලා පැහැය අතරින් ගලා යයි. මිනිස් මුහුණෙහි නළලතහි දීප්තියක් ඇත. මෙය සමස්ත තාගෝර් කලාවේ සංකේතයක් ලෙස මේ සිත්තම සැලකීමේ වරදක් නැත.

තාත්විකවාදී යථාර්ථවාදයන්ට එරෙහි නූතනවාදයන් යුරෝපයේ මතුවීමට අඩු තරමින් දශක තුනකට වත් පෙර සාහිත්‍යික යථාර්ථවාදයේ සීමා ගැන තාගෝර් ඉතාමත් සවිඥානකව සිට ඇති බවට බොහෝ සාක්ෂි තිබේ. මෙම සාහිත්‍ය විෂයක දාර්ශනික ආස්ථානයට ඔහු එළඹ ඇත්තේ භාරතීය සම්භාව්‍ය සාහිත්‍යයත්, උපනිෂද් දර්ශනයත් ඔස්සේය. බටහිර රොමැන්ටික් සාහිත්‍ය සම්ප්‍රදායත් තාගෝර් සමීපව ඇසුරු කළේය.[27] යථාර්ථවාදය සාහිත්‍ය ප්‍රතිනිර්මාණ විධියක් ලෙස සාවධානව සහ ගැඹුරට සලකා බලා දේශීය දාර්ශනික පද්ධතීන් වෙතට එය උරා ගැනීම තාගෝර් අතින් සිදු වී ඇති වැදගත් සේවයකි. එය දකුණු ඉන්දියානු සාහිත්‍ය ඉතිහාසය දෙස පශ්චාත්-යථාර්ථවාදී යුගයේ සිට ආපසු හැරී බලන විට වඩාත් හොඳින් පෙනේ.

දීපේෂ් චක්‍රබර්ති තාගෝර්ගේ යථාර්ථවාදය අරභයා කරන සාකච්ඡාවක් අපගේ තේමාවට ගැලපෙන පරිදි අදාළ කර ගනිමු. චක්‍රබර්ති යනු ශ්‍රමය, රජය, ප්‍රජාතන්ත්‍රවාදය, නූතනත්වය ආදී දේශපාලන සහ සංස්කෘතික නූතනත්වයට අයිති සංකල්පවලට ඉන්දියානු වූ අර්ථයක් ඇද්දැයි සලකා බැලීමට ප්‍රංශසනීය උත්සාහයක් ගත් ඉතිහාසඥයෙකි. ඔහුගේ, අප ඉහත උපුටා දැක්වූ **යුරෝපය ප්‍රාදේශීයකරණය** කිරීම යන අගනා කෘතියේ පරිච්ඡේදයක් ජනතාවක් තමන් වෙනම ජාතියක් ලෙස පරිකල්පනය කරන්නේ කෙසේද යන්න සාකච්ඡා කිරීමට වෙන් කරයි. ''පරිකල්පනය'' යන සංකල්පය ඉන්දියානු ජාතිකවාදයන් තුළ භාවිත වෙන විශේෂ ආකාරය සාකච්ඡා කිරීම උදෙසා ඔහු තාගෝර්ගේ සාහිත්‍යයෙන් එක් අංශයක් යොදා ගනියි. එහෙත් එම සාකච්ඡාව තුළ සාහිත්‍ය යථාර්ථවාදය පිළිබඳ කෙරෙමින් තිබෙන කතිකාව උදෙසා උකහා ගත හැකි අදහස් රාශියක් තිබේ.

ස්වාමි විවේකානන්දගේ බැතිමතියක ලෙස අයර්ලන්තයේ සිට ඉන්දියාවට ආ මාගරට් නෝබල් ''නිවේදිතා සහෝදරිය'' ලෙසින් ඉන්දියානු වී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය යටතේ පීඩාවට ලත් දුගී දුප්පත් ඉන්දියානුවන්ට සේවය කළාය. 1911 දී නිවේදිතා සහෝදරියගේ අවමගුලේදී කතාවක් පැවැත්වූ තාගෝර් සුදු ගැහැනියක වූ නිවේදිතාට ඉන්දියාවට පෙම් කළ හැකි වූයේ ඇය **යථාර්ථයේ කඩතුරාව** ඉරා ඉන්දියාව දෙස බැලීමට හැකි වූ නිසා යැයි කීවේය. මෙහි අදහස වූයේ දුගී දුප්පත් කමින්, අසම්පූර්ණකමින් පිරුණු ඉන්දියාව දෙස යථාර්ථවාදී බැල්මක් හෙලූ විට එය පෙනෙන්නනේ ආදරය කළ හැකි දේශයක් ලෙස නොවන බවය. ඉන්දියාවේ ආදරණීය අංශ දකීමට නම් වාස්තවිකත්වයත්, යථාර්ථයත් ඉක්මවා දකිය යුතුය යන්න තාගෝර්ගේ අදහස විය.[28] මේ වූ කලි යථාර්ථයත්, වාස්තවිකත්වයත් ගැන පමණක් නොව කලාකරුවෙකුගේ දෘෂ්ටිය පිළිබඳවත් අද්විතීය ආස්ථානයකි. අප කලින් විස්තර කළ පරිදි හුදු ස්වාභාවිකවාදී යථාර්ථවාදය ඉක්මවා යාමට තාගෝර්ට හැකි වීමේ රහස ඇත්තේ මෙම දාර්ශනික ආස්ථානයෙහිය.

තාගෝර් ''යථාර්ථයේ කඩතුරාව විනිවිද බැලීම'' යන්නෙන් අදහස් කළේ කුමක්ද? ඔහු එය විස්තර කළේ දෛනිකත්වයේ කඩතුරාව විනිවිද සදාතනිකත්වය දකීම ලෙසටයි.[29] චක්‍රබර්ති සඳහන් කරන හැටියට තාගෝර්ගේ සාහිත්‍ය, විශේෂයෙන්, ඔහුගේ කවිය සහ ඔහුගේම නව මාධ්‍යයක් වූ ගද්‍යමය-පද්‍ය[30] මෙසේ එදිනෙදා ජීවිතයේ වාස්තවික යථාර්ථය විනිවිද සදාතනිකත්වය දකින්නට ආයාස දරයි. තාගෝර්ගේ කෙටිකතා පිළිබඳ චක්‍රබර්තිගේ කියවීම සහ මගේ කියවීම තරමක් වෙනස් වන්නේ මෙහිදීය. තාගෝර්ගේ ගද්‍ය ප්‍රබන්ධ යථාර්ථවාදීව ඉන්දියානු ගම ප්‍රතිනිර්මාණය කරන ලද අතර ඔහුගේ කවිය සහ ගද්‍යමය-පද්‍ය යථාර්ථයේ කඩතුරාව ඉරා ඉන් එපිට බලන්නට තැත් කළ බව චක්‍රබර්තිගේ අදහසයි.[31] මෙය ඔහු ඉතිහාසඥයකු මිස සාහිත්‍ය න්‍යායධරයෙකු නොවීම නිසා සිදු වූ මග හැරීමකි. නොඑසේ නම් චක්‍රබර්ති වූකලී සාහිත්‍ය කලාවන් මගින් ඉතිහාසය හැදෑරීම උදෙසා ලබා ගත හැකි අන්තර්දෘෂ්ටීන් කෙරෙහි අතිශය සංවේදී විද්‍යාර්ථියෙකි. ඔහු එම නිගමනයට බසිද්දී ඔහුගේ අවධානයට වඩාත් ලක්වන්නේ බෙංගාලි සාහිත්‍ය යථාර්ථවාදයේ ඉතිහාසය මිස තාගෝර්ගේ කෙටිකතා කලාව නොවේ. බෙංගාලි ගම්බද ජන ජීවිතයේ සමාජයීය යථාර්ථය (දුප්පත්කම, නූගත්කම, පන්ති භේදය, කුලභේදය, ස්ත්‍රී පීඩනය, දෑවැදි ප්‍රශ්න) තාගෝර්ගේ කෙටිකතාවට විෂය වී ඇති බව සැබෑය.[32] එහෙත් මෙම පරිච්ඡේදය මුලින් පෙන්වා දෙන ලද පරිදි ඉතාම යථාර්ථවාදී කතා පවා ඇතැම් අවස්ථාවලදී පරමෝත්කෘෂ්ට ප්‍රකෘතිය හා සදාතනිකත්වය වෙත ළංවීමට ප්‍රයත්න දරයි. එම නිසා තාගෝර්ගේ කෙටිකතා, යථාර්ථවාදී වස්තු විෂයයන් ඒවාහි තිබුණද, සැබෑ යථාර්ථවාදී කතා ලෙස පිළිගනු ලැබී නැත.[33] එහෙයින් සාහිත්‍ය කියවීම පිළිබඳ පුහුණුවක් හා සාහිත්‍ය රසිකත්වයක් සහිත විලියම් රැඩිස් තාගෝර් කතා කලාවේ යථාර්ථවාදය තාගෝර්ටම ආවේණික ප්‍රතිනිර්මාණ මාදිලියක් ලෙස තේරුම් ගැනීමට දරණ ප්‍රයත්නය අගය කළ යුතුය.

රැඩිස්ගේ මතය අනුව තාගෝර් යථාර්ථවාදය සහ විඥානවාදය එකට මුසු කිරීමට තැත් කරයි. යථාර්ථවාදය වූකලී තර්කවාදය, විද්‍යාත්මක ලෝක දෘෂ්ටිය සහ වාස්තවිකත්වය පදනම් කර ගත්තකි. විඥානවාදය තාර්කිකත්වයට එපිටින් ඇති අතාර්කික අදෘශ්‍යමාන සහ අධිස්වභාවික ප්‍රපංචයක් පදනම් කර ගනියි. මේ එකිනෙක පරස්පර ලෝක දෘෂ්ටීන් දෙක සාහිත්‍ය පඨිතයන් තුළ හෝ එක් තැන් කළ නොහැකිද? ප්‍රබන්ධය යනු ඊටම ආවේනික නීති රීති ඇති ලොවකි; එහෙයින් එහිදී සැබෑ ජීවිතයේදී යුද හමුදාවන්ගෙන් සන්නද්ධව වෙන්වී සිටින දෘෂ්ටීන්ට පවා සුසංයෝග වන්නට පුළුවන. තාගෝර්ගේ විකල්ප-යථාර්ථවාදය උපදින්නේ එක් දර්ශනයක සීමා අනෙක් දර්ශනයේ ප්‍රබලතාවන්ගෙන් සමතික්‍රමණය කිරීමට දරන සවිඥානක උත්සාහයක පළ වශයෙනි.

අප මෙම කෘතියෙහිදී දිගින් දිගටම සාකච්ඡා කළ පරිදි යථාර්ථය යන්නට හෝ යථාර්ථවාදය යන්නට සර්වකාලීන, සජාතීය අර්ථයක් ඇතැයි ගැනීම සාවද්‍යය. එසේම යුරෝපයීය සාහිත්‍යික යථාර්ථවාදය, යථාර්ථවාදී ප්‍රතිනිර්මාණ විධිය පිළිබඳ තිබිය හැකි එකම නිර්වචනය ලෙස පිළිගැනීම ඊටත් වඩා සාවද්‍යය. යුරෝපයම වත් එසේ කර නැත.

තාගෝර් යථාර්ථවාදය යන සංකල්පයම පවා උපනිෂද් අර්ථයකින් වටහා ගත් බව අපි දුටිමු. ඒ වූකලී යුරෝපයීය යථාර්ථවාදයේ ඓතිහාසිකත්වයත්, ලෝක දෘෂ්ටියත්, සංස්ස්කෘතියත් ඥානමීමංසාත්මකව සමතික්‍රමණය කිරීමකි. මේ වූකලී ථෙරවාදී බුදු දහම යුරෝපයීය බුද්ධි ප්‍රබෝධ චින්තනය සේම යථාර්ථවාදී, හේතුවාදී එකක් යැයි පිළිගෙන ජාතක කතාවල ඇත්තේද යුරෝපයීය යථාර්ථවාදය යැයි කී මාර්ටින් වික්‍රමසිංහගේ ආස්ථානයට වඩා බෙහෙවින් වෙනස් වූවකි.

යම් සමාජයක බාහිර වාස්තවික යථාර්ථය අදාළ ඓතිහාසික මොහොතේ ආර්ථික, සාමාජික ඓතිහාසිකත්වයද සමග ප්‍රබන්ධ කතාවට හසු කර ගැනීම සම්භාව්‍ය යථාර්ථවාදයෙන් අදහස් කෙරුණු බව අප දෙවැනි පරිච්ඡේදයේදී දුටුවෙමු. බාහිර කරුණුමය වාස්තවිකත්වය, ඓතිහාසිකත්වය සමග ඒකීයත්වයෙන් යුතුව හසු කර ගැනීම ඉන් අදහස් විය. එනම්, අදාළ සමාජයේ දෘශ්‍යමාන කරුණුමය 'සත්‍යය'ද, එම සමාජයේ ඒ මොහොතට අදාළ සමාජ විකාශනමය (එනම් ඓතිහාසිකත්වය)ද නියම සම්භාව්‍ය යථාර්ථවාදයට හසු විය යුතුය. මින් උපදින්නේ, තාර්කික, ලෞකික, ඓතිහාසික යථාර්ථවාදයකි.

රවීන්ද්‍රනාත් තාගෝර්ගේ ''යථාර්ථය'' සංකල්පය ඒ තාර්කික ලෞකිකත්වය ඉක්මවා යථාර්ථය පිළිබඳ තවත් මානයක් හා සංයෝග වූවකි. මෙම යථාර්ථ සංකල්පය සෑදී ඇති සංරචක මොනවාද?

තාගෝර්ගේ ලිපි ලේඛනවල 'යථාර්ථය' යන්නට සුවිශේෂ අර්ථයක් ඇත. ''සත්‍ය'' යන සකු වදන ''යථාර්ථයත්'', ''සත්‍යයත්'' යන දෙකම අදහස් කළේය. එසේම ඉන්දීය දර්ශනයන්හි ''සත්‍යය'' යන්නෙන් මානව අගයයන් හෙවත් වටිනාකම්ද අදහස් කෙරිණ. එහෙයින් තාගෝර් යථාර්ථය යන වචනය භාවිතා කරන්නේ මානව අගයයන් පෞද්ගලික තලයේදී සාක්ෂාත් කර ගැනීමද අදහස් කිරීමටය. ආදරය, සෞන්දර්යය, යහපත යනාදිය මනුෂ්‍ය ජීවිතය තුළදී ''යථාර්ථයක්'' බවට පත් කර ගත නොහැකි නම් ඒවායෙහි පලක් නැත. මිනිසා යනු මානව අගයන් දරා සිටින්නාය. අගයන් යනු වියුක්ත සංකල්පයන්ය. ඒවාට යථාර්ථ ස්වරූපයක් ලැබෙන්නේ මිනිසා විසින් ඒ යථාර්ථය සාධනය කළ පසුය. සත්‍යයන්ද එසේය, මීළඟට යථාර්ථයේ තවත් අංගයක් තාගෝර් දකියි. ඔහු එය හඳුන්වන්නේ ''තථ්‍ය'' යන වචනයෙනි. ඒ නම් ''කරුණුය'' නැත්නම් ''දත්තය''. සත්‍යයන්, මානව අගයයන් සහ දත්ත/කරුණු තාගෝර් යථාර්ථය යන්නෙහි ඇතුළත් කරයි. මේ හැරුණු විට, පෞරුෂත්වය සහ ආනන්දය යන දෙකද ඔහු යථාර්ථයේම කොටස් ලෙස දකියි. මානව අගයන්/වටිනාකම් යථාර්ථය බවට පත් කරන්නේ මිනිස් පුද්ගලයායි, නැත්නම් පෞරුෂයයි. එය යථාර්ථකරණය නිසා ආනන්දය උපදී. එහෙයින් ඒ දෙකද යථාර්ථයේම කොටස්ය. [34]

යුරෝපීය බුද්ධි ප්‍රබෝධ චින්තනයේ තාර්කික ප්‍රත්‍යක්ෂවාදය සහ වාස්තවිකත්වය, පිළිනොගෙන ඊට විකල්ප ලෙස මිනිස් ලෝකය පරිකල්පනය කළ, යටත් විජිත යුගයේ දකුණු ආසියාවේ සිටි ප්‍රධානතම චින්තකයා ද තාගෝර් විය හැකිය. යථාර්ථවාදය පිළිබඳ ඔහුගේ අදහස් යුරෝපා බුද්ධි ප්‍රබෝධ තර්කවාදයට එරෙහිව, ඒ නිසාම යටත් විජිත දෘෂ්ටිවාදයට එරෙහිව

ගිය ඔහුගේ දර්ශනයේම කොටසක් ලෙස තේරුම් ගත යුතුව ඇත. ඇල්බර්ට් අයින්ස්ටයින් සහ තාගෝර් අතර ඇති වූ ප්‍රසිද්ධ සාකච්ඡාවේදී අයින්ස්ටයින් වාස්තවිකත්වය පිළිබඳ සම්මත බටහිර ස්ථාවරයෙහි පිහිටා සිටි අතර තාගෝර් එහි අනෙක් පස නියෝජනය කළේය. ඒ සංවාදයෙන් කොටසක් මේය.

**අයින්ස්ටයින් :**
විශ්වයේ ස්වභාවය පිළිබඳ සංකල්පයන් දෙකක් ඇත. එකක් නම් ලෝකය යනු මනුෂ්‍යයා මත රඳා පැවතීමෙන් යුතු ඒකීයත්වය යන්නයි දෙවැන්න නම් ලෝකය මනුෂ්‍යයාගෙන් ස්වාධීන යථාර්ථයක්ය යන්නයි.

**තාගෝර් :**
මෙම ලෝකය වූකලී මනුෂ්‍ය ලෝකයකි. එම ලෝකය පිළිබඳ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයද විද්‍යාත්මක මනුෂ්‍යයාගේ දෘෂ්ටිකෝණයයි. ඒ නිසා අපෙන් තොරව ලෝකයක් නොපවතියි. ඒ වූකලි සාපේක්ෂ ලෝකයකි. එය එහි යථාර්ථය උදෙසා අපගේ විඥානය මත රඳා පවතියි.[35]

ජොනතන් ශියර් සඳහන් කරන අන්දමටම අපගේ සාමාන්‍ය අවබෝධය අනුව සලකතොත්, තාගෝර්ගේ තර්කය වූ කලී විකාරයකි.[36] එනම්, ප්‍රිය පාඨකය, ඔබ මේ පොත කියවන්නේ පටන් ගැනීමට පෙර මෙම පොත මෙම පොත නොපැවතියේ යැයි කීම වැන්න. නොඑසේ නම් මිනිස් වර්ගයා පරිණාමය වීමට පෙර පෘතුවිය නොපැවතියේ යැයි කීමක් වැන්න.

එහෙත් තාගෝර් මෙහිදී මතු කරන්නේ ඥානයේ සහ ඥාතනයේ ස්වභාවය පිළිබඳ ඥානමීමංසාත්මක ප්‍රශ්නයකි. ශියර් පැහැදිලි කරන පරිදිම, මිනිස් විඥානයෙන් ස්වාධීනව දේවල් පවතින්නේය යන්න සිතීමම පලක් නැති දෙයකි. අපට දේවල් ගැන දැනගත හැක්කේ ඒවා අපගේ විඥානයට සම්බන්ධ වූ තරමටය.[37] තාගෝර් තම තර්කය තවත් පියවරකින් තීව්‍ර කරමින් සිය මනුෂ්‍යයා/මනුෂ්‍යත්වය සංකල්පයට විශ්වීය මනස හෝ විඥානය හෙවත් බ්‍රහ්මන් යන අදහස එක් කරයි. වේදාන්ත සම්ප්‍රදාය තුළ තම ආස්ථානය පිහිටුවමින් විඥානයෙන් තොරව කිසිවක් නොපවතියි යැයි තර්ක කළේය.[38]

මෙම සිත් ගන්නා දාර්ශනික සංවාදය තවදුරටත් ඉදිරිපත් කිරීම අපගේ ලිපියේ මූලික අරමුණ ඉක්මවා යයි. අප දැක ගත යුතු දේ නම්, මිනිස් ඥානය පිළිබඳ තාගෝර්ගේ ආස්ථානය විසිවැනි සියවසේ මැද වන විට බටහිර විද්‍යාව විසින්ද ළං වූ ආස්ථානයකි.[39] තාගෝර් මෙම දාර්ශනික ආස්ථානය ප්‍රකාශයට පත් කළ පළමු අවස්ථාව 1930 ගණන්වල සිදු වූ අයින්ස්ටයින්-තාගෝර් සංවාදය නොවේ. ඔහුගේ කෙටිකතා කලාවෙහි ඔහුටම ආවේනික යථාර්ථවාදයද අප තේරුම් ගත යුත්තේ යථාර්ථය පිළිබඳ ඔහුගේ වේදාන්තවාදී ආස්ථානයෙහිම ප්‍රකාශනයක් ලෙසය.

පශ්චාත් යථාර්ථවාදී ප්‍රබන්ධ මාදිලි ගැන හැදෑරීමක දී රවීන්ද්‍රනාත් තාගෝර්ගේ දායකත්වය සැලකිල්ලට ගන්නේ කෙසේ ද යන්න සලකා බැලිය යුත්තකි. යථාර්ථවාදය ඉක්මවා යාමට යථාර්ථවාදී නවකතාවේ ඇති දරදඬු සහ ඒකමිතික බව බිඳ බව දැමීමට විසිවැනි සියවසේ මුල් භාගයේ ඇතැම් යුරෝපයීය ලේඛකයන් (ජේම්ස් ජොයිස්, මාෂල් ප්‍රූස්ට්, ෆ්‍රාන්ස් කෆ්කා, වර්ජිනියා වුල්ෆ් ආදී) දරණ ලද නැත ප්‍රබන්ධ කතාව පිළිබඳ නූතනවාදී අවදිය ලෙස හැඳින්වේ. එහෙයින් තාගෝර් පශ්චාත්-යථාර්ථවාදියෙකු (නූතනවාදියෙකු ලෙස කියවීම කාලවිරෝධයකි. ''නූතන කාව්‍ය'' අරභයා ලිපියකට ආරාධනයක් ලැබූ තාගෝර් 1932 දී මෙසේ ප්‍රකාශ කළේයඃ

''නූතන ඉංග්‍රීසි කවියන් ගැන ලියන්නට මට ඇරයුම් කරනු ලැබ තිබේ. එම කාර්ය ලෙහෙසි පහසු එකක් නොවේ; ලිත බලා නූතන කාල වකවානු සලකනු කර දෙන්නේ කවුද? නූතනත්වය වූකලී අදහස් පිළිබඳ දෙයක් මිස කාලවකවානු පිළිබඳ දෙයක් නොවේ.''[40] ඊළඟට මෙම කියමන පැහැදිලි කරන තාගෝර් නූතනවාදී සාහිත්‍යික අංගලක්ෂණ යැයි යුරෝපයේ හැඳින්වුණ අංග වසර දාහකටත් වඩා පැරණි චීන කවියකුගේ කවිවල පවා ඇතැයි තාගෝර් තර්ක කරයි. මෙම තර්කය වාච්‍යාර්ථයෙන්ම ගැනීම කෙසේ වෙතත්, එහි එක්තරා වැදගත් ඇඟවුමක් අඩංගුවේ. එනම් අද්භූතවාදය-යථාර්ථවාදය-නූතනවාදය යන සරළ රේඛීය මානය ඔස්සේම සාහිත්‍යික ප්‍රතිනිර්මාණ විධි විකාශනය වීය යන්න අතිශය යුරෝකේන්ද්‍රීය අදහසකි. ඇතැම් ආසියානු, අප්‍රිකානු, සාහිත්‍ය සංස්කෘතීන් තුළ මේ සියලු අංග චක්‍රීය සහ පැවැත්මක යෙදේ. යුරෝපයේදී කෙසේ වෙතත් අප්‍රිකාවේදී සාහිත්‍ය ඉතිහාසය යනු එක් ඉස්ටේසමකදී තාත්ත්විකවාදයත්, ඊ ළඟ ඉස්ටේසමේදී යථාර්ථවාදයත්, ඊ ළඟ ඉස්ටේසමේදී අධි-යථාර්ථවාදයත් පටවා ගෙන රේඛීය ගමනක යෙදෙන දුම්රියක් නොවේ යැයි නොබෙල් ත්‍යාගලාභී නයිජීරියානු සාහිත්‍යධර වොලේ සොයින්කා වරක් ප්‍රකාශ කළේද එහෙයිනි.[41]

රවීන්ද්‍රනාත් තාගෝර් වැනි සාහිත්‍යධරයෙකු නැවත හැදෑරීමත්, ඔහුගේ කෘතිවල ඇති විකල්ප-යථාර්ථවාදී විභවතා යළි සලකා බැලීමත් සිංහල බසින් කෙරෙන පශ්චාත්-යථාර්ථවාදී සාහිත්‍ය කතිකාව පොහොසත් කර ගැනීමට හේතු වෙනු ඇත.

## පාදක සටහන්

1. දයාසේන ගුණසිංහ තාගෝර්ගේ වැදගත්කම වටහා ගනියි. එහෙත් ඔහු තාගෝර් කතා කලාව නිසි පරිදි ඇගයීමට අසමත් වෙයි. දයාසේන ගුණසිංහ, **කේතුමතී හෝටලයේ රාත්‍රියක්** (නුගේගොඩ; දීපානි ප්‍රකාශකයෝ, 1990) 13
2. 'Skeleton'
3. Rabindranath Tagore, *Selected Short Stories*, Trans, William Radice (London: Penguin, 1994) 84
4. "Little Master's Return". මෙම කතාව මුලින් පළ වූයේ 1891 වර්ෂයේදීය.
5. 'A Single Night'
6. Rabindranath Tagore, *Selected Short Stories*, Trans, William Radice (London: Penguin, 1994) 96
7. Ibid; 96
8. 'The Post Master' - මෙම කතාව මුලින්ම පළ වූයේ 1891 දීය.
9. Rabindranath Tagore, *Selected Short Stories*, Trans, William Radice (London: Penguin, 1994) 46-7
10. මෙහි ඉංග්‍රීසි පරිවර්තනය 'The Hungry Stones' යනුවෙන් පරිවර්තනය කර ඇත. මා එය ''ක්ෂුද්‍රා හරිත පාෂාණ'' යනුවෙන් සිංහලයට නගන්නේ එහි වංග ශීර්ෂය වන ''ක්ෂුධිත පාෂාණ්'' යන්න දෙස බලාගෙනය. මෙය මුලින්ම පළ වී ඇත්තේ 1895 දී ය.
11. Rabindranath Tagore, *Selected Short Stories*, Trans. William Radice (London: Penguin, 1994) 233-43
12. මෙම කතාව අජිත් තිලකසේනගේ 'වන්දනාව' සහ සයිමන් නවගත්තේගමගේ 'ප්‍රේතවස්තුව' වැනි කතාවක් සමඟ සසඳ බැලිය හැකිය.

13. එහි ඇසෙන අදිසි ළඳුන්ගේ ස්වර්ණාභරණ හඬ, නාන ගැහැනුන්ගේ ෂැම්පු සුවඳ, සානායි නමැති සංගීත භාණ්ඩයේ නාදය මූගල් අධිරාජ්‍යයෙකුගේ මාළිගයක දර්ශනයක් සිහි කරයි. Rabindranath Tagore, *Selected Short Stories*, Trans. William Radice (London: Penguin, 1994) 236
14. Ibid, 237-8
15. Ibid, 269
16. Ibid, 234-5
17. Ibid, 235
18. තාගෝර් කෙටිකතා අනූවකට වැඩි ගණනක් ලියා ඇතැයි කියවේ (රැඩිස්, 1994, පි. 1). ඉන් මා කියවා ඇත්තේ කතා තිහකට ආසන්න සංඛ්‍යාවක් පමණි. ඒ ද ඉංග්‍රීසි බසිනි
19. ඔහුගේ කතා අනවශ්‍ය ලෙස කාව්‍යාත්මක යැයි ඇතැම් විචාරකයෝ චෝදනා කරති. William Radice, *Introduction in Rabindranath Tagore selected short stories* (London: Penguin, 1994) 13
20. එම්. එච්. අබ්‍රාම්ස් සඳහන් කරන ආකාරයට ස්වභාවික යථාර්ථවාදියෙකු මිනිස් ශාරීරික ක්‍රියාවන් කරන්නේ වෛද්‍ය ශාස්ත්‍රානුකූල නිරවද්‍යතාවකින් යුතුවය. M. H. A. Abrams, *Glossary of Literary Terms* 6th edition, (Font worth: Horcourt, 1993) 175
21. Ibid, 14
22. විලියම් රැඩිස් තාගෝර්ගේ මෙවන් ප්‍රකාශන දෙකක් උපුටා දක්වයි. William Radice, *Introduction in Rebindranath Tagore selected short stories* (London: Penguin, 1994) 4-5
23. Ibid, 15
24. Ibid, 18
25. *Home and The World* සහ *Quaret* යන නවකතා දෙක වශයෙන් ම'සිතට නගී. ඉන් පළමු වැන්න අතිදුර්වල පරිවර්තනයක් යැයි කියනු ලබන අතර දෙවැන්න විශිෂ්ට පරිවර්තනයක් ලෙස අගය කරනු ලැබේ. ඒ නිසාම දෙවැන්නෙහි අප මෙහි සාකච්ඡා කරන තාගෝර් ලකුණ පැහැදිලිව දැකිය හැකිය.
26. Andrew Robinson, *The Art of Robindranath Tagore* (Calcutta: Rupa and co.; 1989) 198.
27. චක්‍රබර්ති. 200 පි. 167. තාගෝර්ගේ ''බන්සි'' හෙවත් ''The Flute" කවිය අරභයා චක්‍රබර්ති කරන අගනා සාකච්ඡාවක දී ඔහු තාගෝර්ගේ ආභාසයන් සියල්ල ගෙන හැර දක්වයි. Dipesh Chakrabarty, *Provincializing Europe* (Princeton: Princeton University Press, 2000) 198
28. Ibid, 150-1
29. Ibid, 151
30. "Prose-Poetry"
31. Ibid, 153-55
32. Ibid, 150-2
33. තාගෝර්ගේ කතා ඇදහිය නොහැකි හෙවත් සැබෑ ජීවිතයේ සිදුවේ යැයි සිතිය නොහැකි සිද්ධිවලින් පිරී ඇතැයි, 1894 දී එක්තරා විචාරකයෙකු තාගෝර් නිර්දය විවේචනයට ලක් කොට ඇත. ඒ නිසා තාගෝර් ක්‍රමයෙන් කෙටිකතා ලිවීම අත හැර දැමීමට තරම් හේතු වූ බව කියවේ. William Radice, *Introduction in Rabinsranath Tagore selected short stories* (London: Penguin, 1994) 26-7
34. මා එහි ඉදිරිපත් කළේ ඉන්දීය දර්ශනයේ ප්‍රකාශකයෙකු ලෙස තාගෝර්ගේ වැදගත්කම් ගැන රෝයි කරන අගය කළ යුතු සාකච්ඡාවක මගේ කියවීමයි. Pabithrakumar Roy *Rabindranath Tagore* (New Delhi, Indian Council of Philosophical Research, 2003) 41-53

35. Jonathan Shear "*Conciousness and Reality : The paradox of objective knowledge in Rabindranath Tagore : University and Tradition ed.* Patrick Hogon & Lalitha Pandit (Madison : Fairlegh Dicknson University Press, 2003) 95 මෙම සංවාදය උපුටා දක්වා ඇත.
36. Ibid, 95.
36. Ibid, 96.
37. Ibid, 96
38. Ibid, 96, මෙම සාකච්ඡාවේදී අයින්ස්ටයින් ගත් මිනිස් විඥානයෙන් ස්වාධීන වාස්තවිකත්වය පිළිබඳ ආස්ථානය එහි ගැටලුද ගැන අවබෝධයකින් ගත්තකි.
39. බොහෝ විද්‍යාඥයන් ද විඥානය සහ 'වාස්තවිකත්වය' පිළිබඳ කාරණයේදී තාගෝර්ගේ ආස්ථානය වෙත පැමිණ ඇති සැටි ශියර්ද විස්තර කරයි. බලන්න ශියර්. 2003, පි. 100-1005
40. Rabindranath Tagore *Selected Writings on Literature and Language* ed. Sukanta Chaudri. (Delhi : Oxford University Press, 2001)
41. Wole Soyinka, *Myth, Literature and African World* (New York : Cambridge University Press, 1995) 36-7


[මේ ලිපිය ලියනගේ අමරකීර්ති විසින් රචිත **අමුතු කතාව - පශ්චාත් යථාර්ථවාදී ප්‍රබන්ධ කලාවක් වෙත ප්‍රබන්ධ න්‍යායික රචනා** (කොළඹ: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 2005) කෘතියේ පරිච්ඡේදයක් ඇසුරිණි].

# The Musical Journey of Rabindranath Tagore (1861-1941)

**Reba Som**

Rabindranath Tagore (1861-1941) was born at the interface of several cultures. In 1858 India came under the British crown. Western cultural ideas, which had already made an appearance, now received renewed vigour. However in India's palimpsest history each cultural encounter, whether Muslim or British, left behind an indelible layer over an ancient Hindu civilisation. The new age or *nabayuga* in which Tagore was born, manifested itself in curious ways on the cultural environment of his family.

තාගෝර්ගේ චරිතය නිර්මාණ හා නන් විධ විෂය ක්ෂේත්‍ර පුරා පැතිරගියා වූ ඔහුගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විශාල සාකච්ඡාවක් නිර්මාණය වී තිබේ. එහෙත් මෙම සාකච්ඡාවලින් බහුතරය ස්ථානගත කර ඇත්තේ තාගෝර් ආධ්‍යාත්මිකවාදියකු, ස්වභාවධර්මය සමග ජීවත් වූ රොමැන්ටික්වාදියකු හෝ භෞතික ජීවන පදනම්වලින් වියුක්තව නැතහොත් හැකි තරම් ඈත්ව කල්ගත කළ පුද්ගලයකු ලෙස හුවා දැක්වීම සඳහාය. තාගෝර්ගේ නිර්මාණ මෙන්ම ශාන්ති නිකේතනයේ අධ්‍යාපනයේ හා ඔහුගේ මධ්‍යම පාන්තික ජීවිතය ද මේ සඳහා බොහෝ විට හුවා දක්වන ලද ආකාරය නිරීක්ෂණය කළ හැකිය. මුනිවරයකු හෝ ඊට ආසන්න තත්ත්වයකට තාගෝර් ගෙන එන මෙම කතිකාවේ තවත් පාර්ශ්වයක් වන්නේ ඔහුගේ නිර්මාණ විශේෂයෙන්ම කාව්‍ය නිර්මාණ හුදෙක් ස්වභාවධර්මයේම සමීප ඡායාරූපයක් ලෙස විග්‍රහ කර ගනිමින් ඒවායේ සමාජ, දේශපාලන නිරූපණාත්මක අගය නොසලකා හැරීමයි.

තාගෝර් සම්බන්ධයෙන් මෙබඳු කතිකාවක් නිර්මාණය වී ඇත්තේ ඔහුගේ භූමිකාව අදාළ යුගයේ ස්ථානගත කිරීමට ඇති අපොහොසත්භාවය නිසා බව පෙන්වා දිය හැකිය. එසේම, තාගෝර්ගේ නිර්මාණ කීපයක් මතුපිට තලයේ විග්‍රහ කිරීමෙන් නිගමනවලට එළඹීම විය හැකිය. තවද තාගෝර් මතු නොව සමස්ත ඉන්දියාවත් එහි පාර්ශවකරුවනුත් ව්‍යාජ ආධ්‍යාත්මික කෝණයකින් නිරීක්ෂණය කිරීම තුළින් විය හැකිය. ඒ සියල්ලමත් නොවේ නම් තාගෝර්ගේ ක්‍රියාකාරීත්වයේ භෞතිකවාදී පදනම වටහා ගැනීමේ ඇති නොසැලකිල්ල හා අසමර්ථභාවය නිසා ද විය හැකිය. කෙසේ වෙතත් ඒ සීමා පිළිබඳ අවධානය යොමු කරමින් මෙම සාකච්ඡාව නිර්මාණය කරමු.

තාගෝර් බෙංගාලි පුනරුදයත් ඒ ඔස්සේ ඉන්දියානු මහා නිදහස් අරගලයත් නියෝජනය කිරීම සඳහා තම නිර්මාණ දායකත්වය මතු නොව සමාජ, දේශපාලන හා සංස්කෘතික ක්‍රියාකාරිත්වයක් ද පළ කළ බව ඔහුගේ කාර්ය සාඵල්‍යය තුළින් නිරීක්ෂණය කළ හැකිය. කෙටියෙන් උදාහරණ කීපයක් ගෙනහැර දැක්වීමට කැමැත්තෙමි.

තාගෝර් උපදින කාල වකවානුව බෙංගාලය තුළ කිසියම් පුළුල් චින්තනමය ප්‍රබෝධයක් මෙන්ම එයට සරිලන සමාජ, දේශපාලන ක්‍රියාකාරිත්වයක් ද නිර්මාණය වෙමින් තිබූ සංක්‍රාන්තික කාල පරිච්ඡේදයකි. බෙංගාල ප්‍රභූහු ඉන්දියාවේ අන්තගාමී හින්දු හෝ වෙනත් ආගමික හර පද්ධතිවලින් ඔබ්බට සිය දෙනෙත යොමු කළහ. අන්තර්ජාතික චින්තනමය භාවිතයක් නිර්මාණය කිරීමටත්, ඒ පදනම මත නිදහස් හා විවෘත චින්තනයකින් හෙබි භාරතයක් නිර්මාණය කර ගැනීමත් මෙහි අභිලාෂය වූ බව පෙනේ. එවකට තම බලය තහවුරු කර ගනිමින් සිටි බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයත්, එහි මතවාදයත් එයට එරෙහිව තවත් පසෙකින් නැඟී එමින් සිටි හින්දු හා වෙනත් ස්වදේශීය අන්තවාදයන් ද මෙහි දී මෙම පිරිසේ විවේචනයට ලක් වූ බව පෙනේ.

වංග මධ්‍යම පන්තිය කිසි විටෙකත් බටහිර නූතන කතිකාවේ සාධනීයතා බැහැර නොකළ අතර ඒවා දෙස නිශේධනාත්මක අර්ථයෙන් නොබැලීය. මේ වන විටත් ඔවුන් තම දරුවන් ශික්ෂණය කරමින් සිටියේ බටහිර ධනේශ්වර හා අධිරාජ්‍යවාදී රාමුව තුළ නිර්මාණය කළ අධ්‍යාපන හා ශික්ෂණ රාමුව තුළමය. Nirad C. Chaudhuri තම *Autobiography of an Unknown Indian* කෘතියේ පෙන්වා දෙන ආකාරයට එම ශික්ෂණ රාමුව තුළ ශේක්ස්පියර්ගේ කෘති පරිශීලනය, ඉංග්‍රීසි අධ්‍යාපනය ආදිය ඉහළින්ම පිළිගැනීම ආදී සංරචක දැකිය හැකිය. එසේම තාගෝර් පවා ඔහුගේ දින සටහන්වල නිරන්තරයෙන් පෙන්වා දෙන්නේත් ඔහුගේ නවකථා හා කෙටිකතාවල බොහෝ සෙයින් නිරූපණය වන්නේත් පුළුල් බටහිර ශික්ෂණ ව්‍යාපෘතිය ඔවුන්ගේ අධ්‍යාපනය හා රුචිකත්වය හා ශික්ෂණය මත ඇති කළ බලපෑමයි. මෙම ශික්ෂණ ව්‍යාපෘතිය තුළ තාගෝර්

පවුල විශේෂ ස්ථානයක් අත්පත් කර ගත් ආකාරයත්, ඒ තුළ ප්‍රබල අන්තර්ජාතික රුචිකත්වයක් නිර්මාණය කර ගත් ආකාරයත් චිදානන්ද දාස් ගුප්ත මෙසේ විස්තර කරයි.

> ඉතාම බලවත් පවුලක් වූ ඨාකුර් පරම්පරාව තුළ ප්‍රබල අන්තර්ජාතික අවබෝධයක් පැවතුණි. එම ශතවර්ෂය කෙළවරදී ඨාකුර්වරු ඔකකුරා සිටුවරයාට කල්කටාවට පැමිණෙන ලෙස ආරාධනා කළෝය. ගංගානේන්ද්‍රනාථ ඨාකුර් ඔකකුරාගේ ජපාන චිත්‍ර කලාව පිළිබඳ ඔජිට්සෙන් පාසැලෙහි සුප්‍රසිද්ධ නෛපුණ්‍යයන් වූ තායිකන් හා හිෂිඩා සමග දිගටම සම්බන්ධතා පැවැත්වීය. ගංගානේන්ද්‍රනාථගේ චිත්‍රවල මෙම සම්බන්ධතා පැහැදිලිව පිළිබිඹු වෙයි. ජ්‍යොතිරින්ද්‍රනාථ මොලියර්ගේ නාට්‍ය ප්‍රන්ස බසින් වංග බසට පරිවර්තනය කළේය. විලියම් රොදන්ස්ටීන්ගේ මහත් ප්‍රසාදයට හේතු වූ ආලේඛ සිත්තම් ඇන්දේය. තවද ඉන්දියාවේ ප්‍රථම නෞකා නිර්මාණ සමාගමද ආරම්භ කළේය. ජර්මනියේ බව්හවුස් ගුරුකුලය නිර්මාණය කරනු ලැබ වර්ෂ දෙකක් ගිය තැන 1921 දී ඨාකුර්වරු බව්හවුස් ප්‍රදර්ශනයක් කල්කටාවේ සංවිධානය කළෝය. රබීන්ද්‍රනාථ (1861-1941) ලෝකය පුරා සංචාරය කළේය. සිය දීර්ඝ ජීවිත කාලය තුළදී රටවල් රාශියක ලේඛකයින්, කලාකාරයින් හා උගතුන් විශාල සංඛ්‍යාවක් සමග පෞද්ගලික සම්බන්ධතා පැවැත්වීය. විදේශික පාලනයක බාධාවන් ද දහනවවන සියවසේදී හා විසිවන සියවස මුලදී සන්නිවේදනයේ පැවැති මන්දගාමී ස්වභාවයද මධ්‍යයේ වුවත් ඨාකුර්වරු ලෝකය තමන්ගේ ම ප්‍රවේණියක් සේ සැලකූහ. ඔවුන් නොදත්, ඔවුන් හා සම්බන්ධ නොවූ යමක් ජාත්‍යන්තර සංස්කෘතීන්හි සිදු වූයේ නම් ඒ ඉතා සුළු දෙයකි (දාස් ගුප්තඃ 2007 ඃ 13-14).

තාගෝර් පවුල ජාත්‍යන්තර බුද්ධිමය සම්ප්‍රදාය තුළින් බොහෝ දේ උකහාගත් බව මෙයින් පෙනේ. එහෙත් මෙහි දී කිසිසේත් අමතක නොකළ යුත්තේ මේ සියලු අන්තර්ජාතික සංවාද මධ්‍යයේ තම රටෙහි භාෂාව, ඉතිහාසය, සාහිත්‍යය හා සංස්කෘතිය සමග ද ගැඹුරු හා අඛණ්ඩ ගනුදෙනුවක් නිර්මාණය කර ගැනීමට බෙංගාලි බුද්ධිමය පැළැන්තිය සමත් වූ ආකාරයයි.[1] තාගෝර් ඒ අතරිනුදු සුවිශේෂ අනන්‍යතාවක් අත්කර ගත් අතර හින්දු මෙන්ම උපනිෂද් සම්ප්‍රදායේ ගැඹුරු හර ඔහුගේ ජීවිතය තුළට බාල වියේ දීම ඇතුළු වූ බව නිරීක්ෂණය කළ හැකිය.

සොබා දහම, ආගමික සංකේත, ආගමික ක්‍රියාකාරිත්වය, පුද පූජා, ව්‍රත චාරිත්‍ර යනාදිය බොහෝ දෙනෙකු වර්තමානයේ අර්ථකථනය කෙරෙන්නේ ව්‍යාජ ආධ්‍යාත්මික බාල රොමැන්ටික්වාදී දේවල් ලෙසය. මෙය මාක්ස්වාදය පිළිබඳ මෙන්ම බටහිර තර්ක ඥානයේත් ඒ ඇසුරින් නිර්මාණය වූ බුද්ධිමය කතිකාවේත් සාරාර්ථ පිළිබඳ නොගැඹුරු වැටහීමකින් ඇති කර ගත් ග්‍රාම්‍ය (ඕලාරික) භෞතිකවාදයක් බව පෙනේ. සොබා දහම, ආගමික ක්‍රියාකාරිත්වය හා ඒ ඇසුරින් උපන් සකලවිධ ක්‍රියාකාරිත්වයන් මිනිසාගේ භෞතික ජීවන ක්‍රියාකාරිත්වයේ ම පරාවර්තනයක් ලෙස හඳුනාගත හැකිය. පිළිබිඹුව පරාවර්තනය වැනි සංකල්ප ගැඹුරින් වටහාගත් විට එය හුදෙක් පවතින දෑ ඒ ආකාරයෙන්ම නියෝජනය වීමක් නොව වඩා සංකීර්ණ සමාජ, සංස්කෘතික ක්‍රියාකාරිත්වයක ප්‍රතිඵලයක් ලෙස නිරූපණය වීමක් ලෙස සැලකිය හැකිය. බටහිර ඥාන විභාගය තුළ පවා වර්තමාන කතිකාව නිර්මාණය වී ඇත්තේ මෙවැනි සංකීර්ණ පරාවර්තන ක්‍රියාවලි වටහා ගැනීමේ දාර්ශනික අභ්‍යාසයක් ලෙසය. මේ සඳහා නිදසුනක් ලෙස ගැඩමර් නම් දාර්ශනිකයාගේ 'දාර්ශනික අර්ථදීපනවේදය' (Philosophical hermeneutics) නමැති විශ්ලේෂණාත්මක ප්‍රවේශය ගෙන බැලිය හැකිය. යථෝක්ත විෂය පිළිබඳ ප්‍රාමාණික බුද්ධිමතකු ලෙස පොදුවේ පිළිගැනෙන ලාංකීය විද්වතකු වන ජයදේව උයන්ගොඩ තම

'සමාජීය මානවීය විද්‍යා පර්යේෂණ දාර්ශනික සහ ක්‍රමවේදී හැඳින්වීමක්' නමැති ග්‍රන්ථයෙහි එම විශ්ලේෂණාත්මක ප්‍රවේශය මෙසේ හඳුන්වයි.

> ගාඩමර්ගේ අර්ථදීපනවේදය තුළ ''සම්ප්‍රදාය'' යන්නට විශේෂ අර්ථයක් තිබේ. සම්ප්‍රදාය යනු හුදෙක් අතීතයම නොවේ. එය අපේ තේරුම් ගැනීම (අවබෝධනය) හැඩගස්වන, එයට බලපෑම් කරන ක්‍රියාවලියකි. "Effective history, එනම් ''සාඵල්‍යාත්මක ඉතිහාසය'', යන යෙදුමෙන් ගාඩමර් ප්‍රකාශ කරන්නේ එය යි. මානවීය විද්‍යාවන්ගේ විෂයය වන ''තේරුම් ගැනීම'' මේ සක්‍රීය ඉතිහාසයේම කොටසකි. අප යම්කිසි විෂය වස්තුවක් අර්ථ කථනය කරන විට, එම විෂය වස්තුව අර්ථ කථනය කරන්නා ද අයත් වන සම්ප්‍රදායය විසින් තේරුම් ගැනීමට ලක් කර ඇති ආකාරයෙන් ස්වාධීනව අපට එය කළ නොහැකිය. එබැවින් ඕනෑම ''තේරුම් ගැනීමක්'' ඉතිහාසය හා සම්ප්‍රදාය තුළ මුල් බැසගෙන තිබේ. වාස්තවික තේරුම් ගැනීමක් තිබිය නොහැක්කේ එබැවිනි. මානවීය විද්‍යාවන් වාස්තවික විද්‍යාවක් විය යුතු යැයි කිව නොහැක්කේ ද එබැවිනි. තේරුම් ගැනීම යනු අර්ථය යළි ගොඩනැඟීම නොවේ. එය වූකලී අර්ථය මාධ්‍යයනය කිරීමයි. අර්ථය යනු මාධ්‍යයනය කරන ලද අර්ථයකි (Understanding is not reconstruction, but mediation) (Linge, 1977:xvi). සෑම තේරුම් ගැනීමක්ම, වාස්තවික තේරුම් ගැනීමක් නොවන නිසා, කිසිම අර්ථදීපනයක් ද අවසන් අර්ථදීපනයක් විය නොහැකිය. තේරුම් ගැනීම යනු, අර්ථ කථනය කරන්නා සහ අර්ථ කථනයට බඳුන්වන පාඨය අතර නිරන්තරයෙන්ම ඇතිවන ද්විඝටනාත්මක සම්බන්ධයකි (උයන්ගොඩ : 2010 : 158).

යථෝක්ත පැහැදිලි කර ගැනීම විභාග කර බලතොත් සම්ප්‍රදාය යනු අතීතයෙන් උරුම වන දෙයම නොව අපේ අවබෝධය තුළ ක්‍රියාත්මක වන අවබෝධයේ වටහා ගැනීමේ ශක්‍යතාව තුළ නැවත නැවත සමකාලීනව නිර්මාණය වන්නා වූ සජීවී ක්‍රියාවලියකි. අප යම් විෂය වස්තුවක් අර්ථකථනය කරන විට එය දිගුකාලීනව පවතින සම්ප්‍රදායෙන් වියුක්ත කොට ගැනීම වෙනුවට අදාළ සන්දර්භය සලකා බලමින් එයට යම් විශේෂ අවධානයක් යොමු කිරීම මෙහි දී කැපී පෙනෙන විශේෂ තත්ත්වයකි. ඕනෑම 'තේරුම් ගැනීමක්, ඉතිහාසය හා සම්ප්‍රදාය තුළ මුල් බැස ගෙන තිබේ' යන්නෙහි අර්ථය එයයි.[2]

තාගෝර් පිළිබඳ සාකච්ඡාව යථොක්ත පැහැදිලි කරගැනීම්වලින් පරිපෝෂණය කළ හැකිය. තාගෝර්ගේ නිර්මාණවල මෙන්ම ක්‍රියාකාරිත්වයේ ද පවතින ගූඪ ආධ්‍යාත්මික හා ආගමික දේවල් මේ අනුව වටහාගත යුත්තේ දිගුකාලීනව ඉන්දියාවේ පැවති යථාර්ථයේම ඓන්ද්‍රීය කොටසක් වශයෙනි. ඉන්දියානු පරිකල්පනයේ සංකේතකරණය වශයෙනි. මාක්ස්වාදී සංකල්පයක් උපයෝගී කරගෙන පැවසුවහොත් ඉන්දියානු වාස්තවික යථාර්ථයේම පිළිබිඹුවක් වශයෙනි. වාස්තවික යථාර්ථය යැයි කී විට මාක්ස්වාදය හා මාක්ස්වාදී විවේචන ක්‍රමය සිහියට නැඟීම වැළැක්විය නොහැකිය. එහෙත් මෙහි දී අප විසින් ඉදිරිපත් කෙරෙනුයේ මාක්ස්වාදී විවේචන ක්‍රමය මතුපිටින් අනුකරණය කිරීම නොවන බව අවධාරණය කෙරිය යුතුය. මන්ද යත් මාක්ස්වාදීන් ආගම හා ඒ ආශ්‍රිත දෑ විඥානවාදී භාවිතයක් හා ආගමික නිසාම ප්‍රතිගාමී දෙයක් ලෙස ඉවත දමන නිසාය. එහෙත් අපි ආගම ප්‍රතිගාමී ප්‍රපංචයක් ලෙස නොසලකමු. එය තවත් වැදගත් තීරණාත්මක ඥානන මාර්ගයක් ලෙස සලකමු.[3]

තාගෝර් පිළිබඳ ගූඪකරණය කරන ලද ආධ්‍යාත්මික මායාව ඇතැම් විට බටහිර වැසියාගේ පෙරදිග දැක්ම තුළින් වර්ධනය වූ ඉන්දියානු යථා ජීවිතයේම ඓන්ද්‍රීය කොටසක් විය හැකිය.

එහෙත් බෙංගාලි පුනරුදයේත් ඉන්දියානු ජාතික අරගලයේත් ප්‍රබල චින්තකයකු ලෙස තාගෝර්ව දැකීමේ දී බටහිර චින්තනය හා පෙරදිග චින්තනය පිළිබඳ සුදු / කළු / අහස / පොළොව වර්ගයේ දෙබෙදුමක් හෙවත් වර්තමාන ජනප්‍රිය අර්ථයෙන් පවසන්නේ නම් ද්විත්ව ප්‍රතිපක්ෂ තත්ත්වයක් දැකිය නොහැකිය.[4]

ලංකාවේ එවැනි දෙබෙදුමක් අධිපතිවාදී චින්තනය තුළ පවතින නිසාත් විශේෂයෙන්ම ජාතික අරගල සමයේත් එහි ප්‍රධාන කඩඉම් ඓතිහාසික අවස්ථාවක් වන 56 අරගල සමයේත් දැකිය හැකි වූ නිසාත් තාගෝර්ගේ ජාතිකවාදී නැඹුරුවක් සහිත ජාත්‍යන්තරවාදය අර්ථකථනය කර ගැනීම අපහසුය. (ඒ පිළිබඳව යම් යම් ඉඟි ලිපියේ දෙවන කොටසින් සාකච්ඡා කරමු.)

බෙංගාලි පුනරුදයේ දී තාගෝර්ගේ කාර්යභාරය ඔහු තුළම යම් නිරවුල් දැක්මක් ඇති නොකළ අභ්‍යන්තරික ගූඪ චින්තනයක් නිර්මාණය කළේ යැයි තර්ක කිරීමේ සාක්ෂි තිබේ. එහෙත් මෙයින් ඇඟවෙන්නේ ඔහුගේ දෘෂ්ටිය ව්‍යාකූලය, සුළු ධනේශ්වරය, මධ්‍යම පාන්තිකය යන මාක්ස්වාදී අදහසෙහි ප්‍රතිරාවය නොවේ. නවකථාකරුවකු, කවියකු වශයෙන් ඔහුට ගාන්ධි-නේරු දේශපාලන වැඩ පිළිවෙළ සමඟ දේශපාලනිකව සෑම විටම එකඟ වීමට නොහැකි වූයේය යන අදහස පමණි. එය දේශපාලන ව්‍යාපාර සමඟ සමාන්තර ලෙස ගමන් කළ ඕනෑම කලාකරුවකුට සාධාරණ තත්වයකි. නිදසුනක් ලෙස මැක්සිම් ගෝර්කි හා සෝවියට් කොමියුනිට්ස් පක්ෂය මේ සඳහා ගත හැකිය.

තාගෝර්ගේ සුප්‍රකට 'ගෝරා', 'ඝරේ බහිරේ' ආදී නවකථා මෙන්ම කෙටිකතා හා කාව්‍ය සංග්‍රහ පිළිබඳව ද යාන්තමින් හෝ සඳහන් කිරීම මෙහි දී වැදගත්ය. එමෙන්ම, වර්තමානයේ සිංහල බසින් පළ වී ඇති චතුරංග, සිව්රඟ රැඟුම වැනි නවකථාවල, තැපැල්හල වැනි නාට්‍යවල තාගෙ ෝර්ටම අනන්‍ය වූ ආඛ්‍යාන කලාවක් පමණක් නොව අත්දැකීම් කලාපයක් ද නිරීක්ෂණය කිරීමේ ඉඩකඩ විශාලය.

තාගෝර්ගේ නිර්මාණය එකවිටම සමකාලීන මිනිස් ආධ්‍යාත්මයත් බෙංගාලි පුනරුදයත් වෙත එක සමාන ආලෝක ධාරා නිකුත් කරන අපූරුව ඒ නිර්මාණ කෘති ලෙස හැඳින්විය හැකිය. ඒවායේ යථෝක්ත අරමුණු දෙක වෙන් කළ නොහැක්කේ ටෝල්ස්ටෝයි, ඩොස්ටයෙව්ස්කි, ගෝර්කි ආදීන්ගේ නිර්මාණ ඔවුන්ගේ ජීවිත හා රුසියානු සමකාලීනත්වය සමඟ ඓන්ද්‍රිය ලෙස බැඳී තිබෙන ආකාරයෙනි. එහෙත් ඒ සමඟම රුසියන් නවකථාව සර්වකාලීන සාර්වත්‍රික තත්වයක් අත්පත් කර ගන්නා සේම තාගෝර්ගේ නිර්මාණ ද එබඳු තත්වයක් වෙත ඉඟිලෙයි. මෙයට කදිම උදාහරණ වන්නේ 'තැපැල්හලයි'. 'තැපැල්හල' මිනිස් අධ්‍යාත්මය පිළිබඳ පැරණි බෞද්ධ වේදාන්ත දර්ශනවල හරයට කිමිදෙන නාට්‍යයකි. එහෙත් එය වර්තමානයේ බොහෝ විට ජනප්‍රිය වන ගූඪ නිර්භෞතික අතීතකාමී නිර්මාණයක ව්‍යාජත්වය ගැබ් කර ගන්නක් නොවේ. තැපැල්හල යන නූතනවාදී භෞතික සංඥාවම අපගේ තර්කයට උදාහරණයකි. මේ නාට්‍යය තාගෝර්ගේ බොහෝ කෙටිකතාවල ද දැකිය හැකි ඔහුටම අනන්‍ය වූ සුවිශේෂ යථාර්ථයක් නිර්මාණය කරන ශිල්පීය රාමුවක් ගොඩනගන බව අපගේ අදහසයි.[5]

තාගෝර්ගේ නිර්මාණ කොතරම් බෙංගාලි පුනරුදයට හා ඉන්දියානු නිදහස් සටනට ප්‍රතිබද්ධ ද යන්න විමසා බැලීම සඳහා හොඳම කටයුත්ත වන්නේ විභූතිභූෂණ බන්දොපාද්‍යා සරච්චන්ද්‍ර චට්ටෝප්පාද්‍යා වැනි ලේඛකයන්ගේ නිර්මාණ සමඟ තාගෝර්ගේ නිර්මාණ සංසන්දනය කර බැලීමයි. එක සමාන යුගයක් නියෝජනය කරන මෙම තිදෙනා එකම සමාජයක එකම යථාර්ථය මත

පදනම් වන අත්දැකීම් තම වස්තු විෂය බවට පත් කර ගත්තෝය. එහෙත් ඔවුන්ගේ නවකථාවල ආඛ්‍යාන රටා, දෘෂ්ටිවාද, චරිත නිරූපණ ආදී මූලික අංග අතර පවතින්නේ මහත් වෙනසක් බව සංසන්දනාත්මකව අධ්‍යයනය කළ විට වටහා ගත හැකි තත්ත්වයකි. එම අධ්‍යයනයේ දී තාගෝර්ගේ නවකථා භූමිකාව සුවිශේෂත්වයකින් යුතුව මතුවීම වැළැක්විය නොහැකිය.

ලංකාව තුළ මෙබඳු සංසන්දනාත්මක සාකච්ඡාවක් මේ වන තෙක් නිර්මාණය වී නොමැත. එහෙත් සෑහෙන කාලයක සිට යථෝක්ත නිර්මාණකරුවන්ගේ වැදගත් නිර්මාණ සිංහලට පරිවර්තනය වෙමින් පවතී. ඇතැම් පරිවර්තකයින් තම පරිවර්තනවල හැඳින්වීම වශයෙන් වර්තමාන ඉන්දියාවේ තීක්ෂණ විචාර ලේඛන ද පරිවර්තනය කර ඇති බව නිරීක්ෂණය කළ හැකිය. ශරත්චන්ද්‍ර චට්ටෝපාධ්‍යායගේ 'දේව්දාස්' නවකථාවේ සිංහල පරිවර්තනය සඳහා හැඳින්වීමක් වශයෙන් ශ්‍රී ජාතගුහාගේ වටිනා ශාස්ත්‍රීය ලිපියක් මෙසේ සිංහලයට පරිවර්තනය වී ඇත. ආනන්ද අමරසිරි පරිවර්තනය කළ එම ලිපිය අපගේ සාකච්ඡාව සම්බන්ධයෙන් අතිශයින්ම වැදගත් ලේඛනයකි. තාගෝර්ගේ හා සරච්චන්ද්‍ර චට්ටෝපාධ්‍යායගේ නවකථා මඟ සංසන්දනය කරමින් ශ්‍රීජාත ගුහා මෙසේ පවසයි.

> බංකිම්චන්ද්‍ර චට්ටෝපාධ්‍යායයන් විසින් ඔහුගේ ඓතිහාසික ප්‍රේම කතා මඟින් දහ නව වැනි සියවසේ මැද භාගයේ දී වැයමින් පණ ගන්වන ලද බෙංගාල නවකථාව තවත් පියවරක් ඉදිරියට ගෙන යන ලද්දේ රබීන්ද්‍රනාථ ඨාකුරයන් විසිනි. විසි වැනි සියවසේ මුල් භාගයේ දී රබීන්ද්‍රනාථයෝ තමාගේ කාව්‍යමය, ප්‍රබෝධජනක ආඛ්‍යාන ශෛලියක් ද චරිත හා අවස්ථා උදෙසා වඩාත් යථාර්ථවාදී පදනමක් ද හඳුන්වා දුන්හ. මුල් වකවානුවේ පළ වූ ශරත්චන්ද්‍රයන්ගේ නිර්මාණවල රබීන්ද්‍රනාථයන්ගේ ලේඛන කලාවේ බලපෑම පැහැදිලි වශයෙන් ම දැක ගත හැකි විය. එහෙත් ඔහුගේ සාහිත්‍ය සේවයේ උච්චතම කාල වකවානුවේ දී ඔහු සාහිත්‍ය කෙරෙහි දැක්වූ ආකල්පය සම්බන්ධයෙන් සලකා බලන කල්හි ඔහු ඉටු කළේ විප්ලවයකට වඩා අඩු යමක් නො වේ. මේවා අත්‍යවශ්‍යයෙන් ම අදහස්, සිද්ධි හෝ ආඛ්‍යානමය ප්‍රහේලිකා පිළිබඳ ලියැවුණු පොත් නො වී ය. ඒවා හුදෙක් ''මිනිසුන්'' පිළිබඳ ලියැවුණු නවකථා විය. සමහර විට ඉන්දීය සාහිත්‍යයේ මුල් වතාවට පොදු ජනයාගේ දුඃඛදෝමනස්සයන්ගෙන් ද භග්නාශාවන්ගෙන් ද චින්තාවන්ගෙන් ද පෝෂිත වූ දෛනික දිවි පෙවෙත ආඛ්‍යානයේ වස්තු විෂයය බවට පත් වන්නට ඇත. යථාර්ථවාදී නවකථා ව්‍යාපාරයේ පෙරමුණේ සිටි ශරත්චන්ද්‍රයන් අනුව ගිය තවත් බොහෝ ලේඛකයෝ විසි වැනි සිය වසේ දී තත් ව්‍යාපාරයට එක් වූ හ (ගුහා : 2003 : 12).

පොදුවේ මෙම නවකථාකරුවන් දෙදෙනාම වංග නවකථාව තුළ පොදු ජන යුගය නිර්මාණය කළ බව ශ්‍රීජාත ගුහාගේ අදහසෙහි හරයයි. එහෙත් තාගෝර් ජනප්‍රිය තලයේ ප්‍රබන්ධය ඉක්මවමින් බෙංගාලි පුනරුදයේ හා ඉන්දියානු නිදහස් සටනේ චින්තනමය හා ප්‍රායෝගික කටයුතුවලට ගැඹුරු සාහිත්‍යයික හා දේශපාලන බලපෑමක් ඇති කළ නවකථාකරුවෙක් විය

මෙය වර්තමානයේ අප විසින් ඉතාමත්ම දැඩි ලෙස අවධානයට ලක් කළ යුතු තත්වයකි. මන්ද යත්, ටෝල්ස්ටෝයි, ඩොස්ටයෙවුස්කි, ගෝර්කි, රුසියන් විප්ලවය සමඟ දැක්වූ සබඳතාව අධ්‍යයනය කිරීමට වඩා වැඩි දේශපාලන, සංස්කෘතික වැදගත්කමක් තාගෝර්ගේ නවකථාව බෙංගාලි පුනරුදයට දැක්වූ සම්බන්ධය අධ්‍යයනය කිරීමෙන් අපට ලැබෙන නිසාය.

තාගෝර්ගේ චතුරංග, බිමාලා (සරේ බයිරේ ඉංග්‍රීසි – *The Home and the World*) 'සිව්රඟ රැඟුම' වැනි නවකථා ඍජුවම බෙංගාලි පුනරුදයට සම්බන්ධයක් දක්වයි. ටෝල්ස්ටෝයිගේ නවජීවනය (Resurrection), ඩොස්ටයෙවුස්කිගේ අපරාධය හා දඬුවම (Crime and Punishment), යක්ෂයෝ (Devils), ගැරහුම් අවමන් ලැබුවෝ (Insulted and Humilated), පාතාල ලෝකයෙන් සටහන් (Notes from underground)[6] ආදී නිර්මාණ රුසියන් විප්ලවය සමඟ බැඳෙන්නේ ඒකාකෘතිකවම නොවේ. ගෝර්කිගේ 'අම්මා' රුසියන් විප්ලවය පිළිබඳ ඍජුවේ සාකච්ඡා කරන කෘතිය වුවත් යථෝක්ත කෘති රුසියන් විප්ලවය සමඟ ගොඩනගන සම්බන්ධය 'අම්මා' කෘතියට වඩා සංකීර්ණය. ගැඹුරුය. සමීපය. ටෝල්ස්ටෝයිගේ දෘෂ්ටිය හා ඩොස්ටොයෙවුස්කිගේ දෘෂ්ටිය මෙන්ම කලාත්මක විධි ක්‍රම අතර විශාල වෙනස්කම් පැවතුණු නමුදු පොදුවේ ඔවුහු විප්ලවය උදෙසා මහා ආධ්‍යාත්මික ජීවිතයක් නිර්මාණය කළෝය. තාගෝර්ගේ නවකථා සහ බෙංගාලි පුනරුදය ඉන්දියානු නිදහස් සටන අතර ඇති සම්බන්ධය වටහාගත යුත්තේ රුසියන් නවකථාව විශේෂයෙන්ම ටෝල්ස්ටෝයි හා ඩොස්ටයෙවුස්කිගේ නවකථාව රුසියන් විප්ලවය සමඟ දක්වන සංකීර්ණ සම්බන්ධය සලකා බලමිනි. තාගෝර් වරෙක ටෝල්ස්ටෝනියානු ප්‍රවේශයක් ගන්නා අතර තවත් වරෙක ඩොස්ටයෙවුස්කියානු ප්‍රවේශයක් ගන්නා බව අපගේ මතයයි.

තාගෝර්ගේ ගුඪවාදය ඉන්දියානු වාස්තවික යථාර්ථයේම කොටසක් යැයි අපි සඳහන් කළෙමු. ඩොස්ටයෙවුස්කිගේ නවකථාවල එන මානව සංවේදනා තුර්ගිනීව්ගේ හෝ ටෝල්ස්ටෝයිගේ නවකථාවල එන සෞන්දර්ය වර්ණනා රුසියන් යථාර්ථයේම කොටසක් - අවියෝජනීය කොටසක් වන්නා සේම තාගෝර් ඔහුටම අනන්‍ය බෙංගාලි කවි සමයක් නවකථාව තුළ නිර්මාණය කළ බව පෙනේ. බිමාලා නවකථාව ආරම්භ වන මෙම ඡේදය උදාහරණ ලෙස සලකා බැලිය හැකිය.

> මැණියනි, ඔබගේ කෙස් වැටිය දෙ පසට වෙන් කරනු ලබන ස්ථානයෙහි තැවරූ රක්ත වර්ණ ලතු සලකුණ ද, ඔබ නිරතුරු ව සැරැසී සිටීමට හුරුපුරුදු ව සිටියා වූ රක්ත වර්ණ පුළුල් වාටිය සහිත සාරිය ද, ගැඹුරු බවකින් හා සන්සුන් බවකින් යුක්ත වන ඔබ ගේ චමත්කාරජනක දෑස ද අද මෙසේ මගේ මතකයට ඇදී එයි. මගේ ජීවන ගමන ආරම්භයේ උදා අරුණලු දහරක් සේ ඒවා එසේ පැමිණියේ මගේ ඉදිරි ගමනෙහි දී මා මෙහෙයවා ඉදිරියට කැඳවා ගෙන යෑමට ඉවහල් වන රන්මුවා මාර්ගෝපකරණ රැසක් මට ප්‍රදානය කරන්නාක් මෙනි (තාගෝර් ඃ 2003 ඃ 17).

කාව්‍යාත්මක යන විශේෂණයෙන් බහුලව හැඳින්වෙන මෙබඳු උපමා, රූපක, විශේෂණාදිය බහුල නවකථා කවි සමයක් තාගෝර් නවකථාව තුළ නිර්මාණය කළේය. එහෙත් ඔහුගේ ගද්‍යමය නැඹුරුවක් සහිත කාව්‍ය නිර්මාණ බොහෝ විට බටහිර කවීන්ගේ සහ පැරණි සංස්කෘත කවීන්ගේ පොහොසත් භාෂාත්මක සළුපිළි සමඟ සසඳන විට අර්ධ ගද්‍යමය වාර්තාමය දිගු ඡේද වූ ආකාරය පහත උදාහරණයෙන් පෙනීයයි.

> අප ගේ ස්වාමියා කම්කරුවෙකි
> අපි ඔහු හා සමඟ වැඩ කරමු
> ඔහු ගේ ප්‍රීතිය සෝෂාකාරී යත
> අපි ඔහු ගේ සිනාව හා සමඟ සිනාසෙමු
> ඔහු තම බෙරය වයයිත අපි ඒ අනුව
> පෙළපාළියෙහි ගමන් කරමු
> ඔහු ගයයිත අපි ඒ ගැයුමේ තාලයට අනුව රඟමු

ජීවිතය හා මරණය ඔහු ගේ ක්‍රීඩාව යිත
අපි අප ගේ සුඛ දුක්ඛ වේදනා ඔට්ටුවට තබා
ඔහු හා සමඟ ක්‍රීඩා කරමු
මේගැජුමක් සේ ඔහු ගේ ඇමැතුම පැමිණෙයිත
මහා සමුද්‍රයන් ද කඳු වැටි ද තරණය කරනු පිණිස
අපි පිටත් ව යන්නෙමු (තාගෝර් : 2010 : 73).

යථෝක්ත උපුටා ගැනීම් සංසන්දනය කර බලන විට පෙනී යන්නේ තාගෝර්ගේ කාව්‍ය නිර්මාණ ගද්‍යමය නිර්මාණ සම්ප්‍රදායක වැඩුණු අතර නවකථා පද්‍යමය සම්ප්‍රදායක වැඩුණු බවයි. එහෙත් සෑම අවස්ථාවක ම එසේ නොවුණු බව තාගෝර්ගේ විවිධ නිර්මාණවල භාෂා පරිහරණය විමසා බැලීමේ දී නිරීක්ෂණය කළ හැකිය. නිදසුනක් ලෙස කෙටිකතාවේ දී වහර හා ආඛ්‍යාන රටාව නවකථාවට හා කවියට අතරමැද ස්ථානයක් අත්පත් කර ගත්තේ යැයි පෙන්වා දිය හැකිය. උදාහරණයක් ගෙන බලමු.

> අපේ කථාව ඇරඹෙන්නේ මෙවැනි දවසකය. එදා දවස පුරාම මහවැහි ඇදහැළී තිබිණ. සුදු පැහැ වලාකුළු කිසිවක්, අහසේ දක්නට නොවීය. සුසුමක් හෙළන තරමේ සුළඟක් හැමුවේ ද නැත. නියඟට මැළැවී තිබූ වල්ගස් හා පඳුරු, වැස්සෙන් පණ ලබා හිස ඔසවා ඇත. වැසිජලය එකතුවූ ජූට් වතුවලින් හා, තෙත් වගාබිම්වලින් නැඟුණේ නැවුම් පුස්ගඳකි. එය මුළු ගම වටාම පැතිරෙමින් තිබිණ. හරක්මඩුව පිටිපස වතුර වළේ, මැඩියන් නැඟූ හඬ සහ පළගැටියන්ගේ නාදය, අහස්කුස සිසාරා පැතිර ගියේය (තාගෝර් : 2008 :248).

තාගෝර් තම නිර්මාණ තුළ ඉතාම කර්කශ දේශපාලන යථාර්ථය සාකච්ඡා කළේය. උපමා, රූපක, සංකේත එකවරම අතහැර නග්න බසින් කල්කටාවේ වීථියට බැස විප්ලවීය ව්‍යාපාර පිළිබඳ සාකච්ඡා කිරීමට තාගෝර් මැළි වූයේ නැත. ලංකාව තුළ තාගෝර් ව්‍යාජ සෞන්දර්ය පිණ්ඩයක් කිරීමට එරෙහිව මෙම යථාර්ථය සාකච්ඡා කළ යුතුය. මේ සඳහා හොඳම උදාහරණය වන්නේ ගරියස් සුරනිමල තෙන්නකෝන් මුදලිගේ සිංහලට පරිවර්තනය කළ තාගෝර්ගේ *Four Chapters* නවකථාවයි. සිව්රඟ රැඟුම නමින් සිංහලෙන් පළ වූ එම නවකථාව ඇරඹෙන්නේ මෙසේය.

> ස්ථානය කල්කටාවේ තේ කඩයකි. එහි එක් පසෙකින් ඇති කුඩා කාමරයේ පාසල් පෙළ පොත් ටිකක් විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබා ඇත. මෙයින් බොහොමයක් පරණ ඒවාය. මෙම පොත් අතර නවීන යුරෝපයේ කතන්දර හා නාට්‍යවල ඉංග්‍රීසි පරිවර්තනයන් විය. පාසල් ළමයි මෙම පොත් පෙරළ පෙරළා බැලුවත් කඩය අයිති විශ්‍රාමික උප පොලිස් පරීක්ෂක කනායි ගුප්ත කිසිම විරෝධතාවක් දැක්වූයේ නැත.
>
> තමන්ට අවශ්‍ය පරිදි නිදහසේ තේ බීමට කැමති වන්නා වූ අය වෙනුවෙන් එහි කොටසක් ගෝණි ගසා වෙන්කර තිබුණි. එදිනෙදා සූදානම් කර තිබූ විශේෂ ආහාර පාන කවරේදැයි මෙම කොටසෙහි දැන්වීම් පුවරුවක සඳහන් වීය. ඉඳගැනීමට ඇති ආසන මදිකම සපුරා ගැනුණේ විවිධ වර්ගයේ ''ඩාර්ජිලිං තේ'' යයි ලකුණු කෙරුණු පෙට්ටිවලින් ය. තේ බොන කෝප්පවල ද සාමානත්වයක් නොතිබුණි. නිල් එනමල් කෝප්පවලට අමතරව සුදු පෝසිලේන් කෝප්ප ද ඒ අතර විය. මේසය මත අඬුව බිඳුණු බඳුනක මල් පොකුරක් තබා තිබුණි (තාගෝර් : 2008 : 13).

ඩොස්ටයෙවුස්කිගේ 'මළගෙයක සටහන්', ගෝර්කිගේ 'අම්මා' වැනි කැරලිකාරී, සිපිරිමය චරිත කේන්ද්‍ර කොට ගත් නවකථාමය ආරම්භයක් මෙම නවකථාවට තිබේ. බෙංගාලි මධ්‍යම පන්තියේ ගෘහීය සීමා එකවරම බිඳ දමන තාගෝර් බෙංගාලි තරුණ කැරලිකාරීත්වයත් සමඟ ඉතාමත්ම විශිෂ්ට ලෙස ඒකාත්මික වෙයි. අධ්‍යාපනය ලැබුව ද සුදුසු වෘත්තිය හිමි නොවීම, කැරලිකාරීත්වය, පොලිස් ලුහුබැඳීම් මෙම නවකථාව තුළ දැකිය හැකිය. ඉන්දීය නිදහස් අරගලයේ මතුපිට මහා අවිහිංසාවාදී ආඛ්‍යානය සමඟ ප්‍රතිබද්ධව සිටිය ද ජනප්‍රිය කතිකාවට පිටින් මතු වූ අභ්‍යන්තරික ප්‍රතිවිරෝධතා සහ කැරලිකාරීත්වයේ පසුබිම ඉතාමත්ම යථාර්ථවාදීව නිරූපණය කිරීමට තාගෝර් සමත් වූ ආකාරය පහත ඡේදයෙන් පෙනෙයි.

> වෙනත් රටකදී ඔහුට පිළිගැනීමක් හෝ ගෞරවයක් ලබා ගැනීමට හැකිවුවත් තමන්ගේ රටේදී උසස්වීමට සිහින මැවීම තේරුමක් නොමැති දෙයක් බව ඉන්ද්‍රනාත්ට තදින් අවබෝධ විය. රාජකාරියේ නියුතු කාල සීමාවේ අවසානය දක්වා ඉගැන්වීමේ ඒකාකාරී නීරස කාර්යයේ යෙදී සිට, අනතුරුව ලැබෙන සුළු විශ්‍රාම වැටුපෙන් අවසානය දක්වා තම ජීවිතය සරි කර ගැනීමේ දඬුවමට ඔහු ලක් වූයේ ය. ඔහුගේ හැකියාවන් මෙසේ ගණිකා වෘත්තියේ යෙදවීමට ඔහු කිසිසේත් එකඟ වූයේ නැත. අවසානයේ ඔහු ප්‍රංශ හා ජර්මන් භාෂාවන් ඉගැන්වීමට කුඩා පන්තියක් ආරම්භ කර ඊට අමතරව විද්‍යා සිසුන්ට උද්භිද විද්‍යාව හා භූ විද්‍යාව ඉගෙනගැනීමට උදව් කළේය. ඔහුගේ මේ කුඩා ආයතනයේ පතුලේ වූ සිදුරක රහස් අරමුණක් පෙරදැරි කරගත් බීජයක් රෝපණය වන්නට විය. එහි සැඟවුණු අතුරිකිලි බන්ධනාගාර හරහා දේශය පුරා විහිදී ගියේය (තාගෝර් : 2008 : 14).

බෙංගාලි පුනරුදය යන ඓතිහාසික ක්‍රියාවලිය ස්ථිතික ඒකාකෘතික ප්‍රපංචයක් නොව බහුවිධ බහුආකෘතික සංකීර්ණ ක්‍රියාවලියක් බව තාගෝර් ගැඹුරින් අවබෝධ කර ගත්තේය. තමාට අනන්‍ය වූ මධ්‍ය පාන්තික සහලක්ෂණ ගණනාවක් පළ කළ ද හෙතෙම තමා පන්තිමය සීමාවෙන් ඔබ්බට තම දෙනෙත විහිදුවීමට සමත් වෙයි.

ඩොස්ටයෙවුස්කිගේ මනුෂ්‍යත්ව සංකල්පය අරාජිකවාදය, හිංසනය සහ විකෘතිය සමඟ අත්වැල් බැඳගෙන පැමිණියාක් මෙන්ම තාගෝර්ගේ දේශපාලන විඥ්ඥාණය හා දෘෂ්ටිවාදය ඉන්දියානු සෞන්දර්ය ආකෘතියක තැන්පත්ව සිට පැමිණියේය. ලාංකීය සාහිත්‍ය කතිකාව තුළ කවරදාකටවත් වඩා මේ මොහොතේ තාගෝර් වලංගු ඒ නිසාවෙනි. තරුණ කැරලි ගණනාවක් ඇති වූ රටක සිවිරඟ රැගුම එතරම් ඉස්මතු නොවූ නවකථාවක් වන්නේ ඇයි ද යන්න මෙහි දී අප විසින් නැඟිය යුතු ප්‍රශ්නයකි.

බිමාලාහි බිමාලාගේ කතාව ඊවා ලූනා නවකථාවට[7] වඩා ඇතැම් විට අපේ රටේ කාන්තාවට වැදගත්ය. බිමාලා සන්දීප් බාබුට ප්‍රේම කරන්නේ ගූඪ ආදරයක් තුළය. එම ගූඪත්වය මනුෂ්‍යත්වයේ අනුරාගයේ සහ දෑ හිතකාමී දේශපාලනයේ අපූර්ව සම්මිශ්‍රණයකි. බිමාලාගේ කතාව නමැති පරිච්ඡේදය මෙහි දී උදාහරණ ලෙස පෙන්වා දිය හැකිය.

> ''ස්වදේශීය ව්‍යාපාරය පිළිබඳ ව දේශනා පැවැත්වීමට සන්දිප් බාබු අප ගේ අසල්වැසි ප්‍රදේශයට පැමිණියේ මේ කාලයෙහි දී ය.
>
> අප ගේ දේවාල ශාලාවෙහි විශාල රැස් වීමක් පැවැත්වීමට නියමිත ය. තිර පටක්

මුවාවෙහි එක් පසෙකින් කාන්තාවෝ වාඩිගෙන සිටිති. වන්දේ මාතරම්... ගීය ගැයෙන ජයග්‍රාහී හඬ වඩාත් ළං ළං ව ඇසේ: එය අසීමෙන් මගේ මුළු ආත්මය ම උද්දාමයෙන් පිරී යයි. තලප්පා පැළැඳ ගත්, පා වැසුම් නොමැති, තවුසන් අඳින ආකාරයේ පඬු පැහැ වතින් සැරසුණු, ප්‍රවාහයක් බඳු තරුණ පිරිසක්, ප්‍රථම වර්ෂාවත් සමඟ, වියැළුණු ගං පතුලකට වදිනා මඩ දිය පාරක් සදිසි ව සතරැස් මිදුල වෙත හදිසියේ වේගයෙන් පැමිණෙති. මුළු සතරැස් භූමිය ම සෙනෙඟින් පිරී යයි. තරුණයන් දහයක හෝ දොළහක හෝ උර හිස් මත රැඳුණු විශාල පුටුවක් මත වාඩි කරවූ සන්දිප් බාබු ඒ මැදින් ඔසවා ගෙන යනු ලබයි.

වන්දේ මාතරම්! වන්දේ මාතරම්! වන්දේ මාතරම්! ආකාශ ගර්භය පැළී විවර ව කුඩා කැබලිවලට කැඩී යන්නාක් මෙන් දිස් වෙයි.

මින් පෙර මම සන්දිප් බාබු ගේ ඡායාරූපය දක ඇත්තෙමි. මා කිසි සේත් නොකැමැති වූ යම් කිසිවක් ඔහු ගේ මුහුණුවරෙහි විය. ඔහු විරූපියකු නොවූ අතර එයට හාත්පසින් ම වෙනස් වූ කදිම කඩවසම් මුහුණක් ඔහු සතු විය.

(තාගෝර් : 2003 : 36 පිටුව)

සන්දීප් බාබුගේ චරිතය ක්‍රමයෙන් බිමාලාගේ චින්තනමය ලෝකය වෙවුළුවාලීමට සමත් වෙයි. එය තාගෝර් නිර්මාණය කරන්නේ සන්දීප්ගේ කතාව, නිඛිල්ගේ කතාව හා බිමාලාගේ කතාව ආදී වශයෙන් වරින් වර විවිධ භූමිකා තුළට ආරූඪව ගැඹුරින් කිමිදෙමිනි. නූතනත්වය පිළිබඳ රුසියන් මහ නවකථාකරුවන් දෙදෙනා (ඩොස්ටයෙවුස්කි හා ටෝල්ස්ටෝයි) පළ කළ සංකීර්ණත්වය තාගෝර්ගේ නවකථාවලින් ද පළ වෙයි. එය තාගෝර්ට හිමි මධ්‍යම පාන්තික භූමිකාව යටතේ උස් පහත් වෙමින් ගමන් කරයි.

'සිව්රඟ රැඟුම්' (Four Chapters) නවකථාව බිමාලාට වඩා වෙනස් ප්‍රවේශයක් ගත්ත ද තේමාත්මකව බිමාලා ස්පර්ශ කරන ලද අත්දැකීම් කලාපයම ස්පර්ශ කරන්නකි. මෙම කුඩා නවකථාව අපට සිහිපත් කරන්නේ ඩොස්ටොයවුස්කිගේ සැහෙන දීර්ඝ කෙටිකතාවක් වන හදවතේ ගීතය සහ ඔහුගේ ප්‍රථම නවකථාව වන 'අසරණ මිනිස්සු'ය. තාගෝර්ගේ සිව්රඟ රැඟුම් එම කෘතිවලට වඩා වෙනස්ව දේශපාලන යථාර්ථයක් එනම් කැරලිකාරී ව්‍යාපාරයක එල්බගනී. එහෙත් මානව ප්‍රේමය ගූඪ හා විවෘත ලෙස එම කැරලිකාරීත්වය තුළ ගැඹුරින් ක්‍රියාත්මක වෙයි.

බෙංගාලි පුනරුදය හා තාගෝර්ගේ නවකථා භූමිකාව මේ අයුරින් අතිශයින්ම සංකීර්ණ ගැඹුරින් සාකච්ඡාවට ලක් විය යුතු එකකි. එම සාකච්ඡාව විවිධ කැරලි කෝලාහලවලින් හා ආධ්‍යාත්මික කම්පනයන්ගෙන් බැට කෑ මෙරට විචාරශීලී පාඨකයාට අතිශයින්ම වැදගත් අත්‍යවශ්‍ය එකකි. එහෙත් මෙතෙක් එවැන්නක් අප අතරින් නිර්මාණය නොවීමෙන් පෙනී යන්නේ බෙංගාලි පුනරුදය හා තාගෝර්ගේ දායකත්වය වෙත දිගින් දිගටම දැක්වූ නොසැලකීමයි.

**ප්‍රථම කොටසේ සමාලෝචනය**

මේ කොටසින් මා අපේක්ෂා කළේ බෙංගාලි පුනරුදය හා ඉන්දියානු ජාතික අරගලය තුළ තාගෝර්ගේ භූමිකාව කෙටියෙන් සඳහන් කිරීමයි. මෙහි දී විශේෂයෙන්ම, ලේඛකයකු වශයෙන් ඔහුගේ භූමිකාව යථෝක්ත පුනරුද ක්‍රියාවලිය වෙත දැක්වූ දායකත්වය විමසුණු අතර තාගෝර් පිළිබඳ නිර්මාණය කර තිබූ අවිචාරී ගූඪවාදය විශ්ලේෂණය කිරීමේ උත්සාහයක නිරත වුණි.

## II

තාගෝර්ගේ බලපෑම ලංකාවට ලැබුණු ආකාරය පිළිබඳ කෙටියෙන් සාකච්ඡා කිරීම මෙහි අරමුණයි. ඒ සඳහා ලාංකීය උගතුන් තාගෝර් පිළිබඳ සිදු කළ විවිධ කියවීම් කෙටියෙන් සඳහන් කරමින් සාකච්ඡාව ගොඩනගමු.

බෙංගාලි පුනරුදය හා ඉන්දියානු ජාතික ව්‍යාපාරය සමග සංසන්දනය කර බලන විට එබඳු පුළුල් ජාතික ජාත්‍යන්තරවාදී චින්තන බීජයක් මෙරට දී ශක්තිමත් දේශපාලන ව්‍යාපාරයක් බවට පත් නොවීය. එහෙත් 56 පෙරළිය සිදුවීමට පෙර එබඳු ශක්තිමත් චින්තන අණුවක් අප අතර මැනවින් වැඩුණු බව අඟවන සාක්ෂි නිරීක්ෂණය කළ හැකිය.

මාර්ටින් වික්‍රමසිංහ, එදිරිවීර සරච්චන්ද්‍ර, උඩකැන්දවෙල සිරි සරණංකර, පියල් සෝමරත්න, ජස්ටින් විජයවර්ධන, සුගුණපාල සමරසිංහ, කුසුම් දිසානායක, එල්.ටී. මංජු ශ්‍රී, නන්ද ජී. හේමන්ත, ජිනසෝම වීරසූරිය, ඩබ්.එම්. ගුණතිලක, චින්තා ලක්ෂ්මීසිංහාරච්චි, සුනිල් විජේසිරිවර්ධන, ආනන්ද අමරසිරි,[8] එරික් ඉලයප්පආරච්චි, ඒ.එම්.ජී. සිරිමාන්න, පී.බී. අල්විස් පෙරේරා, මහගමසේකර, ඊ.තෙන්නකෝන්,[9] අනඳපිය කුඩාතිහි, පී. නිශ්ශංක[10] ආදී විවිධ ලාංකීය පිරිස්වල අවධානය තාගෝර් වෙත ලැබී තිබේ. එය නිරීක්ෂණය කළ හැක්කේ ඔවුන්ගේ ලිපි ලේඛන හා පරිවර්තන ලේඛන පිරික්සා බැලීමෙනි (මේ ලිපි සංග්‍රහයේ එන තාගෝර්ගේ කෘතිවල සිංහල පරිවර්තන පිළිබඳ ලේඛනය ද බලන්න - සංස්කාරක). ලලිතකලා පක්ෂයෙන් ශාන්ති නිකේතනයේ ආභාසය තවත් විශාල පිරිසකට ලැබුණු බවට සාක්ෂි ඇතත්, මෙම ලිපියේ දී අවධානය යොමු වන්නේ තාගෝර් පිළිබඳ සඳහන් වන ලිපි ලේඛන කීපයක් ගැන පමණි.

1913 දී පළ කළ 'ඇත්ත යුත්ත' යන ලිපි සංග්‍රහයේ 'ජාතිකවාදය හා ජාත්‍යන්තරවාදය' යන තේමාව යටතේ මාර්ටින් වික්‍රමසිංහ පළ කළ ලිපියේ 56 ට පෙර ක්‍රමයෙන් නිර්මාණය වෙමින් පැවති පුළුල් චින්තන අණුවක බිංදු මාත්‍රයක් දැකිය හැකිය. ආනන්ද කුමාරස්වාමි වැනි උගතුන්ගේ රචනාවල එය වඩාත් දීප්තිමත්ව දැකිය හැකි වුව ද 56 ක්‍රියාවලිය එම චින්තන අනුවේ වර්ධනය මුළුමනින්ම නවතාලූ අවස්ථාවක් වීම වැළැක්විය නොහැකිය. තාගෝර්ගේ බලපෑම ලාංකීය ප්‍රබුද්ධත්වය නියෝජනය කළ තරුණ පෙළට ප්‍රථමයෙන් ලැබුණු ආකාරය මැනවින් කියාපාන ලිපි මාලාවක් ලෙස එදිරිවීර සරච්චන්ද්‍ර යාපනයේ පළ වූ *Kesari People's Weekly* පුවත්පතට 1942 ජූලි 31 සිට අගෝස්තු 31 දක්වා ලියූ ලිපි මාලාව සැලකිය හැකිය. 2001 සුචරිත ගම්ලත් විසින් සිංහලට පෙරළන ලදුව ගොඩගේ ප්‍රකාශකයන් විසින් පළ කෙරුණු මෙම ලිපි එකතුව පැරණි පුවත්පත් අතරින් සොයා ගන්නා ලද්දේ ඉයන් ගුණතිලක විද්වතාණන් විසින් බව පරිවර්තකයා තම 'වචන කිහිපයක්' නම් පෙරවදනේ දී සඳහන් කරයි.

තමා ශාන්ති නිකේතනයට යෑමත් එහි ගත කළ ජීවිතයත් සරච්චන්ද්‍ර මෙම ලිපි මාලාවේ දී විස්තර කරයි. සරච්චන්ද්‍රගේ මෙම විස්තරය ඔහුගේ ජීවිත කතාව ලෙස සැලකිය හැකි **පිං ඇති සරසවි වරමක් දෙන්නේ** කෘතියේ එන විස්තර සමඟ ද ගළපා අවබෝධ කර ගත හැකිය. තාගෙ ා්ර් එවකට (30, 40 දශකවල) ලාංකීය ධනපති පංතියේ අතළොස්සක් ප්‍රබුද්ධයින් වෙත දැක්වූ ආකර්ෂණයෙත් තාගෝර්ගේ ශාන්ති නිකේතනය අධ්‍යාපන රටාව ඔවුන් වෙත කළ බලපෑමත් මෙහි දී පැහැදිලි වෙයි. මේ වන විට බෙංගාලි පුනරුදය ඔස්සේ ලෝකය දෙස බැලීමට මෙරට වාමාංශිකයන් පවා පෙළඹී සිටි ආකාරය නිරීක්ෂණය කළ හැකිය. ඉන් මෙරට සමසමාජ නායකයන් ඉන්දියාව සමඟ සම්බන්ධ වූ ආකාරයත් පක්ෂ නිර්මාණය කළ ආකාරයත් සම සමාජ ඉතිහාසය තුළ සඳහන් වෙයි. කොමියුනිට්ස් පක්ෂයේ ආරම්භක හිතවතකු වූ උඩකැන්දවෙල

සරණංකර හිමි ශ්‍රේෂ්ඨ රුසියන් ගත්කරුවකු වූ ඇලෙක්සැන්ඩර් පුෂ්කින්ගේ කපිතාන්ගේ දියණිය පොත සිංහලට පරිවර්තනය කොට ඇත්තේ රුසියන් හෝ ඉංග්‍රීසි බසින් නොව වංග බසිනි. පියදාස සිරිසේනට කල්කටාවේ චින්තන ව්‍යාපාරයේ ආභාසය නොලැබුණ ද බෙංගාලි පුනරුදයේ එක් පක්ෂයක් වූ දේශීය කර්මාන්ත හා ධනපති පංතියක් නිර්මාණය කිරීමේ අදහස ඔහුගේ නවකථාවල මුඛ්‍ය හරය ලෙස ගැබ් වේ (*Sri Lanka : Collective Identities Revisited - II)* ලිපි සංග්‍රහයට ආචාර්ය සරත් අමුණුගම ලියූ ජයතිස්ස හා රොසලින් නවකථාව පිළිබඳ ලිපිය මෙහි දී වැදගත්ය). නිසැකයෙන්ම සිරිසේන මේ ආභාසය ලබන්නට ඇත්තේ අනගාරික ධර්මපාලතුමාගෙන් විය හැකිය. අධිරාජ්‍යවාදීන් අනුකරණය කළ පංතිය, ශාන්ති නිකේතනය අධ්‍යාපනය විහිළුවක් ලෙස සැලකූ බව පෙනේ. සරච්චන්ද්‍ර තම ප්‍රථම විවාහයේ දැවැද්දට ලැබුණු මුදලින් ශාන්ති නිකේතනයට යන විට ඔහුගේ ඥාතීන් එය නිෂ්ප්‍රයෝජන ගමනක් සේ සලකා එයට එරෙහි වූ ආකාරය 'පිං ඇති සරසවි වරමක් දෙන්නේ' කෘතියෙහි සඳහන් කරයි.

ශ්‍රීපාලිය සඳහා මුල්ගල තැබීමට තාගෝර් මෙරටට පැමිණීම බොහෝ තරුණයන් තුළ විශාල ප්‍රබෝධයක් ඇති කළ බව පෙනේ. තාගෝර්ගේ 'ශාප්මෝචන්' නාට්‍ය පිළිබඳ එවකට ජනප්‍රිය දේශපාලනඥයකු වූ ඇස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක විවේචනයක් ලිවීම මේ ජනප්‍රියතාවයේ ප්‍රතිඵලයක් වන්නට ඇත.

ශාන්ති නිකේතනයට ගිය ලාංකිකයන් චිත්‍ර කලාව, මුද්‍රා නාට්‍යය හා නර්තනය පිළිබඳ එයින් ලද ආභාසය වික්‍රමසිංහ තම 'Tagore and Ceylon' නමැති ලිපියේ සඳහන් කරයි. මේ ලිපිය වික්‍රමසිංහගේ විචාර චින්තනය හෙළි කරන්නක් ලෙස පමණක් නොව තත් යුගයේ ඉතිහාසය පිළිබඳ ලේඛකයෙක් ලෙස ද වැදගත්ය.

වික්‍රමසිංහ තාගෝර් දර්ශනය හා කාර්යභාරය පිළිබඳ විග්‍රහයක් කරයි. 56ට පෙර වික්‍රමසිංහ වර්ධනය කළ ජාතිකවාදී ජාත්‍යන්තර ලිබරල් ආස්ථානය මෙම ලිපියේ විශිෂ්ට ලෙස ඉස්මතු නොවේ. එහෙත් උපනිෂද්, බෞද්ධ, ජෛන ආගම්වල හර පද්ධතීන් අතර සමානකම හා පොදු මානවීය එකඟතාව යන සාධක ගවේෂණයේ දී මෙම ලිපිය වැදගත් න්‍යායික මැදිහත්වීමකි. තාගෝර් නූතන හින්දු දහමේ ආයතනික ක්‍රියාකාරිත්වයට එකඟ නොවී එහි හරය පමණක් පිළිගත් බව පවසන වික්‍රමසිංහ ඒ සඳහා 'රබීන්ද්‍රනාත් තාගෝර්' යන මැයෙන් මහාචාර්ය ලෙස්නි ලියූ ලිපියක් ගෙනහැරපායි. වික්‍රමසිංහගේ තාගෝර් කියවීම තාගෝර්ගේ ටෝලස්ටෝනියානු පක්ෂය මතු කරන්නකි. ආගමික සංවිධාන නමැති කුරිරු ව්‍යුහයට එරෙහිවුණු ටෝල්ස්ටෝයි කිතු දහමේ හරය මත පදනම් වෙමින් මානවවාදී චින්තන ප්‍රවේශයක් නිර්මාණය කර ගත් ආකාරය තාගෝර් ඇගයීමේ දී වික්‍රමසිංහ මත බලපෑම් ඇති කළ බව පෙනේ.

සරච්චන්ද්‍රගේ ශාන්ති නිකේතනයේ ගමන එම ආයතනයේ අධ්‍යාපනික මූලධර්ම හා සංවිධාන රටාව විග්‍රහ කෙරෙතත් තාගෝර්ගේ සාහිත්‍යය පිළිබඳ (වික්‍රමසිංහට මෙන්ම) ඔහුට ද ප්‍රබල උනන්දුවක් හෝ අවබෝධයක් නොතිබූ බව පෙනේ. මෙය අද අප විසින් වැදගත් ලෙස විමසිය යුතු සාධකයක් වන්නේ විසිවන සියවසේ මෙරට විසූ තීරණාත්මක සාහිත්‍ය, සංස්කෘතික ක්‍රියාධරයන් දෙදෙනෙකු වන මේ දෙපොළ තාගෝර් පිළිබඳ හෙලූ දෘෂ්ටිය තාගෝර්ගේ ලාංකීය බලපෑම සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ දී අතිශයින්ම වැදගත් වන බැවිනි.

රුසියන් නවකථා පිළිබඳ දීර්ඝ සංසන්දනාත්මක ලිපි ලියූ වික්‍රමසිංහ තාගෝර්ගේ නවකථා පිළිබඳ අවධානය යොමු නොකරන අතර *Modern Sinhalese Fiction* නමැති පුරෝගාමී නවකථා

විචාර ග්‍රන්ථය ලියූ සරච්චන්ද්‍ර පවා තාගෝර්ගේ ශාන්ති නිකේතනය හා සංගීතය පිළිබඳ මිස නවකථා හා කෙටිකතා ගැන ලියූ බවක් නොපෙනේ.

මෑතක දී (2005 දී) පළ වූ මාර්ටින් වික්‍රමසිංහගේ **මානවහිතවාදය හා එතෙර වියත්හු** ලිපි සංග්‍රහයේ වික්‍රමසිංහ තාගෝර් ගැන සිංහලෙන් ලියූ ලිපි දෙකක් දක්නට ලැබේ. 'පොදු ජනතාවගේ මහා කවියා' යන මාතෘකාව යටතේ ලියවුණු එයින් එක් ලිපියක් 1961 මැයි 08 දිනමිණ පුවත්පතෙහි අතිරේකයකට ලියන ලද්දකි. 'තාගෝර් චරිතයෙන් උගත යුතු පාඩමක්' නමැති තේමාව යටතේ ලියවී ඇති දෙවන ලිපිය 1961 මාර්තු **නවලෝකය** සඟරාවට ලියන ලද්දකි. හරයාත්මක වශයෙන් මේ ලිපි දෙකම අප පෙර සාකච්ඡා කළ 'Tagore and Ceylon' ලිපියට සමානය. වික්‍රමසිංහ මෙහි දී ද තාගෝර්ගේ නවකථා ගැන වදනකුදු සඳහන් නොකරයි. එහෙත් තාගෝර් ලාංකීය ශාස්ත්‍රීය කතිකාවත බලපෑ ආකාරය මැනවින් විශද වන වැදගත් තීරණාත්මක ස්ථානයක් මේ සියලු ලිපි තුළින් නිරීක්ෂණය කළ හැකිය. එනම් ව්‍යවහාරික භාෂා කතිකාව පෝෂණය කිරීමටත්, එය මැනවින් සාධාරණීකරණය කර ගැනීමටත් තාගෝර් වංග භාෂා කතිකාව තුළ ගෙනගිය ජයග්‍රාහී අරගලයයි. පැරණි වංග පඬුවන්ගේ ආචීර්ණ කල්පික භාෂා ආකල්ප පැරදවීමට තාගෝර් ගත් ව්‍යවහාරික භාෂාත්මක පියවර වික්‍රමසිංහ ප්‍රාචීන භාෂා ආධිපත්‍යයට එරෙහිව තමන් මෙරට තුළ දියත් කළ කතිකාව පෝෂණය කිරීමට යොදා ගත් බව පෙනේ.

තාගෝර්ගේ නවකථා, කාව්‍ය නිර්මාණ නූතනවාදය හා එහි බෙංගාලි අනන්‍යතාව වටහා ගැනීම සඳහා භාවිත නොකිරීම මෙම ගුඪත්වය පිළිබඳ සාධකය මතු වන ස්ථානය ලෙස හඳුනාගත හැකිය. ලංකාවේ සාහිත්‍ය විචාරයේ මෙන්ම සංස්කෘතික විචාරයේ ද අනෙක් අතට දේශපාලන සංවාදයේ ද පවතින එක් කැපී පෙනෙන දුබලතාවක් මෙයින් පිළිබිඹු වේ. එනම් බෙංගාලි පුනරුදය පිළිබඳ ඇති බටහිරවාදී නොසැලකීමයි. පුළුල් අර්ථයෙන් අධිරාජ්‍යවාදී චින්තනයේ හා භාවිතයේ ම කොටසක් ලෙස මෙම තත්ත්වය අවබෝධ කර ගත යුතු අතර යුරෝපය, ලිබරල් කතිකාව මතු නොව රුසියාව ඔස්සේ අප වෙත පැමිණි මාක්ස්වාදී, මානවවාදී කතිකාව පවා ඉමහත් ලෙස අගය කිරීමකට ලක්වෙද්දී බෙංගාලි පුනරුදයේ චින්තනමය පාර්ශවය නොසලකා හැරීම ඉතාමත්ම පැහැදිලිව කැපී පෙනේ. මාර්ටින් වික්‍රමසිංහ, එදිරිවීර සරච්චන්ද්‍ර වැනි තාගෝර් පිළිබඳ උනන්දුවක් දක්වූ ප්‍රබුද්ධයන්ගේ ලිපි ලේඛනවල පවා තාගෝර් කැරිස්මාවක් සහිත කේවල චරිතයක් ලෙස අගය කිරීම හැරුණු විට බෙංගාලි පුනරුදයේ සමස්ත කාර්යභාරය සමඟ චින්තනමය සම්බන්ධය විශ්ලේෂණය කිරීමට ගත් උත්සාහය විරලය. මෙම තත්වය පුද්ගල දුබලතාවක් ලෙස වටහා ගැනීමට අපි අපේක්ෂා නොකරමු.

මෙම තත්ත්වය ලාංකීය චින්තනය කියවීම නමැති පුළුල් රාමුව තුළ ස්ථානගත කිරීමට උත්සාහ දරමු. 30, 40 දශකවල මෙරට පැවති අධ්‍යාපන ක්‍රමය තුළ පටු දේශිය අන්තගාමිත්වය හා නග්න අධිරාජ්‍යවාදය යන ද්විත්ව ප්‍රතිපක්ෂවලට එරෙහිව පුළුල් ජාතික හා ජාත්‍යන්තර චින්තනමය නිර්මාණයක් ඉස්මතු නොවූ බව මෙහි දී පැහැදිලි වෙයි. මේ සඳහා තවත් උදාහරණයක් වෙත ගමන් කරමු. ඒ විසිවන සියවසෙහි මෙරට විසූ තීරණාත්මක බුද්ධිමය කාර්යභාරයක් ඉටු කළ රෙජී සිරිවර්ධන තාගෝර් වෙත දක්වූ අවධානය කෙබඳු දැයි විමසීම සඳහාය.

අර්ධ ජීවන චරිතාපදානයක් ලෙස තම ළමා විය හා ශිෂ්‍ය ජීවිතය පිළිබඳව සිරිවර්ධන පළ කළ *Working Underground* ග්‍රන්ථය මෙහි දී අතිශයින් ම වැදගත්ය. බෞද්ධ ක්‍රිස්තියානි දේශීය අධිරාජ්‍යවාදී යනුවෙන් ද්විත්ව ස්වරූපවලින් යුක්ත චින්තන රාමු හරහා තමා ගමන්

කළ ආකාරයත් තමාගේ පියාගේ හා පවුලේ චින්තනයත් එවකට අධ්‍යාපන රටාව තුළ පැවති චින්තනයත් තමාට බලපෑ ආකාරය මෙම ග්‍රන්ථය ඔස්සේ කියවිය හැකිය. සෙන් තෝමස් විද්‍යාලය, ආනන්ද විද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය ඔස්සේ සමසමාජ පක්ෂය තුළට පිවිසෙන සිරිවර්ධන තරුණයා තාගෝර් පිළිබඳ මෙසේ සඳහන් කරයි.

> දාහතරවන වියේ දී මම තාගෝර්ගේ ගීතාන්ජලිය කියවීමි. එය මගේ තාරුණ්‍යයේ රොමැන්ටික්වාදී පිබිදීම චමත්කාරයෙන් පිරවීය. දෙවියන් වහන්සේ විශ්වාස කරමින් සිටි මම පන්සලට ගොස් පන්සිල් ගැනීමට මගේ පියාගෙන් අවසර පැතුවෙමි. එය ඔහු තුළ විශාල කම්පනයක් ඇති කළ අතර ඕනෑම මාදිලියක දේව විශ්වාසයක් ඔහු අතාර්කිකව අහව්‍ය එකක් ලෙස ඉවතට දැම්මේ ඔහුගේ ප්‍රියතම චින්තකයකු වූ ඉන්ග සෝල් හා සෙසු තර්කවාදීන් වෙත තදින් නැඹුරු වූ නිසාය. පාසල (මෙහි දී පාසැල යනුවෙන් සිරිවර්ධන අදහස් කරන්නේ ගල්කිස්ස ශාන්ත තෝමස් විදුහලයි) විසින් මා ක්‍රිස්තියානි ආගමට නැඹුරු කරන ලද බව ඔහු ඒත්තුගෙන තිබුණි. තාගෝර් ඔහුගේ අවබෝධයෙන් බැහැර ව තිබූ සාධකයක් පමණක් විය. කෙටි කාලයකින් මා ශාන්ත තෝමස් විදුහලෙන් අස් කොට ආනන්ද විද්‍යාලයට ඇතුළු කරන ලදී
> (Siriwardhana : 1999 : 7).

*Working Underground* සිරිවර්ධනගේ යථෝක්ත විග්‍රහය එම යුගයේ මධ්‍යම පාන්තික චින්තනය අවබෝධ කර ගැනීම සඳහා අතිශයින්ම වැදගත්ය. ඔහුගේ පියා එම මධ්‍යම පන්තිය නියෝජනය කළ තාර්කික අනුභූතිවාදියෙකි. හෙතෙම සියලු ආකාරයේ දේව විශ්වාසවලට පටහැනිව තර්ක බුද්ධිය ඇදහුවේය. ඉංග්‍රීසි අනුභූතිවාදී චින්තන සම්ප්‍රදාය ඔහු කෙරෙහි විශාල බලපෑමක් ඇති කළ බව පෙනේ. දේව විශ්වාසවලට වඩා යම් තාර්කික ස්වභාවයක් පළ කළ බුදු දහම ඔහුගේ ගෞරවයට ලක් වූ බව පෙනේ. තරුණ වියට එළඹෙමින් සිටි අයකු ලෙස ගීතාංජලී කියවා රොමැන්ටික්වාදය දෙසට ඇති කර ගත් නැඹුරුව උපන්ගෙයිම මිය යාමට හේතු වූයේ තම අධ්‍යාපනය හා පවුල විසින් තමා මත ඇති කරන ලද නැඹුරුව බව රෙජී සිරිවර්ධන අප වෙත ගෙන එන පණිවිඩයේ හරයයි. සරච්චන්ද්‍ර ශාන්ති නිකේතනයට යෑමට ගත් උත්සාය ඔහුගේ පවුලේ සාමාජිකයන් හා මිතුරන් උපහාසයට ලක් කරන්නේත් (සහතික රහිත, වෙළඳපොළ වටිනාකමින් පහළ තත්වයක පවතින) වෙළඳපොළ සාධකය හා ඒ හා සබැඳි අධිරාජ්‍යවාදී ඉහළ මධ්‍යම පාන්තික වටිනාකම් මත පදනම් වෙමිනි. වික්‍රමසිංහ සාධකය මෙහි දී වැදගත් වන්නේ මෙවැනි ව්‍යුහාත්මක බන්ධනවලින් තොරව තාගෝර් පිළිබඳ ලිවීමට ඔහු සතු හැකියාව සැලකිල්ලට ගනිමිනි. මෙයින් පෙනීයන්නේ තාගෝර් හා වංග පුනරුදය පිළිබඳ ලිබරල් ධනේශ්වර කතිකාව තුළ මෙන්ම මාක්ස්වාදී කතිකාව තුළ ද පැවති ආකල්ප නිශේධනාත්මක ස්වරූපයක් ගත් බවයි. එය එක් අතකින් බලාපොරොත්තු විය හැකි පොදු තත්වයකි. මක් නිසාද යත්, දකුණු ආසියාව පිළිබඳ මාක්ස් ලියූ ලිපි ලේඛනවල මූලික හරය වන්නේ ද ඉන්දියාව වැනි රටවල ශිෂ්ටාචාරය ඉතාමත්ම ආර්ථිකවාදී පටු ස්ථානයකින් වටහා ගැනීමක් වෙන නිසාය.[11] බෙංගාලි පුනරුදය වාම නැඹුරුවක් සහිතව විග්‍රහ කර ගැනීමටත්, එය මෙරට වාමාංශික ව්‍යාපාරය තුළ සමාජ සංස්කෘතික බලවේග යක් ලෙස ක්‍රියාත්මක කරවීමටත් පුරෝගාමී මෙහෙවරක් ගත්තේ (අප මෙම ලිපියේ වෙනත් ස්ථානයක ද සඳහන් කළ පරිදි) උඩකැන්දවෙල සිරි සරණංකර ස්වාමීන් වහන්සේය. එහි එක් ප්‍රධාන පියවරක් ලෙස දැකිය හැක්කේ කොමියුනිට්ස් පක්ෂයට සම්බන්ධ 'නවලෝකය' සඟරාව තාගෝර් කලාපයක් 1961 දී පළ කිරීමයි. මීට අමතරව බොහෝ අවස්ථාවල තාගෝර්ගේ පතපොත පළ කිරීමට සක්‍රීය මැදිහත්වීමක උන්වහන්සේ නිරතව සිටි සේක.

තාගෝර්ගේ කෘතියක අනුවාදයක් ලෙස ජිනසෝම වීරසූරිය පළ කළ 'චිත්‍රා' නාට්‍යයේ පෙරවදනේ අනුවාදකයා මෙසේ පවසයි.

> මේ කෙටි නාටක දෙක මා විසින් අනුවාදිත වූයේ මෙයට අවුරුදු හත අටකට පෙර ය. නිසි පරිදි අවසර ලබා ගෙන ම මෙය පළ කරවීමට අදහස් කළ හෙයින් ඒ සඳහා ග්‍රන්ථ ප්‍රකාශකයන්ගේ පිහිට සොයන්නට සිදු විය. මෙය නො ලැබෙන තැන, පොත මුද්‍රණය කරවීමේ අදහස කලකට අත්හැර දමන්නට විය. එහෙත් මෙහි දී ගරු උඩකැන්දවල සිරි සරණංකර හිමිපාණෝ ගම්පහ නව සාහිත්‍ය මණ්ඩලය මගින් මෙය පළ කරවන්නට කැමති වූහ. මෙය මෙසේ එළි දක්වන්නට අවස්ථාවක් සැලසුණේ උන්වහන්සේගේ කරුණා පූර්වක අනුග්‍රහය නිසා ම බව කෘතවේදී ව මෙහි ලා සඳහන් කරනු කැමැත්තෙමි (වීරසූරිය : 1961 : පෙරවදන).

සරණංකර හිමිගේ මැදිහත්වීම වඩාත් සංවර්ධනය කරමින් ඉදිරියට රැගෙන යාමට වාමාංශික ව්‍යාපාරය තුළ භූමිකා නිර්මාණය නොවීම කනගාටුදායකය. එය සමසමාජ - කොමියුනිට්ස් පක්ෂ නියෝජනය කරන සාම්ප්‍රදායික වමට නොව ජවිපෙ ප්‍රමුඛ නව වාම කණ්ඩායම්වලට ද පොදු තත්වයකි. එසේම මෑත භාගයේ සංස්කෘතික ක්ෂේත්‍රයේ බොහෝ ජනප්‍රිය භූමිකා නිර්මාණය කළ පශ්චාත් නූතනවාදී දේශපාලන කණ්ඩායම් තුළ ද බෙංගාලි පුනරුදය හා තාගෝර් පිළිබඳ කතා බහක් නිර්මාණය නොවූ බව නිරීක්ෂණය කළ හැකිය.

කොළඹ කවිය තුළ විශේෂයෙන්ම එහි දෙවන භාගයේ දී තාගෝර්ගේ නිර්මාණවල ආභාසය දැකිය හැකිය. එහෙත් එය ගැඹුරු ආභාසයක් නොව තාගෝර්ගේ නිර්මාණවල මතුපිටට වහල් වීමෙන් සිදු වූ දුර්වල අනුකරණයක් බව නිරීක්ෂණය කළ හැකිය. කොළඹ කවීන් අතර තාගෝර් වෙත වඩාත් නැඹුරු වූයේ පී.බී. අල්විස් පෙරේරා බව නිරීක්ෂණය කළ හැකිය. අල්විස් පෙරේරා තාගෝර්ගේ මරණයෙන් පසු ඔහු වෙනුවෙන් දිගු විරිතක් භාවිත කරමින් පද්‍ය පන්ති දෙකක්ම රචනා කළේය. සිලෝ විරිතට හුරුකම් කියන, ගැයීමේ ප්‍රබල හැකියාවක් සහිත මෙම විරිත 'පැරකුම්බා සිරිත' ආදී ශබ්ද මාධුර්යය ඉහළින් සැලකූ පැරණි කාව්‍ය ග්‍රන්ථවල ද භාවිත කළ සුප්‍රකට තාල රටාවකි. අල්විස් පෙරේරාගේ පද්‍ය පන්ති දෙකෙන් එකක් මීමන ප්‍රේමතිලක සංස්කරණය කළ 'නවීන පද්‍ය රචනා' 1 ග්‍රන්ථයෙහි පළ වූ අතර අනෙක සාගර පළන්සූරිය සංස්කරණය කළ 'පද්‍යාවලී' ග්‍රන්ථයෙහි පළ විය. මේ පද්‍ය පන්ති දෙකම තාගෝර්ගේ නිර්මාණ චින්තනය හෝ ජීවන දහම ගැඹුරින් නොගත් මතුපිට වර්ණනා යැයි සඳහන් කිරීමට සිදු වේ. මන්ද යත් අල්විස් පෙරේරා මේ දෙපැදිපෙළෙන් උත්සාහ ගන්නේ තාගෝර් වෙනුවෙන් සොබා දහම වැළපුණු ආකාරය ගෙනහැර පෑම මිස ඉන් ඔබ්බට විහිදී ගිය ජීවන දර්ශනය ග්‍රහණය කර ගැනීමට නොවේ. එය කොළඹ යුගයේ පොදු ගුණාංගයකට වඩා අල්විස් පෙරේරාගේ කවිත්වයේ පවතින ඔහුටම අනන්‍ය ගුණාංගයක් ලෙස වටහා ගනිමු. අල්විස් පෙරේරා තාගෝර් දෙස බැලූ ආකාරය පිළිබඳ විචාරයක් ඒ.එම්.ජී. සිරිමාන්න, ජී.බී. සේනානායක ප්‍රභාෂණ ලිපි සරණියට ලියූ නූතන සිංහල කවියේ බටහිර ආභාසය ලිපියේ සාකච්ඡා කරයි. එහිලා ඔහු පවසන පහත අදහස තාගෝර්ගේ ලාංකීය බලපෑම මෙහි ස්වරූපය වටහා ගැනීමේ දී වැදගත්ය.

තාගෝර්ගේ චින්තනය හා ජීවන දර්ශනය විශේෂයෙන්ම ඔහුගේ අධ්‍යාපන දර්ශනය ලංකාව වැනි රටක අධ්‍යාපන ක්‍රියාවලියෙහිලා දක්වන වැදගත්කම විශාලය. එහෙත් ඔහු ශාන්ති නිකේතන මාදිලිය අනුව යමින් හොරණ පිහිටුවා ඇති ශ්‍රීපාලි සරසවිය (එය වර්තමානයේ

කොළඹ සරසවියේ එක් මණ්ඩපයක් ලෙස හැඳින්වේ). එම පරමාදර්ශ වඩා දියුණු කිරීමට අපි අපොහොසත් වුණෙමු. වර්තමානයේ මුළුමනින්ම පාහේ සෙසු විශ්වවිද්‍යාලවලට සමාන අධ්‍යාපන පටිපාටියක් එහි ක්‍රියාත්මක වන බව පෙනීයයි. බෙංගාලි පුනරුදයේත්, තාගෝර් චින්තනයේත් එම චින්තනය වෙත නැඹුරු වුණු අතළොස්සක් දේශීය ධනපති පංතියේත් අගනා තිළිණයක් වූ ශ්‍රීපාලිය පිළිබඳ විමර්ශනයක අවශ්‍යතාව අප ඉදිරියේ තිබේ. එහෙත් එය මෙබඳු ලිපියක දී කිරීමේ අවකාශය අප සතු නොවේ).[12]

තාගෝර්ගේ අධ්‍යාපනික අදහස් පිළිබඳ සාධනීය, වඩාත් විචක්ෂණ සාකච්ඡාවක් හැට (60) දශකය මැද භාගයේ මෙරට නිර්මාණය වූ බව පෙනේ. ඒ 1965 ඔක්.-දෙසැ. පළ වූ සංස්කෘති විශ්වවිද්‍යාල අංකය තුළය. විසිවන සියවසේ මෙරට විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳ දියත් වූ වඩාත් ප්‍රබුද්ධතම සාකච්ඡාවක් වන මෙම සාකච්ඡාවේ එක් ලිපියක් රචනා වී ඇත්තේ 'තාගෝර්ගේ අධ්‍යාපනික අදහස් සමහරක්' යනුවෙනි (මේ ලිපි සංග්‍රහයේ එය නැවත පළ කර ඇත).

විශිෂ්ට සිනමා විචාරකයකු මෙන්ම විචක්ෂණ ලේඛකයකු වූ පියල් සෝමරත්න ලියූ එම ලිපිය තාගෝර්ගේ ලාංකීය බලපෑම විමර්ශනය කිරීමේ දී අතිශයින්ම වැදගත් රචනාවකි. අල්විස් පෙරේරාට සාපේක්ෂව පියල් සෝමරත්න තාගෝර්ව ගැඹුරින් ග්‍රහණය කර ගැනීමට සමත් වන ආකාරය එම ලිපිය කියවීමෙන් නිරීක්ෂණය කළ හැකිය. මීට අමතරව එම විශ්වවිද්‍යාල අංකයේ අග සඳහන් කර ඇති (සටහන්) නම් ප්‍රායෝගික න්‍යායාත්මක විවරණයේදී කැප වූ ලේඛකයා (Commited Writer) යන සංකල්පය යටතේ ඇතුළත් කළ හැකි ලේඛකයන් උදාහරණ වශයෙන් පෙන්වා එහි තාගෝර්ගේ නම ද සඳහන් කොට ඇත.

'තාගෝර්ගේ අධ්‍යාපනික අදහස් සමහරක්' යන මැයෙන් පියල් සෝමරත්න ලියා ඇති ලිපියේ ආරම්භය මෙසේය. (එම ලිපිය මේ ලිපි සංග්‍රහයේ නැවත පළ කර ඇත).

''තාගෝර්ගේ ජීවිත මතක සටහන් විමසා බැලීමේ දී සෝමරත්නගේ විශ්ලේෂණය මුළුමනින්ම නිවැරදි බව පෙනේ. තම මතක සටහන්වල තාගෝර් මෙසේ ලියයි.

''අපට කරදර කිසිත් නොවුව ද මේ තැනත් පාසැලකි. පන්ති කාමරවල බිත්ති පොලිස් කාරයන් මෙන් මූසල ලෙස බලා සිටියි. මිනිසුන් වසන තැනකට වඩා පරෙවි කූඩුවක් සිහිගන්වන පන්ති කාමරයේ ළමුන්ගේ සිත් ඇදගන්නා කිසිවක් නැත. පින්තූරයක් හෝ ලස්සන වර්ණ හෝ කිසිම අලංකාරය දනවන්නක් එහි නොවීය. ළමා මනසෙන් විශාල කොටසක් ඔහු කැමති හා අකැමැති දේ පිළිබඳ හැඟීම්වලින් පිරී ඇත. ඒ බව මේ පන්ති කාමරය සැකසීමේදී මුළුමනින්ම අමතක කර ඇත. ආයත චතුරශ්‍රාකාර පටු කාමරයට ඇතුළු වූ කල අපගේ සිත මුළුමනින්ම කඩා වැටෙයි. එම නිසා අපි හේතුවක් නොමැතිව පාසල් නොගොස් සිටීමට පුරුදු වීමු'' (තාගෝර් : 2000 : 45). ඉන්දියාව වැනි අතිවිශාල භූගෝලීය ඒකකය චින්තනමය පෙරළියක් කිරීමේ දී අධ්‍යාපනය ප්‍රථම ස්ථානයට වැටීම වැළැක්විය නොහැකිය. පංති කාමරය සිර ගෙයක් සේ දුටු තාගෝර් බාලයේ සිටම නිවසේ පරිසරයෙන් ලැබූ අධ්‍යාපනයේ එවකට බෙංගාලි පුනරුදයේ පදනම මැනවින් කියාපාන්නකි.

අධ්‍යාපනය ජාතික සංස්කෘතියෙන් වෙන් කළ නොහැකි ඒස මඟ ඓන්ද්‍රීය බද්ධව බැඳී ගිය සාධකයක්ය යන්න තාගෝර්ගේ අධ්‍යාපන ප්‍රතිපත්ති අතරින් සෝමරත්නගේ ප්‍රබල අවධානයට හසුවන්නකි. එම අදහස් 56 දී ඉස්මතු වූ පටු ජාතිවාදී අදහස් සමඟ සමාන්තරව ගෙන නොයා වඩාත් පුළුල් දේශීය චින්තනයක් තුළ ස්ථානගත කිරීමට සෝමරත්න උත්සාහ දරයි.

ඒ ආනන්ද කුමාරස්වාමි ලියූ 'කලා හා ස්වදේශී' ග්‍රන්ථය ද මැනවින් පරිශීලනය කරමිනි. මෙරට මිෂනාරී අධ්‍යාපනයේ අර්බුදය බටහිර සංස්කෘතිය ඉතා මතුපිටින් ගෙනවිත් අපගේ උරුමය නොතකමින් මෙරට සංස්කෘතියට ඇතුළු කිරීමේ උත්සාහය බව හෙතෙම හඳුනා ගනියි. මෙයින් පෙනෙන්නේ සෝමරත්න, තාගෝර්ගේ ආභාසය වඩාත් පුළුල් ලිබරල් රාමුවක් තුළ තබමින් දියුණු ජාතිකවාදයක් වෙත රැගෙන යාමට උත්සාහ දැරීමේ නිරත වූ බවයි.

අවාසනාවකට පසුගිය දශක කීපය තුළ මෙරට අධ්‍යාපනය තුළ ස්ථාපිත වූයේ මෙබඳු පුළුල් චින්තන ධාරාවක් නොව බොහෝ පටු සංවෘත දේශීය චින්තනයකි. මෙය තාගෝර්ගේ චින්තන ආභාසය යටපත් කරගෙන එල්.එච්. මෙත්තානන්ද වැන්නවුන්ගේ ආන්තික ජාති ආගම්වාදී අධ්‍යාපන අදහස් ඉස්මතු වීමක් ලෙස පෙන්වා දිය හැකිය. පියල් සෝමරත්න මතු කරන තාගෝර්, ආනන්ද කුමාරස්වාමි වැනි විවෘත චින්තනයක් සහිත උගතුන්ගේ අදහස්වලට පටහැනි අන්තගාමී අදහස් අධ්‍යාපනය සම්බන්ධයෙන් මතු වූ ආකාරය L.H. Mettananda ලියූ *The Theory and Practice of Education* නමැති ග්‍රන්ථය කියවා බැලීමෙන් අවබෝධ කර ගත හැකිය.

ස්වභාෂාව අධ්‍යාපන මාධ්‍යය බවට පත් කිරීමේ වැදගත්කම තාගෝර් ඇසුරින් පෙන්වන සෝමරත්න එය මෙරට ඇති වූ ආකාරයේ මතුපිට දේශපාලන ප්‍රතිසංස්කරණයක් නොවිය යුතු යැයි ද සඳහන් කිරීම අතිශයින්ම වැදගත්ය.

තාගෝර්ගේ අධ්‍යාපනය 'ශික්ෂා-ශාස්ත්‍රා' යනුවෙන් හඳුනාගන්නා මෙම ලේඛකයා එහි අරමුණ ශිෂ්‍යයාගේ සහජ දක්ෂතාව ඉස්මතු කිරීම හා එයට අවැසි පරිසරය නිර්මාණය කිරීම බව ද පවසයි. නිරවුල් චින්තනය සාර්ථක වැඩිහිටි ජීවිතය මෙහි දී ඉලක්ක කර ගත් ආකාරය පෙන්වයි. සෝමරත්න තම ලිපියේ දී ඕපපාතිකව තාගෝර්ගේ අදහස් උපුටා නොදක්වමින් ලාංකීය තත්ව සමඟ සංයුක්තව මැනවින් ඉදිරිපත් කරයි. ශාන්ති නිකේතනය පිළිබඳ සෞන්දර්ය වර්ණනාවක් නොවන මෙම ලිපිය තාගෝර්ව මෙරට දේශපාලන කටයුත්තක් සඳහා යොදා ගත් ප්‍රධාන චින්තනාත්මක අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.

ලංකාවේ ජාතිකවාදය හා ඒ ආශ්‍රිත දේශපාලන චින්තනය පිළිබඳ සාකච්ඡාව සඳහා තාගෝර්ගේ අදහස් තීරණාත්මක ලෙස මැදිහත් කිරීමට දැරූ උත්සාහයන්හි විරල බවක් පෙනේ. Nationalism in Japan, Nationalism in the West and Nationalism in India වැනි රචනාවල හරය ලෙස සැලකිය හැක්කේ ඒ ඒ රටවල ජාතිකවාදවල ඓතිහාසික හරය අධ්‍යාත්මික පරිචය ගවේෂණය කිරීමට තාගෝර් ගත් උත්සාහයයි. මාක්ස්වාදය ඔස්සේ පැමිණි කතිකාවේ ඇති භෞතිකවාදී ආධිපත්‍යය නිසා හෝ ව්‍යාජ ජාත්‍යන්තරවාදී න්‍යායික විලංගුව නිසා හෝ තාගෝර්ගේ ජාතිකවාදය වෙත ප්‍රමාණවත් අවධානයක් යොමු නොවූ බව පෙනේ.[13]

තාගෝර්ගේ භාෂා අරගලය පිළිබඳව ද වාග් විද්‍යාඥයින්ගේ අවධානය බොහෝ සෙයින් යොමු විය යුතු වුවත් මාර්ටින් වික්‍රමසිංහගේ මැදිහත්වීම පමණක් එම ක්ෂේත්‍රය තුළ ශේෂ වීම ඛේදවාචකයකි. අජිත් තිලකසේන භාෂාව සම්බන්ධ තමන්ගේ ලිපිලේඛනවල වංග, හින්දි භාෂාවල නවීකරණය පිළිබඳ සාධනීය සාකච්ඡා දියත් කළේය. එහෙත් තාගෝර් ව්‍යවහාර භාෂා කතිකාව වෙත දක්වූ ඇල්ම ඔහුගේ අවධානයට වෙසෙසින් ලක්වූයේ ද යන්න සැක සහිතය.

තාගෝර්ගේ සමාජ, දේශපාලන බලපෑම පිළිබඳ මෑතකාලීනව සැලකිය යුතු කතිකාවක් නිර්මාණය කිරීමට වෙහෙසුණු අයකු ලෙස ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන පෙන්වා දිය හැකිය.

2011 වසරේ දී ඔහු ලියා පළ කළ පුරවැසි මංපෙත් ගැටුම්වේදය ආශ්‍රිත සංස්කෘතික හා දාර්ශනික අවලෝකන කෘතියේ බෙංගාලි පුනරුදය හා ලාංකීය ජාතික ව්‍යාපාරය සංසන්දනාත්මකව කියවා වටහා ගැනීමට උත්සාහ දරයි. පොත මුද්‍රණයෙන් පිටවීමට පෙර සිටම දීර්ඝකාලීනව ඔහුගේ ලිපි ලේඛන හා දේශනවල මෙම සන්සන්දනාත්මක උත්සාහය නිරීක්ෂණය කළ හැකිය. සුනිල්ගේ අදහස් අප විසින් සැලකෙනුයේ අභිනව දේශපාලන චින්තන කතිකාවතකට පදනම් දැමීමට තැත් කරන විකල්ප දේශපාලනඥයකුගේ මැදිහත්වීමක් වශයෙනි. මේ විකල්ප දේශපාලඥයා ඇගයීම සඳහා දශක ගණනාවක සමාජ ඉතිහාසයක් වෙත ගමන් කළ යුතුව තිබේ. (එහෙත් මෙහි දී එවැන්නක් නොකෙරේ. ප්‍රස්තුත මාතෘකාවට අදාළව ඉතා කෙටි සාකච්ඡාවක් කෙරේ.)

ලාංකීය ජාතික ව්‍යාපාරයේ ජාතිවාදී අන්තගාමී මාවත විදාරණය කිරීමට මෙන්ම පොදුවේ පශ්චාත් යටත් විජිත චින්තනය තුළ අප මුහුණදෙන තීරණාත්මක ප්‍රශ්න දෙස බැලීමට තාගෝර්ගේ මතවාද හා ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය සුනිල් මෙහි දී උපයෝගී කොට ගත් ආකාරය නිරීක්ෂණය කළ හැකිය.[14] පහත උදාහරණය විමසා බලන්න.

> ධර්මපාලගේ යටත්විජිත මනසට හා අධිකාරවාදී සංවෘත දැක්මට බෙංගාල පුනරුදයේ අරුත් ගෝචර වූ බවක් පෙනෙන්නට නැත. උදාහරණ වශයෙන් තාගෝර්ගේ නවීකාරක චින්තාව ධර්මපාලගේ ද්වේශය ඇවිල වූ බවට ඉතා පැහැදිලි සාක්ෂි තිබේ. 'යුරෝපීය ශීලාචාරයට ගරු කරන, සියලු ජාතීන්ගේ සම්බන්ධය සුන්දර යැයි කියන මොහු කාමභෝගියෙකි'' යනුවෙන් තාගෝර් ගැන ඔහු කියූ කියමන ධර්මපාලගේ සමාජ චින්තාව හකුලා කියන්නාක් මෙනි. බටහිරින් ආ ජාතිකවාදයට තාගෝර් සපුරා විරුද්ධ විය. ''ජාතිය ගොඩනැගීම සඳහා මිනිසා බිල්ලට දීමේ මුග්ධ මාවත'' තාගෝර් ප්‍රතික්ෂේප කරන්නේ ප්‍රධාන වශයෙන් ම උපනිෂද් දර්ශනය මත සිට ගනිමිනි. යුරෝපයේ පුනරුදය හරහා නැවත ගොඩ නැගෙන මානවවාදය තාගෝර්ට ප්‍රිය වන්නේ ද එම උරුමය නිසාමය. බටහිර ජාතික රාජ්‍ය මොඩලය ඔහු ප්‍රතික්ෂේප කරන්නේ ද එම උරුමය නිසාමය. තත්ත්වය එසේ නම් තාගෝර් යුරෝපීය ශීලාචාරයට යට වී යයි දොස් නැගීම මහත් උත්ප්‍රාසයක් දනවන්නේ නොමැතිද? (විජේසිරිවර්ධන : 2010 : 223).

සුනිල්ගේ පොත පිළිබඳ දීර්ඝ සාකච්ඡාවකට ගමන් කිරීම මෙහි දී අපේක්ෂා නොකරමු. කෙසේ වෙතත් මෙහි දී පැහැදිලි කළ යුතුව ඇත්තේ තාගෝර් සහ බෙංගාලි පුනරුදය ලාංකීය ජාතික ව්‍යාපාරය පිළිබඳ සාකච්ඡා කිරීමේ නිර්ණායකයක් ලෙස සුනිල් විසින් භාවිත කෙරුණු ආකාරයයි.

**සමාලෝචනය**

මේ ලිපියේ ප්‍රථම කොටසින් බෙංගාලි පුනරුදය තුළ තාගෝර්ගේ කාර්යභාරයත් දෙවන කොටසින් තාගෝර්ගේ ලාංකීය බලපෑමත් කෙටියෙන් සඳහන් කිරීමට උත්සාහ දැරුවෙමු. බොහෝ මූලාශ්‍ර ගැඹුරින් එනම් ඒවායේ අන්තර්ගතය සමඟ බද්ධව දීර්ඝ උදාහරණ ගනිමින් සාකච්ඡා කිරීමට අපේක්ෂා නොකළෙමු. එසේ කළේ නම් ලිපිය තවත් අතිශයින් ම දීර්ඝ වීමත් ඇතැම් විටක පොතක් තරම් විස්තෘත වීමත් නොවැළැක්විය හැකි බැවිනි. අදාළ මූලාශ්‍ර ඉතා කෙටියෙන් දීර්ඝ උපුටා ගැනීම්වලින් තොරව සඳහන් කරන්නේ පාඨකයාගේ අවශ්‍යතාව පරිදි එය සොයා ගැනීමේ හා පරිශීලනය කිරීමේ ශක්‍යතාව නිර්මාණය කරමිනි. තවද

තාගෝර් පිළිබඳ විශාල විස්තර කථනයක් කිරීම අපගේ අපේක්ෂාව නොවුණි. තාගෝර් පිළිබඳ අප විසින් සංවර්ධනය කෙරුණු අදහස ප්‍රකාශ කිරීම සඳහා විස්තර විවරණ ආදිය ප්‍රයෝජනයට ගෙන ඇත.

**පාදක සටහන්**

1. රැම් මෝහන් රායි ලියූ *'The Middle Class of India* මේ පිළිබඳ ප්‍රමාණවත් කතිකාවක් දියත් කළ ග්‍රන්ථයකි.

2. මේ පිළිබඳව ටී.එස්. එලියට්ගේ අදහස් විමසීම අතිශයින්ම වැදගත්ය. අපගේ තේමාවට අදාළව එලියට්ගේ අදහස් විමසන හේමරත්න ලියනාරච්චි විචාරකයා 'අතීතය වර්තමානයෙහිම ක්‍රියාශීලී බලවේගයකි' ලිපියේ මෙසේ ලියයි.

   සමස්ත සංස්කෘතියක් විසින් එහි අතීතය පිළිබඳ හැඟීමට සාපේක්ෂ ව එහි වර්තමානය තුළ ඊට උරුම තැන සොයා ගනු ලබන ක්‍රියාවලිය යනු කාව්‍ය නිර්මාණයේ අගය බව එලියට් තහවුරු කරයි. අතීතය යනු වර්තමානය තුළ පවත්නා ක්‍රියාශීලී බලවේගයකි. අතීතයෙහි වත්මන් බව රැකෙනුයේ එකී බලවේගය විසිනි. තව ද අතීත යනු එක් තනි කවියකු ගේ චිත්තයට වඩා විශාල වන සංස්කෘතික චිත්තයට ප්‍රවේශ මාර්ගයකි. එහෙයින් ම අවසාන විග්‍රහයෙහි දී එය කිසියම් යුගයක අර්ථාන්විත කලාවන්හි දිශාව හා අභිප්‍රාය නිවැරදි ව තහවුරු කරන තීරණාත්මක සාධකයක් වෙයි. මෙවැනි මතවාදයන් පසු කලෙක නූතන විචාර මං පෙත් සාදා පාදා දීමෙහි ලා මහෝපකාරී විය (ලියනාරච්චිඃ 2007ඃ 63).

3. තාගෝර්ගේ ලේඛන, (ශාස්ත්‍රීය, නිර්මාණාත්මක හා වෙනත් ලේඛන) අපගේ තර්කය සඳහා දීර්ඝ වශයෙන් උපුටා දැක්විය හැකිය. එහෙත් අප මෙහි දී ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලියක් දක්වන නිසා උපුටා ගැනීම් දීර්ඝ නොකරමු. මන්ද යත් අපගේ තර්කය සමග වැඩිදුර පක්ෂ විපක්ෂ සාකච්ඡා ඇරඹීමේ උනන්දුවක් දක්වන කියවන්නෙකුට ඒ සඳහා සංයුක්ත මූලාශ්‍ර රාශියක් අප විසින් සැපයෙන බැවිනි.

4. ඉන්දියාව පිළිබඳ ඇති ද්විත්ව ප්‍රතිපක්ෂ ආකල්ප බිඳලීම සඳහා කියවිය හැකි පොතක් ලෙස එරික් ඉලයප්ආරච්චි මෑතක දී ලියා පළ කළ 'ඉන්දියාව ශූන්‍යය සෙවීම' නමැති ග්‍රන්ථය සැලකිය හැකිය. චාරිකා සටහනක ආකෘතියක ලියවුණු මෙම ග්‍රන්ථය කළු / සුදු ඉන්දියාවක් වෙනුවට වඩා සංකීර්ණ රටක් පිළිබඳ ඉඟි කරන සමකාලීන දේශාටන වාර්තාවකි.

5. තාගෝර්ගේ කෙටිකතා කලාව පිළිබඳව ද විසිවන සියවසෙහි මෙරට සාහිත්‍ය විචාරය තුළ අංශු මාත්‍ර හෝ සාකච්ඡාවක් නිර්මාණය නොවූ බව නිරීක්ෂණය කළ හැකිය. එවැන්නකට අගනා පදනමක් වැටෙන්නේ ආචාර්ය ලියනගේ අමරකීර්ති 2005 දී පළ කළ 'අමුතු කතාව පශ්චාත් යථාර්ථවාදී ප්‍රබන්ධ කලාවක් වෙත ප්‍රබන්ධ න්‍යායික රචනා' නමැති කෘතියෙනි. අමරකීර්ති මෙම ග්‍රන්ථයෙහි හත්වන පරිච්ඡේදය ''දකුණු ආසියානු විකල්ප යථාර්ථවාදයක් රවීන්ද්‍රනාත් තාගෝරගේ කෙටිකතා කලාව යනුවෙන් නම් කළේය.'' (මේ ලිපි සංග්‍රහයේ එය නැවත පළ කර ඇත. - සංස්කාරක). අමරකීර්තිගේ සාකච්ඡාවේ වටිනාකම ඇත්තේ තාගෝර්ගේ ශිල්ප ක්‍රම කලාව ගැන තාගෝර් දැක්වූ අදහස් ලංකාවේ යථාර්ථවාදය පිළිබඳ අදහස් සමඟ සංසන්දනාත්මකව සාකච්ඡා කිරීමට උත්සාහ ගැනීමයි. ඔහු මෙසේ පවසයි. ''තාගෝර් යථාර්ථවාදය යන සංකල්පයම පවා උපනිෂද් අර්ථයකින් වටහා ගත් බව අපි දුටිමු. ඒ වූකලී යුරෝපයීය යථාර්ථවාදයේ ඓතිහාසිකත්වයත්, ලෝක දෘෂ්ටියත්, සංස්කෘතියත් ඥානමීමංසාත්මකව සමතික්‍රමණය කිරීමකි. මේ වූකලී

ථෙරවාදී බුදු දහම යුරෝපයීය බුද්ධි ප්‍රබෝධ චින්තනය සේම යථාර්ථවාදී, හේතුවාදී එකක් යැයි පිළිගෙන ජාතක කතාවල ඇත්තේ ද යුරෝපයීය යථාර්ථවාදය යැයි කී මාර්ටින් වික්‍රමසිංහගේ ආස්ථානයට වඩා බෙහෙවින් වෙනස් වූවකි'' (අමරකීර්ති : 2005 : 254).

අමරකීර්තිගේ සාකච්ඡාවට න්‍යායික පදනම වැටෙන්නේ බටහිර ප්‍රබුද්ධතාවාදී මහා කතිකාවට එරෙහිව මෑත දශක කීපය තුළ නිර්මාණය වූ නව ඥාන මීමාංසාවෙන් බව පෙනේ. මාක්ස්වාදය, ලිබරල්වාදය මතු නොව බටහිර කේන්ද්‍රීයත්වය පවා මෙම කතිකාව තුළ ප්‍රශ්න කෙරුණු අතර අමරකීර්තිගේ මෙම මැදිහත්වීම 40, 50 හා 60 දශකවල මෙරට උගතුන් තාගෝර් හා බෙංගාලි පුනරුදය කියවීමට දැරූ උත්සාහයට වඩා වෙනස් එකකි. මේ බටහිර නව ඥාන මීමංසාව තාගෝර් හා බෙංගාලි පුනරුදය දෙස බැලීමට තෙවන ඇසක් අප වෙත නිර්මාණය කිරීම උත්ප්‍රාසාත්මකය. අමරකීර්ති මෙම ග්‍රන්ථයෙන් පසු තාගෝර් පිළිබඳ තම අවධානය යොමු නොකිරීම කණගාටුදායකය.

6. මේ කෘතිවලින් නවජීවනය, ගැරහුම් අවමන් ලැබුවෝ යන නවකථා දෙක ආනන්ද අමරසිරි සිංහලට පරිවර්තනය කළේය. 'අපරාධය හා දඬුවම' කෘතියේ සිංහල පරිවර්තන දෙකක් තිබේ. ඉන් එකක් ඉංගිරියේ මුනිදාස සෙනරත් යාපා කරන ලද්දකි. අනික දැදිගම වී. රුදීගු විසින් කරන ලද්දකි. රුදිගුගේ පරිවර්තනය සෘජුව රුසියන් බසින් කරන ලද්දකි.

7. ඒවා ලූනා යනු ලතින් ඇමරිකානු ලේඛිකා ඉසබෙල් අයියන්දේ ලියූ නවකථාවකි. මෙය එනමින්ම සිංහලට පරිවර්තනය කරන ලද්දේ ගාමිණී වියන්ගොඩ විසිනි.

8. ආනන්ද අමරසිරි මෙහි දී සුවිශේෂ අයකු වන්නේ හුදෙක් පරිවර්තකයකු පමණක් නොවෙමින් තාගෝර් හා බෙංගාලි පුනරුදය පිළිබඳ සාකච්ඡාව ගැඹුරින් මෙරට පාඨකයාට ගෙන ඒමට උත්සාහ කළ අයකු වශයෙනි. තම පරිවර්තන ග්‍රන්ථයන්හි පෙරවදන්වලින් ඔහු එය ඉටු කළේය.

9. මෙහි සඳහන් බොහෝ ලේඛකයෝ තාගෝර්ගේ නිර්මාණ පරිවර්තනය කළ අයයි. ඊ.තෙන්නකෝන් එහි දී සුවිශේෂ අනන්‍යතාවක් අත්පත් කර ගනියි. මන්ද යත් තෙන්නකෝන් තාගෝර්ව පරිවර්තනය නොකරයි. එහෙත් තම 'රුප්පේ අන්දරය' නමැති කවිකතාවේ තාගෝර් සම්බන්ධ කොට කවියක් ලියයි.

මූණ ද ගල ද මැඬැ ලා රස කළල් කැඳ
ලා යළි මඳක් වැඩි වන්නට සුනු සුවඳ
පැ කිවි තකුරයන් සිසු මෙනෙවියක බඳ
සේ සළු හැඳැ පැළැඳි කුසුමා ළඳ බොළඳ
(රුප්පේ අන්දරය, 338 පැදිය)

මෙහි දී කවියා තම වර්ණනාවක් සඳහා තාගෝර් කවියාගේ වර්ණනාවකින් පෝෂණය ලබයි. 56ට පෙර කලාපීය සෞන්දර්යාත්මක චින්තනයක් හෙළ හවුලේ කවීන් තුළ පවා වැඩුණු බවට මෙය කදිම සාක්ෂියකි. එමෙන්ම තෙන්නකෝන් තාගෝර්ව මැනවින් පරිශීලනය කළ බවට ද මෙය මනා සාක්ෂියකි.

10. මේ ලැයිස්තුව ඉතා දිගය. එහෙත් ඉඩකඩ සලකා කෙටි කරමු.

11. මේ පිළිබඳ වැඩිදුර කියවීමට මාක්ස් සහ එංගල්ස් ලියූ 'On Colonialism' රචනය යොදාගතත හැකිය. රංජිත් පෙරේරා ප්‍රවාද 11 වන කලාපයට (1996 පෙබ.-අප්‍රේල්) ලියන දකුණු ආසියාව පිළිබඳ මාක්ස් නමැති ලිපියේ මේ පිළිබඳ සාකචඡාවක් ගොඩනැගීමට උත්සාහ දරා ඇත.

12. තාගෝර් පිළිබඳ සාකච්ඡාව ඉදිරියට ගෙන යාමට උත්සාහයක නිරත වන විචාරකයන් වර්තමාන ශ්‍රීපාලියේ සිටින බව පෙනේ. මෙයට කදිම උදාහරණයක් පෙන්වමි. ඒ 2011 මාර්තු 29 වන දින Daily News පුවත්පතේ 10 වන පිටුවේ පළ වූ 'Contemplations on Sinhala Music' නමැති ලිපියයි. ශ්‍රීපාලි මණ්ඩපයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක විසින් රචිත එම ලිපියේ තාගෝර් මෙරට සංගීත කතිකාවට බලපා ඇති ආකාරය විශ්ලේෂණය කිරීමට උත්සාහ ගෙන තිබේ. මෙය වඩාත් පුළුල් විය යුතු හා අඛණ්ඩව නිර්මාණය කළ යුතු සාකච්ඡාවක් යැයි සිතමු.

13. තාගෝර්ගේ ඝරේ බයිරේ (සිංහල පරිවර්තනය බිමාලා) සිංහල පරිවර්තනයට සංඥාපනය ලියූ ආනන්ද අමරසිරි පරිවර්තකයා මෙම තත්වය යම් තරමකින් වටහා ගැනීමට උත්සාහ කළේය. ඔහු මෙසේ ලියයි. තාගෝර් කවියාගේ *The Home and the World* නවකථාව බටහිර විචාරකයන්ගේ කර්කශ විචාරයට බඳුන් විය. මාක්ස්වාදී විචාරකයකු වන ජෝර්ජ් ලූකාස් ඒ කෘතිය හුදු මධ්‍යම පාන්තික යටත් හැල්ලක් ලෙස හැඳින්වීමට තරම් සැහැසි විය. ඊ.එම්. ෆොස්ටර් වැනි බටහිර විචාර ගුරුකුලයෙහි නවකථාකරුවෙක් ද ඒ කෘතියෙහි දුබලකම් දුටුවේය. ලූකාස් සම්බන්ධයෙන් බලන කල ඔහුගේ ප්‍රකාශන ගැන විමතියක් පහළ නොවන්නේ භෞතික ලෝකයේ මාක්ස්වාදී න්‍යායට හසු නොවන සියුම් ආධ්‍යාත්මික ලෝකයක් ද ඇති බැවිනි. ඔහු ඒ නවකථාව ලියූයේ බටහිර පාලකයන්ගේ පිහිටාධාර පතාගෙන යයි කියවෙන අවලාද පැන නැඟුණි. එහෙත් ගෝරතර මිනිස් ඝාතනයට එරෙහිව ඔහු තමාගේ නයිට්නාමය අත්හළ බැවිනි. විසිවන සියවසේ මුල් භාගයේ දී ඉන්දියාවේ ඇති වූ දේශපාලන කැලැඹීමේ ක්‍රියාකාරී සාමාජිකයන් ලෙස රබීන්ද්‍රනාථයෝ කටයුතු කළහ. මේ නවකථාවෙහි ලා ඔහු සඳහන් කරන ත්‍රස්තවාදයේ මූල බීජය, එවක හුදු රොමැන්ටික් විඥ්ඥාණවාදී සංකල්පයක් ම විය (ආනන්ද අමරසිරි, සංඥාපනය : බිමාලා : පිටු අංක සඳහන් නොවේ).

14. ඔහුගේ දේශනවලට දිගුකාලීනව සහභාගි වූ අයකු ලෙස ලැබූ අත්දැකීම් පදනම් කර ගනිමින් මම මෙය ප්‍රකාශ කරමි.

### ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අමරකීර්ති, ලියනගේ (2005) **අමුතු කතාව - පශ්චාත් යථාර්ථවාදී ප්‍රබන්ධ කලාවක් වෙත ප්‍රබන්ධ න්‍යායික රචනා**, කොළඹ; විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය,

ඉලයප්පාරච්චි, එරික් (2010) **ඉන්දියාව ශුන්‍යය සෙවීම**, කොළඹ: සරසවි ප්‍රකාශකයෝ.

උයන්ගොඩ, ජයදේව (2010) **සමාජීය මානවීය විද්‍යා පර්යේෂණ - දාර්ශනික සහ ක්‍රමවේදී හැඳින්වීමක්**, කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

තාගෝර්, රබීන්ද්‍රනාත් (1987) **උපගුප්තගේ අබිසරු ගමන** (පරි : සියඹලාගහරුප්පේ විජිතධම්ම) කැලණිය: විද්‍යාලංකාර පිරිවෙන.

(1990) **පුංචි මහත්තයා යළි පැමිණීම**, (පරි : සියඹලාගහරුප්පේ විජිතධම්ම) ඇස්.ගොඩගේ, කොළඹ.

(1998) **චාරුලතා** (පරි : සේනාරත්න වීරසිංහ) වේයන්ගොඩ: ප්‍රභා ප්‍රකාශකයෝ.

(2000) **රවීන්ද්‍රනාත් තාගෝර්ගේ මතක සටහන්** (පරි : පද්මා ගුණසේකර) නුගේගොඩ: සුනෙර ප්‍රකාශකයෝ.

(2002) **බිඳුණු බැඳුම්** කෙටි නවකතාව සහ තවත් කතා (පරි : අනඳපිය කුඩාතිහි), කොළඹ: ඇස්.ගොඩගේ.

(2003) **බිමාලා,** (පරි : ආනන්ද අමරසිරි) කොළඹ: සූරිය ප්‍රකාශකයෝ

(2003) **බිනෝදිනී** (පරි : අනඳපිය කුඩාතිහි) ඇතුල්කෝට්ටේ: ඒ.එස්. මුද්‍රණකරුවෝ සහ ප්‍රකාශකයෝ.

(2007) **චතුරංග** (පරි : ඩබ්ලිව්.එම්. ගුණතිලක) මුදුන්ගොඩ: තරංග ප්‍රකාශකයෝ.

(2008) **දඬුවම** (පරි : චන්දන මෙන්ඩිස්) ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා, කෝට්ටේ: චන්දන මෙන්ඩිස් ප්‍රකාශන.

(2008) **සිව්රඟ රැඟුම** (පරි : ගරියස් සුරනිමල තෙන්නකෝන් මුදලිගේ) කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

තාගෝර් රබීන්ද්‍රනාත්,* (2010) **රබීන්ද්‍රනාත් තාගෝර් සංගෘහිත කවි** මානසී (පරි ආනන්ද අමරසිරි) කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

තාගෝර්, රබින්ද්‍රනාත් (1961) **චිත්‍රා** (අනුවාදක ජිනසෝම වීරසූරිය) ගම්පහ: නව සාහිත්‍ය මණ්ඩලය,

තාපර්, රොමීලා (1994) **ඉන්දියාවේ ඉතිහාසය** (නිශ්චිත පරිවර්තකයකු සඳහන් නොවේ) කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ගුප්ත, චිදානන්ද දාස් (2007) **සත්‍යජිත් රායිගේ සිනමාව** (පරි : රාණි සේනාරත්න රාජපක්ෂ) කළුබෝවිල: විදර්ශන.

නේරු, ශ්‍රී ජවහර්ලාල් (2008) **ලෝක ඉතිහාස සිහිවටන *(Glimpses of World History),*** පරි : ඩේවිඩ් කරුණාරත්න, කොළඹ: ගුණසේන.

පෙරේරා, රංජිත් (1996) **දකුණු ආසියාව පිළිබඳ මාක්ස් ප්‍රවාද**, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, කොළඹ, 11 කලාපය, 1996 පෙබ.-අප්‍රේල්.

ලියනාරච්චි, හේමරත්න (2007) **'අතීතය වර්තමානයෙහිම ක්‍රියාශීලී බලවේගයකි', සිළුමිණ, පුන්කලස, ශාස්ත්‍රීය ලිපි සරණිය**, කොළඹ: සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

විතානගේ, සිරිසේන (2008) **රවීන්ද්‍රනාත් තාගෝර්, බත්තරමුල්ල**: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

වික්‍රමසිංහ, මාර්ටින් (1917) **ඇත්ත යුත්ත**, (ප්‍රකාශකයකු සඳහන් නොවේ).

(2005) **මානව හිතවාදය හා එතෙර වියත්තු**, නාවල: සරස.

විජේසිරිවර්ධන, සුනිල් (2011) පුරවැසි මංපෙත් ගැටුම්වේදය ආශ්‍රිත සංස්කෘතික හා දාර්ශනික අවලෝකන, ප්‍රකාශනය FLICT, ගැටුම් පරිවර්තන දේශීය ආරම්භයකට පහසුකරණය, කොළඹ.

වෛද්‍යසේකර, ලක්ෂ්මන් (මුද්‍රිත වර්ෂය සඳහන් නොවේ) **භාරත අංජලී**, කොළඹ: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

සරච්චන්ද්‍ර එදිරිවීර (2001) **ශාන්තිනිකේතනයේ ඇසින්** (පරි : සුචරිත ගම්ලත්) කොළඹ: ඇස්. ගොඩගේ.

සෝමරත්න, පියල් (1965) 'තාගෝර්ගේ අධ්‍යාපනික අදහස් සමහරක්', **සංස්කෘති**, විශ්වවිද්‍යාල අංකය, 1965 ඔක්.-දෙසැ., සංස්කෘති ප්‍රකාශන සංගමය, (සංස්.) සුසිල් සිරිවර්ධන, එස්. විජේසූරිය.

චට්ටෝපාධ්‍යාය, ශරත්චන්ද්‍ර (2003) **දේව්දාස්** (පරි : ආනන්ද අමරසිරි) කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

Ayyub, ABU Sayeed (1995) (Translated by Amitava Ray) *Modernism and Tagore*, New Delhi: Sahitya Akademi.

Chaudhuri, Nirat C. (2008) *Autobiography of an Unknown Indian* New Delhi: Jaico Publishing House.

Doestoyesky, Fydor. (1971) *The Devils*, London: Penguin Books.

Mettananda, L.H. (2006) *The Theory and Practice of Education*, Published by Kamaladevi Ediriwira.

Siriwardena, Regi (1999) *Working Underground, The LSSP in wartime : Memoir of Happenings and Personalities,* Colombo: ICES.

Tagore, Rabindranath (2003) *Boat Accident*, New Delhi: Fusion Books.

Tagore, Rabindranath, (n.d.) *Great Works of Rabindranath Tagore*, New Delhi: Jainco Publishers.

Wickramasinghe, Martin (2006) *Buddhism and Culture,* Nawala: Sarasa Publisher.

* අප මෙහි 'රබීන්ද්‍ර' යනුවෙන් යොදන්නේ ආනන්ද අමරසිරි එසේ භාවිත කර ඇති නිසාය.

# Nationalism and National Freedom: Tagore's Perspective

**Nirosha Paranavitana**

Nationalism results in India as a historical development, which materialized as a cause of the advancement of educational and economic changes which took place during the colonial age. The original Indian nationalists were individuals who asserted that an Indian nation, however defined or ought to exist, had unique characteristics and goals. They were mostly religious and political reformers, political agitators, poets, saints and statesmen. Some had programs for change, while others merely criticized the conditions around them and some others were content to express their devotion to India, which existed only in religious and mythological symbols. Hence for Indians, Nationalism was a representation of many ideals. For Mahatma Gandhi it meant getting rid of the British through non-violence and for Jawaharlal Nehru it was not purely an anti-western ideal.[1] For Indians, primarily and most commonly accepted norm of nationalism meant getting rid of a western political domination, which later with the development of communication became an ideal, which transcended to advancement of the common man and the state towards the twentieth century, consequently to a building of a modern nation; India.

The leaders of the nationalist movement in India, who based nationalism as a revival of Hindu culture openly acknowledged their identification of nationalism with Hinduism. Reformists like B.G. Tilak stressed on the concept of *Hindutva* being devotional to Hinduism as an expression to Nationalism, which may have routed racial problems created among Indian people at a later stage. However, the reformist movement in India had its dawn in Bengal, the ruling centre of the British Rāj. The movement in Bengal is hence most known as the Bengal awakening or 'Bengal Renaissance'.

Rabindranath Tagore was born on 7th May 1861 to a family house of the Tagore's Jorasanko, a centre of 19th century Bengal Renaissance when Hindu revivalist movement, which began by Raja Rammohan Roy with formation of *Brahmo Samaj* was already in progress. Maharshi Debendranath Tagore, father of Rabindranath Tagore, was an ardent follower of Raja Rammohan Roy, the maker of modern India. Maharshi Debendranath was a practitioner of a reoriented faith found on the pure monotheism of the ancient Upaniśads abjuring idolatry and accepting initiation onto *Brahmo dharma*. Every morning the Tagore sons had to recite versus culled from the *Vedas* and *Upaniśads* with proper pronunciation and accent. These morally uplifting prayers and its recital practice influenced young Rabindranath and made a lasting impression on his mental makeup. Rabindranath Tagore therefore grew up in a surrounding of reformists, philosophers and intellectuals. While describing his boyhood days he states;

> Pundits of the deepest learning would visit father's drawing room to discuss the scriptures and sciences: musicians would display their skill… such people made of our house a living university.[2]

Rabindranath Tagore's nationalistic views may serve as one major example of the Bengali focus of the nationalist movement. Though his ideas on Nationalism are yoked with his unparalleled charm and clarity in the language as in the literary works of his contemporary Bankim Chandra Chaterjee, Tagore could stimulate not only the populace but also the masses in Asia itself. Tagore assumed that European Nationalism was political in nature and dedicates to strengthen the nation state and its sovereign independence. Writing on nationalism he states.

> A nation in the sense of the political and economic union of a people is that aspect which a whole population assumes when organized for mechanic purpose. Society as such has no ulterior purpose. It is an end of itself. It is a spontaneous self expression of man as a social being. It is a natural regulation of human relationships, so that men can develop ideals of life in co-operation with one another. It has also a political side, but it is only for a special purpose…[3]

Tagore derived a subtle negativity on the idea of nationalism practiced at that time: Hindu civilization, by contrast he saw as dedicated to a spiritual rather than a political freedom and its ultimate goal was the religious liberation of individual.[4] According to Tagore the word 'nation' did not actually exist in any Indian language and he noted that neither Indian history nor its religious and domestic life show any evidence of emphasis on nation building activities. In one of his writings he had stated as,

> We have no word for nation in our language. When we borrow this word from other people it never fits us. The Bengali word *rāstra* is used to indicate a state or a large political unit but has no cultural connotations. The term *deś* was often used to refer to either to Bengal or to India but the term originally meant the place of origin, place of geographic, social, linguistic and cultural sense and the equivalent for our country, home and place.[5]

Therefore, agreeing with many historians of his time, Tagore was of the opinion that the concept of nationalism is comparatively a new idea for India, as people in India most rarely moved outside their little village. They were divided from each other not only by the fact that they lived in fairly static groups but also by caste, religion, wealth and education; they were more ready to think of themselves and act as Hindus, Muslims, Brahmins, or Untouchables, Bengalis or Punjabis rather than Indians.[6] Tagore further establishes his ideas of society being the base of Indian nationalism as:"Our real problem in India is not political, it is social. This is a condition not only prevailing in India but among all nations."[7]

*Svadeśi Samāj* was a strong nationalistic campaign in Bengal. The *Svadeśi Samāj* created a sensation with its combination of eloquence and practical suggestions. Voices were occasionally heard in *Svadeśi* period calling for a total rejection of the West. Rabindranath Tagore's Santiniketan represented a poet's imaginative reaction against the factory like atmosphere of urban schools.[8] The idea existed in him that the children should be given a chance to learn from the nature herself under open skies, where the rhythms of seasons would teach them far better science than any formal text book, class or a lecture. For Rabindranath Tagore the conception of National education had little to do with politics; it formed a part of their vision of constructive *Svadeśi* autonomous development of resources of the country, ignoring rather than opposing foreign rulers.[9]

Tagore, who popularized the name "Mahatma" – great soul – as a description of Gandhi with great admiration, had many disagreements with him on the ideas related to Nationalism. Though Gandhi's mission was humanitarian, as an experienced lawyer he could not divorce himself from political constrains, his ultimate goal was national freedom and social harmony through non-violence and truth. His campaign on *Svadeśi, Svarāj* and *Satyagraha* (passive resistance) and his ideal of *Ahimsa* in many ways connoted his rediscovery of Hinduism as well as means of adopting tolerance to unite India into one secular nation. Tagore knew that he could not have given India the political leadership that Gandhi provided. He also started a *Svadeśi Bandar* movement in Calcutta for the promotion of indigenous goods and actively supported the movement by composing a number of national songs, leading processions and by raising funds for the establishment of the national schools. When in the course of time the *Svadeśi* movement assumed a form of a mere political agitation producing extreme reactions, Tagore withdrew from it. The burning of much needed cloth in the name of boycott of foreign goods and the alienation of Muslims by Hindu religious motifs in the struggle deprived Tagore. It is a well known fact that Tagore gradually moved away from the mainstream of nationalist movement and with his initial involvement with *Svadeśi* movement, which later centred on partition of Bengal in 1905. Thence he retreat himself at Santiniketan and started writing on public issues concerning the violent passion of patriotism, the illegitimacy of Nationalism, and disengagement of political from the social and moral. Nationalism and nation states thereafter appeared to him as a great menace and a 'geographical monster'.[10] The author of India's national anthem was thus outspoken in his views on Nationalism as he did not expect the idea of a nation-state to supersede Indian society and civilization.

*Home and the World*, most renowned novel of Tagore set against the days of *Svadeśi* movement in Bengal, could be regarded as Tagore's assessment of the world of *Svadeśi* in fictional form. The novel, however, is not an investigation of the *Svadeśi* movement but a dramatization of its implications for individuals and their reactions with one another in the days of the struggle for independence. The two protagonists in the novel Nikhil and Sandip exemplify the paradoxical approach to the problem. Nikhil's concept of freedom, self government and constructive leadership seems to reflect Tagore's own vision of the

struggle for independence. Nikhil had done his best to encourage indigenous manufacture in his estates; as a Zamindar he could afford the luxury of imported goods but preferred native ones, his wife Bimola recounts when the boycott of foreign goods had become a fashionable slogan. The eruption of the *Svadeśi* movement broke down the barriers of the home and the world for Bimola, because its impact was felt on everyone in Bengal. At an instance Bimola says,

> One day there came the new era of *Svadeśi* in Bengal; but as to how it happened, we have no distinct vision. There was no gradual slope connecting past with the present. For the reason, I imagine, the new epoch came in like a flood breaking down the dikes and sweeping all our prudence and fear before it. We had no time even to think about, or understand, what had happened, or what was to happen. My sight and my mind, my hopes and my desires, became red with the passion of this new age. Though, up to this time, the walls of the home which was the ultimate world to my mind – remained unbroken, yet I stood looking over into the distance, and I heard a voice from the far horizon, whose meaning was not perfectly clear to me, but whose call went straight to my heart.[11]

Eager to do some personal sacrifice, she wants to get rid of her English teacher Miss. Gilby and also burns her foreign clothes and she becomes displeased with her husband who tells her,

N: 'Why burn them?"… ' you need not wear them as long as you please?'
B: as long as I please! not in my life…'
N: 'very well do not wear them for the rest of your life, then. But 'why this bonfire business?[12]

Bimola feels very unhappy that though her husband supports Svadeśi he has not wholeheartedly adopted the spirit of bande mātaram and she consequently thinks of her husband as,

> My husband still sharpens Indian made pencils with his Indian made knife, does his writings with reed pens, drinks his water out of bell-metal vessel, and works at night in the light of an old fashioned castor-oil lamp. But this dull milk and watery Svadeśi of his never appealed to us.[13]

As opposed to Nikhils patriotism, even though Nikhil's friend, Sandip is opportunistic and looks for the means for achieving personal power representing a prototype of a populist. Sandip goes about inflaming people in the cult of *bande mātaram* and the concept of freedom by force rather than inculcating the *Svadeśi* spirit among the people. Sandip therefore portrays a revolutionary or an arrogant type of a nationalist, implying the nationalist ideals that Tagore was reluctant to admire. Nikhil observes Sandip as,

> What I really feels is this, that those who cannot find food for their enthusiasm in a knowledge of their country as it actually is, or those who cannot men just because they are men, who needs must shout and deify their country in order to keep up their excitement more than their country…

Nikhil simultaneously realizes that his restraint individual patriotism would have no appeal to the mass mind. The antithetical relationship of Nikhil and Sandip both friends provide the main conflict of the novel as well as Tagore's opinions on the *Svadeśi* movement or the nationalism blended within it.

The prime element of renaissance of India was the worship of past glories and the circumstances made the past glory harked back predominantly to Hindu past. The 'awakened' were also Hindu by origin. Therefore, these factors combined to make up the second element, the Hindu superiority. It was understandable that the majority of Indians are Hindus but non-Hindus, especially Muslims also formed a sizeable part of the population. Tagore could not really suggest any concrete social or economic program which would suit the masses, for his nationalistic ideas were largely influenced by humanitarianism which rather had a universal touch. Hindu, Muslim relations suggested a great challenge before the *Svadeśi* movement. Tagore seems to have had a common national life than a 'Hindu' one. In one of his poems he had stated,

> "…Non-Hindu and Brahmin
> What is the difference here? Surely not religion
> God dwells only in the heart of men
> And there all are but equal…"[15]

Furthermore, Tagore asserts that if something like an Indian nation emerges, it can never be by leaving out Muslims. His idea was that the Hindus are unique in this world and that they may and may not be called a distinct nation, though in the west the political unity has been the primary determination of nationhood. He says that Hindus never had this unity but it does not follow that they were not a nation implying his subtle contempt towards 'Hindu' nationalism. The protest is voiced not only through poetic allegory but also in direct prose.

> Its our religion, not our human nature, which tells us to despise man in practice in so unjust a fashion… it is this religion which tells the people that the majority has no right to the full truth, that they must be satisfied with the incomplete… To the Aryan non-Aryan disunity we have given the name of Hindu religion we boast of an eternal heritage; it's awful load has kept our people down in the dust for untold ages… our educated people proclaim with pride that such amazing diversity in religion is not to be seen anywhere in this world.. in Hindu society alone we have both high and low found a place irrespective of their worth. But

> the rational judgment is the judgment of man. Man must judge between high and low, good and evil, creed and human nature… the case of our wretched condition is to be found in our peculiar religion and nowhere else.[16]

Thus he voices that nationalism should not be Hindu superiority among non-Hindus. The Freedom for him is seeing humanity in the Supreme Being. The Muslim participation in *Svadeśi* became a great concern to Tagore. At the Bengal provincial, conference 1908, Tagore called for Hindus to support special concessions to Muslims in order to bring about a healthy relationship between the communities. What was demanded after the idea of unification of both groups is a breaking down of walls, a rejection of sectarian barriers and building of *Mahājāti* on the basis of broad humanism. Tagore states.

> People whose religion teaches them to despise others, whose heaven is supposed to be ruined by drinking water touched by a neighbour, who have to protect their sanctity by insulting others – such people deserves no better fate than humiliation.[18]

To Rabindranath Tagore, the vision of united India on the basis of transcending all barriers of caste, religion and race were the ultimate goal of a nation. His daily contact with the simple share cropping peasants may have led him to value Indian traditions. In his writings on 'What is Nationalism'[19] Tagore exemplifies nation as a mental construct and he differentiates between the idea of a nation in the West and the idea of society in Indian History. He further states that:

> What we have to understand is that society or community reigns supreme in India. In other countries, nations have protected themselves from various revolutions for survival. In our country society has survived countless convulsions from time immemorial… [20]

Many of his short stories deal with the life of the villagers and his poems showed a deepening love for his natural surroundings. The beauty, simplicity and harmony with the nature of rural life grew so congenial for him that he idealized his life as the true Indian culture.[21] In his famous *Svadeśi Samāj* address (1904), he had pleaded that all around efforts have to be made to promote self help in the countryside through the revival of the traditional village community, or *Samāj* through which he seems to have had a romanticized conception.[22] There a committee of five would be chosen by the inhabitants of each village to promote *Svadeśi* art and crafts, setting up schools, dispensaries and irrigation constructions to uplift the life of the rural community.

Unlike the other *Svadeśi* members, Rabindranath did not reject the influence of western thoughts in Indian renaissance. He stated that India must recognize that it is providential that the west has come to India and yet one must show the east to the west and convince the

west that east has her contributions to make the history of civilizations.[23] He emphasized the idea of equality of the east with the west stating.

> Only when she (India) can meet him (England) as, his equal with all reasons for antagonism and with it all the conflicts disappear. Then will east and west unite in India. Country with country, race with race, knowledge with knowledge endeavour with endeavour, then will the history of India come to an end merged in the history of the world…[24]

It seems that the ultimate goal through nationalism is harmonizing India with the west and universalizing India and identifying it with the rest of the world. He repeatedly emphasized on the misuse of power and aggressive force made by the nationalist movement in India. It is the very fact which has been the bottom of India's troubles; Tagore was sadly disappointed with Japan and blamed the intense nationalism and militarism he saw there on insidious western influence. Tagore assumes that the idea of a nation is an aspect of a whole people as an organized power. Even though he mentions power on nationalism he is displeased by the movements which seek political independence. He states that,

> There are different parties in India with different ideals. Some are struggling for political independence. Others think that the time has come and has not arrived for that yet, and yet believe that India should have the rights that the colonies have. They wish to gain autonomy as far as possible.[25]

Tagore admired Gandhi's fight for awakening the rural masses to self help and political consciousness but thought that Gandhi had taken an devaluated *Svadeśi* and revolutionary movement and was afraid that people are blindly embracing the new faith of the new 'Guru'.[26] Tagore wanted to retain the gains of western education as a ground for the meeting of all cultures on the basis of mutual exchange. He also admired Raja Rammohan Roy as the person, who laid the foundation to Indian Renaissance and described Rammohan Roy as a person, "with a wondering breadth of heart and intellect he accepted the west without betraying the east and led India into the freedom of space and time and built for her the bridge between east and west."[27]

Rabindranath Tagore's universality of the idea of Nation as a non Hindu ideal is much depicted in his novel *Gora*[28] published in 1910. He displays the conditions of the society through the unforgettable characters in the novel *Gora*. Haranbabu represents as a staunch Brahmo, Harimohini as a ritualistic Hindu and Pareshbabu and Anandamayee as example of religion of Man, the universal. The central character *Gora* is initially a staunch Hindu, who observes Hindu rituals with special attention to them, but when he came to know his Irish birth surprisingly declares that he was free then without a religion, caste, creed and no bondage of doctrines. He becomes a Human being without any socio-religious convictions. Through the character *Gora* one sees the religion of man and the concept of freedom. It is

noted that Tagore spoke his ideas through Pareshbabu's voice and Anandmayee's work.[24] It is evident that the freedom through Nationalism or Hindu-patriotism is beyond the average political endeavor. His idea of a free nation is hence an ideal status without any religious ties. Just as much as Gandhi steered the concept of *Ahimsa*, which is the most common of all Indian religious faiths to bring about a political freedom and consequently a free united Indian nation, Rabindranath Tagore molded all the positive aspects of the religions to bring about freedom to a one nation one state concept independent from British affiliation. As the religion played a vital part in Indian society, freedom from a sole authority of a vernacular was essential for Tagore's views on Nationalism. In his lectures he insists this idea as:

> I have been asked to let you know something about my own view of religion. One of the reasons why I always reluctant to speak about this is, that I have not come to my own religion, based upon the utterance of Indian sages in the Upanisads. But owing to my idiosyncrasy of temperament, it was impossible for me to accept any religious teaching on the only ground that people in my surroundings believed to be true … Thus my mind was brought up in an atmosphere of freedom, freedom from the dominance of any creed that had its sanction in the definite authority of some scripture or in the teaching of some organized worshippers…[30]

The tendency to love the territory, language and common descent eventually has become the natural elements out of which nationalism is formed; however, according to Kohen it is not a natural phenomenon, not a product of eternal or natural laws but a product of the growth of social and intellectual factors of a certain age of history. Charies Heimsath, a prominent Orientalist, opines that there has never been a clear-cut for the definition of nationalism. He, agreeing with Kohen asserts that it is also an attitude of mind (of people) or set of beliefs that is shared by a group of people large enough to be influential embodying the idea of nation and the nation's goals.[31] Nationalism, therefore, could be considered as a process of integration of masses of people into a common socio-political entity. Nationalism thus presupposes the existence, in fact, as an ideal of a centralized form of a government over large and a distinct territory.[32] Thus, representing as an important fact in the formation of a social group, nationalism becomes a natural tendency in human mind to love the birthplace or the place of their childhood sojourn surroundings and climate. The language then becomes important as people have an easily understandable preference for their own language, for language makes the way in which they can thoroughly understand each other and to create a homely atmosphere.

The age of nationalism represents a period of history of mankind. Nationalism which emerged in the eighteenth century in Western Europe spread into the farthest corners of the world and wherever it reached, it shaped human thought and society according to its own image. The impact of the western ideas had evoked various responses in the nineteenth century; some had attempted the synthesis between east and west in the field of learning and some in the field of social reform. Tagore, however, did not transcend and inherit

them, but blended all and affected it into another synthesis with his poetic genius. Tagore looked forward to a universal humanity, which is evolving through nationality to fulfill a spiritual destiny. Tagore placed the greatest emphasis on the dignity, freedom and equality of individual and at the same time emphasized the obligation of the individual to the human society. Rabindranath Tagore wielded his pen with a new stimulating national resurgence and contributed for the political awakening of his countrymen with no identification of self with any group of active political participants but as a free individual and still remains as a mighty spreading tree routed to the Indian soil.

## Endnotes

1. Mabett, I.W., 1968. *A Short History of India.* Melbourne: Cassel. p. 190.
2. Konolkar, G.D., 1963. *The Lute and the Plough.* Bombay: The Book Centre. p. 15.
3. Tagore, Rabindranath, 1917. *Nationalism*. London: Macmillan. p. 9.
4. Hay, Stephan, 1970. *Asian Ideas of East and West.* Harvard University Press. p. 32.
5. Gordon, L.A., 1974. *Bengal: The Nationalist Movement 1876-1940.* New York: Columbia University Press. p. 11.
6. Mabett, I.W., Op.cit. p. 97.
7. Tagore, Rabindranath, Op.cit. p. 97.
8. Sarkar, Sumit., 1973. *The Svadeshi Movement in Bengal 1903-1908.* New Delhi: Peoples Publishing House. p. 155.
9. Ibid. p. 157.
10. Nationalism. p. 97
11. Tagore, Rabindranath, 1919. *Home and the World.* London: Macmillan. p. 17-18.
12. Ibid. pp. 12-20.
13. Ibid. pp. 138-139.
14. Ibid. p. 45.
15. Sarkar, Susobhan., 1970. *Bengal Renaissance and other essays*. New Delhi: Peoples publishing House. p. 167.
16. Ibid. p. 179.
17. Gordon, L.A., Op.cit. p. 93.

18. Sarkar, Sumit., Op.cit. p. 85.
19. Tagore, Rabindranath, 1939-65. (tr.). *Rabindra Rachanabali* 3. Calcutta: Govt of West Bengal. pp.515-19
20. Ibid, p.522
21. Hay, Stephan, Op.cit. p. 32.
22. Sarkar, Sumit., Op.cit. p. 245.
23. Tagore, Rabindranath, *Nationalism*. p. 109.
24. Hay, Stephan, Op.cit. p. 45.
25. Ibid. p. 112.
26. Gordon, L.A., Op.cit. p. 184.
27. Tagore, R., Op.cit. p. 102.
28. Tagore, Rabindranath, 1910. *Gora*. London: Macmillan.
29. Dasgupta, Asin "Rabi Thakurs Party". In: *Visva-Bharati Quarterly*. New Series. Vol. IV. No. I & II.
30. Tagore Rabindranath. 1970. *Lectures and Adresses*. London: Macmillan. p.11.
31. Heimsath, Charles, 1961. *Indian Nationalism and Hindu Social Reform*. New Jersey: Princeton University Press. p. 133.
32. Kohen, Hans, 1961. *The Idea of Nationalism*. New York: Macmillan. p. 4.

# නූතන සිංහල සාහිත්‍ය කලා සම්භාෂණය සහ රවීන්ද්‍රනාථ ඨාකූර්

**සරත් විජේසූරිය**

මම බැතිමතෙක් ද නොවෙමි, මිසදිටුවෙක් ද නොවෙමි
මම සිකපද අනුව හෝ මගේ බුද්ධිය අනුව හෝ ජීවත් නොවෙමි
මම දේශකයෙක් ද ශ්‍රාවකයෙක් ද නොවෙමි
මම ස්වාමියෙක් ද සේවකයෙක් ද නොවෙමි
මම නිදහස් ද නො නිදහස් ද නොවෙමි
මම කිසිවවෙකුගෙන් දුරස්තර කිසිවෙකුට ළං ද නොවෙමි
මම දෙව්ලොවට ද අපායට ද නොයන්නෙමි
මම සියලු කාර්යන්හි ව්‍යාවෘත වන අතර,
සියලු කාර්යකින්ම පිටස්තර වෙමි
මා වටහා ගන්නන් නැති තරම් ය,
මා වටහා ගන්නා තැනැත්තේ
සාමය භජනය කරන්නේ ය.

\- රවීන්ද්‍රනාථ ඨාකූර්
(උද්ධෘතය : පඤ්ඤාවංස (පරි), 1999:20)

ශ්‍රී ලංකාවේ සංස්කෘතිය, ආගම මෙන්ම දේශපාලනය සම්බන්ධයෙන් අතීතයේත් වර්තමානයේත්, ඉන්දියාව සමීපතම රාජ්‍යයයි. ඒ සමීපතාව මෙන් ම බලපෑම කෙතරම් ද යත්, මුළු මහත් ඉන්දියාවටම අදත් මහා පුරුෂයන් වන, මහත්මා ගාන්ධිතුමාත්, රවීන්ද්‍රනාථ ඨාකූර්තුමාත් අපට ද මහා පුරුෂයෝ වෙති. ආසියාවේ පහළ වූ ශ්‍රේෂ්ඨතම කවියා මෙන් ම චින්තකයා ද වන රවීන්ද්‍රනාථ ඨාකූර් අපගේ සාහිත්‍ය කලා සම්භාෂණයෙන් මතු අනාගතයේ දී වත් දුරස්ථ නොවන චරිතයකි. නූතන සිංහල සාහිත්‍ය කලාව පිළිබඳ ඉතිහාසය ලියන කවරෙකුට වුව ඨාකූර්තුමා ගැන සිහිපත් නොකර යමක් ලියන්නට අපහසුය යන්න අතිශයෝක්තියක් නොවේ.

නූතන සිංහල සාහිත්‍ය කලාවේ ප්‍රගමනයට රවීන්ද්‍රනාථ ඨාකූර්ගේ චින්තනය සිදු කළ අර්ථ සම්පන්න බලපෑම පිළිබඳ සමාලෝචනයක් කිරීම මෙම ලිපියේ අරමුණයි. එමෙන්ම එතුමන්ගේ චින්තනය අපගේ සාහිත්‍ය කලාවේ අනාගතයට අසාමාන්‍ය ආලෝකයක් බව පෙන්වා දීමට ද අදහස් කරමි.රවීන්ද්‍රනාථ ඨාකූර් අපට අමතක කළ නොහැකි අන්දමේ විශිෂ්ටයෙකු වන්නේ කෙසේ ද? අනාගතයට, අපගේ අනාගත සමාජ චින්තනයට එතුමන් වැදගත් වන්නේ කවරාකාරයෙන් ද? ප්‍රථමයෙන් ඒ සම්බන්ධ අනුස්මරණයක නිමග්න වන්නට මම කැමැත්තෙමි.

> යුනිවසිටි කොලීජියට ඇතුල් වී උපාධියක් ලබාගැනීමේ ආසාව කෙමෙන් මගේ සිතෙන් ගිලිහී යන්ට පටන් ගති. සංගීතඥයෙකු වීමේ ආසාව ඒ වෙනුවෙන් මගේ සිතෙහි පැන නැඟුණි. මේ පරිවර්තනයට එක් හේතුවක් විය හැක්කේ මහා කවි රවීන්ද්‍රනාථ ඨාකුරයන්

(තාගෝර්) මෙහි පැමිණීමත්, 'ශාප මෝචන' නම් ඔහු විසින් නිර්මාණය කරන ලද මුද්‍රා නාටකය මට බලන්ට ලැබීමත් ය (සරච්චන්ද්‍ර ; 1985 : 40).

රවීන්ද්‍රනාථ ඨාකූර් භාරතයේ සාහිත්‍ය කලා සම්භාෂණයට කළ බලපෑම කෙතරම් ද, එවන් බලපෑමක් අපගේ සාහිත්‍ය කලා සම්භාෂණයට සිදු කළ මෙරට පුරවැසියා එදිරිවීර සරච්චන්ද්‍රයි. සරච්චන්ද්‍රයන් අපගේ සාහිත්‍ය කලා සම්භාෂණයට කළ බලපෑම පිටුපස ආලෝකය රවීන්ද්‍රනාථ ඨාකූරයන් ය යන්න පැහැදිලි කරුණකි. දීර්ඝ කාලයක් යටත් විජිතයක්ව පැවති ශ්‍රී ලංකාවේ සමාජ සංස්කෘතික ජීවිතය බටහිරීකරණය නොවී දේශජ ලක්ෂණ සොයා යාමට අවශ්‍ය බුද්ධිමය චින්තනය උත්පාදනය කෙරෙන්නේ පෙරදිග සෞන්දර්ය ප්‍රවාහයේ උල්පත සේ සැලකෙන ඨාකූරයන්ගේ ශාන්ති නිකේතනයෙන් සරච්චන්ද්‍රයන් ලත් ආභාසය විය යුතු ය; මහත්මා ගාන්ධිතුමන්ගේ දර්ශනයෙන් ලත් ප්‍රභාව විය යුතු ය.

භාරතය ශ්‍රී ලංකාවේ සමාජ සංස්කෘතික ජීවිතයට ඈත අතීතයේ සිටම විශාල ආලෝකයක් උදා කළ බව පිළිගත් කාරණාවකි. නූතන සිංහල සාහිත්‍ය කලා ක්ෂේත්‍රයට ද ඒ ආලෝකය විවිධාකාරයෙන් ලැබී තිබේ. ඒ සඳහා රවීන්ද්‍රනාථ ඨාකූරයන්ගේ ශාන්ති නිකේතනය නිහඬ ප්‍රදීපස්තම්බයක් වී ඇත. ශාන්ති නිකේතනය ඨාකූරයන්ගේ චින්තනය විදහා පෑ දැවැන්ත විද්‍යාස්ථානයකි. මෙරටින් එහි ගොස් ඉගෙනුම ලැබූ පුද්ගලයන් සියලු දෙනාම අපගේ විවිධ කලා මාධ්‍යයන්හි ද, සාහිත්‍ය ක්ෂේත්‍රයේ ද, පුරෝගාමීන් වූ බව සත්‍යයකි. බටහිර විශ්වවිද්‍යාල වලට ගොස් පසුකාලීනව හෝ ශාස්ත්‍ර හදරා මෙරටට පැමිණි පුද්ගලයන් කිසි කෙනෙකුට මෙරට සමාජ සංස්කෘතික ක්ෂේත්‍රයට කළ නොහැකි වූ ප්‍රබල බලපෑමක් ඨාකූරයන් සෙවණේ, ශාන්ති නිකේතනය සෙවණේ, අධ්‍යාපනය ලැබූ ශාස්ත්‍රසේවීන් හට කළ හැකි විය. ඒ බලපෑම අද දක්වාම පවතින එකක් වීම ඉතා වැදගත්ය. ඊට තුඩු දුන් වැදගත්ම බලපෑම කළ පුද්ගලයා ඨාකූර් නම් වූ චින්තකයා ය. ඨාකූර්ගේ චින්තනය සතු වූ අසාමාන්‍ය ප්‍රභාව ගැන මෙන් ම, සරච්චන්ද්‍රගේ ජීවන පුරුෂාර්ථ විෂයෙහි හෘදයංගම අවබෝධයක් ලැබීම පිණිස මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ ආවර්ජනයක් වෙත අවධානය යොමු කරන්නට කැමැත්තෙමි.

ගාන්ධිතුමා ජීවමාන ස්වරූපයෙන් මට පළමුවරට දකින්ට ලැබුණේ මා ශාන්තිනිකේතනයෙහි භාරතීය දර්ශනයත්, සංගීතයත් හදරමින් සිටි අවස්ථාවෙහි දී ය. මේ ලෝක ප්‍රකට ආයතනයට යන්ට මා තීරණය කෙළේ ඨාකූර කවීන්ද්‍රයාත් එතුමාගේ නිර්මාණයක් වූ "ශාප්මෝචන්" නම් මුද්‍රා නාටකයත් අවුරුදු කීපයකට උඩ දී නරඹා ඒ නිර්මාණයේ හුදු සෞන්දර්යයෙන් වශී වීමත් එහි සංගීතයෙන් මෝහනය වීමත් නිසා ය. මේ වූ කලී ඨාකූර කවීන්ද්‍රයාණන්ගේ පැමිණීම හේතු කොටගෙන අපේ සංස්කෘතික දරිද්‍රතාව කෙබන්දක් දැයි මධ්‍යම පන්තික තරුණයන්ගේ සිත්වලට කා වැදෙන්ට පටන්ගත් අවධිය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් අපේ සංස්කෘතියේ මුල් සොයා ශාන්තිනිකේතනය හා භාරත දේශයෙහි පිහිටි අඩියාර්, කේරළ කලාමණ්ඩලම් වැනි ආයතනවලට මෙරටින් ගලා යාමක් සිදු වූයේ ය....

රවීන්ද්‍රනාථ ඨාකූර කවීන්ද්‍රයන්ගේ ශාන්තිනිකේතන සංකල්පය ගාන්ධිතුමා විසින් විවේචනයට ලක් කරන ලද බව ප්‍රකට ය. "සෙත් නිවස" යන අර්ථය දරන ශාන්තිනිකේතනයට යාම අවට පවතින ජාතික සටනට පිටුපෑමක් වැනි යයි ගාන්ධිතුමා කීවේ ය. එහෙත් ශාන්තිනිකේතනයට ගොස් එහි තතු සියැසින් බැලීමෙන් පසු ගාන්ධිතුමාගේ අදහස වෙනස් විය.

> එය අතීතයට පලා යාමක් නො ව තමා විසින් මෙහෙයවනු ලබන ධර්මිෂ්ඨ සටනෙහි අංගයක් බව එතුමාට ප්‍රත්‍යක්ෂ විය. භාරතය වූ කලී ලෝකයේ කවර රටක හෝ සංස්කෘතියකට නොදෙවෙනි සංස්කෘතියක් හිමි කරගත් රටක් වන බැවින් එබඳු රටක ජනතාවගේ ස්වාධීනත්වය පැහැර ගැනීම අධර්මිෂ්ඨ ක්‍රියාවක් බව අධිරාජ්‍යවාදීන්ට ඒත්තු ගැන්වීමට ශාන්තිනිකේතනය ඉවහල් වන බව එතුමාට පෙනුණි.
>
> (ගලහිටියාව සහ ධර්මදාස, 1993 ; 160-161)

ශාන්තිනිකේතනයට යන සරච්චන්ද්‍රයන් සුභාවිත කලාව සහ ඊට ආලෝකය සපයන භාරතීය දර්ශනය සහ භාරතීය සෞන්දර්යවේදය පිළිබඳ මූලික අවධානය යොමු කරන්ට ඇතැයි සිතිය හැකිය. එතුමන් පසුකාලීනව කලා විචාරයෙහි ඉවහල් කර ගත් න්‍යායාත්මක ප්‍රවේශය මඟින් ඒ උපකල්පනය සනාථ වෙයි. සරච්චන්ද්‍රයන් ම පවසන පරිදි ඨාකුරයන්ගේ නිර්මාණ සහ එතුමන් භාවිත කළ සංගීතයෙන් වශීකෘත වීම තමාගේ ජීවිතයට තද බලපෑමක් කර තිබේ. එහෙත් ඨාකුර් ගේ කලාව හුදු සෞන්දර්යමය ආස්වාදය උදෙසාම වූවක් නොවේ. සුභාවිත කලාව එතුමන් භාරතීය දර්ශනයෙන් හා සෞන්දර්ය විද්‍යාවෙන් උත්පාදනය කළ එක් මහාර්ඝ නිර්මාණාත්මක ඥාන ධාරාවකි. එතුමන්ගේ නිර්මාණාත්මක කාර්යසාධනයෙහි තවත් ප්‍රබල අංශයක් ඇත.

## ඨාකුර් නමැති චින්තකයා

ඨාකුර්තුමා හුදු සෞන්දර්යකාමියෙක් නොවේ. සැබවින්ම එතුමා සමාජ චින්තකයෙකි. සමාජ චින්තකයෙකු ලෙස විද්‍යමාන වන්නේ ගද්‍ය සාහිත්‍යය ඔස්සේ ය. එතුමන් ගේ ප්‍රබන්ධ රචනා ඔස්සේ ය. ඒ අංශයෙහි විදහා පෑ ප්‍රතිභාව හා ශක්තිමත් ජීවන පුරුෂාර්ථ අධ්‍යයනය කරන විට එතුමා, 'පෙරදිග චින්තනය' අනාගතය උදෙසා දීප්තිමත් ඥානාලෝකයක් ලෙස කල්තබාම හඳුනාගත් බව පෙනේ. ඨාකුර්තුමන්ගේ ප්‍රබන්ධ රචනා, එතුමන්ගේ අතිරමණීය පද්‍ය සාහිත්‍ය නිර්මාණවලින් වෙසෙසා හඳුනා ගත යුතු ය. පද්‍ය නිර්මාණයේ දී ඨාකුර්තුමා සැබෑම සෞන්දර්යවේදියෙකි. සංගීතය, පද්‍ය නිර්මාණයේදී එතුමන්ට නිර්මාණාවේශය ලබා දෙන ලද උල්පත වීය. ප්‍රබන්ධ රචනයේ දී සංගීතය නොව 'සමාජ දේශපාලනය' එතුමන් ගේ නිර්මාණාවේශය අවදි කර තිබෙන බව පෙනේ. එතුමන්ගේ කෙටිකතා සහ නවකතා සමස්ත භාරතයම, භාරතීය සමාජ ජීවිතයම, ස්වකීය හෘදයංගම අත්දැකීම් ඔස්සේ ප්‍රති නිර්මිත නිර්මාණාත්මක 'දේශපාලනික වියමන්' ය. අසමසම පරිකල්පන ශක්තියෙන් ද, තියුණු නිරීක්ෂණයකින් ද, ප්‍රබල දේශපාලන දෘෂ්ටියකින් ද, ඔහු භාරතීය සමාජය වසා ගත් සියලු උපද්‍රවයන් විභාග කර ඇත. අභාග්‍යය නම් ඨාකුර්ගේ පද්‍ය සාහිත්‍ය තරම්, එතුමන්ගේ ගද්‍ය සාහිත්‍යය, අපගේ සාහිත්‍ය කලා සම්භාෂණයෙහි නිසි අවධානයකට ලක් නොවීම ය. එහෙත් නවසිය හැට ගණන්වල සිට ම එතුමන්ගේ උසස්ම ප්‍රබන්ධ කථා සිංහලයට නැගී තිබේ. ඨාකුර්ගේ කලාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පුරෝගාමී විද්වතා වන සරච්චන්ද්‍රයන්ට හෝ ප්‍රබන්ධ කතා කලාවට වැදගත්ම බලපෑමක් කළ ලේඛකයා වන මාර්ටින් වික්‍රමසිංහට හෝ, ඨාකුර්ගේ ප්‍රබන්ධ කතාවල වූ කලාත්මක ගැඹුර හඳුනා ගන්නට නොහැකි වීම අභාග්‍යයකි. ඨාකුර්ගේ ප්‍රබන්ධ කතා ඉතා පැහැදිලිවම ප්‍රබල දේශපාලනික කථිකාවන් ය. එතුමන් සිය කුඩා කාලයේ පටන් ලත් ජීවන අත්දැකීම් ආවර්ජනය කරමින් ලියා තිබෙන සෑම කෘතියකම ඨාකුර් නමැති චින්තකයා විද්‍යමාන ය. මතු දැක්වෙන්නේ අත්දැකීම්වලින් හා නිරීක්ෂණයන්ගෙන් මුහුකුරා යමින් තිබූ ඨාකුර් ගේ සමාජ දේශපාලන දැක්ම කුළු ගන්වන සටහනකි.

කලිකතා වැසියන් වන අපට එහි පෞරාණික ශ්‍රී විභූතිය පිළිබඳ කිසිදු සාක්ෂියක් කොහෙන් වත් දක්නට ලැබෙන්නේ නැත. අපේ දර්ශනය මේ එක තැන නතර වූ කාලයන්හි පටු සීමා තුළ සිර වී තිබුණි. ඉතිහාසය මඳ විරාමයකට නතර වී සිය වංශාධිපති යටගියාව දෙසට මුහුණ ලා සිටගත් වනම සිටින බවක් මට පළමු වරට හැඟුණේ අහමාබාද්හි දී ය. ඇගේ අතීතයේ ප්‍රථම භාගය බහිරව නිධානයක් මෙන් පොළාව තුළ වැළලී ගොසින් ය. "සාගිනි පාෂාණ" කතාව ලිවීමට මුල් ම අදහස් මගේ මනසේ පහළ වූයේ මෙහිදී ය.

ඒ යුගයේ සිට සියවස් කීයක් ගත වී ඇත් ද? එකල වන්දීන් ගේ ශාලාවේ නහබත් ඛානාහි රැයත් දවාලත් පුරා දවසේ ඒ ප්‍රහාර සමයයන් අටට ගැළපෙන සංගීත ඛණ්ඩ, සංගීතඥයන් විසින් වාදනය කරන ලදී. වීථීන්හි රිද්මයකට අනුව අශ්වයන් ගේ කුර ගැටෙන හඬ රැව් දුන්නේ ය. තුර්කි අශ්වාරෝහක බළඇණි උත්කර්ශවත් පෙරෙට්ටු පවත්වන කල ඔවුන් ගේ තෝමර මත හිරු එළිය ලෙළදිණි. විනාශකාරී කුමන්ත්‍රණ ගැන අසුබ පෙරනිමිති පිළිබඳව රහස් කතා පාද්ෂාහ් ගේ රාජසභාව තුළ රහසින් තොල් මැතුරුණි. ඇබිසිනියානු නපුංසකයෝ කඩු ඇද ගත් වනම අභ්‍යන්තර ආගාර රැකවලෙහි යෙදුණහ. බෙගම්වරුන් ගේ නාන තටාකයන්හි රෝස වතුර උල්පත් කෙළිදෙළෙන් රඟදෙන අතර කෝමල අත් වල ගැවසි වළලු නද දිනි. ෂාහිබාග් අද මතකයෙන් මැකී ගිය කථාන්තරයක් මෙන් නිහඬ ව සිටියි එහි වූ නන් පැහැ වර්ණ සියල්ල සේදී ගිහින් ය. දිවා කාලයේ පැවැති ශෝභාව වියැකී ගොසිනි. රාත්‍රි කාලයෙහි පැවැති රසාලිප්තභාවය මැකී ගොසිනි.

ඒ පැරණි සමයෙන් ඉතිරි වී ඇත්තේ මසින් ලෙයින් තොර වූ ඇටකටු පමණකි. හිස පළන් කිරුළ ගිලිහී ගොස් කෞතුකාගාරයක ඇති මමියක වැනි නග්න හිස් කබල දිස් වෙයි. ඒ වියළි ඇටකටු ලෙයින් මසින් පුරවා යළිත් මුල් තත්වයට සම්පූර්ණයෙන් ආපසු ගෙන ඒමට මගේ මනසට හැකි විණැයි කිවහොත් එය අතිශයෝක්තියකි. මූලික වූ රළු ආකෘතියත්, එය නැගී සිටුනා පසුතලයත් යන දෙක ම හුදෙක් කාල්පනික නිර්මාණයක් පමණකි. මේ අවුරුදු අසූවකට පසුවත් මා ඉදිරියේ මැවෙන චිත්‍රය එහි රේඛාවක් පාසා යථාර්ථය සමඟ සම්පාත වන්නේ නැත. එය බොහෝසෙයින් ම සංකල්පනාවන්හි ප්‍රතිඵලයකි.

(සේනාරත්න, 2005 : 71-72).

ඨාකුර්ගේ ප්‍රබන්ධ කතා හැම එකකටම පසුබිම් වී තිබෙන්නේ උරුමය සොයා ගිය පරිශ්‍රමයක ආවේශය බව විශද කරන්නට ඔහුගේම ලේඛන සාක්ෂි සපයයි. ඔහු සිය රට වෙනුවෙන් රටේ අනාගතය ගොඩ නඟන්නන් වෙනුවෙන් බුද්ධිමය දේශපාලනයක නිමග්න වූ බව එවන් අප්‍රමාණ ලේඛනවලින් මනාව පැහැදිලි වේ. ඒ නිසාම ඨාකුර්ගේ ප්‍රබන්ධ කතාවල 'අගය' හෝ 'ගුණය' විමසිය යුත්තේ ඉන්දියානු නිදහස් සටන පසුබිමෙහි තබාගනිමිනි. එසේ නොකළහොත් ඒවාට පටු අර්ථකථන සැපයීමට කෙනෙකු උත්සුක වනු ඇත. එය පියදස සිරිසේනගේ නවකතා අප කියවූ සාවද්‍ය ප්‍රවේශය ම වනු නිසැකය. අප යථාර්ථවාදී නවකතා හඳුනා ගන්නට ඉවහල් කර ගත් ක්‍රමවේදය අපේ ප්‍රබන්ධ කතා කියවීමට ප්‍රමාණවත්වීම කෙසේ වෙතත්, ප්‍රබන්ධ කථාවේ අනාගතය වෙනුවෙන් කිසිසේත් ප්‍රමාණවත් නොවූ බව නම් අද පැහැදිලි ය.

**ගෝරා, ශ්‍රී ලංකාවේ හෙට දවස වෙනුවෙන් ඥානාලෝකය**

"....ගෝරා නවකතාව සැකයක් නැතිවම රවීන්ද්‍රනාථ ඨාකූර් ගේ හොඳම නවකතාව ලෙස සැලකේ.

> යටත් විජිත පාලන සමයේ මේ නවකතාව ලියූ වකවානුව ජාතිය තුළ අවදි වීමක් ඇති වෙමින් පැවතුණේ ය. ගෝරා නවකතාව හින්දු සමාජය තුළ පැවති අඩුපාඩුකම් පිළිබඳව අවධානය යොමු කරවන කෘතියක් වන අතරම එය භාරත දේශයේ නිදහස සඳහා මඟ පෙන්වන ග්‍රන්ථයක් ලෙස ද සැලකිණ. වංග ජාතිකයන් තුළ පමණක් නොව සමස්ත භාරත වාසීන් තුළ තම සහෝදර වැසියන් කෙරෙහි පැවති ආකල්ප පිළිබඳව නැවත සිතා බැලීමට පොළඹවන ආකාරයේ ග්‍රන්ථයක් දෙස ද මෙය හැඳින්විය හැකිය.
>
> (ලක්ෂ්මීසිංහආරච්චි ; 1999 : iv)

අද අප ජීවත් වන්නේ අලුත් සමාජ දේශපාලනික හා සංස්කෘතික වෙනසක් අපේක්ෂා කරන යුගයක ය. දශක තුනක් පැවතුණ යුද්ධය අවසන්ව, යළි යුද්ධයක් අවශ්‍ය නැත යන ප්‍රාර්ථනාව පෙරටු කර ගත් පසුබිමක ය. ජාතියක් වශයෙන් අපට අලුතින් සිතන්නට සිදු වී ඇත. වෙනස් වන්නට අවශ්‍යයෙන්ම සිදු වී තිබේ. එය වූ කලී ඓතිහාසික අවශ්‍යතාවකි. අනාගත අපේක්ෂණයන් උදෙසා අවශ්‍ය වූවකි. 'අපේ රට සිංහල බෞද්ධ රට' යනුවෙන් උදම් ඇනීම මෙන්ම, 'අපි අසම සම ජාතියකි' යන දෘෂ්ටිවාදය ද ඇතුළු අප වටකර ගෙන තිබෙන හා අප බඳු වැළඳ ගන්නට පෙළඹෙන, පටු දේශපාලනික අරමුණු සාක්ෂාත් කරන සියල්ල වටහා ගත යුතු තීරණාත්මක අවස්ථාවක අපි ජීවත් වන්නෙමු. අපි අනාගතය වෙනුවෙන් සිතා කල්පනාකාරීව තීරණ තීන්දු ගත යුතු වෙමු. ඒ සඳහා අපව පරීක්ෂා කර ගැනීමට නිර්භය අදහස් හා මතවාද සමඟ භාෂණයක යෙදිය යුතුය. ඒ සඳහා රවීන්ද්‍රනාථ ඨාකූරයන්ගේ 'ගෝරා' නවකතාවෙන් විශිෂ්ට ඥානාලෝකයක්, ප්‍රඥාවක් අපට උරුම කර ගත හැකි ය.

රවීන්ද්‍රනාථ ඨාකූර්ගේ විශිෂ්ටතම නවකතාව ලෙස පිළිගැනෙන 'ගෝරා' මුලින්ම සිංහලයට නැඟෙන්නේ 1961 දී ය. ඒ වන විට 'ගම්පෙරළිය' පළ වී දශකයක් ඉක්ම ගොසිනි. පියදස සිරිසේනගේ නවකතාව යථාර්ථවාදී නවකතාවක් නොවේ යන්න සනාථ කිරීම මෙන්ම, නියම යථාර්ථවාදී නවකතාව කවර ස්වරූපයක එකක් ද යන්න ගැන තීන්දු ගෙන හමාර ය. ඒ සන්දර්භය තුළ 'ගෝරා' පිළිබඳ එකල පිළිගත් විචාරකයෙකුගේ විචාරයක් හෝ යම්කිසි හඳුන්වා දීමක් හෝ පළ වෙන්නේ නැත. 'ගෝරා' නවකතාව ඒ අවස්ථාවේ පළ කරන්නේ ලංකාවේ ප්‍රධානතම පොත් ප්‍රකාශන ආයතනයයි. ඒ ආයතනයට 'ගෝරා' නවකතාව අලෙවි කර ගැනීමට ද සෑහෙන කාලයක් ගත වෙයි. ඒ සමාගම නැවත ඒ නවකතාව පළ කිරීමට ද පියවර නොගනියි. ඊට හේතුව 'ගෝරා' අපේ සාහිත්‍ය සම්භාෂණයට ඇතුළත් කර නොගැනීම විනා වෙන හේතුවක් නොවේ. මේ කාරණාව අප බරපතල කාරණාවක් ලෙස සලකා බැලිය යුත්තේ ඇයි? බරපතළ කාරණාවක් ලෙස සලකා බැලිය යුත්තේ, ගම්පෙරළියෙන් පසු සිංහල නවකතාව අවසන්ය යන ප්‍රකාශය පමණක් නොව, සිංහල නවකතාව නිසරු ප්‍රලාපයක් බවට පත්ව ඇත යන ප්‍රකාශය ද දිගින් දිගටම විචාරකයන් විසින් පවසනු ලබන නිසා ය. ඇත්තටම ගම්පෙරළියෙන් පසු සිංහල නවකතාව අවසන් වී නම් හෝ දුර්වල වී නම් ඊට හේතු කවරේ ද? 1956 දී පළ වෙන 'විරාගය' මාර්ටින් වික්‍රමසිංහගේ විශිෂ්ටතම කෘතිය බවට නම් කළත් ඉක්බිතිව ලියවුණ නවකතා 'කාම කතා' හෝ 'පරාජිත චරිත' නිරූපණය කරන නවකතා ලෙස විවේචනය වූයේ මන් ද? ගුණදාස අමරසේකර විසින් මෑතක දී ලියා පළ කරන ලද, 'නොසෙවුනා කැඩපත' නම් කෘතියෙන් පවසා

සිටින්නේ සිංහල නවකතාව සමාජ චින්තනයකින් වියුක්ත වූ බවය. ඊට හේතු සාධක කීපයක් ඔහු පෙන්වා දෙයි. ඒ හේතු සාධක ඔහු 'අබුද්දස්ස යුගයක්' නම් වූ කෘතියේ ද දක්වන හේතු සාධකම වේ. අමරසේකරයන්ගේ මූලික තර්කය වන්නේ, අපගේ නවකතාව හරවත් සමාජ සංවාදයකට මඟ පෙන්වන්නට අසමත් වූ බවයි. අපට සිංහල නවකතාව සම්බන්ධ බරපතළ ප්‍රශ්නය මෙය නම්, අප යථාර්ථවාදී නවකතාව අවබෝධ කර ගත් අන්දම හා ඊට ඉවහල් කර ගත් ප්‍රවේශයෙහි ගැටලුවක් නොතිබේ ද? රවීන්ද්‍රනාථ ඨාකූර්ගේ 'ගෝරා' නම් වූ නවකතාව නොසලකා හැරීම, රවීන්ද්‍රනාථ ඨාකූර් ප්‍රබන්ධ කථාකරුවෙකු ලෙස අප නිසි ගෞරවයකින් පිළිනොගැනීම පිළිබඳ ප්‍රශ්නය වැදගත් වන්නේ මෙහි දී ය. ආචාර්ය ලියනගේ අමරකීර්ති මේ කාරණාව වෙත ඔහුගේ ශාස්ත්‍රීය ග්‍රන්ථ දෙකක දීම උවමනාවෙන් සාකච්ඡා කර ඇතත් ශාස්ත්‍රාලයී වියතුන් ඒ ගැන අවධානයක් යොමු කර නැත. සැබවින්ම ඒ කාරණාව ගැන පමණක්ම නොව ඒ කෘති දෙක ගැනම අවධානයක් යොමු කර නැති බව ද මෙහි දී කිව යුතු ය.

ඨාකූර් 'ගෝරා' රචනා කරන්නේ බරපතළ සමාජ සංවාදයක් වෙනුවෙන් යයි සිතිය හැකිය. එය විසිවන සියවසේ මුල් භාගයේදී රචනා කර ඇතැයි සැලකේ. 1908 - 1910 දක්වා කාලය තුළ 'ප්‍රවාසී' නම් වූ සඟරාවේ කොටස් වශයෙන් පළ කර ඇත. ඒ කාර්යය පියදාස සිරිසේන සිය 'ජයතිස්ස සහ රොසලින්' නමැති නවකතාව පාඨකයා හමුවට පත් කළ ක්‍රමවේදය ම වේ. මෙහිදී පියදාස සිරිසේන රවීන්ද්‍රනාථ ඨාකූර් ආදර්ශයට ගෙන ඇතැයි පවසන්නට අපට සාධක නැත. කෙසේ වෙතත් මේ දෙදෙනාගේ බුද්ධිමය ධාරිතාවන් අසාමාන්‍ය පරතරයක් විදහා පෑව ද, කාර්යයේ ස්වරූපය නම් එක සමානය. ඨාකූර් සිය බුද්ධිමය දේශපාලනය කරන්නේ දැවැන්ත රාජ්‍යයක් තුළ ය. ඔහුගේ දේශපාලනය ශක්තිමත් කරන උරුමයන් හා, ඔහුට ඥානාලෝකය සපයන බලවේග ප්‍රබලය. ඔහුගේ නිරීක්ෂණයට ලක්වන කරුණු කාරණා අතිශයින්ම සංකීර්ණය. ඔහු ජීවත් වූ යුගයට ඉදිරියෙන් පැවතිය යුතු රටක් වෙනුවෙන් සිය පරිකල්පන ඥානය අවදි කළ පුද්ගලයෙකි. කුල වාදය, වර්ග වාදය, මානව හිංසනය, පිටු දැකීමට අවශ්‍ය මානවහිතවාදය සමාජය තුළ අවධානයට ලක් කිරීම ද, අධිරාජ්‍යවාදයට එරෙහි ආස්ථානයක පිහිටමින්, දේශානුරාගය වෙනුවෙන් පෙනීසිටීම ද ඨාකූර්ගේ බුද්ධිමය දේශපාලනයට අදාළ විය. ඒ හේතු සාධකවල බරපතළකම නිසාම ඨාකූර්ගේ ප්‍රබන්ධ රචනය තුළ දිදුලන්නේ දීප්තියකි. අපට ආදර්ශයට ගැනීමට තිබුණ හොඳම ප්‍රබන්ධ රචනය, ප්‍රබලම යථාර්ථවාදී ප්‍රබන්ධ විලාසය ඨාකූර් විසින් නිර්මාණය කරන ලද, යථාර්ථවාදී ප්‍රබන්ධ විලාසය බව බව වටහා ගැනීම අද වුව අපට ඵල දයකය. 'යුද්ධය නිම විය' යන තාවකාලික සුව සිහිනය තුළ සිටින අප, අපගේ අනාගතය ගැන කල්පනා කළ යුත්තේ කෙසේ ද? මානව සංස්කෘතික උරුමයන් මෙන්ම මානව ගරුත්වය ගැන අප ගේ දෘෂ්ටීන් අර්ථසම්පන්න ලෙස සකස් කර ගත යුත්තේ කෙලෙස ද? අනාගත පරම්පරාවට ලබා දිය යුතු ආධ්‍යාත්මික ශික්ෂණය, පෝෂණය විය යුතු ධර්මතා මොනවාද යන්න ගැන අප තවමත් කතා කරන්නේ නැත. යුද ජයග්‍රහණය සැමරීම වෙනුවට, යළි යුද්ධයක් ඇති නොවන සමාජ චින්තනයක් වෙනුවෙන් අනාගතයට පියමං කරන්නට විනයක් අපට අවශ්‍ය ය. අද අපට රවීන්ද්‍රනාථ ඨාකූර්ගේ 'ගෝරා' නව සමාජ කියවීමකට විවෘත කර ගත හැකි බව අප වටහා ගත යුතු ය.

ආචාර්ය ලියනගේ අමරකීර්ති විසින් ඨාකූර් සම්බන්ධයෙන් සිදු කරන ලද අධ්‍යයනයන් දෙකකින් පාඨ කීපයක් මෙහි දී ගෙනහැර දක්වන්නට කැමැත්තෙමි.

> යථාර්ථය යන්නට හෝ යථාර්ථවාදය යන්නට සර්වකාලීන, සජාතීය අර්ථයක් ඇතැයි ගැනීම සාවද්‍යය. එසේම යුරෝපයීය සාහිත්‍යික යථාර්ථවාදය, යථාර්ථවාදී ප්‍රතිනිර්මාණ

විධිය පිළිබද තිබිය හැකි එකම නිර්වචනය ලෙස පිළිගැනීම ඊටත් වඩා සාවද්‍යය. යුරෝපයමවත් එසේ කර නැත.

තාගෝර් යථාර්ථවාදය යන සංකල්පයම පවා උපනිෂද් අර්ථයකින් වටහා ගත් බව අපි දුටිමු. ඒ වූ කලී යුරෝපීය යථාර්ථවාදයේ ඓතිහාසිකත්වයත්, ලෝක දෘෂ්ටියත්, සංස්කෘතියත් ඥානමීමංසාත්මකව සමතික්‍රමණය කිරීමකි........බාහිර කරුණුමය වාස්තවිකත්වය, ඓතිහාසිකත්වය සමඟ ඒකීයත්වයෙන් යුතුව හසු කර ගැනීම ඉන් අදහස් විය. එනම් අදාළ සමාජයේ දෘශ්‍යමාන කරුණුමය 'සත්‍යය' ද" එම සමාජයේ ඒ මොහොතට අදාළ සමාජ විකාශනමය (එනම් ඓතිහාසිකත්වය) ද නියම සම්භාව්‍ය යථාර්ථවාදයට හසු විය යුතුය. මින් උපදින්නේ, තාර්කික, ලෞකික, ඓතිහාසික යථාර්ථවාදයකි.

රවීන්ද්‍රනාත් තාගෝර්ගේ "යථාර්ථය" සංකල්පය ඒ තාර්කික ලෞකිකත්වය ඉක්මවා යථාර්ථය පිළිබඳ තවත් මානයක් හා සංයෝග වූවකි. මෙම යථාර්ථ සංකල්පය සෑදී ඇති සංරචක මොනවාද?

තාගොර්ගේ ලිපි ලේඛනවල 'යථාර්ථය' යන්නට සුවිශේෂ අර්ථයක් ඇත. "සත්‍ය" යන සකු වදන "යථාර්ථයත්", "සත්‍යයත්" යන දෙකම අදහස් කළේය. එසේම ඉන්දීය දර්ශනයන්හි "සත්‍යය" යන්නෙන් මානව අගයන් හෙවත් වටිනාකම් ද අදහස් කෙරිණ. එහෙයින් තාගෝර් යථාර්ථය යන වචනය භාවිත කරන්නේ මානව අගයන් පෞද්ගලික තලයේ දී සාක්ෂාත් කර ගැනීම ද අදහස් කිරීමටය. ආදරය, සෞන්දර්යය, යහපත යනාදිය මනුෂ්‍ය ජීවිතය තුළ දී "යථාර්ථයක්" බවට පත් කර ගත නොහැකි නම් ඒවායෙහි පලක් නැත. මිනිසා යනු මානව අගයන් දරා සිටින්නාය. අගයන් යනු වියුක්ත සංකල්පයන්ය. ඒවාට යථාර්ථ ස්වරූපයක් ලැබෙන්නේ මිනිසා විසින් ඒ යථාර්ථය සාධනය කළ පසුය. සත්‍යයන් ද එසේය. මීළඟට යථාර්ථයේ තවත් අංගයක් තාගෝර් දකියි. ඔහු එය හඳුන්වන්නේ "තත්‍ය" යන වචනයෙනි. ඒ නම් "කරුණු ය" නැත්නම් "දත්තය". සත්‍යයන්, මානව අගයන් සහ දත්ත/කරුණු තාගෝර් යථාර්ථය යන්නෙහි ඇතුළත් කරයි. මේ හැරුණු විට, පෞරුෂත්වය සහ ආනන්දය යන දෙක ද ඔහු යථාර්ථයේම කොටස් ලෙස දකියි. මානව අගයන්/වටිනාකම් යථාර්ථය බවට පත් කරන්නේ මිනිස් පුද්ගලයායි, නැත්නම් පෞරුෂයයි. එය යථාර්ථකරණය නිසා ආනන්දය උපදී. එහෙයින් ඒ දෙකද යථාර්ථයේම කොටස් ය.

(අමරකීර්ති ; 2005 ; 254-255)

ආචාර්ය අමරකීර්ති, ඨාකුර්ගේ කෙටිකතා පිළිබඳ අධ්‍යයනයක යෙදෙමින් සිය "අමුතු කතාව" නම් වු ග්‍රන්ථයෙහි ඉතා වැදගත් කියවීමක නිමග්න වෙයි. ඔහු මේ අධ්‍යයනයෙන්, ඨාකුර්ගේ කෙටිකතාවලින් දකුණු ආසියානු යථාර්ථවාදයක් මතු කර පෙන්වයි. එමෙන්ම ඔහු ඨාකුර්ට සාහිත්‍ය අධ්‍යයනයෙහි දී නියම ගෞරවය හිමි වී නැති බව ද ශාස්ත්‍රීය පදනමක පිහිටා ප්‍රථම වතාවට පෙන්වා දෙයි. එය ඊට පෙර වෙනත් ලාංකික විචාරකයෙකු අතින් සිදු නොවූවකි. අමරකීර්ති සිය අධ්‍යයනයේ දී ශාන්ති නිකේතනයේ පහස ලැබූ උදවිය පවා ඨාකුර් අපගේ ප්‍රබන්ධ කතාවට සහ ප්‍රබන්ධ න්‍යායට කළ බලපෑම වටහා ගන්නට අසමත් වීම ගැන ද විග්‍රහයක් කරයි. සැබවින්ම ඊට හේතුව කුමක් ද? එකල ඨාකුර් චින්තනයේ ප්‍රධානම ලක්ෂණය වූ සෞන්දර්ය වෙත පමණක් අවධානය යොමු කිරීම විය යුතුය. සාහිත්‍ය දෙස අවධානය යොමු

වුණේ ද හුදු රසය හා වින්දනය අත් කර දෙන මාධ්‍යයක් සේ සලකා බව පෙනේ. ඒ වෙන විට ඨාකුර්ගේ ප්‍රබන්ධ කතා ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය වී තිබුණේ ද, ඒවා අධ්‍යයනය කිරීමට න්‍යායාත්මක දැනුමක් තිබුණේ ද යන්න එක් අතකින් සලකා බැලිය යුතුය. කෙසේ වෙතත් ඨාකුර්ගේ චින්තනය, අමරකීර්ති ම පෙන්වා දෙන චින්තනය, සරච්චන්ද්‍ර ප්‍රමුඛ කිහිප දෙනෙකුට සිය නිර්මාණ ජීවිත ප්‍රභාමත් කර ගැනීමට ඉවහල් වූ බව අමතක කළ නොහේ.

අමරකීර්ති ඊළඟට ඨාකුර් සම්බන්ධ තවත් වැදගත් අධ්‍යයනයක නිමග්න වෙයි. ඨාකුර්ගේ 'ගෝරා' නවකතාව කේන්ද්‍ර කර ගනිමින් සංස්කෘතික අනන්‍යතා දේශපාලනය පිළිබඳ කතිකාවක නිමග්න වන අමරකීර්ති ඨාකුර් සම්බන්ධ ප්‍රාමාණික අධ්‍යයන ඇසුරු කර ගනිමින් එතුමන්ගේ චින්තනය භාරතයට කළ බලපෑම ගැන කදිම නිරීක්ෂණ ඔස්සේ වැදගත් විග්‍රහයක් කරයි.

> නිදහස් ඉන්දියාවේ ප්‍රථම අගමැති ජවහල් ලාල් නේරු තමන්ට ගුරුවරුන් දෙදෙනෙකු සිටින බව කියන්නට පුරුදුව සිටියේ ය. එක් කෙනෙක් ගාන්ධි ය. අනික් ගුරුවරයා තාගෝර්ය. නේරු නොකියා කියූ වැදගත් කාරණය ගාන්ධි දේශපාලන ගුරුවරයා ද තාගෝර් බුද්ධිමය ගුරුවරයා ද වූ බවය."
>
> ""......ගාන්ධිට "මහත්මා" යැයි මුළින්ම කීවේ තාගෝර්ය. තාගෝර්ට "ගුරුදේව" යැයි මුළින්ම කීවේ ගාන්ධි ය. පිරුණු මිනිසුන් වූ ඔවුහු එකිනෙකාට නිසි ගෞරව පිදීමට මොහොතක්වත් මැලි නොවූහ.
>
> \- (අමරකීර්ති 2008 ; 295)

නූතන භාරතයේ ජීවත් වූ මහා පුරුෂයන් දෙදෙනා වන්නේ මහත්මා ගාන්ධි සහ රවීන්ද්‍රනාථ ඨාකුර් ය. මේ දෙදෙනා සැබවින්ම අතිප්‍රබල දේශපාලනික ක්‍රියාවලියක පුරෝගාමීන් ලෙස හැඳින්විය හැකිය. ඨාකුර් විසින් කරන ලද දේශපාලනය අතිප්‍රබලය. ඔහුගේ දේශපාලනය 'බුද්ධිමය' ලෙස සිදු කළ දේශපාලනයකි. ඔහු ජවහර්ල් ලාල් නේරුට පමණක් නොව මුළු මහත් භාරතයටම බුද්ධිමය ගුරුවරයා වන්නට ඇත. ඔහු භාරතයට පමණක් නොව සැබවින්ම ආසියාවටම බුද්ධිමය ගුරුවරයා නොවී ද? ආසියාවේ ප්‍රථම නොබෙල් ත්‍යාගලාභියා බවට පත්වීම සංකේතවත් කරන්නේ ඒ සත්‍යය විය හැකිය.

'ගෝරා' නවකතාව කියවීමට පටන් ගත් සැණින් අපට පෙනී යන්නේ භාරතයට අනන්‍ය වූ ලක්ෂණ මෙන්ම ඒ විසල් රට තුළ ජීවත් වන පුරවැසියන් හිසින් ගෙන සිටින දැඩි දෘෂ්ටිවාදයන්ය. අද අප ජීවත්වන සමාජ දේශපාලනික සංදර්භය තුළ බරපතළම ගැටලුව නම් කුඩා දූපතකට ඔරොත්තු නොදෙන තරම් දෘෂ්ටිවාදයන් ගෙන් ආබද්ධව සිටීම යි. දිනෙන් දින ඒ දෘෂ්ටිවාද පිළිකා මෙන් වර්ධනය වන තත්වයන්ය දක්නට ලැබෙන්නේ. රටේ යහපත වෙනුවෙන්, මනුෂ්‍ය වර්ගයාගේ යහපත වෙනුවෙන් ආවේණික වූ කාරණාවන් වුව සලකා බැලීමට සූදානමක් නැති තරමට දෘෂ්ටිවාද බරපතළය. ඊට මූලික හේතුව සමාජ සංවාදයකින් වියුක්ත අදහස් තහවුරු කිරීමට දරන ප්‍රයත්න බලවත් වීමයි. 'ගෝරා' නවකතාව ඔස්සේ ඨාකුර් සුනු විසුණු කර දමන්නේ ද එවන් දෘෂ්ටිවාදවල නිසරු බවයි. නිරර්ථක බවයි. එබැවින් තරුණ දරුවන්ට මේ නව කතාව පාදක කර ගෙන මානව සම්බන්ධතා, මානව ගරුත්වය, මානවවාදය ගැන මෙන්ම අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම යනාදී කාරණා ගැන සියුම් අවබෝධයක් ලබා දීමට හැකි නම් ඒ වූ කලී අනාගතය වෙනුවෙන් අවශ්‍ය වැදගත් බුද්ධිමය ආයෝජනයක් යයි සිතමි.

ඨාකුර් ඔහුගේ සෙසු නවකතාවල මෙන්ම 'ගෝරා' නවකතාවේ ද සෑම චරිතයක්ම ගොඩ

නඟන්නේ පළල් වූ දේශපාලනික අවශ්‍යතාව පෙරටු කර ගෙන ය. නවකතාව දිග හැරෙන්නේ පාරිශුද්ධ මිනිස් ප්‍රජාවක් නැත යන කාරණාව මෙන්ම, පාරිශුද්ධ වූ අනන්‍යතාවක් ද නැත යන කාරණාවට පාඨකයා විවිධාකාර සංසිද්ධීන් ඔස්සේ ඒත්තු ගන්වමිනි. කතාවට ජීවය දෙන 'විනය' මෙන්ම කතාවේ ප්‍රධාන චරිතය වන 'ගෝරා' පාඨකයා තුළ මුල සිටම ඇති කරන්නේ මුළ සිටම කැළඹීමකි. ඒ කැළඹීම ඔස්සේ පාඨකයා ගේ නුවණැස අවධි කරන්නේ ගෝරා ගේ මව වන 'ආනන්දමයී' ය.

"තාගෝර්ගේ නවකතාවල නිතර සිදුවන්නාක් මෙන් මේ සංයුක්ත යථාර්ථයන් වෙත පිරිමින්ගේ ඇස් අරවන්නෝ ස්ත්‍රීහුය." - (අමරකීර්ති. 2008 ; 293)

ඨාකූර් සිය නවකතාවල දී මෙන්ම, කෙටිකතා වල දී ද කාන්තාව ස්ථානගත කරන්නේ පිරිමියාට වඩා දීප්තිමත් ඥානාලෝකයක් උද්දීපනය කිරීමටය. ඒ බව සනාථ කිරීමට ඔහුගේ විශිෂ්ට කෙටි කතාවක් වන 'මහාමායා' කතාව වුව ප්‍රමාණවත් ය. ඉන්දියානු සමාජය තුළ අතීතයේ සිට ස්ත්‍රියට උරුම වූ ජීවිතය ගැන ඨාකූර් තුළ වූ දැඩි කම්පනය මේ ආකල්පය සඳහා ඉවහල් වී ඇති බව ඔහු ගේ 'මා බාල කාලේ' නම් වූ කෘතියේ ද, 'මතක සටහන්' කෘතියේ ද විස්තර කරන කරුණුවලින් පැහැදිලි වේ. සැබවින්ම 'ගෝරා' නවකතාව තුළ ගෝරාත් ඇතුළුව පිරිමි චරිතවල පවතින්නේ භාවාත්මක චරිත ලක්ෂණය. කාන්තා චරිත එසේ නොවේ. සියල්ලට වඩා වැදගත් වන්නේ කාන්තාවන් තීරණ ගැනීමේ දී පළ කරන දීප්තිමත් බවයි; එඩිතර බවයි.

> සුචරිතා නිසා ගෝරා තම දැඩි හින්දූකම පිළිබඳ බරපතල අර්බුදයක් දකියි. එනම් සාම්ප්‍රදයික හින්දුත්වය ස්ත්‍රිය නොසලකා හැරීමයි. හින්දුත්වය ද ජාතිය, කුලය, වැනි අනික් සාමූහික අනන්‍යතා සංකල්ප මෙන්ම සමූහය වෙනුවෙන් ඒකපුද්ගල මනුෂ්‍යයා නොසලකා හරියි; අවතක්සේරු කරයි. සුචරිතා වෙත ආකර්ෂණය වීම නිසා ගෝරා වටහා ගන්නා එක වැදගත් දෙයක් නම් ඉන්දියානු ස්ත්‍රිය වැදගත් වන්නේ හින්දුත්වය, සම්ප්‍රදය, සංස්කෘතිය ආදිය නියෝජනය කරන්නියක ලෙස ඇට ඇති වැදගත්කම නිසා නොව ස්ත්‍රිය ද ස්වාධීනව සිතන, කාරක ශක්තියකින් යුතු ඒක පුද්ගල මනුෂ්‍යයෙකු නිසාය යන කරුණයි. ඔහු පතන පරමාදර්ශී, පවිත්‍ර හින්දු පුනර්ජීවනය හෙවත් භාරත වර්ෂය තුළ ස්ත්‍රීන් සිටින්නේ ද, සිටිය යුතු ද යන ප්‍රශ්නය පවා ගෝරා තමාගෙන් ම අසා ගන්නේ ඉතා පසු කලෙක ය. එහෙත් ඔහුට හින්දුත්වය නම් සමස්තය තුළ ඒකපුද්ගල මිනිසාට, තමාගේම ආදරවන්තිය පවා අමතකව ගොසිනි......
>
> (අමරකීර්ති, 2008 ; 289)

ඨාකූර්ගේ 'ගෝරා' නවකතාව පුළුල් කැන්වසයක අති දක්ෂ සිත්තරුන් කිහිප දෙනෙකු ස්වාධීනව ඉමහත් සැලකිල්ලකින් හා ඉමහත් අවධානයකින් දැඩි වගකීමකින් සිතුවම් කරන ලද ප්‍රබල සිතුවමක් වැනිය. ඒ ඒ සිත්තරාගේ අනන්‍යතාව මෙන්ම, සිතුවම තුළ සමස්තයක් වශයෙන් තිබිය යුතු අනන්‍යතාව ද පාඨකයා ට අවබෝධ වෙයි.

'ගෝරා' නවකතාව විකාශනය වන ආකාරය ද සැලකිල්ලට ලක් විය යුතු ය. නවකතාව විකාශනය වන්නේ කතා රසය ඔස්සේ නොවීම ඉතාම වැදගත් කාරණාවයි. කතා රසය උද්දීපනය වීමට තිබෙන අවකාශයන් අපමණය. එහෙත් කතුවරයා ආරම්භයේ සිටම නිරූපණය කරන හෙණ හඬක් බඳු කටහඬකින් යුක්ත, අසාමාන්‍ය පෞරුෂයකින් යුක්ත පුද්ගලයෙකු වන කරන ගෝරා සමඟ ඔහු යන දිශාවට පියමන් කිරීමට පාඨකයා තුළ ඇති වන්නේ නිරුත්සාහක උවමනාවකි. මේ උවමනාව ඇති කරන්නේ නවකතාව තුළ පවතින, කතුවරයා ගේ ප්‍රතිභානය තුළ පවතින, ඔහුගේ චින්තනය තුළ පවතින ප්‍රබල කාරණාවකි. එය අමරකීර්ති විවරණය කරන්නේ මෙලෙස ය.

.......හුදෙක් බාහිර සමාජ යථාර්ථය විස්තර කිරීමෙන් නොනැවතුණු තාගෝර් සිය නවකතාවල තේමාවන් එල්ල කළේ ඉන්දියානු බව, හින්දුත්වය, නූතනත්වය පිළිබඳ කතිකාව වෙත ය. ඉන්දියානු බව, හින්දුත්වය, නූතනත්වය, සම්ප්‍රදාය සහ නූතනකරණය යනාදී සංකල්ප මිනිස් සමාජය මත එකල එනම්, 19 වැනි සියවසේ අග කාලයේ සහ 20 වැනි සියවසේ මුල් කාලයේ ක්‍රියාත්මක වූ අන්දම සහ ඒ ඇසුරින් පැන නැඟුණ ප්‍රශ්න තාගෝර්ගේ ආඛ්‍යානවලට විෂය වේ.

සංකීර්ණ සමාජ ප්‍රශ්න විභාග කරමින් නිර්මාණය වූ සාහිත්‍ය කෘති පරිශීලනයට උත්සුක වීමෙන් පුද්ගලයන් තුළ සිදු වන වෙනස්කම් කිසිසේත් සරල නොවේ. සැබවින්ම ඒ වෙනස්කම් ගැඹුරුය. නීතිය පෙරටු කර ගෙන සිදු කරන්නට ගන්නා සමාජ පරිවර්තනයක් වුව සාර්ථක වීම සඳහා දැන උගත් සමාජය තුළ බුද්ධිමය සංවාදයක් දියත් කිරීම ප්‍රඥාගෝචරය. සමාජයක් දියුණුවීම හෝ දියුණු කිරීම තුළ අනිවාර්යයෙන්ම සිදු වන්නේ වෙනස්කම් ය. සිදු කරන්නට සිදු වන්නේ ද වෙනස්කම් ය. වෙනස්කම් පුද්ගලයා තුළ සිදු කිරීම සෙමින් සිදු වන සැබෑවකි. සෙමින් හෝ ඒ වෙනස සිදු කිරීමට ප්‍රබල නැණ නුවණක් අවශ්‍ය වේ. භාරතයට ඒ නැණ නුවණ ලබා දුන්නේ රවීන්ද්‍රනාථ ඨාකුරයන් ය. එබැවින් අපට එතුමා අලුත් මානයන්ගෙ න් කියවීම නිසැකවම යහපතක් වනු ඇත. ඨාකුර්ගේ වචන වල ගැඹුර අපේ හෙට දවසට සූර්යාලෝකයක් ලෙස දකින්නට අප ජීවත් වෙන සමාජයේ ජන විඥානයට බලපෑම් කළ හැකි පිරිස් උත්සුක වීම, 'දේශපාලනික' අවබෝධයක් ලැබීම, යහපත් හෙට දවසක් වෙනුවෙන් වැදගත් යයි සිතමි.

(අමරකීර්ති, 2008 ; 285)

### ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන


අමරකීර්ති ලියනගේ (2005), **අමුතු කතාව,** කොළඹ: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය,

(2008) **සහෘද සාක්ෂිය**, කොළඹ: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

අමරසේකර, ගුණදාස (2008) **නොසෙවුනා කැඩපත**, කොළඹ: විසිදුනු ප්‍රකාශකයෝ.

කරුණාරත්න, කුසුමා සහ විජේසූරිය, සරත් (සංස්) (2000) **විදේශීය කෙටිකතා සංග්‍රහය**, කොළඹ: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

ගලහිටියාව, බර්ටි සහ ධර්මදස කේ. එන්. ඕ, (සංස්), (1990) **සාර සංග්‍රහය**, කොළඹ: රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව.

සුචරිත ගම්ලත්, (පරි) (2001) **ශාන්තිනිකේතනයේ ඇසින්,** කොළඹ: ඇස් ගොඩගේ සහෝදරයෝ.

ගුණසේකර, පද්මා, (පරි) (2000) **මතක සටහන්**, කොළඹ: සූනෙර ප්‍රකාශකයෝ.

පඤ්ඤාවංස, මණ්ඩාවල (පරි) (1999) **මම වෙමි ද නොවෙමි ද නොවෙමි**, කොළඹ: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

ලක්ෂ්මීසිංහආරච්චි, චින්තා, (පරි) (1999) **ගෝරා**, කොළඹ: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

සරච්චන්ද්‍ර, එදිරිවීර (1985) **පිං ඇති සරසවි වරමක් දෙන්නේ**, කොළඹ: දයාවංශ ජයකොඩි සමාගම.

සේනාරත්න, මාධවී (පරි) (2005) **මා බාල කාලේ,** කොළඹ: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

# இரவீந்திரநாத் தாகூரின் பொதுமைவாத மெய்யியல்

மல்லிகா ராஜரத்தினம்

இந்தியாவின் மாபெரும் புதல்வர்களில் ஒருவராகவும், உலகப் பொதுமை பற்றிய மெய்யியலின் சாரத்தினை பல்வேறு வகையிலான ஆக்கங்களினூடாக வெளிப்படுத்தியவருமான இந்தியாவின் வங்க நாட்டைச் சேர்ந்த தாகூரின் (1861-1941) 150 ஆவது பிறந்த தின விழாவை அனைத்துலக மக்களும் கொண்டாடிக் கொண்டிருக்கும் இவ்வேளையில், மனிதத்துவ பொதுமைவாதம் பற்றிய மெய்யியல் கட்டுரையாக இது அமைகின்றது. தாகூரின் இலக்கியங்களும், கட்டுரைகளும், கலைப்படைப்புகளும் நூல்களிலும் வெளிப்படுத்தப்படுகின்ற மனிதத்துவ பொதுமைவாதம் பல்வேறு அடித்தளங்களை கொண்டிருக்கின்றது. குறிப்பாக உபநிடத மெய்யியல், சூபித்துவ மெய்யியல், பௌத்த மெய்யியல் போன்ற பல்வேறுபட்ட பொதுமைத்துவம் சார்ந்த மெய்யியல் மரபுகள் அவரது கவிதை உள்ளிட்ட அனைத்து ஆக்க இலக்கியங்களிற்கும் அடிப்படையாக அமைந்தன. தாகூர் குறிப்பிடுவது போன்று, அவரது படைப்புகளிற்கு அடிப்படையாக இருக்கின்ற தளம் ஆழ்பார்வை (Vision) என்பதாகும் தூய அறிவு மாத்திரமல்ல. இந்தவகையில் இந்திய தத்துவ தரிசனங்கள் ஆழ்பார்வையை அடிப்படையாகக் கொண்டு விளங்குகின்றமை குறிப்பிடத்தக்கதாகும். இந்நிலையில் மேலை நாட்டின் செல்நெறி மரபின் ஆழ்பார்வையை மையப்படுத்தியதாக அமைகின்ற தன்மை யிள்ள பிளேட்டோவின் “குடியரசு” என்ற நூலின் மூலம் அறியலாம். (ஏழாவது அத்தியாயம்) தத்துவஞானிகளையும் தத்துவஞானி அல்லாதவர்களையும் விளக்குகின்றபோது, யாருக்கு முழுமையான பார்வை இருக்கின்றதோ அவனே தத்துவஞானி ஆவான் (Who is having total vision is Philosopher) என பிளேட்டோ கூறுகின்றார்.

மேலைத்தேச, கீழைத்தேச செல்நெறி மரபுகளில் வழங்கப்படும் மெய்யியல் தளத்தினை தாகூரின் மெய்யியல் விளக்குகின்றது. குறிப்பாக ஒவ்வொரு நாடும் உலக நாகரிகத்திற்கு சுயஅனுபவம், சுயவெளிப்பாடு என்பவற்றின் ஊடாக பங்களிப்பு செய்கின்றது. அந்தவகையில் இந்தியாவின் பங்களிப்பு குறிப்பிடத்தக்கதாகும். அத்தோடு இந்தியாவின் பங்களிப்பும் அதன் மெய்யியலிருந்தே வெளிப்படுகின்றது. இந்திய மெய்யியலின் சுய வெளிப்பாடு எல்லா உயிரினங்களின் ஒருமைப்பாட்டையும் மையப்படுத்துகின்றது. (Unity of all beings) இதுவே இந்திய மெய்யியலின் சாரமாகவும் அனைத்துத்துறைக் கலாசார வெளிப்பாடாகவும் அமைகின்றது.

இவ்வாறான தனித்துவமான இந்தியத் தன்மையைத் தாகூரின் படைப்புகள் வெளிப்படுத்துகின்றன. இந்தியாவின் மனிதத்துவப் பொதுமைவாதம் பற்றிய மெய்யியலானது இந்தியாவின் மிகப் பழைய இலக்கியமாகக் கருதப்படும் உபநிடதங்களில் மிக ஆழமாக வெளிப்படுத்தப்பட்டிருக்கின்றது. தமது இளமைக்காலத்திலே இவ்வாறான ஆழமான பொதுமைசார் மெய்யியல் மரபுகளை அறிந்து கொள்ளும் வாய்ப்பினைத் தமது குடும்பப் பின்னணியிலிருந்து பெற்றுக் கொண்டார். அவரது தந்தை தேவேந்திரநாத் தாகூர் பிரம்மசமாயத்தில் ஆழமான ஈடுபாடு கொண்டவராக விளங்கினார். அத்தோடு, தந்தையுடன்

இமாலாய பிரதேசங்களிற்கு மேற்கொண்ட பயணங்களில், இயற்கை மீதான ஈடுபாடு பொதுமைத்தள மெய்யியலுக்கு அடிப்படையாக விளங்கியது.

குறிப்பாக, உபநிடதங்களில் மிகப் பரவலாக வளர்ச்சியடைந்த நிகழ்விய ஒருமையியல் (Phenomenological Monism), இவரது அனைத்துப் படைப்புகளிலும் வெளிப்படுகின்றது. குறிப்பாக, அவரது "ஆக்க ஒருமை" (Creative Unity) என்ற நூலில் "தமக்குள்ளே இருக்கின்ற ஒருமை பற்றிய உணர்வின் மகிழ்வு வெளிப்பாட்டை தேடுகின்றபோது படைப்பாக்கம் பெறுகின்றது" இதனேயே (Joy of Unity within us seeking expression Becomes Creative) எனக் குறிப்பிடுகின்றார். மேலும் அவரது உலகப் புகழ் பெற்ற நோபல் பரிசு பெற்ற கவிதைத் தொகுப்பான கீதாஞ்சலி ஆழ்நிலை நிகழ்விய ஒருமைவாதத்தின் வெளிப்பாடாகும். முதன்முறையாக ஆசிய இலக்கியம் நோபல் பரிசு பெற்றதனூடாக உலகத்தரத்தினைப் பெற்றது. நோபல் பரிசு பெற்ற ஏற்புரையில் இந்திய மரபின் சாரமாக உலகளாவிய பொதுமை மெய்யியலாக வெளிப்படுத்தப்படும் உபநிடத மகா வாக்கியத்தினை நினைவுப்படுத்தினார்.

"எவனொருவன் தன்னில் எல்லாவற்றையும்
எல்லாவற்றில் தன்னையும் காணுகின்றானோ
அவனே பிரமஞானி"

இவ்வாறான மனிதத்துவ பொதுமைத்தளம் பரஸ்பர அகப்பொதுமையை வெளிப்படுத்துகின்றது (Inter subjectivity) மேலும், இத்தகைய அகப்பொதுமைத்தளத்தில் இருந்தே எல்லாக் கலாசாரத்தினையும் உள்வாங்குகின்ற பரந்த மனப்பாங்கும், ஆழமான பொதுமைசார் அறவியலும் வெளிப்படுத்தப்படுகின்றது. இதனைக் கீதாஞ்சலியில்,

"எங்கே மனம் அச்சமற்றும், சிரம்
பெருமிதத்தால் உயர்ந்தும் இருக்கின்றதோ
எங்கே அறிவு சுயமாக செயற்படுகின்றதோ
எங்கே உலகம் உறவுகளின் குறுகிய
எல்லைகளினால் துண்டாடப்படாமலிருக்கின்றதோ
எங்கே வார்த்தைகள் உண்மையின்
ஆழத்திலிருந்து வெளிப்படுகின்றதோ
எங்கே சோர்வற்ற முயற்சிகள்
முழுமையைத் தேடி விரைகின்றதோ
எங்கே நியாயத்தின் தெளிந்த நீரோடை
வழிமாறி அநீதியின் பாலை நிலத்தினூடாகப்
பாயாமலிருக்கின்றதோ
எங்கே மனம் எப்போதும் விசாலமுறும்
எண்ணங்களினாலும், செயல்களினாலும்
உன்னால் வழிநடத்தி செல்லப்படுகின்றதோ
அங்கே அந்த விடுதலையின் சுவர்க்கத்தில்
என் பிதாவே, என் தாய்நாடு விழிப்புறட்டும்
(கீதாஞ்சலி – 35)

அவருடைய பாடல், ஆழமான அறிவின் சுயதளத்தை வெளிப்படுத்துவதோடு, குறுகிய எல்லைகளால் துண்டாடப்படுகின்ற, குறுகிய தேசிய வாதங்களை தாண்டுகின்ற உண்மைத் தளத்தின் வெளிப்பாடாக மனதின் எண்ணங்களை வெளிப்படுத்துகின்ற அற்புதமான கவித்துவ படைப்பாகவும் அதனூடாக தமது தாய்நாடு விழிப்புறட்டும் எனக் கூறுவது உலகளாவிய பொதுமைத் தளத்தினை வெளிப்படுத்துகின்றது. அத்தோடு உலகம் தழுவிய அரசியல் தளத்தின் கவித்துவ வெளிப்பாடாகவும் அமைகின்றது.

சமய மெய்யியலில் தாகூரின் நோக்கு இந்தியத்தின், இந்தியத் தத்துவத்தின் வெளிப்பாடான பொதுமைவாத மெய்யியல் சார்ந்ததாகும். மனிதனின் சமயம் (Religion of Man) கலைஞனின் சமயம், (Religion of an Artist) கவிஞனின் சமயம் (Religion of Poet) என்பதாக அவரது சமயம் பற்றிய மெய்யியல், தனிப்பட்ட சமயங்களைச் சாராது பொது மானிடம் சார்ந்த மெய்யியலை வெளிப்படுத்தியது. ஆழமான பொதுமைவாதம் சார்ந்த உபநிடத சிந்தனைகள், பௌத்த மெய்யியல் சூபித்துவம், கிறிஸ்தவ மறைஞானம், தூ ரகிழக்கு மறைஞானம் என்பவை தாகூரின் பொது மானிட வெளிப்பாட்டிற்கு அடிப்படையாக அமைகின்றன. மானிடத்தின் பொதுத்தளத்தினை அவரது 'அனைத்துலக மனித நோக்கு' (Towards Universal Man) என்ற நூல் மிக அழகாக வெளிப்படுத்துகின்றது. மேலும் சமயம், மெய்யியல், கலைகள், அறவியல் அனைத்தும் கீழைத்தேய மரபில் குறிப்பாக, இந்திய மரபில் ஒன்றுடன் ஒன்று இணைந்தவையாக, ஒரே ஆத்மீக நோக்கினைக் கொண்டுள்ள தன்மை தாகூரின் எழுத்துக்களிவ் பிரதிபலிக்கின்றது. இந்திய மரபில் ஆத்மீகம் என்பது பொது மானிட அனுபவத்தினையே குறிக்கின்றது.

இத்தகைய மனிதத்துவ பொதுமைவாத மெய்யியல் ஆக்க இலக்கியங்களிலும், கலைமெய்யியலிலும் மிகத் தெளிவாக வெளிப்படுகின்றது. உண்மையே நன்மை, உண்மையே அழகு (Truth is goodness, Truth is Beauty) போன்ற அவரது கருத்துக்கள் உபநிடத மெய்யியலை நினைவுபடுத்துவதோடு, மேலைத்தேச செல்நெறி கிரேக்க மெய்யியலில் குறிப்பாக பிளேட்டோவின் கருத்துக்களையும் நவ பிளேட்டோனியவாதக் கருத்துக்களையும் ஞாபகம் ஊட்டுகின்றது. கலை மெய்யியலும், சமய மெய்யியலும் நடைமுறைசார் ஒருமைவாத ஆத்மீக நோக்கினை கொண்டுள்ளது. கலை என்பது, உண்மையின் வெளிப்பாடு, நன்மையின் வெளிப்பாடு அதுவே அனந்தம் (Infinity) என்ற கருத்துக்கள் தைத்திரிய உபநிடத வரிகளான சத்,சித், அனந்த (sat- Pure Existence, chit-Pure consciousness, Anada-Pure Bliss/ infinity) என்பது மீளவும், மீளவும் தாகூரின் கட்டுரைகளிலும், கவிதைகளிலும் வெளிப்படுத்தப்படுகின்றன. இந்தவகையில் புகழ் பெற்ற மேலைத்தேச கவிஞரான, கீற்ஸின் (Keats) வரிகளான குறிப்பாக அழகே உண்மை, உண்மையே அழகு என்பதனை மேற்கோள் காட்டினார்.

மேலும், சாதனா என்ற நூலில் (Sadhana the Realization of life) அழகின் வடிவம் நன்மையின் துல்லியமான வடிவமாகும். மேலும், நன்மையின் வடிவம், அழகு அதனுடைய உண்மையான பிரதிபலிப்பை வெளிப்படுத்துவதாக அமைகின்றன. கலையைப் படைக்கும் போது கலைஞன் பொது அனுபவத்திலிருந்தே படைக்கின்றான்.

தாகூரின் ஆத்மீக அறிவு சாதாரண முரண்பாடுகளுக்கு அப்பாற்பட்டது. இவரின் மறைஞானம் சாதாரண அளவையியலுக்கு அப்பால், கலையின் பொதுமைத்தன்மையினையும், பொது

மானிடத்தையும் வெளிப்படுத்துகின்றது. இவ்வாறான தாகூரின் அழகியல் மறைஞான மானிடவியல் கருத்துக்கள் அவரது கவிதைத் தொகுப்புக்களான சித்ரா, கீதாஞ்சலி, நைவேத்தியம் போன்றவற்றில் வெளிப்படுத்தப்படுகின்றன.

மேலும், வீடும் நாடும் (The Home and the world) என்ற நாவல் தேசியம் சார்ந்த, மானிடம் சார்ந்த பொதுமைத்துவத்தினை வெளிப்படுத்துகின்றது. அவரது கலைத்துவ உள்ளுணர்வு எண்ணக்கருவற்ற ஞானமாகும். அவரது அழகியல், சாதாரண விஞ்ஞான பூர்வமான விளக்கங்களிற்கு அப்பால் ஆழ்நிலை விஞ்ஞான அனுபவத்தை ஒத்ததாக அமைகின்றது. தாகூரின் கருத்துப்படி, ஆழ்நிலை விஞ்ஞானமும், கலை அனுபவமும் வேறுபட்டதல்ல. கலை ஆத்மீக அழகியலின் வெளிப்பாடு, அது பொது மானிடத்தின் வெளிப்பாடு ஆகும்.

அந்தவகையில், தாகூரின் கவிதைகள் தத்துவக் கவிதைகளாக அமைகின்றன. எல்லையற்ற விடுதலை உணர்வை அவரது கவிதைகளும், ஆக்க இலக்கியங்களும் வெளிப்படுத்துகின்றன. தாகூரின் கருத்துப்படி கலையானது முன்னையது ஏதுவான கடந்த நிலை ஒருமை அனுபவமாகும். கணிதவியல் விஞ்ஞானத்திற்கும், கலைக்குமுள்ள தொடர்பை தாகூர் இனங்காட்டுகின்றார். உண்மையை உணர்தல் என்பது, கணிதவியலில் தற்புல உண்மையை (Axiom) உணர்தல் போன்றது. தாகூரின் இலக்கியம் பற்றிய வரைவிலக்கணம், பொதுமானிடத்தின் அடிப்படையை விளக்குகிறது. சுய அனுபவத்தினூ டாக (Self Realization) பொதுமை அனுபவத்தினை இலக்கியங்கள் வெளிப்படுத்துகின்றது. அமரத்துவ நிலையின் அனுபவம் ஒருவனது பொதுமானிடம் சார்ந்த அனுபவமாகும். இலக்கியத்தின் வங்கமொழிச் சொல்லான 'சாகித்தியம்' சமஸ்கிருத மொழியின் அடிப்படையிலிருந்து வருகின்றது. சாகித்தியம் என்ற சொல் மீளவும் இணைதல் என்ற (Reunion) பொருளைக் குறிப்பதாக அவர் காட்டுகின்றார். அதாவது இலக்கியம் மீளவும் பொது மானிடத்தோடு இணையும் ஆற்றலை வழங்குகிறது.

கலையில் அதன் உருவமும், உள்ளடக்கமும் இணைய வேண்டும் என்பது தாகூரின் கருத்தாகும். கலை மனிதனின் முழுமையான ஆளுமையை வெளிப்படுத்த வேண்டும். தாகூரின் மனிதத்துவ பொதுமைவாத மெய்யியல் தனிமனிதத்தன்மையினை பொது மானிடத்துடன் இணைக்கிறது. ஆளுமை பற்றிய உணர்வு, நம்முடனே உள்ள ஒருமை பற்றிய உணர்வாகும். மேலும் அவருடைய பல்துறை ஆளுமை குறிப்பாக அவரது கவித்துவப் புலமைத்துவம் இசையோடு இணைந்ததாக அமைகின்றன.

தாகூர் தம்முடைய கவிதைகளுக்குத் தனித்துவமான இசை மரபினையும் வழங்கினார். அவரது கருத்துப்படி கவிதைகள் இசை வடிவமில்லாதபோது முழுமையான கலை வடிவத்தினைப் பெறாது. அவரது இசை அனுபவமும் பல்வேறுவகைப்பட்ட உலகளாவிய இசை மரபுகளையும், இந்திய இசை மரபுகளையும் இணைக்கும் தன்மையினதாகக் காணப்படுகிறது. இவருடைய இசை இந்தியாவின் இந்துஸ்தானிச் செல்நெறி மரபுகளையும், நாட்டுப்பாடல் மரபுகளையும், பக்தி இசை மரபுகளையும் உள்ளடக்குவதாக அமைகின்றது. தாகூருக்கும் அயன்ஸ்ரைனுக்கும் இடையில் நடைபெற்ற வரலாற்றுப் புகழ் பெற்ற உரையாடல் பேர்லின் நகரில் யூலை மாதம் 1930ம் ஆண்டில் இடம் பெற்றது. மனிதனும் சமயமும் என்ற நூலில் அவை வெளியிடப்பட்டது. இந்த உரையாடலில் ஆழமான

பௌதீகவியல், கணிதவியல் கருத்துக்களையும், இசை மெய்யியல், உளவியல் கருத்துக்களையும் இணைப்பது குறிப்பிடத்தக்கதாகும்.

பௌதீகவியல் கருத்துக்களையும், கணிதவியல் கருத்துக்களையும் உளவியல் முறையில் குறிப்பாக, இசை மெய்யியல் அடிப்படையில் தாகூர் வெளிப்படுத்தினார். மேலைத்தேச இசையிலும் அவர் அளவற்ற ஈடுபாடு கொண்டிருந்தார். ஆங்கில விஞ்ஞானியான அயன்ஸ்ரைன் சார்புவாதக் கோட்பாட்டைத் (Theory of Relativity) தமது விஞ்ஞான வெளிப்பாடுகளின் மூலம் பரந்த அளவில் வெளிப்படுத்துகின்றபோதும், கிழக்கு மரபில் ஆழமான மரபுகளைத் தாகூரின் உரையாடலின்போது வெளிப்படுத்தினார். இந்திய இசையானது சொற்களுக்கு அப்பாற்பட்டது. சொற்களைக் கடந்தும் அதனை விளங்கிக் கொள்ள முடியும் என்பது போன்ற கருத்துக்கள் ஆழமாக இசை மரபின்மீது அவர் வெளிப்படுத்தினார்.

தாகூர் இந்த உரையாடலில் இசை பற்றிய மதிப்பீட்டில் தனித்துவமான வெளிப்பாடுகளும் கூடப் பொதுமையான மரபுகளோடு இணைந்திருக்கின்றன என்பதனை வெளிப்படுத்தினார். (The individual taste confirming to the universal standard) இந்தவகையில் கிழக்கையும், மேற்கையும் அவரது பொதுமைவாத மெய்யியலின் ஊடாக ஓர் அர்த்தமுள்ள இணைப்பாக இணைக்கின்றார். (meaningful integration of east / west)

மேலும் தாகூரின் தேசியவாதத்தின் மீதான கருத்துக்கள் பல கவிதைகளிலும். கட்டுரைகளிலும் நாவல்களிலும் காணப்படுகின்றது. இந்தியத் தேசிய கீதத்தையும் வங்காளத் தேசத்தின் தேசிய கீதத்தையும் இயற்றி இசையமைத்தவர் தாகூர் ஆவார். இந்தியாவின் தேசிய கீதம் பிரபலமான தேசியப் பாடலாகவும், தாகூரின் பன்மையில் ஒருமை காணும் மெய்யியலையும், பொது மானிடத்தையும் இணைக்கும் ஆழமான மெய்யியல் வெளிப்பாடாக அமைகின்றது. வங்க மொழியில் அமைந்த தேசிய கீதம் இந்தியாவின் பல்வேறு கலாசாரத்தினை உள்ளடக்குவதோடு இந்தியத்தின் பொதுமைத் தன்மையினையும், மானுடத்தின் பொதுமைத் தன்மையினையும் வெளிப்படுத்துகின்றது. 1905ல் வங்கப் பிரிவினையை எதிர்த்து எழுதிய அவரது தேசியப் பாடலான "அமா சோனார் பங்களா" என்ற பாடல் சுதந்திர வங்காளத் தேசத்தின் தேசிய கீதமாகும். தேசியவாதம் மீதான கருத்தினை மிகவும் பரந்த மனப்பாங்குடன் வெளிப்படுத்தியவர் தாகூர். அதீத தேசியவாதமும், தேச மானிலங்களும் மாபெரும் தீமையாக மாறுவதை அவர் எதிர்த்தார். அவரது கருத்துப்படி அதீத தேசிய வாதம் புவியியல் அரக்கனாக இனங்காட்டப்படுகின்றது. மாறாக இந்திய ஆழமான தேசியத்தளம் உலகம் தழுவிய உயர்விற்கு வழிகாட்ட வேண்டும் என்பது அவரது கருத்தாகும்.

மேலும், கீழைத்தேச உயர் விழுமியங்களின் இணைப்பினையும், ஆசிய விழுமியங்களின் குறிப்பாக, இந்திய விழுமியங்களின் பொது மானிடத்தன்மையினையும் முழு உலகிற்கும் வழிகாட்ட வேண்டும் என்பதும் அவரது கருத்தாகும். கீதாஞ்சலியை (1904) இயற்றிய காலத்தில் இயற்கையியல் ஒழுங்கிற்கும் அறவியல் ஒழுங்கிற்கும் இடையிலான இடைவெளியினை நீக்கும் ஒழுங்கினை அவர் ஆழமாக வெளிப்படுத்தினார். இந்திய மெய்யியலின் பரந்த நோக்கும் உலகளாவிய பொதுத்தன்மையும், உலகம் முழுவதையும் பாதுகாக்க வேண்டும் என்ற கருத்து நிலையையும் கொண்டிருந்தார்.

குறுகிய தேசியவாதங்களில் ஏற்படும் பிரச்சினைகளுக்கு அப்பால் பொதுத்தளத்தினைத் தேசியத்திற்கும் அரசியலுக்கும் வழங்கியவர் தாகூர்.

தாகூரின் கல்வி பற்றிய மெய்யியல் உலகளாவிய கவனத்தை ஈர்த்த கருத்தியலை அடித்தளமாகக் கொண்டுள்ளது. அவரின் கல்விக் கோட்பாடும் மனிதத்துவம் சார்ந்த பொதுமைவாத மெய்யியலையே வெளிப்படுத்துகின்றது. இயற்கையோடு இணைந்த கல்விமுறையினையும், ஆழ் விழுமியங்களினை வெளிப்படுத்தும் கல்விமரபினையும் பல கட்டுரைகளில் குறிப்பிட்டு காட்டியுள்ளார். கல்வியில் ஆக்கப்பூர்வமான, விமர்சனபூர்வமான (creative and critical) சுய வெளிப்பாட்டுத் தளத்தை வலியுறுத்தியுள்ளார். கிழக்கிலும் மேற்கிலும் காணப்படும் செல்நெறி மரபுகள் குறிப்பாக ஆசிய மரபுகளில் காணப்படும் விழுமியம்சார் கோட்பாடுகள் கல்விக் கொள்கைகளுக்கு அடிப்படையாக அமைகின்றன. ஆசியப் பல்கலைக்கழகம் எவ்வாறு அமைய வேண்டும் என்பது அவருடைய 'கிழக்கின் பல்கலைக்கழகம்'(An Eastern University) என்ற கட்டுரையில் வெளிப்படுகின்றது.

இன்றைய சிக்கலான உலகின் பிரச்சினைகளிலிருந்து விடுபடுவதற்கு ஆசியாவின் எழுச்சி அவசியம் என வலியுறுத்தினார். இவ்வாறு ஆசியாவின் விழிப்புணர்வு சரியான வழியில் வழிநடத்தப்பட்டால் ஆசியா மட்டுமல்ல உலகம் முழுவதும் பயனுறும் எனக் கருதியவர் தாகூர். கல்வியில் கிழக்கையும், மேற்கையும் இணைப்பதில் ஆர்வம் காட்டினார். அதற்காகவே அவரது விஸ்வபாரதி பல்கலைக்கழகம் சாந்தினிகேதனில் அமைக்கப்பட்டது. கிழக்கு மரபினுடைய ஞானச்சுடர் உலகம் முழுவதற்கும் ஒளிபரப்ப வேண்டும் எனக் கருதியவர். அத்தோடு கிழக்கு மரபு தனக்காக மட்டுமல்லாமல் முழு உலகத்தின் நன்மை கருதியதாக அமைய வேண்டும் எனக் கருதியதன் விளைவாக விஸ்வபாரதி பல்கலைக்கழகம் உருவாக்கப்பட்டது. கிழக்கையும் மேற்கையும் அர்த்தமுள்ள வகையில் இணைப்பதனூடாகப் பொதுமைத்துவம் சார் கல்விக் கொள்கையினை உருவாக்கினார். இந்தவகையில் அரசியல் மெய்யியல், கலை மெய்யியல், விஞ்ஞான மெய்யியல், சமய மெய்யியல் போன்ற அனைத்துத் துறைகளிலும் தாகூர் தனது பொதுமைவாத மெய்யியலை வெளிப்படுத்தினார். அவருடைய மனிதத்துவ பொதுமைவாதம், உலகளாவிய கலாசார வளர்ச்சிக்கும் அறவியல் மேம்பாட்டிற்கும் அடிப்படையாக அமைவதுடன் தற்கால அரசியல் கலாசார அறவியற் பிரச்சினைகளிலிருந்து உலகத்தை மீட்பதற்கும் பயனுடையதாக அமையும். இவ்வகையில் தாகூரின் பல்துறை ஆளுமையும், மனிதத்துவ பொதுமைவாதமும் இந்தியாவை மட்டுமல்ல உலகம் முழுவதையும் வழிகாட்டக்கூடிய தன்மையைக் கொண்டுள்ளமை குறிப்பிடத்தக்கது.

# තාගෝර්ගේ අධ්‍යාපනික අදහස් සමහරක්

පියල් සෝමරත්න

තාගෝර්ගේ අධ්‍යාපනික අදහස් සියල්ල ම පාහේ පදනම් වී ඇත්තේ ඔහුගේ පෞද්ගලික අත්දැකීම් හා පළපුරුද්ද මතය. කුඩා කල මෙහෙකරුවන්ගේ රැකවරණ යටතේ ඇතිදැඩි වූ ඔහුට නාගරික ජීවිතයේ පටු බවත්, ළමයින් තුළ සහජයෙන් ම පිහිටා ඇති නිවහල් ක්‍රියාකාරිත්වය පිළිබඳ ඇල්මත් ඒත්තු ගියේය. පංති කාමරයක් තුළ හිර කර තැබීම සහ තමා අකැමැති විෂයයන් ඉගෙන ගැනීමට බල කිරීම නිසා ගතානුගතික අධ්‍යාපන ක්‍රමය කෙරෙහි ඔහු තුළ බලවත් පිළිකුලක් ඇති විය. තම නීරස පාසැල් ජීවිතය ගැන 'කවියකුගේ පාසල' නම් නිබන්ධයෙහි ලා ඔහු මෙසේ සඳහන් කරයි. ''පැහැය, සංගීතය හා ජීවන ලීලාව පිළිබඳ මහත් පිපාසයක් මා තුළ විය. එහෙත් අපේ නාගරික අධ්‍යාපනය මෙම අවශ්‍යතා නොසලකා හරියි.... ඉක්මනින් ම මා තුළ වූ නොදැමූ ප්‍රකෘතික ස්වභාවය නැගී සිට ළමා වියේදී ම මා පාසැලෙන් පන්නා හරිනු ලැබීය.''[1]

තමා ලැබූ අධ්‍යාපනය සමාජ ජීවිතයට සහ රටේ සංස්කෘතියට අසම්බන්ධ බව ද තාගෝර්ට අවබෝධ විය. ස්වභාවධර්මය කෙරෙහි ඔහු තුළ පැවතියේ අසීමිත ඇල්මකි. දඬුවම් ලැබීමේ බියෙන් තොරවීමත්, ප්‍රකෘති ලෝකය සමග නිරතුරු සමීප සම්බන්ධතාවයක් තිබීමත් ළමයාගේ නිරෝගී වැඩීමට බෙහෙවින් ම අවශ්‍ය බව ඔහුට අවබෝධ විය. එහෙයින් ළමයා තුළ පිහිටා ඇති සහජ දක්ෂතාවන් වර්ධනය කෙරෙන සේ දේශීය සම්ප්‍රදායට අනුකූල අධ්‍යාපන ක්‍රමයක් සකස් කිරීම ඔහුගේ අරමුණ විය. මෙම ලිපියේ පරමාර්ථය වනුයේ තාගෝර්ගේ එම අධ්‍යාපනික අදහස් කීපයක් ගැන සලකා බැලීම යි.

යටපත් ව ඇති ජාතික හරයන් මතුකොට සමකාලීන සමාජ අවශ්‍යතාවන්ට හා ජීවිතයට අනුකූල වන සේ සකස් කිරීම තාගෝර්ගේ අධ්‍යාපනය පිළිබඳ සංකල්පයේ ප්‍රධාන තැනක් ගනී. සමාජ අවශ්‍යතාවන්ට හා සම්ප්‍රදායට නොගැලපෙන කිසිම කටයුත්තක් සඵල නොවන බව වටහා ගත්තත්, පැරණි අධ්‍යාපන ක්‍රම ඒ අයුරින් ම ක්‍රියාවේ යෙදීමට තරම් ඔහු අන්තවාදී නොවීය. පරිණාමය ජීවිතයේ ධර්මතාවයක් ලෙස පිළිගත් ඔහු පැරණි ක්‍රමයේ සාරවත් මූලධර්ම පමණක් තෝරාගෙන ඒවා නූතන සමාජයට වැඩදායක වන සේ සකස් කිරීමට තැත් කළේ ය. තාගෝර්ගේ අධ්‍යාපන ක්‍රමය ඉන්දියානු අධ්‍යාපනයෙහි සැලකිය යුතු වෙනසක් ඇති කිරීමට සමත් වූයේ ද මෙම නිවැරදි දැක්ම නිසා ය. විශ්ව භාරතී ජාත්‍යන්තර විශ්ව විද්‍යාලය හා ශ්‍රී නිකේතනය තාගෝර්ගේ එම අදහස්වල සාරවත් බව දක්වන මූර්තීන් වේ.

1863 දී මහාර්ෂී දේවේන්ද්‍රනාත් තාගෝර් විසින් ආරම්භ කරන ලද ශාන්තිනිකේතනයේ මූලික පරමාර්ථය වූයේ ඉන්දීය සංස්කෘතීන්, ආගම් හා දර්ශන හැදෑරීමට අවකාශ සලසාලීම යි. මෙම පරමාර්ථය තවදුරටත් පුළුල් කළ රබින්ද්‍රනාත් පැරණි සාරවත් හරයන් නූතන අවශ්‍යතාවයන්ට ගැලපෙන සේ සකස් කිරීමේ පර්යේෂණායතනය වශයෙන් විශ්ව භාරතීය පිහිටෙව්වේ ය. ''සාවධාන ව ඉගෙනීමෙන් හා පර්යේෂණ පැවැත්වීමෙන් පෙරදිග විවිධ සංස්කෘතීන්ගේ ඒකීයත්වය වටහා ගෙන ඒවා අතර සුහද සම්බන්ධතාවයක් වර්ධනය කිරීම'' විශ්ව භාරතියේ එක් පරමාර්ථයකි. විශ්ව භාරතියේ අරමුණ වනුයේ එහි අධ්‍යාපනික කාර්‍යයෙහි ලා නූතන යුගයේ හොඳ ම සංකල්පය පිළිගැනීම යි.... පෙර අපර දෙදිග විවිධ සංස්කෘතිය මෙම ආයතනයට එක් රැස් කිරීම අපේ මුල් ම වෑයම විය යුතුය''[2] යි විශ්ව භාරතියේ අරමුණු සලකා ගෙන තාගෝර් ප්‍රකාශ කළේ ය.

මෙ රට අධ්‍යාපනය ඵලදායක නොවීමට ප්‍රධාන හේතුව එය දේශීය සම්ප්‍රදාය හා ජාතික උරුමයන් මත පදනම් නොකිරීම යයි නිගමනය කළ හැක. අවුරුදු 450 ක පමණ විදේශාධිපත්‍යය නිසා බොහෝ දුරට විනාශ වී ඇති මෙ රට සංස්කෘතිය දැන් යළිත් වර්ධනය වෙමින් පවති යි. ''නැති වී ගිය මෙම සංස්කෘතික හරයන්ගේ පුනරුත්ථානය විසින් ජාතිය තුළ සමගියක් ශ්‍රේෂ්ඨත්වයක් මෙන්ම නිර්මල බවක් ද ඇති කරනු ඇත.... අධ්‍යාපන කාර්‍යයෙන් සංස්කෘතික අධ්‍යාපනය වෙන් කිරීම දුෂ්කර වේ''[3]. සංවර්ධනය වෙමින් පවතින රටකට අවශ්‍ය වන්නේ එරට ජාතික උරුමයන් මත පදනම් වූ ජාතික අවශ්‍යතාවයන් ඉටු කිරීමට සමත් අධ්‍යාපනයක් බවට කිසිම සැකයක් නැත. පටු මිෂනාරි අධ්‍යාපනයක් තුළින් දියුණු වූ මෙරට අධ්‍යාපනය එම ජාතික අවශ්‍යතාවයන් ඉටු කිරීමට සමත් වී නොමැති බව ද පැහැදිලි කරුණකි. දේශීය සංස්කෘතියට හා සම්ප්‍රදායට අනුකූල අධ්‍යාපනයක් නොලැබීම නිසා මෙ රට උගතුන්ට එම ජාතික අවශ්‍යතාවයන් මැනවින් වටහා ගත නොහැකි හෙයිනි. ''අප සංස්කෘතීන්ගේ ශ්‍රේෂ්ඨත්වය ගැබ් කරන සියළු අවයව අපකීර්තියටත් පරිහානියටත් වැටීමට ඉඩ හැර ඒ වෙනුවට අප විසින් ලබා ඇත්තේ ඉංග්‍රීසි අධ්‍යාපනයේ නාමයෙන් ලංකාවේ දී ටික ටික බෙදා දෙනු ලබන බටහිර ශිෂ්ටාචාරයේ ඉතාමත් ම නොගැඹුරු පිට සිවිය''[4] වීම ඊට ප්‍රධාන හේතුවයි. කරුණු මෙසේ හෙයින්, දේශීය සංස්කෘතියේ සාරවත් හරයන් මතුකොට මෙරට අවශ්‍යතාවයන්ට ගැළපෙන සේ ඒවා උපයෝගී කර ගැනීමට සමත් අධ්‍යාපන ක්‍රමයක් සකස් කිරීම අපේ මූලික අවශ්‍යතාවයකි.

අධ්‍යාපනයේ මාධ්‍යය මව් බස විය යුතු යයි තාගෝර් තදින් ම ඇදහුවේය. විදේශීය භාෂාවක් මඟින් ලබන අධ්‍යාපනය කෘත්‍රිම ස්වභාවයක් දරන අතර දුෂ්කරතා කීපයක් ද මතු කරයි. එම බසේ ව්‍යාකරණය, භාෂා විධි, උච්චාරණය හා භාවිතය නුහුරු හෙයින් විදේශීය බසකින් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයාගේ මනස තුළ නිරන්තර අසහනයක් හා ගැටීමක් පවති යි. මෙම නුහුරු බව නිසා ම එම අධ්‍යාපනය ශිෂ්‍යයා තුළ ප්‍රත්‍යක්ෂ අවබෝධයක් හා වින්දනයක් ඇති නොකරයි. විදේශීය බසකින් ලබන දැනුම ඔහුගේ වැඩිහිටි ජීවිතයට ප්‍රයෝජනවත් වන්නේ ද මඳ වශයෙනි. ඒ නිසා ජීවිතය හා අධ්‍යාපනය අතර පරතරයක් හට ගනී. ''අධ්‍යාපනය හා ජීවිතය ඒකාබද්ධ කිරීම අද අපට මුහුණ දීමට ඇති ඉතා ම බරපතල ප්‍රශ්නය යි. මෙම ඒකාබද්ධතාවය ඇති කළ හැක්කේ වංග භාෂාව හා සාහිත්‍යය මඟින් පමණි'' යි තාගෝර් කීවේ ය. ජීවිතය හා අධ්‍යාපනය ඒකාබද්ධ නොවූ විට ශිෂ්‍යයා තුළ කිසි ම නිර්මාණ ශක්තියක් ඇති නො වේ. ඔහු ලබන දැනුම හෝ එම බස ඔහු තුළ ප්‍රකාශන ශක්තියක් හා වින්දනයක් ඇති නොකරන හෙයිනි. නියම අධ්‍යාපනයේ දී ජීවිතය, දැනුම හා භාෂාව මැනවින් සංයෝජනය විය යුතු ය. මේ සඳහා පදනම විය යුත්තේ ශිෂ්‍යයාගේ මව් බස යි. සංස්කෘතිය හා සාහිත්‍ය තුළින් වැඩී ආ තම මව් බසින් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයාගේ සහජ ශක්තීන් පිබිදී ජාතික අවශ්‍යතාවයන්ට අනුකූල වන සේ යම් යම් දේ නිර්මාණය කිරීමේ ශක්තිය ඔහු තුළ ඇති වේ. ඔහු සමාජයට ඵලදායක පුද්ගලයකු වන්නේ එවිට යි.

මෑතක් වන තෙක් ලංකවේ ද අධ්‍යාපන මාධ්‍යය වූයේ ඉංග්‍රීසිය යි. තාගෝර් පවසා ඇති පරිදි විදේශීය භාෂා අධ්‍යාපනයකින් දේශීය අවශ්‍යතාවයන්ට උචිතනා ශක්තීන් බිහි කිරීම ඉතා අසීරු ය. ඉංග්‍රීසි උගත් පිරිස මෙ රටට ආගන්තුකයන් වීමටත්, දේශිය ප්‍රශ්න තේරුම් ගැනීමට හෝ ජාතික සංවර්ධනයෙහි ලා සහභාගි වීමට ඔවුන් අසමත් වීමටත්, එක් ප්‍රධාන හේතුවක් වී ඇත්තේ ස්වභාෂාවන් අමතක කොට ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් ඉගැන්වීම නිසා යයි නිගමනය කළ හැක. රටක සංස්කෘතියත්, අවශ්‍යතාත් මැනවින් වටහා ගත හැක්කේ මව් බසින් ලබන හොඳ අධ්‍යාපනයකින් පමණි. ''පාසල් අධ්‍යාපනය නිම කිරීමේ සියළු විභාගවල දීත්, ඉන් ඉහළට වූ වෘත්තීය මෙන් ම කාර්මික පරීක්ෂණයන්හි දීත්, මූලික අවශ්‍යතාවයක් වශයෙන් ඉංග්‍රීසි

මෙන් ම ලාංකික භාෂා සහ සංස්කෘති පිළිබඳ එක හා සමාන දැනුමක් අනිවාර්ය කරන්නෙමි'' යි ආචාර්ය ආනන්ද කුමාරස්වාමි ප්‍රකාශ කර ඇත්තේ මෙම අවශ්‍යතාවය සලකා ගෙන ය.

දැනට මෙ රට අධ්‍යාපන මාධ්‍ය ස්වභාෂාවන් වුවත් ඉන් ජාතික සංවර්ධනයට රුකුලක් ලැබී තිබේ දැයි කෙනෙකුට ප්‍රශ්න කළ හැක. මෙ රට ස්වභාෂා අධ්‍යාපනය අසාර්ථක වීමට හේතු දෙකක් ඇත. ඉහතින් දැක්වූ පරිදි මෙරට අධ්‍යාපන ක්‍රමය දේශීය අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම ඉන් පළමු වැන්න යි. ස්වභාෂාවන් මෙ රට අධ්‍යාපන මාධ්‍ය වූයේ ක්‍රමානුකූල සැලැස්මක් අනුව නොව පටු දේශපාලන උද්ඝෝෂණයක ප්‍රතිඵලයක් වශයෙන් වීම දෙවැනි හේතුව යි.

තාගෝර් තම අධ්‍යාපන ක්‍රමය හැඳින්වූයේ ''ශික්ෂා-ශාස්ත්‍ර'' යනුවෙනි. ශික්ෂා-ශාස්ත්‍රයේ මූලික අරමුණ ළමයාගේ සහජ දක්ෂතාවන් පුබුදුවාලීමට හැකි වන පරිසරයක් සකස් කිරීම යි. ශිෂ්‍යයා නේවාසිකයකු ලෙස පාසැලේ ම ජීවත් විය යුතු අතර ඒ අවට ඇති ප්‍රකෘති ලෝකය ඊට හොඳ ම පරිසරය යි. ස්වභාව සෞන්දර්ය කෙරේ අසීමිත ඇල්මක් ඇති ශිෂ්‍යයයන් නිදැල්ලේ හැසිරෙමින් ජීවිතය හා අවට ලෝකය ගැන ඉගෙනීමට පටන් ගනී. තම සහජ ලැදිකම්වලට අනුව කෙරෙන එම ඉගෙනීමෙන් ඔහුගේ හැකියාවන් පිබිදෙයි. පුබුදු ඉඳුරන් මඟින් ලබන හැඟුම් නිසා නිර්මාණාත්මක කාර්යයන් සඳහා තම අවයව හා බුද්ධිය පාවිච්චි කිරීමට ඔහු පෙළඹෙයි. මෙම අවස්ථාවේ දී ශිෂ්‍යයාගේ සහජ දක්ෂතාවයන්ට ගැලපෙන ශිල්පයක් හෝ වෘත්තියක් වෙත ඔහු යොමු කළ යුතු ය.

ශික්ෂා-ශාස්ත්‍රය අනු ව අධ්‍යාපනය යනු **නිෂේධාත්මක** කාර්යයක් නොවේ. තාගෝර් පවසන පරිදි අධ්‍යාපනය යනු ප්‍රකෘතිය සමග ජීවත් වෙමින් ප්‍රත්‍යක්ෂ වශයෙන් ජීවිතය පිළිබඳ ව ලබන ප්‍රායෝගික පුහුණුවකි. අධ්‍යාපනයේ වැදගත් ම කාර්ය වනුයේ වැඩිහිටි ජීවිතයේ වගකීම් සාර්ථක ව ඉසිලීමට තරම් ශක්තියක් ශිෂ්‍යයාට ලබා දීම යි. මිනිස් ජීවිතයේ සාර්ථකත්වය රැඳී ඇත්තේ නිරවුල් චින්තනය මත ය. එ හෙයින් ළමයින්ට නිවැරදි ව සිතන්ට පුහුණු කිරීම ද ශික්ෂා-ශාස්ත්‍රයේ වැදගත් ම ලක්ෂණයකි.

පැරණි ආශ්‍රම අධ්‍යාපන ක්‍රමයේ මූලධර්මයක් වූ මෙම ශික්ෂා-ශාස්ත්‍රය ශාන්තිනිකේතන හා ශ්‍රී නිකේතන අධ්‍යාපන ක්‍රමයේ පදනම වෙයි. මෙම විද්‍යා පීඨයන්හි නේවාසික ව සිටින සිසුන්ට මානව දයාව මෙන්ම ජීවිතයේ විවිධ ගැටළු පිළිබඳ ව ද මනා පුහුණුවක් හා අවබෝධයක් ලබා ගැනීමට ඉඩ සලසා ඇත.

This is mysticism, if we like to call it so, but not a mysticism that, relinquishing personality, seeks to become absorbed in an All that approaches a Nothingness, but one that, with all the talents and faculties of the soul trained to their highest pitch, eagerly sets forth to meet the living Father of the whole creation. This more strenuous type of mysticism was not wholly unknown even in India before the days of Tagore, hardly indeed among the ascetics and philosophers of ancient times but rather in the many forms of *bhakti*, a piety whose very essence is the profound love of and reliance upon God. Ever since the Middle Ages, influenced in some measure by the Christian and other foreign religions, *bhakti* has sought the ideals of its faith in the different phases of Hinduism, varied in character but each to all intents monotheistic in conception. All those higher forms of faith have disappeared or have been depraved past recognition, choked by the superabundant growth of that mixture of cults that has attracted to its banner all those Indian peoples who lacked an adequate power of resistance to its blandishments. Even though Tagore may have borrowed one or another note from the orchestral symphonies of his native predecessors, yet he treads upon firmer ground in this age that draws the peoples of the earth closer together along paths of peace, and of strife too, to joint and collective responsibilities, and that spends its own energies in dispatching greetings and good wishes far over land and sea. Tagore, though, in thought-impelling pictures, has shown us how all things temporal are swallowed up in the eternal:

Time is endless in thy hands, my lord.
There is none to count thy minutes.
Days and nights pass and ages bloom and fade like flowers. Thou knowest how to wait.
Thy centuries follow each other perfecting a small wild flower.
We have no time to lose, and having no time, we must scramble for our chances. We are too poor to be late.
And thus it is that time goes try, while I give it to every querulous man who claims it, and thine altar is empty of all offerings to the last.
At the end of the day I hasten in fear lest thy gate be shut; but if I find that yet there is time. (*Gitanjali,* 82.)

***By Harald Hjärne, Chairman of the Nobel Committee of the Swedish Academy, on December 10, 1913***

[From Nobel Lectures, Literature 1901-1967, Editor Horst Frenz, Elsevier Publishing Company, Amsterdam, 1969 MLA style: "Nobelprize.org". Nobelprize.org. 5 Mar 2011 http://nobelprize.org/nobel_prizes/literature/laureates/1913/press.html]

# තාගෝර් චරිතයෙන් උගත යුතු පාඩමක්

## මාර්ටින් වික්‍රමසිංහ

### I

කවියෙකු නොහොත් සාහිත්‍යකාරයකු වශයෙන් තාගෝර්ගේ චරිතයෙහි එක් අංගයක් අප රට සාහිත්‍යකාරයන්ගේත් පොත්පත් කියවන්නන්ගේත් විශේෂ සැලකිල්ලට භාජන විය යුත්තකි. ඉංග්‍රීසින්ගේ පාලනයත් ඔවුන්ගේ භාෂාව හා සාහිත්‍ය කලා පැතිරීමත් නිසා පෙරදිග හැම රටක වාගේ සිදුවුණු අවුලක් තාගෝර්ගේ සාහිත්‍යික චරිතයෙන් හෙළි වෙයි.

තාගෝර් දහ හත් ඇවිරිදි වියෙහි පටන් කවි රචනා කෙළේය. විසිපස් ඇවිරිදි වියෙහි ඔහු ප්‍රකෘතිය (ස්වභාව ධර්මය) කෙරෙහි ඇල්මක් ඇති, නිදහස් මත සලකන, තරුණ කවියෙකු මෙන් ප්‍රකට විය. ඔහු තරුණ වියෙහි කවි, කෙටිකතා හා නිබන්ධ රචනා කෙළේ ''කලාව උදෙසාය''. යන බටහිර සමහර කවීන්ගේ මතය ගුරු කොටගෙන යයි කශී අබ්දුල් වදූද් නමැති විචාරකයා කියයි.[1]

අවුරුදු 25 ඉක්මවූ පසු තාගෝර්ගේ අදහස් හා මතාන්තර කෙමෙන් වෙනස් විය. බටහිර සංස්කෘතිය පිළිබඳ ඔහුගේ අදහස් ද වෙනස් විය. රටත් ජාතියත් පිළිබඳ ඔහුගේ හැඟීම් දියුණු විය.

හින්දු ආගම ගැන කලකිරුණු ඔහුට උපනිෂද් ධර්මයත් බුදු දහමත් ප්‍රිය විය. ඔහු ඒ දෙ දහමින් ආස්වාදයක් ලැබුවේය. ඒ ආස්වාදය ඔහුගේ කවි ප්‍රතිභාව තියුණු කෙළේය. 'බ්‍රහ්මන්' 'නිර්වාණය' යන දහම් ඔහුගේ ආගමික හැඟීම් ගූඪ වාදයට යොමු කෙළේය. ඔහු පසු කාලයෙහි රචනා කළ කවි අතරින් මේ ගූඪ වාදීය හැඟීම යපටක් ඔස්සේ දිවෙන විදුලිය බලයක් මෙන් දිවීය. තාගෝර්ගේ සමහර නාටකයන් කෙරෙහිත් පද්‍ය රචනා කෙරෙහිත් බෞද්ධ කථා වස්තු, ජාතක පෙළ, ථෙරි ගාථා හා ථෙර ගාථා ද බලපෑවේය. තාගෝර් තමාගේ එක් නිබන්ධ සංග්‍රහයක ප්‍රස්තාවනාවෙහි ලා ඒ බලපෑම ගැන වෙසෙසින් සඳහන් කෙළේය.

තාගෝර්, තමාගේ කවි, නවකථා ආදිය රචනා කෙළේ පොදුජනයා වහරන වංග බසිනි. ඔහු පැරණි වියරණයත්, සකු වදනුත් එතරම් ගුරු කොට නොසැලකුවේ ය. පොදු වගු බස් වහර ගුරුකොටගත් ඔහුගේ රීතිය ඉංගිරීසි රීතිය අනුව සකස් වූවකි.

'වංග නවකථාවෙහි බටහිර ප්‍රභාව' යන මැයෙන් ප්‍රිය රංජන් සෙන් (ඇම්. ඒ) 1932 දී ලියූ නිබන්ධයක් කල්කටා විශ්ව විද්‍යාලයෙහි සාහිත්‍යයික සංග්‍රහයෙහි පළ විය. ඒ විශ්ව විද්‍යාලයෙහි කථිකාචාර්‍යයකු වූ ඔහු බංකිම් චන්ද්‍රගේ පහත දැක්වෙන කියුම ගෙන ඇරපායි.

''දනුදු මගේ ලිපි, ඇත්ත වසයෙන්, වංග රීතිය නොවෙයි. දනුදු මගේ පොත්වල අතරින් පතර ඉංගිරීසි රීතියෙහි පරිවර්තනයන් ලෙස සැලකිය යුතු පාඨ දක්නා ලැබේ. මේ දෝෂය ඉංගිරීසි උගැන්මක් ලැබූ වංගයකුගේ වගු බසෙහි දක්නා ලැබේ. චන්ද්‍රනාථගේ 'ශකුන්තලාව' ඔබ කියවන්ට ඇතැයි සිතමි. චන්ද්‍රනාථ වංග අකුරින් ඉංගිරීසි ලියුවේ ය.''[2]

## II

වංග බසත්, සකුවත්, ඉංගිරීසියත් හොඳින් උගත් බංකිම් චන්ද්‍ර මෙසේ කියුවේ ජාතික හැඟීමෙන් උද්දාමව ඉංගිරීසිය බැහැර කොට ඒ බසින් ලියුම් ලිවීම පවා නවත්වා කලකට පසුය. බංකිම් චන්ද්‍ර ගැන 'ඉන්ඩියර් මිරර්' ඉංගිරිසි පතෙහි කතු ඇන්. ඇන්. සෙන් ලියූ විවේචනයකින් කොටසක් ප්‍රිය රංජන් සෙන් තම නිබන්ධයෙහි බහා තිබේ. එයින් ගත් පාඨයක භාවය මෙසේය.

බංකිම් බාබුගේ චරිතයෙන් උගත හැකි එක පාඩමක් නොසැලකීම සමාව නො ලැබිය යුතු වරදකි. බටහිර සංස්කෘතියෙහි බලපෑම හින්දු සිතේ නිර්මාණාත්මක ශක්තිය හා ජාතික හැඟීම ද මරන්නක් නොවී ය. බාබු බංකිම් චන්ද්‍ර මෙන් යුරෝපයේ චින්තනය හා පාණ්ඩිත්‍යය නමැති පොකුණෙහි ගැඹුරුම තැනින් දිය බිවූ අනිකෙක් නොවී ය. සිතුම් කියන විදියෙන් ඔහු ඉංගිරීසියෙක් විය. ඔහු මැරෙන්නට පෙර ලියූ වේදය පිළිබඳ නිබන්ධය ඉංගිරිසි නිබන්ධයක සංක්ෂිප්ත රීතිය ඇත්තකි.[3]

බංකිම් චන්ද්‍රගේ රීතිය නවීන වංග ලේඛකයන් කෙරෙහි බලපෑවේ ය. රවීන්ද්‍රනාත් තාගෝර්ගේ රීතිය ද බංකිම් චන්ද්‍රගේ රීතියට අනුගුණව සකස් විය. ප්‍රිය රංජන් මෙසේ කියයි.

> ''රවීන්ද්‍ර හා බංකිම් යන දෙදෙනාම මහා විචාරකයෝ වූහ. ඔවුන්ගේ සාහිත්‍ය සමාලෝචනා අන්‍යයෝ පිළිගත්හ. ඔවුන්ගේ මත පොදුවේ සැලකිලි ලැබීය. ඔවුන්ගේ කියුම් සාහිත්‍ය ලෝකයෙහි සිඤාන්ත විය. සාධනා යෙහි පළ කරනු ලැබූ බංකිම්ගේ දයාරියෙහි කතා කාන්තෙර් ද ජ්ෆලර් හා තවත් එවැනි ලේඛනවල භාෂා රීතිය රවීන්ද්‍රගේ රීතිය නොහොත් කියුම් වීදිය කෙරෙහි බලපෑවේ ය.''

බංකිම් චන්ද්‍ර සකු බසෙහි ද හසළ දැනුම ඇත්තෙක් විය. ඉංගිරීසි භාෂා රීතියට අනු ගුණව සකස්වුණු ඔහුගේ රීතිය වංග පඬුවන්ගේ සැලකිල්ලට හසුවූයේ ඔහුගේ සකු බස් දැනුම නිසා විය හැකි ය. තාගෝර් 1913 වන තෙක් සමහර වංග පඬුවන්ගේ නින්දාවට භාජන විය. ඊට එක් හේතුවක් වූයේ තාගෝර් සකු බසත් සකු වියරණයත් නොතකා පොදු ජනයා වහරන බසින් කවි හා නවකතා රචනා කිරීම විය යුතුය. වගු බස දත් සිංහල උගතුන් දෙතුන් දෙනකුගේ මතය අනුව තාගෝර්ගේ පද්‍ය රචනාවල පමණක් නොව ගද්‍ය භාෂාවෙහි ද ගීත රසයක් ඇත. එය පොදු ජනයා වහරන වගු බසට හිමි ස්වර මාධූර්යය වෙයි. වගු බස ගැන දැනුමක් නැති මට මේ මතය විනිශ්චය කිරීමට පුළුවන් කමක් නැත.

## III

1913 දී නොබෙල් තෑග්ග ලබන තුරු තාගෝර් වංග පඬුවන්ගේ දෝෂ දර්ශනයටත් ඇතැම් විට ඇනුම් පදයටත් භාජන වීය. තාගෝර්ගේ පොත්වලින් උපුටාගත් පාඨ කල්කටා විශ්ව විද්‍යාලයෙහි මැට්රික් විභාග ප්‍රශ්න පත්‍රවල ඇතුළත් කරනු ලැබීය. එයින් සමහර ප්‍රශ්න පත්‍රයක ලා වගු පඬුවෝ මේ පාඨවල වියරණ දොස් නිදොස් කරමින් ශිෂ්ට වංග භාෂාවෙන් නැවත ලියනු යි සිසුන්ට නියම කළෝ ය. මේ කරුණ තොම්සන් දේවගැති තුමාගේ රවීන්ද්‍ර චරිතයෙහි විස්තර කොට ඇත. මේ පඬුවෝ 1913 දී නොබෙල් තෑග්ග දිනූ පසු තාගෝර්ට ගරු බුහුමන් කරන්ට වූහ' යි තොම්සන් දේවගැතිතුමා කියයි.

මෙය මඳක් විමසිය යුතු පුවතකි. ඉංගිරීසින්ගේ ආණ්ඩු සසුනත් ඔවුන්ගේ සිරිත් හා භාෂා සාහිත්‍යයත් නිසා ඉන්දියාව පමණක් නොව ලංකාව වැනි රටවලත් මිනිසුන් වරිගවලට බෙදී ජීවත්වීමෙහි ඇතැම් විපාක ඒ විමසීමෙන් දත හැකිය. සිරිත්, බස හා ඇඳුම් පැළඳුම් විසින් වරිගවලට බෙදුණු උගතුන් අතර ඊෂ්‍යාව, කුහකකම, බොරු මානය හා ව්‍යාජත්වය ද දියුණු වීය. සිතින් හදින් පිරිහුණු මොවුන් අතර ඉංගිරීසි භාෂා සාහිත්‍යය උගතුන් මෙන් ප්‍රාචීන භාෂා සාහිත්‍යය උගත්තු ද බහුල වූහ. මොවුන් ඉතාම අඩු වූයේ බුද්ධියෙන් නොවැඩුණු පොදු ජනකාය අතරය. නොබෙල් තෑග්ග ලැබීමට පෙර තාගෝර් මේ පොදු ජනකායගෙන් බොහෝ ගරු බුහුමන් ලැබී ය. පොදු ජනකායත් ඔවුන්ගේ ජනකවි ජන කලා හා බසත් අශිෂ්ට සංස්කෘතික අංගයන් ලෙස සලකන්නෝ ඉංගිරීසි භාෂා සාහිත්‍යය උගතුන් අතරත් සංස්කෘත භාෂා සාහිත්‍යය උගතුන් අතරත් බහුල වූහ.

මොවුන්ගෙන් සමහරු තාගෝර්ගේ ගද්‍ය-පද්‍ය රචනයන්ටත් එහි බස් වහරටත් ගරහන්ට වූහ. තාගෝර්ට වඩා උසස් ලෙස පිළිවෙළින් ඉංගිරීසි භාෂා සාහිත්‍යය උගත් පඬිවරු මෙසේ සිතන්ට ඇත. තමන්ට නොකළ හැකි වූ දෙයක් ඉංගිරීසි භාෂා සාහිත්‍යය ස්වෝත්සාහයෙන් උගත් තාගෝර් කරන්නේ කෙසේ ද? ඔහු තම පද්‍යයන්, නවකතා හා විචාර ලිපි ද රචනා කෙළේ ඉංගිරීසි සාහිත්‍යයෙන් ගත් දේ එක්කොට ගැලපීමෙනි. ඔහුගේ බස් වහර ද ශිෂ්ට ඉංගිරීසි බස් වහරට අනුගුණව සකස්කොට ගත්තකි. ඉංගිරීසි උගතුන්ගෙන් සමහරුන් තාගෝර්ගේ රචනයන්, නොබෙල් තෑග්ග ලබන්න පෙර විවේචනය කෙළේ මේ හැඟීමෙහි පිහිටා යයි මම සිතමි. ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර උගත් සමහර වංග පඬිවරයන් තාගෝර්ගේ පද්‍යයන්, නවකථා හා නිබන්ධනයන් විවේචනය කෙළේ එහි වියරණ දොස්, අශිෂ්ට ව්‍යවහාර ආදිය හෙළි කරන අදහසිනි.

නොබෙල් තෑග්ග ලේඛකයකුගේ ශ්‍රේෂ්ඨත්වය මැනෙන මිනුමක් නොවේ. නොබෙල් තෑග්ග පිරිනැමීමෙහි දී සාහිත්‍යික කරුණු පමණක් නොව එයින් පිටස්තර කරුණු ද සැලකිල්ලට භාජන වෙයි. බටහිර රටවල සමහර උගතුන්ගේ සිත් තාගෝර්ගේ පද්‍යයන්ට ඇදී ගියේ ඒ පද්‍යයන්ට පිවිසි ගුඨවාදීය හැඟීම නිසා ය. එකල බටහිර ශ්‍රේෂ්ඨ කවීහුත්, නවකතාකාරයොත් ඊශ්වර වාදය හා ආත්මවාදය නොඉවසන්නෝ වූහ. සමහරු ඊශ්වර වාදයට පහර දෙමින් තමන්ගේ ගද්‍යයන් හා පද්‍යයන් රචනා කළෝ ය. නොබෙල් තෑග්ග දිනූ ඇනටෝල් ප්‍රාන්ස් නමැති ප්‍රංශ ලේඛකයා ඊශ්වරවාදය උපහාසයට හසු කෙළේ ය. නොබෙල් තෑග්ග දිනූ තවත් ප්‍රංශ ලේඛකයකු වූ ඇනඩ්රේ ජීඩ් ඊශ්වරවාදියකු නොව නිදහස් ගුඪවාදියෙක් වීය. තාගෝර්ගේ ගුඪවාදය බටහිර ලේඛකයන් අතර පැතිරි අතීශ්වර වාදයෙහි සැර අඩු කෙරෙන්නකි. එය ගුඪවාදයත් ආත්මවාදයත් භක්තියත් කාම රාගයත් යන සතර සංකලනයෙන් උපන් හැඟීමකි. උපනිෂද් ධර්මයත්, ථෙරි ගාථා, ථෙර ගාථා වැනි බෞද්ධ කාව්‍යයනුත්, කාලිදාස, ජයදේව ආදී සකු කවීන්ගේ කාව්‍යයනුත් ඇසුරෙන් ලත් දැනුම තාගෝර්ගේ ගුඨවාදය තියුණු කෙළේ ය. ඉංගිරීසි කවීන්ගේ කාව්‍යයන් උගැන්ම නිසා ඒ ගුඨ හැඟීම නවීන වේෂයක් ගත්තේ ය. අයිරිෂ් ජාතික කවියකු වූ යේට්ස් ගුඨවාදියෙක් විය. ඔහු හා ඔක්ස්පර්ඩ් විශ්ව විද්‍යාලයේ දේවගැතිවරුන් ද තාගෝර්ගේ ගීතාඤ්ජලිය නොබෙල් තෑග්ග පිළිබඳ සාහිත්‍යික උපදේශක මණ්ඩලයට හඳුන්වා දුන්හයි සමහරු කීහ. කිතුසමයටත් පටහැණි වූ බටහිර සමහර විචාරකයෝ ගීතාඤ්ජලියෙහි සැඟ වී ඇති ගුඪ භක්තිවාදය අබිං වෙසෙසක් යයි සරදම් කළහ.

නොබෙල් තෑග්ග කවියකු මැනෙන මිනුමක් නෙවේ යයි මා කීවේ මෙවැනි කරුණු සලකා ය. ළඟදී බොරිස් පැස්ටර්නාක් නමැති රුසියන් කවියාට නෝබල් තෑග්ග පිරිනැමීමෙහි දී ජාත්‍යන්තර දේශපාලන කරුණු ද අනුශාසක සභාව කෙරෙහි බල පැවැත්වූ බව පෙනේ. විප්ලවයෙන් පසු යුරෝපයට පලා ගොස් ප්‍රංශයෙහි ජීවත් වූ රුසියන් ලේඛකයන් අතුරෙන්

ඉවාන් බුනින් නවකතාකාරයෙකි. ඔහු ද නොබෙල් සාහිත්‍යික තෑග්ග දිනා ගත්තේ ය. එහෙත් ටොල්ස්ටෝයි, චැකොෆ් සහ ගෝර්කි යන තිදෙනා ම නොබෙල් තෑග්ගට හිමිකම් ඇත්තන් ලෙස සලකනු නොලැබූහ.

තාගෝර්ගේ බසටත්, කාව්‍යයන්ටත්, මතයන්ටත් නින්දා කරමින් සිටි විශ්ව විද්‍යාලවල සමහර පඬිවරයන් හා පැරණි ගුරුකුල පඬිවරයන් ද යන දෙගොල්ලම නොබෙල් තෑග්ග දිනාගත් පසු තාගෝර්ගේ කවීත්වයෙහිත් 'අශිෂ්ට' භාෂාවෙහිත් උසස්කම් දැකීම විහිළුවක් නොවන්නේද? තාගෝර් 'නොබෙල් තෑග්ග දිනාගත්තේය'යි මා මෙහි ලියන්නේ ද සමහර වංග පඬුවන්ගේ අදහස් වෙනස් වූයේ ඔහුගේ රචනාවන්ගේ හරයත් ඔහුගේ බසෙහි චාම් සරල බවත් වටහාගත් නිසා නොව වංග බස නොදන්නා බටහිර සාහිත්‍යික අනුශාසක සභාවකින් තෑග්ගක් ලැබීමේ වාසනාව සලකාගෙන බව මතක් කරන අදහසිනි.

තාගෝර් ඉංගිරිසි කවියෙන්, ප්‍රංශ නවකතාවෙන් හා රුසියන් නවකතාවෙන් උපමා, අලංකාර, අදහස් චරිත ගන්නා ලදැයි සමහරු චෝදනා කළහ. මේ චෝදනා ප්‍රිය රන්ජන් සෙන් යට කියන ලද විශ්ව විද්‍යාලය සංග්‍රහයෙහි ලා පරීක්ෂණයට භාජන කෙළේ ය. අනික් රටවල සාහිත්‍යයෙන් එළිය ලැබීම මිස ණයට ගැනීමක් තාගෝර්ගේ රචනාවල නොදක්නා ලැබේයයි ඔහු නිගමනය කළේ ද තාගෝර්ට නොබෙල් තෑග්ග හිමි වූ පසුයි.

තමන්ගේ රටේ ලේඛකයන්ට හා කවියන්ට මෙවැනි චෝදනා නැඟීම වංග ජනතාව අතරට සීමා වූවක් නොවේ. ඉංගිරීසින් විසින් පාලනය කරනු ලැබූ හැම රටක උගත්තු, තමන්ගේ රටේ සාහිත්‍යකාරයන්ට හා කලාකාරයන්ට, එවැනි චෝදනා නැඟීම ඇබ්බැහිකමක් කරගත්හ. මේ ඇබ්බැහිකමට අනුබල දෙන සේ ඔවුන්ගේ සිත් හැදුණේ කරුණු රාශියක් නිසා ය. තමන්ගේ බසත් සාහිත්‍යය හා කලාත් පහත් කොට සැලකීම; ඉංගිරීසින් සතු දේ මහත්කොට සලකා ඒවා අනුකරණය කිරීම, අනුකරණයෙහි රුසියන් වීම නිසා අමුතු දෙයක් ගැන සිතන්ට නොහැකි වීම; උත්පාදන ශක්තිය අතුරුදන්වීම; ඊර්ෂ්‍යාව, කුහකකම, මේ සියල්ල දියුණු කරන කුලභේදය; පංතිභේදය හා ඉංගිරිසි උගත් ලොකු මිනිසුන්ගෙන් තුති පැසසුම් ලැබීමේ ආසාව යනු එයින් කිහිපයකි.

ආසියාවේ ජනයා නිදහස ලැබීමෙන් පසු මෙයින් ඇතැම් කරුණු කෙමෙන් නැතිවෙයි. එහෙත් මෙවැනි අදහස් හා හැඟීම් අප අතරින් පමණක් නොව බටහිර උගතුන් අතරින් ද දුරු කරන දැනුම පැතිරෙන්නේ නවීන මානව විද්‍යාව නිසාය. බටහිර හැම සංස්කෘතියක්, සාහිත්‍යයක්, කලාවක් ස්වාධීනව වැඩුණේ ලොව නොයෙක් රටවලින් ණයට ගත්දේත් ලත් දැනුමත්, උගැන්මත් ඒ ඒ ජාතීන්ට හිමි ශක්තීන් විසින් සංකලනය කරනු ලැබීමෙනියි මානව විද්‍යාඥයෝ පෙන්වා දුන්හ. ණයට ගැනීම, සොරාගැනීම, අනුකරණය යන වචන සංස්කෘතීන් හා සාහිත්‍ය කලා ද අරබයා ඉතා පරෙස්සමෙන් වහරට ගතයුතු කියුම් වෙයි. එක් සාහිත්‍යයකින් ගන්නා දේ අනික් සාහිත්‍යයකට පිවිසෙන්නේ එහි බසටත්, සංස්කෘතියට හා කවියාගේ ශක්තියටත් අනුරූපව සකස් කරනු ලැබීමෙන් පසුයි. 'ස්වාධීනත්වය' යන පදවලින් හැඳින්වෙන්නේ නැති දෙයක් මැවීම නොවේ. ඇති දෙයකට අලුත් අමුතු ස්වරූපයක් දීමයි.

කේජු දැන් යුරෝපයේ සාදනු ලබන කෑමකි. ඒ කෑම අපගේ ජීර්ණ යන්ත්‍රයට හසු වීමෙන් ජීර්ණ වෙයි. එහි රසය අපේ ලෙයටත්, තෙලටත්, ඇඟමසටත් එක් වන්නේ ඒ සකස් වීමෙන් හා වෙනස් වීමෙන් පසුය. අපේ ලෙයටත්, තෙලටත් ඇඟ මස් සෑදුණු ප්‍රෝටීන් නමැති ධාතුවලටත්

එක් වන්නේ ණයට ගත් කේජු මෙන් නොව අපගේ ජීණී යන්ත්‍රය විසින් විච්ඡේදනයෙන් අලුත් උත්පාදනයකට හරවන ලද රස ධාතු ලෙසිනි. සාහිත්‍ය කලාවෙහි ඇතුළු වන ස්වාධීන උත්පාදකයෝ මීට නැකම් ඇත්තෝය.

මානව විද්‍යාව පසුගිය අවුරුදු පනහ තුළ දියුණු වූ දැනුම් වෙසෙසකි. ඉංගිරීසි අධ්‍යාපනඥයෝ ඒ දැනුම පෙරදිග රටවල පැතිරෙනු නොඉවසූහ. අද්වීතියයි සලකනු ලැබූ ඔවුන්ගේ සංස්කෘතියට එයින් පහර වැදෙයි. පහත් යයි සලකනු ලැබූ පෙරදිග සංස්කෘතීහු උසස් තැන් ලබයි. ආත්ම වාදය, ආදී කාලීන වැදි මිනිසුන්ගේ 'පිශාච වාදය' (animism) ඇසුරෙන් ප්‍රබලව දියුණුවූවකැයි මානව විද්‍යාවෙන් ඉගැන්වෙයි. මේ කරුණු නිසා මානව විද්‍යාව පෙරදිග පැතිරෙනු ඉංගිරීසි පාලකයොත් ඔවුන්ගේ අනුගාමිකයොත් නොඉවසූහ.

තාගෝර්ගේ සාහිත්‍යික චරිතයෙහි එක් අංගයක් විමසීමෙන් අපට උගත හැකි පාඩම කුමක්දැයි ඔබට දැන් වැටහෙතියි සිතමි. අපේ බසත් සාහිත්‍යයත් දියුණු කරනු පිණිස හොඳම දසාව දැන් ලබා තිබේ. ඒ දසාවෙන් නියම පල ලබා ගත හැක්කේ ඉංගිරිසිකාරයන් හා ඉංගිරිසි උගතුන් විසින් අප රට වපුරන ලද නිසරු අදහස්වලට හා මතවලට වහල්ව ලේඛකයන් හා කලාකාරයන් කුලල් කනු වැළැක්වීමෙනි. තාගෝර්ගේ රචනයන්ගෙන් හා ඔහුගේ සාහිත්‍යික චරිතයෙන්ද උගතයුතු පාඩම මේ අවදියෙහි අප විසින් සිහි කළ යුතුය.

තාගෝර් ජාත්‍යන්තර කීර්තියක් ලැබුවේ නොබෙල් තෑග්ග දිනූ හෙයිනි. ඔහු ඒ ජාත්‍යන්තර කීර්තිය නොලැබුවේ නම් සිංහල උගත්තුත් ඉංගිරිසි උගත්තුත් ඔහු සිහි නොකරති. ඉන්දියාවේ උගතුන් පවා තාගෝර්ගේ භාෂාවත් බටහිර සාහිත්‍යයට ණය ගැතිකමත් නොනවත්නා විවේචනය කරනු ඇත.

1. Contemporary Indian Literature. A Symposium (Sahity Akademi).
2. Journal of the Department of Letters, Calcutta University, Vol. XXII.

(**නවලෝකය**-1961 මාර්තු)

[1934 දී තාගෝර්ගේ ලංකා ගමන නිමිත්තෙන් විශේෂ ලිපියක් 'දිනමිණට' ලියූ බව වික්‍රමසිංහ සිය **උපන් දා සිට** (1961) ග්‍රන්ථයේ සඳහන් කරයි (255-256 පිටු). තාගෝර් සියවස වෙනුවෙන් 'නවලෝකය' සඟරාවේ එය පසුව පළ විය. මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ **මානව හිතවාදය හා එතෙර වියත්හු** (2005) කෘතියේ නැවත පළ වී ඇති මේ ලිපිය මෙහි පළ කෙරෙන්නේ මාර්ටින් වික්‍රමසිංහ භාරකාර මණ්ඩලයේ කාරුණික අවසරයෙනි - සංස්කාරක].

# ශාන්ති නිකේතනය පිළිබඳ මතක සටහන්

එදිරිවීර සරච්චන්ද්‍ර

ශාන්ති නිකේතනය යයි කියන්නේ, රවින්ද්‍රනාත් ඨාකුරයන්ගේ පියා වන මහර්ෂි (මහා ඍෂි) දේවේන්ද්‍රනාථ ඨාකුරයන් විසින් පිහිටුවන ලද ආශ්‍රමපදය යි. 'ශාන්ති නිකේතන් යනු සෙත් (ශාන්ති) නිවස (නිකේතන) යන අරුතිනි. එවැනි ආශ්‍රමපද පිහියුවනු ලැබූවේ වෘක්ෂලතා, ලියගොමු ආදියෙන් ගැවසීගත් ස්වාභාවික වටාපිටාවෙන් යුත් පෙදෙස් වලය. පුරාතන ඍෂිවරු ගස්වල සෙවනෙහි හිඳ භාවනායෝගීව කල් ගෙවූහ.

ශාන්ති නිකේතනයේ ස්වභාවය දැන සිටි මම, එහි නවීන ආයතනයක තිබෙන අයුරේ විශාල ගොඩනැගිලි දකින්ට බලාපොරොත්තු නුවූයෙමි. මා මෙසේ කීවේ අප එහි වාසය කරන දවස්වල පැමිණි ලාංකිකයන් කෝ ඉතින් මේකෙ ගොඩනැගිලි මුකුත් නැනේ'යි කියමින් විස්මයට පත් වූ සැටි සිහි වූ බැවිනි. ලොකු ගොඩනැගිලි වසයෙන් එහි තිබුණේ 'ස්ත්‍රී භවනය' යන නමින් හැඳින්වූ ගැහැනු නේවාසිකාගාරය.' චීන භවනය් යයි නම් කරන ලද, චීන ආණ්ඩුව විසින් පරිත්‍යාග කරන ලද ගොඩනැගිල්ල 'රතන් කුටි' යනුවෙන් හඳුන්නවනු ලැබූ, විදේශ අමුත්තන් සඳහා තනන ලද නිවාසය යන මේවා පමණි. ස්ත්‍රී භවනය හා චීන භවනය උඩුමහල් තලයකින් ද යුත් ගෘහ විය. රතන් කුටියෙහි තිබුණේ පොළෝතල මහල පමණි. සෙසු නිවාස පැල්පත් මෙන් කුඩා විය. 'ගුරු පල්ලි' නමින් හැඳින්වූ කුඩා ගෙවල් පෙළක් ආශ්‍රමයේ පිටිපස කෙළවර තිබුණි. ඒවා ආචාර්‍යවරුන්ගේ නිවාස විය.

ආශ්‍රමයට පිවිසීමට තොරණකට සමාන දොරටුවක් තිබිණැයි සිතමි. මෙබඳු විස්තර සම්බන්ධයෙන් මගේ ස්මරණය එතරම් පැහැදිලි නැත. එහෙත් තොරණට උඩින් වංග අක්ෂරවලින් එකමෙව අද්විතීයං යද් විභාති...' යන උපනිෂද් පාඨය තිබුණු බව මට අමතක නොවේ. එකල මා උපනිෂද් මුල් ග්‍රන්ථ පරිශීලනය කොට තිබුණේ නැත. එහෙත් මහාචාර්‍ය රාධාකෘෂ්ණන්ගේ 'භාරතීය දර්ශනය' නමැති ඉංග්‍රීසි පොත කියවීමෙන් අන් හැම දර්ශන වාදයකට වඩා අද්වෛත වේදාන්තය කෙරෙහි මගේ සිත ඇදී ගියේය. විශ්වය පිළිබඳ පරමාර්ථ සත්‍යය මේ දර්ශනයෙන් කියවීණැයි එක් කලෙක මගේ විශ්වාසයක් ද විය. එබැවින් වේදාන්ත දර්ශනයේ හරය දක්වෙන යට සඳහන් පාඨය වර්තමාන ලෝකයේ යම් කිසි ආයතනයක ආදර්ශ පාඨය වී තිබෙනු දැකීමෙන් මා තුළ පෙර නුවූ විරූ චිත්ත ප්‍රාමෝද්‍යයක් ජනිත වූ බව කිව යුතු ය.

***********************************

රවින්ද්‍රනාථ ඨාකුරයන්ගේ පියා වන දේවේන්ද්‍රනාථ ඨාකුරයන් වේදාන්තවාදියෙකු වන්ට ඇතැයි සිතමි. එහෙත් රවීන්ද්‍රනාථ කවියාගේ දර්ශනය දේවභක්ති විශේෂයක් බව ඔහුගේ කාව්‍ය කියවන විට හැඟේ. ඇතැම් කාව්‍යවලින් පෙනෙනුයේ ඔහු හැම දෙයක ම දෙවියන්ගේ මූර්තිය දුටු හැම දෙයක් ම සගුණ දේවයෙකුගේ (සගුණ බ්‍රහ්ම හෙවත් ඊශ්වර) සංකේතයක් වසයෙන් දුටු ගුඨවාදියෙකු (mystic) බව ය. බටහිර විචාරකයන් ඔහු හැඳින්වූයේ ස්පිනෝට්සා (Spinoza) සේ දේවභක්තියෙන් මත් වූ (god - intoxicated) කවියෙකැයි කියා ය.

මට ඨාකුරයන්ගේ 'ගීතාංජලී' හා 'ද ගාඩ්නර්' නම් කවි පොත් දෙක කියවීමට අවස්ථාව ලැබුණේ මා විශ්ව විද්‍යාලයට පිවිසීමට පෙර ය. ඒවා ඔහු විසින් ම තමාගේ වංග මුල් කවි වලින්, ඉංග්‍රීසියට පෙරළන ලදී. රවීන්ද්‍රනාථගේ කවීත්වය කෙරෙහි මා බෙහෙවින් පැහැදුණු බව සඳහන් කළ යුතුය. ඉංග්‍රීසියට පෙරළන ලද ඔහුගේ කෙටි කතා සංග්‍රහයක් ද අපේ පංතියට නියමිත ව තිබී මම කියවා රස වින්දෙමි.

ශාන්ති නිකේතනයට ලියූ ලියුම්වලට පිළිතුරු නොලැබුණු නමුත්, එහි ගොස් පාලකයන් හමු වූ විට අපට ඉතා හොඳින් සැලකූ බව සඳහන් කිරීම වටී. එහෙත් සති දෙකක් තුනක් යන තුරු කිසි වැඩක් නොකෙරිණ. මුල් දවස්වල එය ජනශූන්‍ය පෙදෙසක් සේ අපට හැඟුණ. ටිකින් ටික, එක්කෙනා දෙන්නා පිළිබඳ ව කිසිවෙකුට කිසි ම හදිසියක් නුවූවා සේ පෙනිණ. කවදා මෙහි යමක් සිදු වේ දැයි අපි භග්නාශාවට පත් ව බලා හුනිමු.

ස්වභාව ධර්මයට සමීප ව විසීම ශාන්ති නිකේතනයේ ආශ්‍රම ජීවිතයේ ප්‍රධාන පරමාර්ථය විය. සෘතුව ද හැම දෙයක් කෙරෙහිම බලපෑවේ මීට අනුකූලව විය යුතු ය.

***************************************

ශාන්ති නිකේතනයේ කාල සටහන් සකස්කොට තිබෙන්නේ විද්‍යා විෂයක් හෝ ශාස්ත්‍ර විෂයක් ඉගෙන ගන්නා කෙනෙකුට සතුටු නම් සංගීතය හෝ චිත්‍ර කලාව හෝ මූර්ති ශිල්පය වැන්නක් ද පුහුණු වීමට ඉඩ ලැබෙන අයුරිනි. සිතාර් වාදනය පුහුණු වීමට මා ආසා කළ අතර ම, භාරතීය දර්ශනය ඉගෙන ගෙන බෞද්ධ දර්ශන විෂයෙහි කිසියම් පර්යේෂණයක යෙදීමට ද මම අදහස් කෙළෙමි. මෙවැනි පර්යේෂණ සඳහා විද්‍යා භවනයට යා යුතුව තිබුණි. සංගීත භවනයේ හා කලා භවනයේ වැඩ පෙරවරු වේලේ යෙදිණ. විද්‍යා භවනය විවෘත වන්නේ පස්වරු වේලේ ය.

මගේ වාසනාවට, විසිපස් වසරක් බරණැස් විශ්ව විද්‍යාලයෙහි භාරතීය දර්ශනය පිළිබඳ මහාචාර්ය ධූරය දරමින් සිටි ඵණීභූෂණ අධිකාරි නම් වයෝවෘද්ධ පඬිවරයා, විශ්‍රාම ගෙන ශාන්ති නිකේතනයෙහි පදිංචියට අවුත් සිටියේ ය. දිනපතා පස්වරු වේලේ ඔහු පවත්වන පංතියට මම යන්ට පටන් ගතිමි.

මහාචාර්ය අධිකාරි මහතා මට පර්යේෂණය සඳහා දුන් මාතෘකාව නම් පාලි අභිධර්මයෙහි එන භවංග චිත්තය ගැන සංකල්පය ය. ඒ පිළිබඳ ප්‍රාරම්භ කටයුතු මම ශාන්ති නිකේතනයෙහි දී ම කෙළෙමි. එහෙත් දිගටම නියැලී එය සම්පූර්ණ කළ හැකි වූයේ මට විශ්ව විද්‍යාලයෙහි පාලි භාෂා අංශයෙන් ආචාර්ය ධූරයක් ලැබුණු පසු ය. මම එය පී. එච්. ඩී. උපාධිය සඳහා නිබන්ධයක් වසයෙන් ලන්ඩන් විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කෙළෙමි. පසු කලෙක එය පොතක් වසයෙන් ද පළ විය.

මම උදේ වරුවේ සිතාර් පංතියකට ගියෙමි. සිතාර් වාදනය ඉගැන්වූ ආචාර්යවරයා සුසිල් බැනර්ජි නම් විය. ඔහු, කොන්ඩෙ දෙපැත්තෙන් වැටෙන සේ දිගට වවාගෙන සිටි, උස, හීන්දෑරි, ලැජ්ජාශීලී පුද්ගලයෙක් විය. සිතාර් වාදනයෙහි දී ඔහු හරඹ පෑමට වඩා මාධුර්යය වැදගත් කොට සැලකුවා සේ විය.

මා දන්නා කිසිවක් වාදනය කරන්ට යයි පළමු දවසේ ඔහු කීවේය. 'ගත්' වාදනයක් දැන නොසිටි මම සින්දුවක් වාදනය කෙළෙමි. ඔහු කිසිවක් නොකියා මට යමක් කල්‍යාණ ගත් එකක් දුන්නේය.

මා එහි සිටි කාලයෙහි දී ඔහු මට භූපාලි ගත් එකකුයි පිලු ගත් එකකුයි තාන කීපයක් හා ඣලා සමග වාදනය කරන්ට ඉගැන්නුවේය.

ශාස්ත්‍රීය පක්‍ෂය කියා නොදී හුදෙක් වාදනය පමණක් ප්‍රගුණ කරවීම ශාන්ති නිකේතන ක්‍රමයෙහි එක් අඩු පාඩුවක් යයි මට දැනුණි. භාරතීය සංගීතයේ මූලික අංග වන රාග, තාල යන දෙක ගැන මට කරුණු කියා දුන්නේ නැත. කිසියම් රාගයක ස්ථායි, අන්තරා යන කොටස් දෙකෙන් යුත් 'ගත්' එකක් දී ('ගත්' යනු set piece යයි කිව හැකි ය), තාන හා ඣලා කීපයක් ඉගැන්වීමේ ගතානුගතික ක්‍රමය නිසා සිතාරය පිළිබඳ මගේ උනන්දුව අඩු වී ගියේ ය. යමන් කල්‍යාණ, භූපාලි හා පිලූ යන රාගවල ලක්‍ෂණ පෙන්වා ඒවා ආලාපා කොට දක්වා, තාන, ඣලා ආදියෙන් කෙරෙන්නේ කුමක් ද කියා දී, තාල ගැනත් විස්තරයක් කොට වාදනය ඉගැන්නුවේ නම්, රසාස්වාදනය කරමින් මට සිතාරය ඉගෙනගන්නට තිබුණි.

***************************************

වංග ගායන ශෛලිය අපේ රටට පළමුවෙන් හඳුන්වා දුන්නේ ආනන්ද සමරකෝන් ය. ඊට පෙර ප්‍රචලිත වූයේ ඛ්‍යාල් ගායන ක්‍රමයත්, තුම්රි, ගසල් හා බවාලි වැනි සරල ක්‍රමත් ය. ශාන්ති නිකේතනයට ගොස් ආපසු පැමිණි කීප දෙනා එම වංග ශෛලියම අනුගමනය කළෝ ය. ඔවුන් අතර සූරිය ශංකර මොල්ලිගොඩ හා සුනිල් සාන්ත ප්‍රමුඛ ය. අමරදේවගේ ගායනයෙහි වංග ශෛලියේත් සිංහල ගැමි ගායන ශෛලියේත් සංකලනයක් වෙතැයි මම සිතමි.

මා ශාන්ති නිකේතනයට ගියේ එක් දහස් නවසිය තිස් නවයේ දී ය. නර්තන ශිල්පය හා සංගීත ශිල්පය අරභයා අපේ උරුමය සෙවීමට මධ්‍යම පංතික රසිකයන් ඉන්දියාවට යන්ට පටන් ගත්තේ මෙකී වර්‍ෂයට ආසන්න වර්‍ෂවලදී ය. අප ශාන්ති නිකේතන යන විට සූරිය ශංකර මොල්ලිගොඩ මහතා එහි සිටියේ ය. සිරි කුමාර යන මහතෙක් ද නැටුම් ඉගෙන ගනිමින් හුන්නේ ය. සුනිල් සාන්ත පැමිණියේ ඒ දවස්වල ය.

මෙසේ සංගීත ශිල්පීන්, චිත්‍ර ශිල්පීන් හෝ නර්තන ශිල්පීන් බවට පත් වීම සඳහා ශාන්ති නිකේතනයට පැමිණි සමහරුන්ට තිබුණේ එකල මධ්‍යම පංතිකයන් ආරූඪ කරගෙන සිටි පුරුතුගීසි, ලන්දේසි හෝ ඉංග්‍රීසි නම් යී පිට රට දී තමන්ගේ ජාතික අනන්‍යතාව රැකගත යුතු යයි දැනුණු නිසාත්, පෙරදිග ශිල්පයක් දක්වන්නාවූ කලාකරුවෙකුට බටහිර නමක් තිබීමේ අනුචිත භාවය වැටහුණු නිසාත් එබඳු අය තමන්ගේ නම් වෙනස් කළහ. භාරතීය කලාකරුවන් අභිවාදනය කළ සමහරු තමන්ට සිංහල නම් තිබුණ ද භාරතීය නම් ආරූඪ කරගත්හ. මෙසේ සංගීතඥ මොල්ලිගොඩ මහතා 'සූරිය ශංකර්' යන්න තම නමට ඈඳා ගත්තේ ය. මෙය 'උදය ශංකර්' නැතහොත් 'රවිශංකර්' යන නම ආදර්‍ශ කොටගෙන කරන ලද්දක් විය හැකි ය. අපේ කාලයට ස්වල්පයකට පසු  ශාන්ති නිකේතනයට විත් නැටුම් ඉගෙන ගත් අතුකෝරාල මහතා 'අනංගලාල්' කියා තම නමට භාරතීය නමක් ඈඳා ගත්තේ ය. ප්‍රේමකුමාර් (දැන් ප්‍රේමකුමාර එපිටවෙල), සිරිකුමාර් ආදිය ද මීට සමාන නිදර්‍ශන ය.

සුනිල් සාන්ත මහතාගේ ආදි නම වූයේ බී. දොන් ජෝසප් ජෝන් යනුයි. ශාන්ති නිකේතනයට පැමිණි විට ඔහු සෙසු සෙසු සිංහලයන්ගේ උපදෙස් ගෙන, තම නම සුනිල් ශාන්ති යයි වෙනස් කෙළේ ය.

මගේ නම මා වෙනස් කෙළේ ශාන්ති නිකේතනයට යාමට මට අදහසක් වත් නොතිබුණු කාලයක ය. එකල අප තුළ හටගත් ස්වදේශාභිමානය හේතු කොටගෙන, මට තුබූ පුරුතුගීසි නම ගැන මම ලැජ්ජ වීමි.

****************************************

ඉන්දියාවේ නොයෙක් ප්‍රදේශවලිනුත්, යුරෝපය, අමෙරිකාව වැනි දුර රටවලිනුත්, ලංකාවෙනුත් ශාන්ති නිකේතනයට එන කවුරුත් තම ජාතික ඇඳුම මාරු කර, එහි හැම පිරිමියෙකුම ඇන්ද සුදු පිජාමා කුට්ටමට හා කුර්තාවට බැසගත්හ. ධර්මසේන නමැති එක් ලාංකිකයෙක් මේ සිරිත අනුග මනය නොකර, කලිසන් පිටින් ම හුන්නේය. ඔහු සෙස්සන්ගෙන් කැපී පෙනුණු බැවින් අනික් ලාංකිකයෝ මේ ගැන නොසතුටකින් පසු වූහ. මෙපමණක් නොව ඔහු සෙසු ලාංකිකයන්ගේ සිත් කළඹන තවත් දෙයක් කෙළේය. තමා එන විට ගෙනා ඉස්පාඤ්ඤ ගිටාරයක් වාදනය කරමින් ඔහු සංගීත භවනයේ ශිෂ්‍ය නිවාසයෙහි හිඳ උදේ සිට සවස දක්වා ඉංග්‍රීසි පෙම් ගී හඬ නගා ගැයුවේය.

සිංහලයන්ගේ මෙවැනි සංකර ඇබ්බැහිකම් ශාන්ති නිකේතනයෙහි දී ද කිසිවෙකු ප්‍රදර්ශනය කිරීම ගැන අපි කවුරුත් ලජ්ජාවෙන් හුන්නෙමු. මේ ක්‍රියාවේ අනුචිත භාවය ගැන සමහරුන් ඔහුට කී නමුත් ඔහු ඊට කන් දුන්නේ නැත. අප හා කුලුපග වූ එක් විදේශ පඬිවරයෙක් ශාන්ති නිකේතනයෙහි වාසය කෙළේය. ගුර්දියල් මල්ලික් නම් වූ මොහුට මුණ වැසෙන දිග සුදු රැවුලක් තිබුණි. දවසක් අප බලන්ට එන විට ශිෂ්‍ය නිවාසය පසු කර එන ඔහුට, ධර්මසේනගේ සින්දු ඇසුණේය. ඔහු විත්, ආරූඪ කරගත් ලජ්ජාවකින් යුතු ව 'මම එන කොට ඔබේ රට වැසියෙක් අයි ලව් යූ මයි බිලවඩ්, ලෙට් මී කිස් යූ ආදී වදනින් මාව අමතන්ට පටන්ගත්තා. මම ලජ්ජාවෙන් දුවගෙන ආවා. මගේ සුදු රැවුල වත් බලාල එපා ද මට එහෙම කතා කරන්න්යි කියමින් විහිළු කෙළේ ය. අප ඔහු සමග සිනාසුණු නමුත් අපේ රට වැසියාගේ හැසිරීම ගැන අපට මහත් ලජ්ජාවක් ඇති විය.

මඳ කලකට පසු අපට ඨාකුරතුමා බැහැ දැකීමට අවසර ලැබුණේ ය. 'ගුරුදේව' යනුවෙන් කවුරුත් හැඳින්වූ එතුමා විසුවේ ආශ්‍රමයට නුදුරින් පිහිටි පරණ වලව්වකට සමාන ගෙයක ය. එතුමාගේ ගෙට 'උත්තරායන' යන නම ව්‍යාවහාර විය. ආශ්‍රමයෙහි විසූවන්ගේ නිවෙස්වලට වඩා එය සුඛදායී බව අපට එක පැහැර සිතුණි. එතුමාගේ පුද්ගල ලේකම් තැන්පත් චන්ද මහතා අප එහි කැඳවාගෙන ගියේය.

ගුරුදේවයන් බැහැ දැකීම ආශ්‍රමවාසීන් විසින් සලකන ලද්දේ එක්තරා විදියක ආගමික වතාවක් සේ ය. දිග ලෝගුවකින් සැරසී හුන් එතුමා සුදු කේසමස්සු ඇති, අංකුසු නාසයකින් හා මොලොක් ඇස් සඟලකින් ද යුත්, ජවි වර්ණයෙන් යුරෝපීයයෙකුට සමාන වූ තේජස්වී පුද්ගලයෙක් විය. යුරෝපයෙහිත් අමෙරිකාවෙහිත් සැරිසැරූ අවස්ථාවෙහි ඔහු, තමන්ට යම් ශාස්වත සත්‍යයක් මතක් කර දීමට පූර්ව දිග් දේශයෙන් පැමිණි මුනිවරයෙක් යයි ඒ රටවල මිනිසුන් තුළ හැඟීමක් ඇති වීම පුදුමයක් නොවේ යයි මට සිතුණි.

බැහැර යන විට වටකුරු හිස් කසුවක් ද පලඳින ගුරුදේව, තමාගේ මේ ඇඳුම සකස් කොට ගත්තේ ටොල්ස්ටෝයිගේ ඇඳුම අනුකරණයෙන් බව මම පසු ව දැනගතිමි. ඨාකුරයන් හා ගාන්ධිතුමා යන දෙදෙන ම ටොල්ස්ටෝයි සමග ලියුම් ගනුදෙනු කරමින් ඔහු කෙරෙහි මහත් ගෞරවයකින් හුන් භාරතීය නායකයෝ වූහ.

ගුරුදේවයන්ට පාද නමස්කාරයෙන් ආචාර කළ අපි එකත්පස් ව හුන්නෙමු. ගුරුදේව තුමාගේ ලංකා ගමනත් වාසයත් සිහි කරමින් ලාංකික පිසමන් පැසසුවේ ය. අපේ මාලු ව්‍යංජනය පිසීමේ විවිධ ක්‍රම තිබෙන බව ඔහු විශේෂයෙන් සඳහන් කෙළේ ය.

ගුරුදේව තම පද්‍ය රචනා මෙන් ඒවා ගැයීමට ස්වර රචනා ද එක වර ම නිර්මාණය කෙළේ ය. මෙවැනි ප්‍රතිභා විශේෂයක් පිහිටන්නේ ස්වල්ප දෙනෙකුට ය. ඔහු ස්වකීය පද්‍ය ගායනා කරනු මම එක් අවස්ථාවක දී ඇසීමි. ඔහුගේ උච්ච හඬෙහි මා පෙර අසා නැති අයුරේ විශේෂ ස්වර ගුණයක් තිබුණි. ඔහු නිදහසේ තනු නිර්මාණය කළ නමුත් රාගධාරි සංගීතයෙහි කෙළ පැමිණියෙකු බව ප්‍රකට ය. බාවුල් හා භටියාලි නම් වූ වංග ගැමි ගායනාවලින් ද ඔහු ආභාසය ලැබූ බව ඔහුගේ ස්වර රචනාවලින් පෙනේ.

රවින්ද්‍රනාථ ඨාකුරයන්ගේ කාව්‍ය මුල් වංග බසින් ශ්‍රවණය කරන විට ඉංග්‍රීසි පරිවර්තනයෙහි දී ඒවා කෙතරම් රසහීන වී ඇද්දැයි වැටහේ. ඒවායේ ශබ්ද ධ්වනිය විසින් අර්ථ ධ්වනිය පෝෂණය වෙමින්, ස්වර රචනාවෙන් ඒ දෙක ම උද්දීපනය වී ඇති සැටි මනෝඥ ය. ඔහුගේ වෂ්ා කාලය පිළිබඳ කාව්‍යවල මේ ශබ්ද ධ්වනිය ඉස්මතු වී පෙනේ. අහස ගිගුම් දෙන හඬ ද වියලි පොළෝ තලය මත වැටෙන ධාරානිපාතය ද වචනවල අපූරු සංකලනය නිසා අපට ඇසෙන්නා සේ දූනේ.

ගුරුදේවගේ රචනා ශෛලියේ ආභාසය වගු බස දත් චන්ද්‍රරත්න මානවසිංහගේ ඇතැම් කාව්‍ය රචනාවල දක්නට ලැබේ. අල්විස් පෙරේරා හා සාගර පලන්සූරිය වැන්නවුන්ගේ කවිවල දක්නට ලැබෙන්නේ ඨාකුරයන්ගේ කවිවල පරිවර්තනවලින් එතුමාගේ දර්‍ශනය පිළිබඳ ඇති වූ ව්‍යාජ වැටහීමක් මිස එයින් උකහාගත් ගැඹුරු ආභාසයක් නොවේ.

නොබෙල් සම්මානය දිනූ පසු රවීන්ද්‍රනාථ කවියා විශ්ව කීර්තියට පත් වූ නමුත් ඒ සමග ම ඔහුගේ කෘති දරුණු විවේචනයට ද පාත්‍ර විය. එංගලන්තයේ විචාරකයෝ රවීන්ද්‍ර කාව්‍ය පෙණ බුබුළුවලට සමාන කළහ. මා සිටි කාලයෙහි පවා කල්කත්තාවේ පළ කරන පුවත්පත්වල ඔහුට නිර්දය ලෙස පහර දී තිබෙනු දුටුවෙමි. එහෙත් ඔහු නවීන වංග සංස්කෘතියේ නිර්මාතෘවරයා බව ඉන්දියාවේ විචාරකයෝ පිළිගත්හ.

රවීන්ද්‍රනාථගේ සමස්ත සේවය නොසලකා ඔහුගේ කාව්‍යවල ඉංග්‍රීසි පරිවර්තනවලින් පමණක් ඔහු තක්සේරු කිරීම සාධාරණ දැයි ඇසිය හැකි ය. අනික, අට කෝටියක් සංඛ්‍යාත වංග ජනතාවගේ රස වින්දනයට භාජනය වූ ඔහුගේ කාව්‍ය බටහිර ජාතීන්ගේ රුචිකත්වය අනුව ඇගයීම යුක්තියුක්ත ද? ඔහුගේ කාව්‍ය, නිශ්ශබ්ද පරිශීලනය සඳහා නොව ගායනය සඳහා රචනා කරන ලද බවත් අමතක කළ යුතු නැත.

අප ශාන්ති නිකේතනයෙහි හුන් කාලයෙහි ඉතා වැදගත් සිදුවීමක් සේ සටහන් කළ යුත්තේ මහාත්ම ගාන්ධිතුමාගේ පැමිණීමය. ගාන්ධිතුමා ශාන්ති නිකේතන සංකල්පය තදබල ලෙස විවේචනය කළ කෙනෙකි. ඉන්දියාවේ ජනතාව, අධිරාජ්‍යවාදීන්ගේ ක්‍රෑර ග්‍රහණයට හසු වී පීඩා විඳිමින් සිටින අවධියක යථාර්ථයෙන් පලා ගොස් නිකේතනය වැනි පරිකල්පිතයක් මවාගෙන, නෘත්‍ය ගීත වාදනයෙන් වට කරන ලදු ව විසීමෙන් බහුතර කවර සෙතක් වේ දැයි ඔහු ඇසී ය. ගාන්ධිතුමා ශාන්ති නිකේතනයට එන විට මම රෝගී ව හුන්නෙමි. මා ලාංකිකයෙකු බව ආරංචි වී ඔහු මගේ කාමරයට අවුත් මගේ නළලට අත තබා ආශිර්වාද කොට ගියේ ය. ගාන්ධිතුමා

පිළිගැනීමට පවත්වන ලද උත්සවයට මට යන්ට නොහැකි විය. එහෙත් මගේ කැමරාව මිත්‍රයෙකුට දී එහි ඡායාරූප කීපයක් ඔහු ලවා ගන්වා මම තබා ගත්තෙමි. එකක, වර්ණවත් ආස්තරණයකින් වසන ලද වේදිකාවක් මත ඨාකුරතුමා හා ගාන්ධිතුමා එරමිණිය ගොතා වාඩි වී සිටිති.

ගාන්ධිතුමා විසින් හෙළා දකිනු ලැබූ නමුත් ඉන්දියාවට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් මිදී ස්වරාජ්‍යය ලබා ගැනීමට ඨාකුරතුමාගේ අතිනුත් වැදගත් සේවයක් ඉටු වූ බව පිළිගත යුතු ය. අන් කිසි ම රටකට දෙවෙනි නුවූ සංස්කෘතික දායාදයකට හිමි කම් කියන ජනතාවක් බලයෙන් යටත් කොට තැබීම අධර්මිෂ්ඨ ක්‍රියාවක් බව ලෝකයාට ඒත්තු ගැන්වීමට ඨාකුරතුමාගේ කවිත්වය මෙන් ම ඔහු විසින් පිහිටුවන ලද ආයතනය ද ඉවහල් විය. ශාන්ති නිකේතනය වූ කලී පුරාතන භාරතයෙන් බිඳක් පුනරුත්ථාපනය කොට තාවකාලික වසයෙන් හෝ තබා ගැනීමට කරන ලද උත්සාහයක ප්‍රතිඵලය යි. ශාන්ති නිකේතනයෙන් ස්ඵුට වූ තවත් කරුණක් නම් පැරණි භාරතීය සභ්‍යත්වය සම්භාවනීය පුරුෂාර්ථ මත ගොඩ නගා ඇති බව ය. නූතන සමාජයට ඒවා ගැළපෙතත් නැතත්, ඉදිරියට යා යුත්තේ ඒවායින් ජීවශ්වාසය ලබාගෙන ය.

ඉන්දියාවට ස්වරාජ්‍යය ලබා ගැනීම සඳහා ගාන්ධිතුමා වැන්නවුන් දේශපාලන භූමියෙහි කළ සටන තරම් ම රවීන්ද්‍රනාථ ඨාකුරයන් වැන්නවුන් සංස්කෘතික ක්ෂේත්‍රයෙහි කරගෙන ගිය ධර්ම යුද්ධය වැදගත් වූයේ මේ හෙයිනි. ස්වරාජ්‍යය ලබාගත් පසු මග පෙන්වීමට කිසියම් පුරුෂාර්ථ පද්ධතියක් අවශ්‍ය ය. ජනතාවගේ ශරීර පෝෂණයට සංස්කෘතිය අවශ්‍ය ය.

මේ ශත වර්ෂයේ භාගයෙහි ඇති වූ වංගීය සාහිත්‍ය සංගීත කලා නවෝදයේ (Bengal renaissance) ජන්මභූමිය වූයේ ද ශාන්ති නිකේතනය බව කවුරුත් පිළිගනිති.

[මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර විසින් රචිත **පිං ඇති සරසවි වරමක් දෙන්නේ** (1985) කෘතියෙන් උපුටා ගැනුණු බව සලකන්න. මහාචාර්ය සරච්චන්ද්‍ර, 1941-44 කාලයේ දී යාපනයේ චුන්නකාම්හි පළ කෙරුණු *Kesari Peoples's Weekly* පුවත්පතට 'Through Santiniketan Eyes' නමින් ලියූ ලිපි මාලාව, මහාචාර්ය සුචරිත ගම්ලත් විසින් සිංහලයට පරිවර්තනය කරනු ලැබ **ශාන්තිනිකේතනයේ ඇසින්** (කොළඹ: ගොඩගේ, 2001) නමින් පළ වී ඇත - සංස්කාරක].

# A Bibliography of Rabindranath Tagore's Works in Sinhala

**Sandagomi Coperahewa & Buddhini Ramanayaka**

This bibliography provides a detailed description of Rabindranath Tagore's translated works in Sinhala. The objective of this bibliography is to provide an up-to-date account on Tagore's works in Sinhala. It mainly covers novels, short stories, lyrical dramas and poetical works of Tagore. All entries are classified according to the alphabetical order of the translator's name. The final section of this bibliography provides a list of biographies of Rabindranath Tagore in Sinhala.

**I**

Alwis, William. *Adasanda* (Sinhala translation of *Crescent Moon)* Galikissa: Sri Lanka Rasayanagaraya, 1954.

_________ *Maha kavi Ravindranath Tagore Thuma ge Kathā* ) Colombo: Godage, 1999.

Amarasinghe, R.D. *Kunātuwakin Sasalau Naukhāva* (Sinhala adaptation of *The Wreck* ) Ragama: Nethma Prakasakyo, 1999.

Amarasiri, Ananda *Bimālā* (Sinhala translation of *The Home and the World*) Colombo: Sooriya, 2003.

_________ *Mānasi* ( Sinhala translation of *Mānasi* ) Colombo: Sooriya, 2010.

De Silva, Sri Charles *Dāka Ghara* ( Sinhala adaptation of *The Post Office)* Gunasena: Colombo, 1966.

Disanayaka, Kusum *Gitānjali* ( Sinhala translation of *Gitānjali* ) Colombo: Godage, 1992.

_________ *Pala Neleema* (Sinhala translation of *Fruit Gathering*) Colombo: Godage, 2000.

Galketiya, Satyapala *Uttara Bhūmiya* ( This anthology includes Sinhala adaptations of Tagore's short stories New Dolls, The Wishes of the Favourite Queen and The Court Jester) Veyangoda: Prabha Prakashana, 1990.

Gunasekara, H.D. Ananda *Gitānjali: Namaskāra Geetha* (Sinhala translation of *Gitānjali*) 1959.

Gunasekara, Padama *Mataka Satahan – Rabindranath Tagore* ( Sinhala Translation of *Reminiscences*) Nugegoda: Sunera Prakasakayo, 2000.

Gunawardhana, Dharmadasa & Masakorala, Sudas *Nurthya Pūja saha Mālini* ( Sinhala translation of *Natir Pūja*) Colombo: Gunasena, 1960.

_____ *Chandālika saha Raja ha Regina* (Sinhala translation of *Chandālika*) Colombo: Gunasena, 1964.

_____ *Mangala Yāthrawa* ( Sinhala translation of *Nauka Dubi*) Colombo: Gunasena, 1967.

Gunathilaka, W.M. *Chaturanga* ( Sinhala translation of *Chathuranga*) Mudungoda: Tharanga Prakasakayo, 2007.

Hemaloka Himi , Urapola & Gunawardhana, Dharamadsa *Gōra* ( Sinhala translation of *Gōra*) Colombo: Gunasena, 1961.

Hemantha, Nandaji *Pem Thilina* (Sinhala translation of *Lover's Gift*) Colombo: Gunasena, 1960.

Hettige, Bastian *Adasanda* (Sinhala translation of *Crescent Moon*) Colombo: Gunasena, 1964.

______ *Gitānjali* ( Sinhala translation of *Gitānjali*) Colombo: Anula Press, 1970.

______ *Ranwan Botttuwa* ( A collection of Tagore's short stories) Colombo: Godage, 1992.

Jayasuriya, Edmund *Gitānjali* (Sinhala translation of *Gitanjali)* Colombo: Gunasena, 2010.

Jayawardhna, Anura *Manmulavu Siyotun* ( Sinhala translation of *Stray Birds*) Colombo: Godage, 2009.

Jayawardhana, R.P. *Udyāna Pālakaya* (Sinhala translation of The *Gardener*) Colombo: Gunasena, 1960.

Karunartahna, D.M. *Prema Yāthra* (Sinhala translation of *The Wreck)* Pannipitiya: Subha, 2000.

Kudatihi, Anadapiya *Bindunu Bedum: Keti Nawakathawa saha tawath Katha* (Sinhala translation of *Broken Ties and Other Stories)* Colombo: Godage, 2002.

________ *Binodini* (Sinhala translation of *Chokher Bali* ) Etulkotte: A.S. Prakasakayo. 2003.

Masakorala, Sudas *Bili Pūja* (Sinhala translation of *Sacrifice* ) Colombo: Gunasena, 1961.

Nissanka, Piyadasa, *Kunātuwa* (Sinhala translation of *The Wreck* ) Colombo: Godage, 1995.

Premavansa, Nimal G. *Nawa Sanda* (Sinhala translation of *Crescent Moon*) Colombo: Godage, 1997.

Ranawaka, Edwin *Bhāratha Kathā Mruthaya* ( Sinhala translation of *Stories from Tagore* ) Colombo: Gunasena, 1959.

Samarakoon, Ananda *Pahana Gita Nātaakya* (Sinhala translation of Tagore's lyrical drama - published for Tagore Centenary Year – 1961)

Samarasekara, J.K.S. *Avasan Kāvyaya* ( Sinhala translation of *Shesher Kabita* ) Padukka: State Printing Corporation,

Samarasekara, Sugunapala *Tagore Nirmana* (Sinhala translation selected Tagore works – *Chitra, Stray Birds, Fruit Gathering*) 1988.

Senaratne, Madhavi *Mā Bāla Kāle* ( Sinhala translation of *My Boyhood Days* ) Mulleriyawa: Wijesooriya Grantha Kendraya, 2005.

Sinhaarchchi, Chinta Lakshmi *Gōra* ( Sinhala translation of *Gōra* ) Mulleriyawa: Wijesooriya, 1999.

Sugathadasa, K.B. *Gitānjali* (Sinhala translation of *Gitānjali)* Wellampitiya: Divesa Prakasakayo, 1984.

Tennakoonmudalige, G. S. *Siuvranga Renguma* ( Sinhala translation of *Four Chapters* ) Colombo: Sooriya, 2008.

Thilakaratne, Premaranjit, *Taepael Hala* (Sinhala translation of *The Post Office*) Nugegoda: Sarasavi, 2004.

Thilakaratne, Wimal *Uthpala* (Sinhala translation of *Uthpala)* Ganemulla: Udaya Printers.

Vijithadhamma Himi, Siyambalagaharuppe *Upaguptage Abisaru Gamana* (Sinhala translation of Tagore's short stories) Kelaniya: Vidyalanakra Pirivena 1987.

_______ *Punchi Mahatmaya Yali Peminei* (Sinhala translation of *Little Master's Return)* 1989.

Vitharana, Vini *Gitānjali* (Sinhala translation of *Gitānjali* ) Colombo: Godage, 2004.

Waidyaratne, Madhava *Gitānjali* (Sinhala translation of *Gitānjali* ) University of Colombo: Arts Council, 1989.

Wanniarachchi, J.P. *Chokar Bali* (Sinhala translation of *Chokhar Bali)* Colombo: Vidarsana, 2010.

Weerakoon, D.D.N. *Sudāwa* (Sinhala translation of *Mashi and other Stories)* Colombo: Gunasena, 1962.

Weerasooriya, Jinasoma *Chitrā* (An adaptation of lyrical drama *Chitrā)* Gampaha: Nawalokaya, 1961.

Weerasinghe, Senaratne *Chārulatha* (Sinhala translation of *Chārulatha*) Veyangoda: Prabha Prakashana, 1986.

Wickremasinghe, Piyal *Chitrā* (Sinhala translation of *Chitra* ) Colombo: Gunasena, 1961.

Wijesinghe, P.R.H. *Saragi Gaehaeniyak* 1970.

Wijesinghe, Ru. Pe. *Gōra* (Sinhala translation of *Gōra* ) Colombo: Godage, 1999.

## II

### Biographies of Rabindranath Tagore (in Sinhala)

Dissanayaka, Hiyubath *Ravindarnath Tagore* Colombo: Gunasena, 1968.

Perera, Bellanwila O.T. *Ravindranath Tagore* Colombo: Godage, 2001.

Sumangala Himi, Maditiyawela *Tagore Charitaya* 1947.

Vithanage, Sirisena *Ravindaranath Tagore* Battaramulla: Dept. of Cultural Affairs, 2008.

# Bibliography - Tagore's Selected Works in English


*Gitanjali (Song Offerings)* / with an Introduction by W. B. Yeats. – London, 1913

*Glimpses of Bengal Life : Being Short Stories from the Bengali of Rabindranath Tagore* / translated by Rajani Ranjan Sen. – Madras ; Chittagong, 1913

*The Gardener.* – London : Macmillan, 1913

*Sâdhanâ : The Realisation of Life.* – London : Macmillan, 1913

*The Crescent Moon* : Child-Poems. – London : Macmillan, 1913

*Chitra : a Play in One Act.* – London : Macmillan, 1914

*The King of the Dark Chamber.* – London : Macmillan, 1914

*The Post Office : a Play* / translated by Devabrata Mukerjea. – London : Macmillan, 1914

*Fruit-Gathering.* – London : Macmillan, 1916

*The Hungry Stones and Other Stories* / Translated from the original Bengali by various writers. – London : Macmillan, 1916

*Stray Birds.* – New York & Toronto : Macmillan, 1916

*My Reminiscences* / translated by Surendranath Tagore. – New York : Macmillan, 1917

*Sacrifice and Other Plays.* – London : Macmillan, 1917

*The Cycle of Spring* / translated by Andrews and Nishikanta Sen. – London : Macmillan, 1917

*Nationalism.* – London : Macmillan, 1917

*Personality : Lectures Delivered in America.* – London : Macmillan, 1917

*Lover's Gift and Crossing.* – London : Macmillan, 1918

*Mashi and Other Stories* / Translated from the original Bengali by various writers. - London: Macmillan, 1918

*The Parrot's Training.* – Calcutta : Simla, Thacker, Spink, 1918

*The Home and the World* / translated by Surendranath Tagore, translation revised by Rabindranath Tagore. – London : Macmillan, 1919

*The Fugitive.* – London : Macmillan, 1921

*The Wreck.* – London : Macmillan, 1921

*Creative Unity.* – London : Macmillan, 1922

*The Curse at Farewell* / translated by Edward Thompson. – London : Harrap, 1924

*Gora.* – London : Macmillan, 1924

*Talks in China : Lectures Delivered in April and May, 1924.* – Calcutta : Visva-Bharati Book-Shop, 1925

*Red Oleanders : A Drama in One Act.* – London : Macmillan, 1925

*Broken Ties and Other Stories.* – London : Macmillan, 1925

*Fireflies.* – New York : Macmillan, 1928

*The Religion of Man : Being the Hibbert Lectures for 1930.* – London : Allen & Unwin, 1931

*The Child.* – London : Allen & Unwin, 1931

*The Golden Boat* / translated by Bhabani Bhattacharya. – London : Allen & Unwin, 1932

*Mahatmaji & the Depressed Humanity.* – Calcutta : Visva-Bharati Bookshop, 1932

*Crisis in Civilization : a Message on Completing His Eighty Years* / translated by Kshitis Roy and Krishna R. Kripalani. – Santiniketan : Santiniketan Press, 1941

*Four Chapters* / Translated from the Bengali Novel Char Adhyaya (1934) by Surendranath Tagore. – Calcutta : Visva-Bharati, 1950

*Letters from Russia* / edited by Sasadhar Sinha. – Calcutta : Visua-Bharati, 1960

*Binodini : a Novel* / translated by Krishna Kripalani. – New Delhi : Sahitya Akademi, 1959

*Wings of Death : the Last Poems of Rabindranath Tagore* / translated by Aurobindo Bose. – London : Murray, 1960

*The Parrot's Training* / translated by Debjani Chatterjee. – London : Tagore Centre U.K., 1993

*Selected Letters of Rabindranath Tagore* / edited by Krishna Dutta and Andrew Robinson, with a foreword by Amartya Sen. – Cambridge University Press, 1997

*Song Offerings (Gitanjali)* / Translated and Introduced by Joe Winter. – London : Anvil, 2000

Translations by the author, where not otherwise stated